# දෙවැනි කොටස

# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | | පිටුව |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | I |
| 2. | බැංකු අධීක්ෂණ | XVIII |
| 3. | බැංකු කටයුතු  අධ්‍යයන කේන්ද්‍රය | XXII |
| 4. | සන්නිවේදන<br>පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය | XXII |
| 5. | ව්‍යවහාර මුදල් | XXV |
| 6. | දේශීය කටයුතු | XXVI |
| 7. | ආර්ථික පර්යේෂණ | XXX |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | XXXII |
| 9. | විනිමය පාලන | XXXV |
| 10. | මූල්‍ය බුද්ධි ඒකකය | XXXVIII |
| 11. | මූල්‍ය පද්ධති ස්ථායිතාවය | XXXIX |
| 12. | මානව සම්පත් කළමනාකරණය | XL |
| 13. | තොරතුරු තාක්ෂණ | XLV |
| 14. | ජාත්‍යන්තර කටයුතු | XLVII |
| 15. | නීති | XLIX |
| 16. | කළමනාකාරිත්ව විගණන | L |
| 17. | ගෙවීම් හා පියවීම් | LI |
| 18. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | LIV |
| 19. | පරිශ්‍ර | LV |
| 20. | රාජ්‍ය ණය | LVI |
| 21. | ප්‍රාදේශීය සංවර්ධන | LX |
| 22. | ලේකම් | LXV |
| 23. | ආරක්ෂක සේවා | LXV |
| 24. | සංඛ්‍යාන සහ ක්ෂේත්‍ර සමීක්ෂණ | LXV |
| 25. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | LXVII |
| 26. | සුභසාධන | LXX |

# 1. ගිණුම්කරණ සහ මූල්‍ය

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. } ඊඑෆ්/ජේ/සීබී/එෆ්ඒ/2008
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date } 2009 මාර්තු 25 දින

## විගණකාධිපති වාර්තාව

2008 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අනෙකුත් පැහැදිලි කිරීම් සටහන් (අංක 1 සිට 24) වල සාරංශයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වෙනි වගන්තිය සහ මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කරන ප්‍රමිතීන්වලට අනුකූල වීම පිළිබඳව වූ විගණනයක් සිදුකරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සඳහා වූ කළමනාකාරිත්වයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණව ඉදිරිපත් කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ. උචිත පරිදි සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීමේදී හා යොදා ගැනීමේදී සහ අවස්ථානුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී, වැරදි හෝ වංචා හේතුකොටගෙන ඇතිවන සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

**විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

මාගේ වගකීම වන්නේ මාගේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමයි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණව සහතික කළ හැකි වන පරිදි විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු බවට නියම කර ඇති ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව විගණනය සිදු කරන ලදී. අගයන් සහ එකී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් වලට උපකාර වන සාක්ෂි නියැදි පදනමින් පරීක්ෂා කිරීම් විගණනයට ඇතුලත් විය. භාවිතා කරන ලද ගිණුම්කරණ මූලධර්ම සහ, කළමනාකාරිත්වය විසින් සිදුකරන ලද වැදගත් ඇස්තමේන්තු ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශයන්හි සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම විගණනයට ඇතුළත් විය. මාගේ දැනීමේ හා විශ්වාසය අනුව විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. එබැවින් විගණනය, මාගේ මතයට සාධාරණ පදනමක් සපයන බව මම විශ්වාස කරමි.

**මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට අනුව 2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුව විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා තිබුණු බවත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, 2008 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය සහ මුදල් ප්‍රවාහ පිළිබඳව සත්‍ය සහ සාධාරණ දර්ශනයක් මූල්‍ය ප්‍රකාශනවලින් පෙන්නුම් කරන බවත් මාගේ මතය වේ.

**පාර්ලිමේන්තු වෙත වාර්තා කිරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

එස්. ස්වර්ණජෝති
විගණකාධිපති

නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව

சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை

INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone } 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ - மெயில் / E-mail } oaggov@sltnet.lk

## ශ්‍රී ලංකා මහ බැංකුව
## දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පත්‍රය

| | සටහන | 2008 රු.'000 | 2007 රු.'000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමානයන් | 1 | **167,338,807** | 160,051,979 |
| මූල්‍ය වත්කම් : | | | |
| - ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 2 | **50,381,845** | 113,583,131 |
| - විකුණුම් සඳහා වන ආයෝජන | 2 | **41,733,314** | 79,541,928 |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් | 3 | **72,399,875** | 71,899,462 |
| අනෙකුත් විදේශීය ලැබිය යුතු මුදල් | | **1,427,899** | 767,873 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **333,281,740** | 425,844,373 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ආයෝජන කළඹ - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | **159,771,674** | 43,612,184 |
| රජයට දෙන ලද අත්තිකාරම් | 4 | **76,307,700** | 60,679,200 |
| අනිකුත් ආයතනවලට දෙන ලද ණය | 5 | **1,577,301** | 2,093,651 |
| අනෙකුත් දේශීය ලැබිය යුතු මුදල් | | **659,770** | 706,767 |
| මූල්‍ය ආයතන හා අනිකුත් ආයතන වල ආයෝජන | 6 | **50,729** | 50,135 |
| අනෙකුත් වත්කම් | | **1,364,690** | 1,230,687 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **239,731,864** | 108,372,624 |
| **මුළු මූල්‍ය වත්කම්** | | **573,013,604** | 534,216,997 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන්වලින් දක්වා ඇති සුරැකුම්පත් | | **10,427,432** | 13,991,886 |
| **දේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොග | 7 | **1,961,687** | 1,665,348 |
| රන් තොගය | | **-** | 59,766 |
| විවිධ වත්කම් | | **2,405,922** | 2,155,045 |
| දේපළ, පිරියත සහ උපකරණ | 8 | **9,242,988** | 9,354,648 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | **15,717** | 953 |
| **මුළු දේශීය මූල්‍ය නොවන වත්කම්** | | **24,053,746** | 27,227,760 |
| **මුළු වත්කම්** | | **597,067,350** | 561,444,646 |
| **බැරකම් සහ හිමිකරුවන්ගේ ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | | **336,091** | 6,730,522 |
| ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල් | 10 | **91,354,909** | 48,454,327 |
| ජා.මු.අ. සම්බන්ධ බැරකම් | | **95,133,658** | 102,291,389 |
| අනිකුත් විදේශිය ගෙවිය යුතු මුදල් | 11 | **1,517,077** | 1,615,652 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | **188,341,735** | 159,091,890 |
| **දේශිය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතු | 12 | **82,311,214** | 91,053,024 |
| රජ්‍යය හා රාජ්‍ය නියෝජ්‍ය ආයතනවල ශේෂ | 13 | **1,245,624** | 1,416,075 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවි කෙරෙන සුරැකුම්පත් | | **13,743,000** | 18,000 |
| සේවක සුභ සාධක යෝජනා ක්‍රමවල ශේෂ | 14 | **1,155,061** | 2,250,167 |
| අනෙකුත් දේශීය ගෙවිය යුතු මුදල් | | **1,664,352** | 1,923,545 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | **100,119,251** | 96,660,811 |
| **මුළු මූල්‍ය බැරකම්** | | **288,460,986** | 255,752,701 |
| **අනෙකුත් බැරකම්** | | | |
| සංසරණයෙහි පවත්නා මුදල් | | **186,098,914** | 173,363,722 |
| රජයේ විලම්භිත ප්‍රදාන | | **-** | 68 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පසු සේවා ප්‍රතිලාභ යෝජනා ක්‍රමවල ශේෂ | | **1,026,698** | 324,183 |
| විවිධ වගකීම් | | **531,960** | 614,603 |
| **මුළු අනෙකුත් බැරකම්** | | **187,657,572** | 174,302,575 |
| **මුළු බැරකම්** | | **476,118,558** | 430,055,276 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල් | | | |
| සංචිත | 15 | **25,000,000** | 15,000 |
| **මුළු හිමිකම්** | 15 | **95,948,792** | 131,374,367 |
| **මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | **120,948,792** | 131,389,367 |
| | | **597,067,350** | 561,444,643 |

නිකුත් කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරි විසින් 2009 මාර්තු 06 වන දින බැංකුව වෙනුවෙන් අනුමත කරන ලදී

**අජිත් නිවාඩ් කබ්රාල් - අධිපති**

**කේ.එම්.ඒ.එන්. දවුලගල - ප්‍රධාන ගණකාධිකාරී**

## ශ්‍රී ලංකා මහ බැංකුව
## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් ප්‍රකාශනය

| මෙහෙයුම් ආදායම | සටහන | 2008 රු '000 | 2007 රු '000 |
|---|---|---|---|
| **විදේශ මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 16 | **11,129,190** | 13,240,762 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/ (පාඩුව) | | **2,211,883** | 4,413,887 |
| මිල වෙනස්වීම් වලින් උපලබ්ධි වාසිය / (පාඩුව) | | **6,648,280** | 2,189,134 |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත සම්පූර්ණ ආදායම** | | **19,989,353** | 19,843,783 |
| **විදේශීය මූල්‍ය වගකීම් ආශ්‍රිත වියදම** | | | |
| පොළී වියදම් | 17 | **(1,301,552)** | (2,226,270) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත සම්පූර්ණ වියදම** | | **(1,301,552)** | (2,226,270) |
| විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභය/ (පාඩුව) | | **(22,810,925)** | 8,812,401 |
| **විදේශ මුදල් ආශ්‍රිත ආයෝජන ආදායම / (පාඩුව)** | | **(4,123,124)** | 26,429,914 |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 16 | **7,043,031** | 9,516,837 |
| පොළී වියදම | 17 | **(511,709)** | (551,596) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත සම්පූර්ණ ආදායම** | | **6,531,322** | 8,965,241 |
| අනිකුත් ආදායම | 18 | **454,250** | 421,396 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම / (පාඩුව)** | | **2,862,448** | 35,816,551 |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| **කාර්ය මණ්ඩල පිරිවැය** | | | |
| - වේතන සහ වැටුප් | 19 | **(1,718,302)** | (1,591,667) |
| - නිශ්චිත දායක යෝජනා ක්‍රම පිරිවැය | 19 | **(215,066)** | (187,834) |
| - පශ්චාත් සේවා නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිරිවැය | 19 | **(1,333,944)** | (1,671,606) |
| | | **(3,267,312)** | (3,451,107 |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **(302,977)** | (270,040) |
| තොග පිරිවැය | | **(926,587)** | (1,052,160) |
| පරිපාලන වියදම් | | **(1,426,257)** | (1,172,964) |
| බොල් සහ අඩමාන ණය සහ ශුද්ධ විවිධ කපාහැරීම් | | **-** | (53) |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **(5,969,133)** | (5,946,324) |
| **ආදායම් බදුවලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලාභය / (පාඩුව)** | | **(3,106,684)** | 29,870,227 |
| ආදායම් බදු | | **(1,937,740)** | (1,044,842) |
| **සාමාන්‍ය කටයුතු වලින් ලැබූ ශුද්ධ ලාභය / (පාඩුව)** | | **(5,044,424)** | 28,825,385 |

## ශ්‍රී ලංකා මහ බැංකුව
## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2008 රු '000 | 2007 රු '000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | | |
| **ප්‍රභවය :** | | | |
| ලැබුණු පොළිය - විදේශීය මුදල් | | **11,970,696** | 13,091,488 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - වෙනත් | | **688,187** | 380,567 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **6,648,280** | 2,189,134 |
| උපලබ්ධි වූ විනිමය ලාභ /(පාඩු) | | **(269,850)** | 89,345 |
| ලැබුණු අනිකුත් ආදායම් | | **454,182** | 348,438 |
| | | **19,491,495** | 16,098,972 |
| **වියපැහැදම් :** | | | |
| ගෙවන ලද පොළිය - විදේශීය මුදල් | | **1,447,241** | 2,234,300 |
| ගෙවන ලද පොළිය - දේශීය මුදල් | | **507,687** | 552,054 |
| සේවකයින්ට ගෙවීම් | | **3,608,251** | 1,782,510 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **(23,623,338)** | 3,583,245 |
| ගෙවන ලද ආදායම් බදු | | **28,611,636** | 663,653 |
| | | **10,551,477** | 8,815,762 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | 21 | **8,940,018** | 7,283,210 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | |
| **ප්‍රභවය :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම) /අඩුවීම | | **(304,851)** | (822,393) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම්වල මුල් මුදල් අයකිරීම් | | **252,307** | 393,795 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන ඉවත් කිරීම / නිදහස් කිරීම | | **(594)** | (4,950) |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන ආශ්‍රිත ආදායම් | | **-** | 28,590 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **13,725,000** | (544,000) |
| | | **13,671,863** | (948,958) |
| **වියපැහැදම්** | | | |
| විදේශීය මූල්‍ය සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **(86,444,960)** | 6,186,179 |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **(541,626)** | 587,989 |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **(33,914,788)** | (12,345,621) |
| අනිකුත් දේශීය තැන්පතු හා ගෙවිය යුතු මුදල් වල ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **(4,861)** | 4,409 |
| ප්‍රදානයන් අඩු කළ දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිලට ගැනීම් | | **(2,269,492)** | 221,448 |
| රන් තොගයේ ශුද්ධ වැඩිවීම /(අඩුවීම) | | **206,080** | (181,599) |
| | | **(122,969,647)** | (5,527,195) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **136,641,510** | 4,578,237 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | |
| **ප්‍රභවය :** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **219,507,915** | 209,034,025 |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **(206,772,722)** | (192,909,909) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **12,735,193** | 16,124,116 |
| **අඩුකිරීම්** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව /(ආපසු ගැනීම්) | 22 | **125,419,584** | (21,422,909) |
| බැංකුව සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව /(ආපසු ගැනීම්) | 23 | **8,741,810** | (8,564,417) |
| | | **134,161,394** | (29,987,326) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව /(ආපසු ගැනීම්) | | **(121,426,201)** | 46,111,442 |
| **වියපැහැදම්** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **8,313,981** | 605,092 |
| අනෙකුත් අරමුදල් සඳහා ගෙවීම් | | **-** | 15,090 |
| අතිරික්තය රජයට ගෙවීම | | **8,000,000** | 4,000,000 |
| | | **16,313,981** | 4,620,182 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(137,740,182)** | 41,491,260 |
| **වසර තුල මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම** | | **7,841,345** | 53,352,706 |
| මුදල් සහ මුදල් සමානයන් මත විනිමය අනුපාතයන් බලපෑම | | **(554,517)** | 1,097,587 |
| වසර ආරම්භක දිනට මුදල් සහ මුදල් සමානයන් | | **160,051,979** | 105,601686 |
| දෙසැම්බර් 31 දිනට ශුද්ධ මුදල් හා මුදල් සමානයන් | 24 | **167,338,807** | 160,051,979 |

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය**

| | දායක ප්‍රාග්ධනය රු'000 | ප්‍රාග්ධන ලෙස විසර්ජනය කළ සංචිත රු'000 | ප්‍රත්‍යාගණන සංචිතය රු'000 | අනිකුත් සංචිත රු'000 | සමුච්චිත ලාභ රු'000 | එකතුව රු'000 |
|---|---|---|---|---|---|---|
| **2007 ජනවාරි 01 දිනට** | 15,000 | - | 473,057 | 90,712,965 | 12,148,493 | 103,349,515 |
| තත් කාලීන තත්ත්වයේ ඇති වූ බලපෑම | - | - | - | - | (520) | (520) |
| ශුද්ධ ලාභය | - | - | - | - | **28,825,385** | **28,825,385** |
| තත් කාලීන දළ පියවුම් පද්ධතිය | | | | | | |
| සඳහා වූ නිදන් අරමුදලට පැවරීම | - | - | - | 46,341 | (46,341) | - |
| ශ්‍රී.ලං.ම.බැ. නිශ්චිත සංචිතවලට පැවරීම | - | - | - | 100,914 | (100,664) | 250 |
| උපලබ්ධි ප්‍රත්‍යාගණන වාසිය පැවරීම | - | - | 2,233,010 | - | - | 2,233,010 |
| පොදු සංචිතයට පැවරීම | | - | | 1,478,488 | (1,478,488) | |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය පැවරීම | - | - | - | 8,812,401 | (8,812,401) | - |
| මහනුවර දේපළ විකිණීමෙන් ලත් මුදල පැවරීම | - | - | - | - | (15,090) | (15,090) |
| 2006 වර්ෂය සඳහා ශුද්ධ ලාභය රජයට පැවරීම | - | - | - | - | (4,000,000) | (4,000,000) |
| විකුණුම් සුරැකුම්පත් සඳහා ඇති | | | | | | |
| ශුද්ධ සාධාරණ වටිනාකම /(පාඩුව) | - | - | - | 996,817 | - | 996,817 |
| **2008 ජනවාරි 01 දිනට** | **15,000** | **-** | **2,706,067** | **102,147,926** | **26,520,374** | **131,389,366** |
| ශුද්ධ ලාභය (අලාභය) | | | | | (5,044,424) | (5,044,424) |
| තත් කාලීන දළ පියවුම් පද්ධතිය | | | | | | |
| සඳහා වූ නිදන් අරමුදලට පැවරීම | - | - | - | 63,294 | (63,294) | - |
| ශ්‍රී.ලං.ම.බැ. නිශ්චිත සංචිතවලට පැවරීම | - | - | - | 150,377 | (150,377) | - |
| පොදු සංචිතයට පැවරීම | - | - | - | 11,722,139 | (11,722,139) | - |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය පැවරීම | | | | (22,810,925) | 22,810,925 | |
| පොදු සංචිතයෙන් ප්‍රාග්ධනය ලෙස විසර්ජනය කළ සංචිතයට අරමුදල් මාරුකිරීම | - | 24,985,000 | | (24,985,000) | | |
| 2007 වර්ෂය සඳහා ශුද්ධ ලාභය රජයට පැවරීම | | | | | (8,000,000) | (8,000,000) |
| විකුණුම් සුරැකුම්පත් සඳහා ඇති | | | | | | |
| ශුද්ධ සාධාරණ වටිනාකම /(පාඩුව) | - | - | - | 2,603,850 | | 2,603,850 |
| **2008 දෙසැම්බර් 31 දිනට** | **15,000** | **24,985,000** | **2,706,067** | **68,891,661** | **24,351,065** | **120,948,792** |

## ශ්‍රී ලංකා මහ බැංකුව
## මූල්‍ය වාර්තාවල කොටසක් ලෙස කියවිය යුතු සටහන්

| සටහන | 2008 රු '000 | 2007 රු '000 |
|---|---|---|
| **1. මුදල් හා මුදල් සමානයන්** | | |
| විදේශීය බැංකුවල ඇති ශේෂයන් | **45,683,515** | 6,831,527 |
| විදේශීය බැංකුවල ඇති කාලීන තැන්පතු | **39,017,982** | 130,280,290 |
| කාලීන තැන්පතු සඳහා කොන්ත්‍රාත්ගත බැඳීම් | **-** | 4,327,401 |
| ප්‍රතිමිලදී ගැනීම් යටතේ ඇති තැන්පතු | **82,637,310** | 18,612,761 |
| | **167,338,807** | 160,051,979 |
| **2. මූල්‍ය වත්කම්** | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **50,381,845** | 113,583,131 |
| විකිණීමට ඇති ආයෝජන | **41,733,314** | 79,541,928 |
| | **92,115,159** | 193,125,059 |
| **3. ජා.මු.අ. සම්බන්ධ වත්කම්** | | |
| ජා.මු.අ. තැම්පතු | **137,458** | 135,516 |
| විශේෂ ගැනුම් හිමිකම්වල දැරීම | **220,853** | 740,172 |
| ජා.මු.අ. පංගුව | **72,041,564** | 71,023,774 |
| | **72,399,875** | 71,899,462 |
| **4. රජයට දෙන ලද අත්තිකාරම්** | | |
| චක්‍රීය ණය | **76,307,700** | 60,679,200 |
| රජයට දෙන ලද මුළු අත්තිකාරම් | **76,307,700** | 60,679,200 |
| **5. අනිකුත් ආයතනවලට දෙන ලද ණය** | | |
| දැනට පවත්නා මුල් මුදල - සම්බන්ධිත පාර්ශව | **48,058** | 50,670 |
| - අනෙකුත් | **2,148,718** | 2,152,116 |
| සුසහන ණය ක්‍රමය යටතේ ලැබීම් - සම්බන්ධිත පාර්ශව | **821,613** | 1,046,496 |
| - අනෙකුත් | **737,404** | 1,022,861 |
| ලැබිය යුතු පොලිය | **4,220,236** | 4,218,134 |
| **දළ ලැබිය යුතු මුදල්** | **7,976,039** | 8,490,277 |
| අඩු කළා : අඩමාන ණය සඳහා වෙන් කිරීම | **(2,178,492)** | (2,178,492) |
| අත්හිටවූ පොලිය | **(4,220,236)** | (4,218,135) |
| **ලැබිය යුතු ශුද්ධ මුදල** | **1,577,301** | 2,093,650 |
| **6. මූල්‍ය සහ අනෙකුත් ආයතනවල ආයෝජන** | | |
| සීමාසහිත ණය තොරතුරු කාර්යාංශය | **15,479** | 12,135 |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | **29,500** | 29,500 |
| සීමාසහිත ෆිච් රේටිංස් ලංකා | **3,500** | 3,500 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | **2,250** | 5,000 |
| | **50,729** | 50,135 |
| **7. තොග** | | |
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **1,538,974** | 1,155,948 |
| සංසරණය සඳහා ඇති කාසි | **441,512** | 497,949 |
| මාර්ගස්ථ කාසි | **7,739** | 41,155 |
| | **1,988,226** | 1,695,052 |
| **අඩුකළා : සෙමින් චලනය වන විෂයයන් සඳහා වෙන්කිරීම්** | **(55,300)** | (55,300) |
| | **1,932,926** | 1,639,752 |
| ලිපිද්‍රව්‍ය සහ විවිධ තොග | **28,761** | 25,596 |
| **පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මත මුළු තොගය** | **1,961,687** | 1,665,348 |

8. දේපළ, පිරියත සහ උපකරණ

| ශේෂය | ඉඩම් සහ ගොඩනැගිලි රු '000 | පිරියත හා පිරියත උපකරණ රු '000 | ලී බඩු සහ උපකරණ රු '000 | මෝටර් වාහන රු '000 | පරිඝනක දෘඩාංග රු '000 | අනිකුත් රු '000 | එකතුව 2008 රු '000 | එකතුව 2007 රු '000 |
|---|---|---|---|---|---|---|---|---|
| සමුච්චිත ක්ෂය අඩුකර ජනවාරි 01 දිනට | 8,166,228 | 780,271 | 193,868 | 98,446 | 61,880 | 53,954 | **9,354,647** | 7,171,183 |
| ප්‍රත්‍යාගණනයන් | - | - | - | - | - | - | - | 2,233,010 |
| එකතු කිරීම් | 11,798 | 2,961 | 28,161 | - | 35,870 | 120,884 | **1,996,674** | 220,177 |
| අපහරණයන් | - | - | (263) | - | (85) | (13,827) | **(13,635)** | - |
| වර්ෂය සඳහා ක්ෂය වීම් | (121,064) | (52,575) | (45,097) | (27,033) | (50,435) | (1,495) | **(297,698)** | (269,722) |
| **සමුච්චිත ක්ෂය අඩු කර දෙසැම්බර් 31 දිනට ශේෂය** | 8,056,962 | 730,657 | 176,669 | 71,413 | 47,230 | 160,056 | **9,242,988** | 9,354,648 |

| | | 2008 දිනට රු '000 | 2007 දිනට රු '000 |
|---|---|---|---|
| 9. | **අස්පෘශ්‍ය වත්කම්** | | |
| | **පරිගණක මෘදුකාංග** | | |
| | පිරිවැය: | | |
| | ජනවාරි 01 දිනට | **464,420** | 463,149 |
| | එකතු කිරීම් | **20,039** | 1,271 |
| | දෙසැම්බර් 31 දිනට | **484,459** | 464,420 |
| | ක්‍රමක්ෂය කිරීම සහ හානිකරණය : | | |
| | ජනවාරි 01 දිනට | **463,467** | 463,149 |
| | වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **5,275** | 318 |
| | දෙසැම්බර් 31 දිනට | **468,742** | 463,467 |
| | ශුද්ධ පොත් අගය : | | |
| | ජනවාරි 01 දිනට | **953** | - |
| | දෙසැම්බර් 31 දිනට | **15,717** | 953 |
| 10. | **බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල්** | | |
| | විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | - | 6,246,208 |
| | අනෙකුත් විදේශීය ආයතනවලට ගෙවිය යුතු මුදල් | **336,091** | 484,314 |
| | **බැංකු හා මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුළු මුදල්** | **336,091** | 6,730,522 |
| 11. | **ජා.මු.අ. සම්බන්ධ බැරකම්** | | |
| | පොලිය දරන ණය - ප්‍රවර්තන නොවන | **7,534,695** | 18,809,059 |
| | පොලිය දරන ණය - ප්‍රවර්තන | **11,543,903** | 8,501,764 |
| | වි.ගැ.හි වෙන්කිරීම් | **12,349,883** | 12,175,406 |
| | ජා.මු.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **39,987,545** | 38,417,617 |
| | පංගු බැරකම් | **23,717,632** | 24,387,543 |
| | | **87,598,963** | 83,482,330 |
| | **ජා.මු.අ. සම්බන්ධ මුළු බැරකම්** | **95,133,658** | 102,291,389 |

| | 2008 රු '000 | 2007 රු '000 |
|---|---|---|
| **12. බැංකු සහ මූල්‍ය ආයතයන් විසින් තැන්පත් කිරීම්** | | |
| **බැංකු විසින් තැන්පත් කිරීම්** | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **33,347,603** | 38,250,751 |
| - අනිකුත් | **48,960,685** | 52,795,434 |
| | **82,308,288** | 91,046,185 |
| **මූල්‍ය ආයතනයන් විසින් තැන්පත් කිරීම්** | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **91** | 64 |
| - අනිකුත් | **2,836** | 6,775 |
| | **2,926** | 6,839 |
| අඩුකළා: එක් දින ද්‍රවශීලි පහසුකම් යටතේ අත්තිකාරම් | **-** | - |
| **බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු** | **82,311,214** | 91,053,024 |
| **13. රජය සහ රජයේ ඒකක සමග වූ ශේෂයන් - සම්බන්ධිත පාර්ශවයන්** | | |
| රජයේ තැන්පතු | **341,343** | 642,135 |
| රජයේ නියෝජිත ආයතන සහ අරමුදල් | **904,281** | 773,940 |
| **රජය සහ රජයේ නියෝජිතයන් වෙත වූ මුළු ශේෂ** | **1,245,624** | 1,416,075 |
| **14. සේවක ප්‍රතිලාභ සැලසුම් සමග වූ ශේෂයන්** | | |
| අර්ථසාධක අරමුදල - සම්බන්ධිත පාර්ශවයන් | **2,563** | 713 |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - සම්බන්ධිත පාර්ශවයන් | **(482,438)** | 437,867 |
| වැන්දඹු / වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමය-සම්බන්ධිත පාර්ශවයන් | **704,166** | 829,216 |
| පාරිතෝෂිත විශ්‍රාම වැටුප් යටතේ ගෙවිය යුතු මුදල් | **39,337** | 46,488 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගෙවිය යුතු මුදල් | **891,433** | 935,883 |
| | **1,155,061** | 2,250,167 |
| **15. ප්‍රාග්ධනය සහ සංචිත** | | |
| දායක ප්‍රාග්ධනය | **15,000** | 15,000 |
| ප්‍රාග්ධනය ලෙස විසර්ජනය කල සංචිත | **24,985,000** | - |
| ප්‍රාග්ධන දායක ගිණුම | **-** | 577,859 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ගිණුම | **2,706,067** | 2,706,067 |
| විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල වෙළෙඳපොළ ඇගයීම් සංචිතය | **1,822,401** | (781,449) |
| වාර්ෂික ලාභය / (අලාභය) | **(5,044,424)** | 28,825,384 |
| ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය | **38,651,679** | 61,422,435 |
| අනෙකුත් සංචිත | **57,813,069** | 38,624,071 |
| | **120,948,792** | 131,389,367 |
| **16. මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| මුදල් හා මුදල් සමානයන් | **4,670,088** | 5,956,825 |
| මූල්‍ය වත්කම් | **6,334,568** | 7,086,382 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වත්කම් | **124,534** | 169,872 |
| අනෙකුත් විදේශීය ලැබිය යුතු දෑ | **-** | 27,683 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් සම්පූර්ණ පොලී ආදායම** | **11,129,190** | 13,240,762 |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| ආයෝජන කළඹ - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **6,538,858** | 9,207,485 |
| අනිකුත් ණය සහ අත්තිකාරම් | **504,173** | 309,352 |
| **දේශීය මූල්‍ය වත්කම් වලින් සම්පූර්ණ පොලී ආදායම** | **7,043,031** | 9,516,837 |
| **මූල්‍ය වත්කම් වලින් ඉපැයූ සම්පූර්ණ පොලී ආදායම** | **18,172,221** | 22,757,599 |

| | | 2008<br>රු '000 | 2007<br>රු '000 |
|---|---|---|---|
| 17. | **මූල්‍ය බැරකම් මත පොලී වියදම** | | |
| | **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොලී වියදම** | | |
| | ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල් | **869,784** | 1,330,404 |
| | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම් | **428,110** | 828,181 |
| | ප්‍රති මිලදී ගැනීමේ එකගත්වය මත අලෙවිකළ සුරැකුම්පත් | **-** | 67,685 |
| | වෙනත් විදේශීය ගෙවිය යුතු මුදල් | **3,658** | - |
| | **විදේශීය මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොලී වියදම** | **1,301,552** | 2,226,270 |
| | **දේශීය මූල්‍ය බැරකම් මත පොලී වියදම** | | |
| | ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවිකරණ සුරැකුම්පත් | **511,709** | 551,596 |
| | **දේශීය මූල්‍ය බැරකම් මත සම්පූර්ණ පොලී වියදම** | **551,709** | 551,596 |
| | **මූල්‍ය බැරකම් මත සම්පූර්ණ පොලී වියදම** | **1,813,261** | 2,777,866 |
| 18. | **අනිකුත් ආදායම්** | | |
| | ලාභාංශ ආදායම - සම්බන්ධිත පාර්ශ්වයන් | **9,048** | 12,648 |
| | - අනිකුත් | **-** | 394 |
| | දේපළ, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලාභය / (අලාභය) | **1,708** | 567 |
| | මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණයෙන් ලාභය /(අලාභය) | **308** | (12) |
| | විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂය වීම | **68** | 60,007 |
| | විවිධ ආදායම් | **443,119** | 347,792 |
| | **මුළු අනෙකුත් ආදායම්** | **454,250** | 421,396 |
| 19. | **සේවක මණ්ඩල වියදම්** | | |
| | උපයන විට ගෙවීම් බදු ඇතුළුව සේවායෝජක විසින් ගෙවන ලද වේතන සහ වැටුප් | **1,718,302** | 1,591,667 |
| | පශ්චාත් සේවක නිශ්චිත ආයක සැලසුම් පිරිවැය | **1,333,944** | 1,671,606 |
| | නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | **215,066** | 187,834 |
| | | **3,267,312** | 3,451,107 |
| 20. | **පරිපාලන වියදම්** | | |
| | අළුත්වැඩියා සහ නඩත්තු | **441,637** | 341,234 |
| | සන්නිවේදන වියදම් | **77,242** | 78,564 |
| | මෙහෙයුම් ගමන් වියදම් | **48,532** | 20,099 |
| | බදුකුලී වියදම් | **1,217** | 1,239 |
| | මුද්‍රණ වියදම් | **23,830** | 23,982 |
| | විගණන ගාස්තු | **8,688** | 9,040 |
| | මුදල් මණ්ඩලයේ සාමාජිකයින්ට පාරිශ්‍රමිකය | **383** | 389 |
| | පොලී වියදම් - ශ්‍රී ලංකා මහ බැංකු අර්ථසාධක අරමුදල | **468,165** | 453,125 |
| | විවිධ | **402,563** | 245,293 |
| | | **1,472,257** | 1,172,965 |
| 21. | **මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම** | | |
| | **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වාර්තා කෙරුණු ශුද්ධ ලාභය /(අලාභය)** | **(5,044,424)** | 28,825,385 |
| | **මුදල් නොවන විෂයයන් එකතු කළා /(අඩු කළා)** | | |
| | ක්ෂයවීම් | **302,977** | 270,040 |
| | ලැබුණු පොලිය - දේශීය මුදල් - ආයෝජන කළඹ | **(6,538,858)** | (9, 131,665) |
| | නිශ්චිත සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ශුද්ධ ප්‍රතිපාදන | **4,682,839** | - |
| | උපලබ්ධි නොවූ ශුද්ධ විදේශ විනිමය (ලාභය) /අලාභය | **22,541,075** | (8,723,055) |
| | අනෙකුත් ප්‍රතිපාදන | **21,329,329** | 1,943,189 |
| | විලම්භිත ප්‍රදනයන් | **(68)** | (59,917) |

| | 2008 රු '000 | 2007 රු '000 |
|---|---|---|
| **එකතු කළා /(අඩු කළා) අනිකුත් කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ චලනය** | | |
| තොගවල (වැඩිවීම) /අඩුවීම | **(296,339)** | 602,189 |
| ලැබිය යුතු පොලිය (වැඩිවීම) /අඩුවීම | **1,025,519** | (141,746) |
| විවිධ බැරකම්වල වැඩිවීම /(අඩුවීම) | **(26,755,479)** | (2,304,419) |
| ගෙවිය යුතු පොලිය වැඩිවීම /(අඩුවීම) | **(141,667)** | (36,171) |
| අනෙකුත් ලැබිය යුතු මුදල් වල වැඩිවීම /(අඩුවීම) | **46,997** | 450,759 |
| **එකතුකළා /(අඩුකළා) ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| ආයෝජන වලින් ආදායම | - | 15,550 |
| ලාභාංශ ලැබීම් | - | (13,041) |
| උපලබ්ධි නොවූ වෙළෙඳපොළ වටිනාකමෙහි ශුද්ධ වෙනස්වීම | **(2,211,883)** | (4,413,887) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **8,940,018** | 7,283,211 |
| **22. රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් නිකුතු /(ආපසු ගැනීම්)** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් කළඹ පරිණත වීම | - | (233,522,233) |
| ආයෝජන කළඹ සඳහා ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම | **114,186,270** | 209,516,796 |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - ආයෝජන කළඹ | **(4,565,637)** | (9,021,548) |
| ශ්‍රී ලංකා රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් වැඩිවීම /(අඩුවීම) | **15,253,700** | 11,663,800 |
| රජය සහ රජයේ ඒකක සමග ශේෂ (වැඩිවීම) /අඩුවීම | **545,251** | (59,724) |
| | **125,419,584** | (21,422,909) |
| **23. බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු /(ආපසු ගැනීම්)** | | |
| බැංකු හා මූල්‍ය ආයතන තැන්පතු (වැඩිවීම) /අඩුවීම | **8,741,810** | (8,564,417) |
| | **8,741,810** | (8,564,417) |
| **24. වසර අවසාන දිනට මුදල් හා මුදල් සමානයන්** | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | |
| අනිකුත් විදේශීය බැංකු සමග මුදල් ශේෂ | **167,338,807** | 160,051,979 |
| **වසර අවසාන දිනට මුදල් හා මුදල් සමානයන්** | **167,338,807** | 160,051,979 |

## 1.1 අරමුණු වලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් කටයුතුභාවය සහ මූල්‍යමය කටයුතු කාර්ය සාධනය

ශ්‍රී ලංකාවේ මුදල් සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මූල්‍ය නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සාක්ෂාත් කරගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින් මහ බැංකුවේ ගිණුම් කටයුතුභාවය සහ එහි මෙහෙයුම්වල සාර්ථකභාවය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය අංශයේ ආයතන වලින් වෙන්කොට හඳුනාගැනීමේ මූලික ලක්ෂණයන්, මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන් වන්නේය. පොලී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහ බැංකුව සතු බැවින් එය ලාභදායීත්ව ප්‍රවේශයක් අනුගමනය කලේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් සිදුවනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායීතා සහ මූල්‍ය පද්ධති ස්ථායීතා පරමාර්ථයන්, ලාභදායීතා අරමුණු වලින් ව්‍යුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් විය යුතු වන්නේය.

මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමණාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාකාරකම් කිරීමේ ප්‍රතිඵල උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සටහන් කරන අතර මෙය රාජ්‍ය ගිණුම් කටයුතු භාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමෙන් මූල්‍ය ගිණුම් කටයුතු භාවය සඳහා පදනම සපයනු ලබන අතර මෙම ප්‍රකාශයන්හි වාර්තාකර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළ යුතුය.

## 1.2 වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

මෙම මූල්‍ය ප්‍රකාශනයන්, ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මූල්‍ය නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") මූල්‍ය ප්‍රකාශනයන් වන්නේ ය. ශ්‍රී ලංකා මහ බැංකුව, නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හා ප්‍රධාන ගණකාධිකාරී විසින් 2009 මාර්තු මස 06 වන දින මෙම මූල්‍ය ප්‍රකාශයන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

## 1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.3.1 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්ති වලින් හඳුන්වාදී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද ඉඩම්, ගොඩනැගිලි සහ ඇතැම් මූල්‍ය වත්කම් හැර මූල්‍ය ප්‍රකාශනයන් ඓතිහාසික පිරිවැය පදනමට මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කරන ලදී.

**වාර්තා කිරීමේ ආකෘතිය**

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාළ ආදායම් සහ වියදම් මාර්ගද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. ශේෂ පත්‍රයෙහි වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී, පුළුල් වශයෙන් එක් එක් වර්ගය යටතේ ද්‍රවශීලවීමේ පිළිවෙලට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 1.5 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

**අනුකූලතා ප්‍රකාශනය**

2008 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) ප්‍රකාර පිළියෙල කර තිබේ. මුදල් නීති පනත අනුව මූල්‍ය නීති පනත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර විගණකාධිපති විසින් විගණනයකර නීතිමය අවශ්‍යතා මත ගැසට් කර ඇත. ජාඃමූඃවාඃප්‍රඃ වල සමහර අවශ්‍යතා මත ගැසට් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සමග වෙනස් විය හැකිය.

**වාර්තාකිරීමේ මුදල් ඒකකය**

අන් අන්දමකට දක්වා නොමැති නම් සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දැක්වේ.

### 1.3.2 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

ගිණුම් ප්‍රතිපත්ති අදාළ කිරීමේදී බැංකුව විසින් ඇස්තමේන්තුවලට අමතරව පහත දැක්වෙන නිශ්චයන් කර ඇති අතර මෙම ගිණුම් ප්‍රකාශනයන්ගේ අගය හඳුනාගැනීම් මත ඒවා සැලකිය යුතු අන්දමින් බලපා ඇත.

**විකිණීමට ඇති ආයෝජන හානිකරණය**

වැදගත් හා නොනවත්වා සාධාරණ අගය එහි පිරිවැයට වඩා පහළ යන විට, විකිණීම සඳහා ඇති ආයෝජන හානි වී ඇති බව බැංකුව තීරණය කරයි. වැදගත් බව සහ නොනවත්වා යන්න තීරණය කිරීමේදී නිශ්චය කිරීම අවශ්‍ය වේ.

**විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම්වල පිරිවැය, ආයුගණක ඇගැයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණක ඇගයීමකදී, වට්ටම් අනුපාත, වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදු කරනු ලැබේ. මෙම සැලසුම්වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ.

### 1.3.3 වර්ෂය තුළ, ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති (IFRS) අදළ කර ගැනීම.

යොදා ගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති, ඉකුත් වර්ෂයේ යොදාගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති සමග අනුරූප වේ.

#### 1.3.3.1 මෙතෙක් ක්‍රියාත්මක නොමැති එහෙත් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රමිතිවලට සංශෝධන ඇතුළු ප්‍රමිති සහ නිර්වචනයන්

2009 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භවන බැංකුවේ ගිණුම් කාලපරිච්ඡේදයන්ට අදාළ වන්නා වූ, එහෙත් බැංකු විසින් මින් ඉහත දී යොදා නොගත්, ඇතැම් නව ප්‍රමිති සහ පවත්නා ප්‍රමිතීන්ට සංශෝධන හා නිර්වචනය කිරීම් ප්‍රකාශයට පත්කර තිබුණි. ඒවා මෙසේ ය.

ජා.මූ.වා.ප්‍ර. 8 - මෙහෙයුම් කාණ්ඩ (2009 ජනවාරි 1 දින සිට බල පැවැත්වේ) ජා.මූ.වා.ප්‍ර. 8: ආයතනයක් විසින් තම මෙහෙයුම් කාණ්ඩයන්හි තොරතුරු, වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කිරීමේ ආකාරය මෙමගින් තීරණය කෙරේ. ජා.මූ.වා.ප්‍ර. 8 සහ එය ස්වේච්ඡාවෙන් අදාළ කර ගැනීමේ බලපෑම බැංකුව විසින් තක්සේරු කෙරෙමින් පවතී.

## 1.4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 1.4.1 විදේශීය මුදල් පරිවර්තනය

බැංකුවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. විදේශීය මුදල් වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේදී පවතින විනිමය අනුපාතික ප්‍රකාර කෘත්‍යාත්මක මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල් වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, ශේෂ පත්‍ර දිනට පවත්නා විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේදී, ප්‍රධාන ව්‍යවහාර මුදල් වලට වූ ඉහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| ප්‍රධාන ව්‍යවහාර මුදල් | 2008 දෙසැ රු. | 2007 දෙසැ රු. |
|---|---|---|
| ඔස්ට්‍රේලියානු ඩොලර් 1 | **78.0495** | 95.5807 |
| කැනඩා ඩොලර් 1 | **92.7604** | 111.0061 |
| යූරෝ 1 | **159.4536** | 160.2741 |
| ජපන් යෙන් 1 | **1.2524** | 0.9713 |
| විශේෂ ගැනුම් හිමිකම් (විගැහි) 1 | **174.2660** | 171.8040 |
| බ්‍රිතාන්‍ය පවුම් 1 | **163.2777** | 217.1507 |
| එක්සත් ජනපද ඩොලර් 1 | **113.1398** | 108.7194 |

විදේශීය මුදල් වලින් ඓතිහාසික පිරිවැය මත මිනුම් කරනු ලබන මූල්‍ය නොවන විෂයයන්, මුල් ගනුදෙනුව සිදු වූ දිනයෙහි පැවති විනිමය අනුපාතය මත පරිවර්තනය කරනු ලැබේ.

### 1.4.2 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන් ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන් තුළින් ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මුදල් නිකුතු සහ බැංකු කටයුතු වලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පිළිඹිබුවේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය ව්‍යවහාර මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම්, මූලිකව පිරිවැය මත හඳුනා ගනු ලබන අතර ආයෝජනයට අදාළ අත්පත් කර ගැනීමේ වියදම්ද ඇතුළුව, ඉදිරිපත්වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මෙම මූලික හඳුනාගැනීමෙන් අනතුරුව වන මිනුම් පදනම් පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වෙළඳාම් දිනයේදී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලී සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළඳ පොළෙහි පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළදී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ හෝ මූල්‍ය වත්කම් වන්නේ ය.

#### ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති සුරැකුම්පත්

වෙළඳාම සඳහා ගැනෙන මුදල් වත්කම්, ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති වත්කම් යටතේ ඇතුළත් කර ඇත. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, ශේෂ පත්‍රයෙහි සුරැකුම්පත්වල වටිනාකම යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගතවන වාසිය / (අවාසිය) ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාළ වාසිය / (අවාසිය) උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය / (අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම් එය මිල වෙනස්වීමෙන් උපලබ්ධි වාසිය / (අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

#### අලෙවිය සඳහා ඇති විදේශ විනිමය සුරැකුම්පත්

වෙළඳාම සඳහා ගැනෙන විදේශ මුදල් සුරැකුම්පත් පසුව වෙළඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළඳපොළ අගයෙහි වෙනස්වීම්, ශේෂ පත්‍රයෙහි සංචිත යටතේ, විකිණීමට ඇති සුරැකුම්පත් වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

වෙළඳාම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළඳපොල අගය වෙනස් වීමෙන් උද්ගතවන වාසිය හෝ අවාසිය, එම ආයෝජන විකුණන, ප්‍රතිග්‍රහණය කරන හෝ වෙනත් අයුරකින් ඉවත් කිරීම කරන තෙක් හෝ එම ආයෝජනය දුබල බවට නිරීක්ෂණය කරනතෙක් ගෙවූ හිමිකරු ප්‍රාග්ධනයේ වෙනම සංරචකයක් (ශේෂපත්‍රයේ වෙනත් සංචිත ලෙස දක්වා ඇති) හඳුන්වනු ලබන අතර එවැනි අවස්ථාවක් උද්ගත වීමේ දී හිමිකරු ප්‍රාග්ධනය ලෙස මූලිකව වාර්තා කල වාසිය හෝ අවාසිය ආදායමට එකතු කරනු ලැබේ.

#### රන් (Gold)

ජාත්‍යන්තර සංචිතයේ සංයුතිය මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, රන් (Gold) මෙම සංචිතයේ කොටසක් ලෙස දැරිය හැක. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස දරා සිටින රන්වල අගය 2008 දෙසැම්බර් 31 දිනට රු.10,427,431 කි.

මෙම රන් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් නිසාවන බැවින් ද සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී අලෙවි වන වෙළෙඳ භාණ්ඩයක් ලෙස භාවිතා නොවන බැවින් ද මෙම රන් (Gold) සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලබයි. රන්වලින් උපලබ්දි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරයි.

#### මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි

මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි පිළිබඳව බැංකුවේ සම්බන්ධතාවය ප්‍රධාන වශයෙන් ඉදිරි විදේශ විනිමය කොන්ත්‍රාත් වලට අදාළ වේ. එවැනි ව්‍යුත්පන්න මූල්‍ය ලියවිලි සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. ඉදිරි විනිමය කොන්ත්‍රාත්වල සාධාරණ වටිනාකම ගණනය කරනු ලබන්නේ, ඒවා සමාන පරිණත නියමයන් සහිත කොන්ත්‍රාත් වලට අදාළව පවත්නා ඉදිරි විනිමය අනුපාතයන්ට යොමු කරමින්ය. ලාභ හෝ පාඩු තත්ත්වයේ පවතින මිල ගිවිස ගත් ලියවිලි තිබේනම්, ශේෂ පත්‍රයෙහි විදේශීය මුදල් වෙළඳාම හෝ විකිණීමට තිබෙන සුරැකුම්පත් ශේෂය යටතේ වාර්තා කරනු ලැබේ.

#### ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මු.අ. සමග සිදු කෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුළත් කර ඇත.

ජා.මු.අ. සමග වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර එම පංගුව සඳහා ජා.මු.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මු.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත වි.ගැ.හි. ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මු.අ. විසින් ශේෂ පත්‍ර දිනට ප්‍රකාශයට පත් කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මු.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගතවන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙන් හඳුනා ගනු ලැබේ.

ජා.මු.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොලිය වහාම ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**මුදල් හා මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු මුදල් හා මුදල් සමානයන්ට අයත් වේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී.ලං.ම.බැ. ඇතැම් ආදායම් ඉපයීමද ඇතැම් වියදම් දැරීමද සිදුකරන නමුත් එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමඟ සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමඟ වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් තුල නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල දායක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, ඉවත්කිරීම හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් ශ්‍රී ලං.ම.බැ. වාර්තාවල සටහන් කරනු ලැබේ.

මූල්‍ය නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී.ලං.ම.බැ. විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන් ඉදිරිපත් කරන මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රීලංකාමහබැංකුවවිසින්මුදල් /ගෙවීම්නියෝගක්‍රියාවලියමඟින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී.ලං.ම.බැ. මත නිකුත් කරන චෙක්පත් මඟින් ලබාගන්නා භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් මත විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමඟ වන ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයන්ට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි අරමුණු සඳහා වන මුදල් හා මුදල් සමානයන්ට මුදල් සහ මුදල් විධානයන්ගේ ශුද්ධ ගලා යෑම් හැරුණුවිට ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් අඩංගු වේ.

**ප්‍රති මිලදී ගැනීම් සහ ප්‍රති විකුණුම් ගනුදෙනු**

ප්‍රතිමිලදීගැනීමසඳහාගිවිසුම්යටතේවිකුණනුලබනසුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රති මිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හෙළිදරව් කරනු ලැබේ. ප්‍රති මිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම්වල සහ ප්‍රති මිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

ප්‍රති විකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම් සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කමක් ලෙස ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රති මිලදී ගැනීමේ සහ ප්‍රති විකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වූයේ නම්, එයද ප්‍රති මිලදී ගැනීමේ සහ ප්‍රති විකුණුම් ගනුදෙනු වටිනාකම සමඟ වාර්තා කරනු ලැබේ.

**ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්**

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරයි. මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

**ආයෝජන කළඹ - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

බැංකුවේ ආයෝජන කළඹ ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවලින් සමන්විත වේ. ඒවායින් බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට සපයන ලද ණය නියෝජනය කෙරන බැවින්, එම කළඹ ක්‍රමක්ෂය පිරිවැයට ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ.

**රජයට දෙන ලද අත්තිකාරම්**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද තාවකාලික අත්තිකාරම්වලින් රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ.

**අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය, අයකරගත නොහැකි ප්‍රමාණයක් සඳහා වූ මුදල අඩුකර, ආරම්භයේ දී ප්‍රදානය කළ මුදල අනුව හඳුනාගෙන දක්වා ඇත. අයකර ගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාල වීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල සහ ඇස්තමේන්තු හා අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනා ගත් අවස්ථාවේදී කපා හරිනු ලැබේ.

**සුරැකුම්පත් ණයට දීම**

ණය දීමේ ගනුදෙනු යටතේ සුරැකුම්පත් ප්‍රතිපාර්ශවයන් වෙත පැවරීමේ දී ඒවායේ අයිතිය හා සම්බන්ධ අවදානම සහ වාසියද පවරන්නේ නම් පමණක් ඒවා ශේෂපත්‍රයෙහි දක්වනු ලැබේ.

**මූල්‍ය වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇතිදැයි බැංකුව විසින් ශේෂ පත්‍ර දිනයන් හිදී තක්සේරු කරනු ලැබේ.

**ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්මේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොලී අනුපාතයෙන්, වට්ටම් කළ අගයන් අතර වෙනසය. වත්කමක ධාරණ අගය

සෘජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩු කරනු ලැබේ. පාඩු වූ ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් හා තනිව හා සාමුහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකර වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ශනය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ශනය කල මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යයි තීරණය කළ හොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමුහිකව විමර්ශනය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරුකල වත්කමකට අදාළව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේනම්, ඒවා සාමුහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ. පසු කලකදී හානිකරණ අලාභය අඩුවන්නේ නම්, එසේ අඩුවීමට හානිකරණය හඳුනාගැනීමට පසු කාලයට අදාල සිද්ධියකට අදාළ කිරීමට නිශ්චිත සාක්ෂි හානිකරණ අලාභයේ නැවත ගලපනු ලැබේ. හානිකරණ අලාභයක් පසු කලකදී නැවත ගැලපීම් කරන්නේ නම්, එදිනට එම වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා පමණි.

**විකිණීමට ඇති ආයෝජන**

විකිණීමට අයත් වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය හා එහි වර්තමාන සාධාරණ අගය) මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර, හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ග කර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනා ගන්නේ නැත. ණය ලියවිලි හානිකරණ අලාභ, ලියවිල්ලෙන් සාධාරණ අගයෙහි වැඩිවීම හානිකරණ පාඩුව හඳුනාගැනීමට පසුව වූ සිද්ධියකට අදාළ වන බවට නිශ්චිත සාක්ෂි තිබේනම් පමණක් එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

**විදේශීය මුදල් කාලින බැරකම්**

විදේශීය මුදල් කාලින බැරකම්, බැරකම්වල, ක්‍රමක්ෂය පිරිවැයට පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම කාලින බැරකම්වල වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලින බැරකම්වල වෙනස්වීම් වලින් උද්ගතවන වාසි හා අවාසි වහාම ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. බැරකමේ අයිතිය තවදුරටත් පවතී නම් වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය හෝ අවාසිය උපලබ්ධි වූ (බැරකම ආපසු ගෙවීම මගින්) අවස්ථාවන්හිදී, එය මිල වෙනස්වීම් වලින් උපලබ්ධි වූ වාසිය / (අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

**මූල්‍ය ඇපකර**

මූල්‍ය වර්තා වලදී මූල්‍ය ඇපකර මූලික වශයෙන් සාධාරණ අගය මත අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ හඳුනාගනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව එක් එක් ඇපකරය යටතේ බැංකුවේ වගකීම ගණනය කිරීම, ඇපකරය හේතුවෙන් උද්ගතවන මූල්‍ය බැඳීම් බේරුම් කිරීම සඳහා වන හොඳම ඇස්තමේන්තුව ප්‍රකාර සිදු කරනු ලැබේ.

**වෙනත් මූල්‍ය වත්කම් සහ බැරකම්**

මුදල්, තැන්පතු සහ කෙටිකාලින අත්තිකාරම් වශයෙන් වූ දේශීය සහ විදේශීය මුදල් වෙළඳ දිනයේ දී හඳුනාගනු ලැබේ.

## 1.4.3 අනිකුත් වත්කම් සහ බැරකම්

**ආශ්‍රිත සමාගම්වල ආයෝජන**

ආශ්‍රිත සමාගම් වල බැංකුවේ ආයෝජන, පසුව අපහරණය සඳහා රඳවාගෙන ඇති ඒවා ද පිරිවැය ක්‍රමයට ගිණුම් ගත කරනු ලැබේ.

**තොග**

තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනමට පිරිවැය නිශ්චය කරනු ලැබේ. සෙමින් වැයවන තොග සඳහා වෙන්කිරීමක් සලසා ඇත.

**දේපල, පිරියත සහ උපකරණ**

දේපල, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර, සමුච්චිත ක්ෂය වීම සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකල පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපල, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය, එය දරන අවස්ථාවේදී හඳුනාගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම්වල එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත. ගොඩනැගිලි සඳහා වූ ක්ෂය සහ ප්‍රත්‍යාගණන දිනයන් පසුව අඩුකළ හානිකරණ පාඩු අඩුකර ඉඩම් සහ ගොඩනැගිලි ගණනය කර ඇත.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීව කාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීව කාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි | |
| ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි | කල්බදු කාලපරිච්ඡේදය තුළ |
| ගොඩනැගිලි | |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලීබඩු සහ උපකරණ | වර්ෂ 10ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| පරිගණක දෘඩාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරවා ගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක යන්ත්‍ර හා උපකරණ වල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය. පළමුව පිරිවැය මත හඳුනාගැනීමෙන් අනතුරුව, ඉඩම් සහ ගොඩනැගිලි

ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට පවත්වාගෙන යනු ලබන අතර එය වූ කලී පසුකාලීන සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ සාධාරණ අගය වේ.

ප්‍රත්‍යාගණනය කල වත්කම්වල සාධාරණ අගය, ඒවායේ ධාරණ අගයෙන් විශාල ලෙස වෙනස්වීම මගහරවා ගැනීමට නිරතුරුව අගය කිරීම් කරනු ලැබේ.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, ශේෂපත්‍රයේ ස්කන්ධයන් යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි වියදමක් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්ත්‍ය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයේ දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම් එම ප්‍රත්‍යාගණන අඩුවීම ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් අපහරණයේ දී කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපල පිරියත සහ උපකරණ ලෙස හඳුනාගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගතවන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලැබෙන ශුද්ධ මුදල සහ සාධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීව කාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

**අස්පෘෂ්‍ය වත්කම්**

පරිගණක දෘඩාංගවලට සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම් වර්ෂ 4 ක ජීවකාලයක් පදනම් කළ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ ධාරණ අගයකට පවත්වාගෙන යනු ලැබේ.

**ලැබිය යුතු ගිණුම්**

ලැබිය යුතු ගිණුම්, නිශ්චිත සාක්ෂි මත අඩමාන ණය සඳහා වෙන් කිරීම පිළිබඳ පසුව, අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මත හඳුන්වනු ලැබේ.

**විවිධ වත්කම්**

**සේවක ණය**

ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන් සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් සඳහා හිමිකම් කියනු ලැබේ. මෙම ණය ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිත අංක.39 ට අනුව වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් සාධාරණ අගයට ගණනය කරන අතර විලම්බිත වත්කමක් ලෙස හා සාධාරණ අගයට ගැලපීම වාර්තා කරයි.

**වට්ටම් අනුපාතය**

ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ගෙන ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන ලදී. වාණිජ්‍යය පොලී නිර්දේශිත අනුපාතය (CIRR) බැංකුවේ විගණන කමිටුව මගින් එකඟ වූ පරිදි වාණිජ්‍ය පොලී නිර්දේශිත අනුපාතය සඳහා සියයට එකක අවධානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය ලෙස භාවිතා කළ අතර එය ණයවල කාලපරිච්ඡේදය සමග වෙනස් වේ. (වසර 15 ක් දක්වා 10.93% ක් ද වසර 15 සිට 30 දක්වා 9.78%)

සාධාරණ අයකරණයේ පිරිවැය වන්නේ ශේෂපත්‍ර දිනට ණයවල පොත් අගය සහ ඉහත පරිදි ගණනය කළ වර්තමාන අගය අතර වෙනසයි. ශේෂ පත්‍රයේ විලම්භිත වත්කම් (හර) සහ සාධාරණ අගය ගැලපීම (බැර) සමග සේවක ණය පොත් අගය ගලපනු ලැබේ.

මෙම ණය සහණදායී පොලී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරන ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භක දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය වෙළෙඳපොළ අනුපාතයන්ට දෙනු ලැබුවේ නම් බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක් අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගයකරණය ගණනය සඳහා යොදා ගනු ලැබූ උපකල්පයන්**

- 2008 වර්ෂය තුළ දී ලබාදුන් සේවක ණය සලකා බලන ලදී.
- සේවක ණය ලබාදුන් දිනය ලෙස 2008 ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ පියවීමක් සිදු වී නොමැත.

අනෙකුත් විවිධ වත්කම් අපේක්ෂිත උපලබ්ධි අගයට ගෙන යන ලදී.

**මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ සිද්ධින් හෝ වෙනත් තත්ත්වයන් හේතුවෙන් ධාරණ අගය හානි විය හැකි බව පෙන්නුම් කරන්නේ නම්, බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සලකුණක් පවතීනම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගතහැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම්, වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ.

**ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික සම්මුතියකින්) ඇති විටකදී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූරණය කිරීම බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූරණය නිසැකවම තහවුරු වන්නාවූ අවස්ථාවලදී එය, වෙනම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කරනු ලබන මුදල්, ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයක් පවතින මුදල් සඳහා වූ බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ.

**නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

බැංකු විසින් විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම පවත්වාගෙන යනු ලබයි. ඉන්, වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම තුනට බැංකුව සහ සුදුසුකම්ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකිය බැර ආයුගණක ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ. ආයුගණක අගය කිරීම් වර්ෂ තුනකට වරක් මඟින් සිදුකරනු ලැබේ.

විශ්‍රාම සේවා වියදම්, ප්‍රතිලාභ හා අත්පත් කර ගන්නා තෙක් දක්වා සාමාන්‍ය කාල සීමාව තුළ සරළ මාර්ග ක්‍රමය ප්‍රකාර වියදම් ලෙස හඳුනා ගනු ලැබේ. ප්‍රතිලාභ, හඳුන්වා අන් අවස්ථාවේම එය අත්පත් කර ගෙන තිබේනම් හෝ වෙනස් වී ඇත්නම් හෝ විශ්‍රාම සේවා වියදම එසැනින්ම හඳුනා ගනු ලැබේ.

අනුභූති ගැලපීම් සහ ආයුගණන උපකල්පනයන් වෙනස්වීම් මත උද්ගතවන ආයුගණක ලාභ සහ පාඩු, නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ සහ සැලසුමේ වත්කම්වල සාධාරණ අගය හෝ වැඩි සංඛ්‍යාව සියයට 10 ඉක්මවන අවස්ථාවලදී ආයුගණක ආදායම් හෝ වියදම් ලෙස හඳුන්වනු ලැබේ. එකී ලාභ හෝ අලාභ, මෙම යෝජනා ක්‍රම සඳහා සහභාගිවන සේවකයන්ගේ අපේක්ෂිත ඉදිරි වැඩ කරන කාලය මත, ආයුගණක ලාභ හා අලාභ ක්ෂණිකව හඳුනාගැනීමට පහසුවන ලෙස විධිමත් ක්‍රමයක් ප්‍රකාර සටහන් කරනු ලැබේ.

**නිශ්චිත දායක යෝජනාක්‍රම**

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවා අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකම් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවානියුක්තියන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදල් නිශ්චිත දායක සැලසුම් ලෙස වෙනමම පරිපාලනය කරනු ලැබේ.

**ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයක් වියදම් විෂයකට අදාළ වන අවස්ථාවකදී වියදමට සරිලන කාලපරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදයම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමකට අදාළවන අවස්ථාවකදී එහි සාධාරණ අගය රජයේ විලම්බිත ප්‍රදාන ගිණුමකට බැර කර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය තුල ආදායම් ප්‍රකාශනයකට මුදා හරිනු ලැබේ.

**සේවක මණ්ඩල විදයම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම් අනිකුත් දේශීය ගෙවිය යුතු ගිණුම් යටතේ දක්වනු ලැබේ.

**ක්‍රියාත්මක කල් බදු**

බැංකුව කල් බදු ගැණුම්කරු වන අවස්ථාවන්හිදි කල්බදු ගත් වත්කම් වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම් කරගෙන, ක්‍රියාත්මක කල්බදු සඳහා ගෙවිය යුතු කුලිය එය බලපවත්නා කාලපරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**ආදායම් බදු**

1949 අංක 58 දරණ මුල්‍ය නීති පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ආදායම ආදායම් බද්දෙන් නිදහස් වේ.

**ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිඵල ගලා ඒමේ හැකියාව සහ ආදායම නිසැකවම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම් ගත කරනු ලැබේ. දරණ ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් සහ වියදම් හැඳින්වීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීමේ උපමානයන්ද සපුරාලිය යුතුය.

**පොලිය**

පොලිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම් මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව සඵල ඵලදායිත්ව ක්‍රමයට උපචිත පදනම මත පොලි ආදායම සහ වියදම ආදායම ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම්, ආයෝජන සහ සුරැකුම්පත් මත උපයන කූපන් සහ භාණ්ඩාගාර බිල්පත් සහ අනිකුත් වට්ටම් ලියවිලි මත උපචිත වට්ටම් සහ අධිමිල පොලී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවලදි පොලි ආදායම අත්හිටුවන අතර ඒවා ලැබෙනතුරු පොලී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස් හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනා ගනු ලැබේ.

**විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ අපහරණයේ දී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම් අපහරණයෙන් ලද වියදම අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම් ගත කර ඇත.

ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකාරම්වලට ආනුශාංගික්‍රියාකාරකම් වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතු කොට ශුද්ධ පදනම මත වර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**ශේෂ පත්‍රයෙන් බාහිර විෂයයන් ඇතුළු අසම්භාව්‍යයන් සහ බැඳීම්**

ශේෂ පත්‍රයේ බාහිර විෂයයන් නියෝජනය කෙරෙන ණයගැතිකම් සහතික වීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල ශේෂ පත්‍රයෙන් බාහිර විෂයයන් ලෙස හඳුනාගෙන, අදාළ ශීර්ෂ යටතේ දක්වා ඇත.

## 1.5 ක්‍රියාකාරම්වල ස්වභාවය සහ විෂය පථය

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් හා කාර්යයන් පැවරෙන අතර, බැංකුවේ කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතුවන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- මුදල් නිකුත් කිරීම
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරග කාර්යයන් සහ ස්ථායිතාවය සැලසීම
- නිශ්චිත මූල්‍ය ආයතන වලට අවසර දීම සහ අධීක්ෂණය
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීම
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකු වලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියාකිරීම

ශ්‍රී ලංකාවේ ඵලදායි සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සපුරාගැනීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ විදේශීය මුදල් ක්‍රියාකාරකම් පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශයනට අදාළව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

**විදේශීය මුදල් ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම් වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ,විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වලින් පවත්වනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් එක්සත් ජනපද ඩොලර්, යූරෝ, රන්පවුම්, සහ ජපන් යෙන් වලින් හඳුන්වා ඇත. මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් සෛවරී සුරැකුම්පත් ප්‍රතිවර්තිත ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනු යටතේ දරනු ලබන සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළඳපොලේ මෙහෙයුම් වලින් උද්ගත වන්නාවූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

**දේශීය මුදල් ක්‍රියාකාරකම්**

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(අ) ද්‍රවශීලතා කළමනාකරන මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළඳපලට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික විවෘත වෙළඳපල මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ආ) සංසරණයෙහි පවතින මුදල් නියෝජනය කෙරෙන බැරකම් ආධාරකව ශ්‍රී ලංකා රජයේ සුරැකුම් පත්වලින් සමන්විත ආයෝජන කළඹක් පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

**භාර සහ භාරකාර ක්‍රියාකාරකම්**

භාරකාර සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්ගේ අන්තර්ගත කොටසක් නොවන බැවින් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර නොමැත.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වීම**

මුදල් නීති පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති විසින් කරගනෙ යන ව්‍යවස්ථාපිත විගණනයට අමතරව, අර්න්ස් සහ යංග්, වරලත් ගණකාධිකාරීන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිතයන්ට (ජා.මූ.වා.ප්‍ර) අනුකූලව පරීක්ෂාකිරීම සඳහා විශේෂ අරමුණු විගණනයක් පවත්වා ඇත. මෙම විගණන වාර්තාවේ පිටපත් මුදල් මණ්ඩලයට සහා විගණකාධිපති වෙත යොමුකොට ඇත.

අනෙකුත් රටවල මහ බැංකු මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේ අරමුණින් මහ බැංකුවේ ගිණුම් ශෛලීය පරිචයක් සමග අනුකූල වීමට හා රජය වෙනුවෙන් ජාත්‍යන්තර ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපලවල ක්‍රියාකිරීමට ගනුදෙනු වල නිරතවීමට පහසුකම් සැලසීමේ අරමුණින් 2002 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ජා. මූ. වා. ප්‍ර. අනුකූලව පිළියෙල කිරීම ස්වේච්ඡාවෙන් මුදල් මණ්ඩලයේ අභිමතය පරිදි කරන ලදි. අර්න්ස් සහ යංග් වාර්තාව වෙනමම ප්‍රකාශනය කරනු ලැබේ.

## 02. බැංකු අධීක්ෂණ

ශ්‍රී ලංකාවේ සියලුම බැංකු ආයතනයන් අඛණ්ඩ අධීක්ෂණයකට ලක්කිරීම සඳහාත්, නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ පරීක්ෂා කිරීම සඳහාත්, මුදල් නීති පනතේ 28 (1) ඡේදය යටතේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් බලපත්‍රලාභී බැංකු සම්බන්ධයෙන් නියාමන සහ අධීක්ෂණ කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලැබේ. මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ආරක්ෂා කිරීම සඳහා මෙන්ම ආරක්ෂාකාරි සහ ශක්තිමත් බැංකු පද්ධතියක පැවැත්ම සහතික කිරීම සඳහා සියලු අවදානම් අවම කිරීමේ අරමුණින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. 2008 වර්ෂය අවසානය වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු 22 ක්ද, බලපත්‍රලාභී විශේෂිත බැංකු 14ක්ද ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනය හා අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකව පවතී. එම බැංකු වල නම්, ආකාරදී පිළිවෙලට ඇමුණුම II-1 හි ඇතුළත් කර ඇත.

එක්සත් ජනපදයේ උපප්‍රමුඛ මූල්‍ය අර්බුදය ගෝලීය මූල්‍ය අර්බුදයක් බවට පත්වීමත් සමඟ බැංකු පද්ධතියේ ස්ථායීතාවය පවත්වාගෙන යාමේ නව අභියෝගයට මුහුණ දීමට 2008 වර්ෂයේදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට සිදුවිය. ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළෙහි ඇතිවූ බාධාවන් හේතුවෙන්, අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, බැංකු කළමනාකාරිත්වයේ වගකීම, ආයතනික යහපාලනය සහ අනුකූලතාවය වැනි කරුණු වල ඇති වැදගත්කම අවධාරණය විය. මෙම කටයුතු සැලකිල්ලට ගනිමින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බාසල් II ප්‍රඥාප්තියට අනුව ශක්තිමත් අවදානම් කළමනාකරණ පද්ධතියක් වර්ධනය කිරිම, ජාත්‍යන්තර ගණකාධිකරණ සම්මුතීන් ඇති කිරීම සඳහා සූදානම් වීම, ඒකාබද්ධිත ණය කළමනාකරණ පද්ධතියක් බැංකු තුළ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් මාලාවක් සකස් කිරීම සහ බැංකුවල ණය අවදානම කළමනාකරණය කිරීම සඳහා දැනට පවත්නා උපදෙස් මාලාව තවත් ශක්තිමත් කිරීම වැනි කටයුතු කෙරෙහි යොමුවිය. තවදුරටත් බැංකුවල ආයතනික යහපාලනය සඳහා නිකුත් කරන ලද උපදෙස් මාලාවන් සුමටව ක්‍රියාත්මක කිරීම සහතික වීම සඳහා අවශ්‍ය වන සංක්‍රාමික ප්‍රතිපාදනයන් හඳුන්වාදීම සහ බැංකු අධ්‍යක්ෂකවරුන්ගේ වගකීම් සහ නෛතික කාර්යයන්හි වැදගත්කම ඇඩිව පෙන්වා දීම සඳහා බැංකු අධ්‍යක්ෂකවරුන් සඳහා සාකච්ඡා සැසියක් මෙම වර්ෂය තුළ පවත්වන ලදි. එසේම මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය පවත්වාගැනීම සඳහා යම් යම් අසීරුතාවයන්ට පත්ව තිබූ බැංකුවල ස්ථායිතාවය වෙනුවෙන් අවශ්‍ය ක්ෂණික පියවරයන්ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබිය.

ඒ අනුව 2008 වර්ෂය තුළදී ගන්නා ලද ක්‍රියාමාර්ගයන් පහත දැක්වේ.

### 2.1. විචක්ෂණ රෙගුලාසි සහ ඒ හා සම්බන්ධ කටයුතු

2008 වර්ෂය තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද නව විචක්ෂණ රෙගුලාසි සහ උපදෙස් සහ දැනට පවත්නා විචක්ෂණ අවශ්‍යතාවයන් සඳහා කරන ලද සංශෝධනයන් පහතින් දැක්වේ. මෙම රෙගුලාසි සහ උපදෙස් පිළිබඳ තොරතුරු මෙම වාර්තාවෙහි තුන්වැනි කොටසෙහි ඇතුළත් වේ.

#### (අ) ප්‍රමාණකරණ ප්‍රවේශය තුළින් බාසල් II ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම:

2008 වර්ෂයේ ආරම්භයේ සිය ණය අවදානම සඳහා ප්‍රමාණීකරණ ප්‍රවේශයද වෙළෙඳපොළ අවදානම සඳහා ප්‍රමාණීකරණ ඇගැයීම් රීතියද, මෙහෙයුම් අවදානම සඳහා මූලික දර්ශක ප්‍රවේශයද බැංකු විසින් අදාළ කරගත යුතුවේ. මෙහෙයුම් උපදෙස් වලට අනුකූලව සියලුම බැංකු විසින් නිවැරදි ආදර්ශයන්ට එකඟව වාර්තා ඉදිරිපත් කරනු ලබන බවට සහතික කරගැනීම සඳහා සියලු වාර්තාවන් නැවත සමාලෝචනය කරනු ලබන අතර, මෙම ප්‍රඥාප්තිය මත පදනම්ව බැංකු විසින් වාර්තා එවනු ලබන්නේදැයි පරීක්ෂා කරනු ලැබේ.

#### (ආ) ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් සංශෝධන නිකුත් කිරීම:

සමහර බැංකු විසින් ආයතනික යහපාලනය පිළිබඳ උපදෙස් අධිකරණයේ දී අභියෝගයට ලක්කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් වල මූලධර්මයන් පිළිගන්නා ලදී. වයස, සේවාකාලය සහ බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂකවරුන් විසින් දැරිය හැකි අධ්‍යක්ෂක ධූර සංඛ්‍යාව පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියමකරන ලද නියෝගයට අනුව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංක්‍රාමික ප්‍රතිපාදනයන් සහිත සංශෝධනයන් නිකුත් කරන ලදී.

#### (ඇ) ණය සහ අත්තිකාරම් වර්ගීකරණය, ආදයම් හඳුනාගැනීම සහ ප්‍රතිපාදනයන්:

ණය අවදානම් කළමනාකරණය වැඩිදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණෙන් දැනට පවත්නා උපදෙස් සඳහා නව ප්‍රතිපාදනයන් එක් කරමින් ඒකාබද්ධ උපදෙස් මාලාවක් නිකුත් කරන ලදී. ඒ අනුව ණය හා අත්තිකාරම් සම්පූර්ණයෙන්ම අයකරගැනීමේ අවදානම සහ ණයවාරික හිඟව ඇති කාලපරිච්ඡේදය පදනම් කරගනිමින් බැංකු විසින් ණය වර්ගීකරණය කළයුතු අතර ශේෂ පත්‍ර සහ ශේෂ පත්‍රයෙන් බාහිර සියලු අයිතමයන් සඳහා මෙම ක්‍රියාමාර්ගය අනුගමනය කළයුතු වේ. ණය කාඩ්පත් සඳහාද විශේෂිත වර්ගීකරණ ප්‍රමාණයක් හා වෙන්කිරීමේ අවශ්‍යතාවයන් හඳුන්වාදී ඇත. තවදුරටත්, ණය පහසුකම් මත නොව ණය ගැතියන් පදනම් කරගන්නා වර්ගීකරණ ප්‍රතිපත්තියක් 2010 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වනු ඇත.

**(ඈ) බැංකු ශාඛා පිහිටුවීම:**

බස්නාහිර පළාතේ පිහිටුවන සෑම නව ශාඛාවක් සඳහාම බස්නාහිර පළාතෙන් පිටත අවම වශයෙන් ශාඛා දෙකක් පිහිටුවන ලෙසට බැංකුවලට නියම කරමින් නව ප්‍රතිපත්තිමය උපදෙස් මාලාවක් නිකුත් කරන ලදී. මෙමගින් බස්නාහිර පළාතෙන් බැහැර ප්‍රදේශවල ආර්ථික වර්ධනය වැඩිදියුණු කිරීම සහ රටෙහි තුලනාත්මක ප්‍රාදේශීය සංවර්ධනයක් ඉටුකරගැනීම සඳහා දායක වීම, මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා අවස්ථාවන් වැඩි දියුණු කිරීම, මූල්‍ය අන්තර්ග්‍රහණය සහ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රචලිත කිරීම තුළින් එම ප්‍රදේශ වල ආර්ථික කටයුතු වැඩි දියුණු වීම සිදුවේ.

**(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 44 සහ 45 යොද ගැනීම:**

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති (IAS) අංක 32 හා 39 සමඟ අනුරූප වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ අනුකූල වීම සඳහා පෙර දැක්මක් බැංකු අංශයට නිකුත් කරන ලදී. මෙම ප්‍රමිතීන් හා අනුගතවීම පහසුකිරීම පිණිස බැංකුකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණෙන් පුහුණු වැඩසටහන් කිහිපයක්ද මෙහෙයවන ලදී.

**(ඊ) බැංකු කටයුතු හා සම්බන්ධ සේවා බාහිර ආයතන මගින් සපයාගැනීම පිළිබඳ උපදෙස් :**

තාක්ෂණික නව්‍යකරණය, විශේෂිකරණයෙහි වර්ධනය, පිරිවැය පාලනය සහ වෙළෙඳපොළ තරඟකාරිත්වය යන අභියෝග යන්ට මුහුණු දීම සඳහා බොහෝ බැංකු විසින් සිය ප්‍රධාන නොවන කාර්යයන් ඉටුකර ගැනීම පිණිස බාහිර ආයතන මගින් සේවා සපයා ගැනීම ආරම්භ කර ඇත. නියාමන අවශ්‍යතා ප්‍රමිතිගත කිරීමත් බාහිර ආයතන මගින් සේවා ලබාගැනීම සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය අනුකූලනය කිරීම උදෙසාත් ඒ සඳහා උපදෙස් මාලාවක් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. එය පිළිබඳව බැංකු ක්ෂේත්‍රයේ අදහස් අපේක්ෂා කෙරේ.

**උ) බැංකු වල ඒකාබද්ධිත අවදනම් කළමනාකරණ පද්ධතින් ක්‍රියාත්මක කිරීම:**

බැංකුවක ඒකාබද්ධිත අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි සමස්ත සැකස්ම සපයන කෙටුම්පත් උපදෙස් මාලාව බැංකු ක්ෂේත්‍රයේ අදහස් ලබාගැනීම සඳහා නිකුත් කරන ලදී.

**ඌ) ණයවර ලිපි සහ ඉතිරි විදේශ විනිමය විකුණුම් ගනුදෙනු සඳහා ආන්තික තැන්පතු අවශ්‍යතාවය:**

ප්‍රතිග්‍රහණය මත ආනයන ලියවිලි නිදහස් කිරීමේ පදනමින් බැංකු පද්ධතියෙන් පරිබාහිරව විදේශ විනිමය ගෙවීම් සීමාකිරීමේ අරමුණෙන් තෝරාගත් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සඳහා සියයට 100 ක ආන්තික තැන්පතු අවශ්‍යතාවයක් නියම කරන ලදී. ලාභාපේක්ෂාවෙන් සිදුකරනු ලබන අහිතකර වූ විදේශ විනිමය ගනුදෙනු සහ විදේශ විනිමය වෙළෙඳපොළේ අධික උච්ඡාවචනයන් වැළැක්වීමේ අරමුණෙන් ඉදිරි විදේශ විනිමය විකුණුම් ගනුදෙනු ගිවිසුම් වලට එළැඹෙන අවස්ථාවේදී, ගිවිසුම් වටිනාකමෙන් සියයට 100 කට නොඅඩු තැන්පතුවක් ලබාගන්නා ලෙසට බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා නියම කරන ලදී.

## 2.2 බැංකු, බැංකු ශාඛා හා අනෙකුත් බැංකු ඒකක සඳහා අනුමැතිය ලබාදීම.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකු පනතට අනුව බැංකු බලපත්‍ර, බැංකු ශාඛා හා අනෙකුත් බැංකු ඒකකයන් විවෘත කිරීම, වසාදැමීම හා බැංකු ප්‍රතිස්ථානගත කිරීම් සඳහා වූ ඉල්ලීම් සඳහා අනුමැතිය දීමට තවදුරටත් කටයුතු කරන ලදී. 2008 වර්ෂය ආරම්භයේදී, සී/ස එස්.එම්.ඊ. බැංකුව සහ සී/ස ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව ඒකාබද්ධ වූ අතර සී/ස ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවට, සී/ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් (පාකිස්තාන්) බැංකුවෙහි ශ්‍රී ලංකා ශාඛාවේ ව්‍යාපාර කටයුතු අත්පත් කරගැනීමට අනුමැතිය දෙන ලදී. එමෙන්ම ලංකා බැංකුව සඳහා එහි ලන්ඩන් ශාඛාව පාලිත සමාග මක් බවට පත් කිරීමට අනුමැතිය ලබාදුන් අතර සී/ස අමානා බැංකුව පිහිටුවීම සඳහා තාවකාලික අනුමැතිය ලබාදුනි. ශ්‍රී ලංකාව තුළ නව බැංකු ආරම්භ කිරීම සඳහා දේශීය හා විදේශීය පුද්ගලයින් / මූල්‍ය ආයතන පෙන්නුම් කළ ඇඩි උනන්දුව හේතුවෙන් බැංකු පනතට අනුකූලව නව බැංකු ආරම්භ කිරීම සඳහා මාර්ගෝපදේශ ප්‍රසිද්ධ කරන ලදී.

මෙම වර්ෂය තුළදී නව බැංකු ශාඛා 47 කට, බැංකු ඒකක (ව්‍යාප්ති කාර්යාල, ජංගම බැංකු ඒකක හා ශිෂ්‍ය ඉතුරුම් ඒකක) 486 කට, ශාඛා ප්‍රතිස්ථානගත කිරීම් 49 කට, ව්‍යාප්ති කාර්යාල ප්‍රතිස්ථානගත කිරීම් 15 කට, ව්‍යාප්ති කාර්යාල ශාඛා ලෙස වැඩිදියුණු කිරීම් 15 කට, ශාඛා වලින් පිටත පිහිටුවන්නාවූ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 24 කට, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 02 ක් වසා දැමීමට සහ ව්‍යාප්ති කාර්යාලයක් වසා දැමීමට අනුමැතිය ලබා දී තිබේ. බැංකු මගින් පාරිභෝගිකයා පාදක කරගත් සේවාවන් සැපයීම අරමුණු කොටගත් ජංගම මුදල් භාවිතා කර ගෙවීම් කිරීම, නිවාසාභිමුඛ (doorstep banking) බැංකු සේවා සහ මුදල් කළමනාකරණ සේවාවන් වැනි නව්‍ය බැංකු සංකල්පය තුළින් බිහිවූ නව නිෂ්පාදිත සඳහා ද අනුමැතිය ලබාදුනි.

## 2.3 බලපත්‍රලාභී බැංකු අඛණ්ඩව අධීක්ෂණය කිරීම

අඛණ්ඩ අධීක්ෂණය යනු අන්තර්ජාල පාදක වාර්තා ක්‍රමය මගින් බැංකු විසින් කාලීනව ඉදිරිපත් කරන ලද තොරතුරු නිරන්තර නිරීක්ෂණය කිරීමෙන් වැඩිදුර විමර්ශනය හා පරීක්ෂාව අවශ්‍ය වන බැංකු වල මූල්‍ය තත්ත්වයන්හි සැලකිය යුතු විචලනයන් හඳුනාගන්නා පූර්ව අවදානම් ඇගැවීමේ ක්‍රියාවලියකි. බැංකුවල කාර්ය සාධනය ඇගයීම සඳහා බැංකු පිළිබඳ කාලීන තත්ව වාර්තාවන් සකස් කරන ලදී. මීට අමතරව, රථවාහන ආනයනය සඳහා බැංකු විසින් නිකුත් කළ ණයවර ලිපි, චෙක්පත් ආපසු එවීමේ සංකේත සාවද්‍ය ලෙස භාවිතා කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් අයකරනු ලබන ගාස්තු සහ කොමිස් වැනි විශේෂිත ගැටළු පිළිබඳ වාර්තාවන් සම්පාදනය කරන ලදී.

### 2.4 බලපත්‍රලාභී බැංකු වල ව්‍යවස්ථාපිත පරීක්ෂණ

මුදල් නීති පනත සහ බැංකු පනත අනුව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල කාලීන ව්‍යවස්ථාපිත පරීක්ෂණ මෙහෙයවිය යුතු වේ. බැංකුවල ණය, වෙළෙඳපොළ හා මෙහෙයුම් අවදානම් සම්බන්ධ වූ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටීන් හා පරිචයන් ශක්තිමත් කිරීමේ අරමුණින් පරීක්ෂණ කටයුතු සඳහා අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක් තවදුරටත් යොදා ගැනිණ. 2008 තුළදී, බලපත්‍රලාභී බැංකු මගින් ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය, ආයතනික යහපාලන ක්‍රියාවලීන් හා යහපත් අභ්‍යන්තර පාලන ක්‍රමයන් යොදාගැනීම ශක්තිමත් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරිනි. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2008 වර්ෂය තුළදී ව්‍යවස්ථාපිත පරීක්ෂණ 33 ක් මෙහෙයවන ලද අතර මෙයින් පරීක්ෂණ 22 ක් 2008 වර්ෂය තුළ ආරම්භ කළ ඒවා වන අතර 2007 වර්ෂය තුළ ආරම්භ කර මෙම වර්ෂය තුළ නිමාකළ පරීක්ෂණ 11 ක් ද වෙයි. ඒ අනුව, 2008 තුළදී බැංකු කළමනාකාරිත්වය සමඟ විධිමත් සාකච්ඡා පැවැත්වීම සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කිරීම තුළින් බැංකු 16 ක පරීක්ෂණ කටයුතු නිමාකළ අතර පරීක්ෂණ 17 ක් නිමා කෙරෙමින් පවතී.

### 2.5 සෙලාන් බැංකුව ස්ථාවර කිරීමේ ක්‍රියාමාර්ගය

සෙලාන් බැංකුවෙහි තැන්පතු ආපසු ගැනීම සහ ද්‍රවශීලතා ගැටළු සම්බන්ධයෙන් වූ දුෂ්කරතාවයන්ට හේතු වූ ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගමෙහි (සෙලින්කෝ සමූහ ව්‍යාපාරයෙහි සාමාජික) ඇතිවූ සිදුවීම් කෙරෙහි මුදල් මණ්ඩලයෙහි අවධානය යොමු විය. ඒ අනුව, මූල්‍ය පද්ධතියෙහි ස්ථායිතාවයට ඇතිවිය හැකි තර්ජන වැළැක්වීම සඳහා මුදල් මණ්ඩලය විසින්, මුදල් නීති පනතේ 30 වන වගන්තිය යටතේ, 2008 දෙසැම්බර් 29 වන දින පටන් සෙලාන් බැංකුවෙහි සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සේවය අත්හිටුවීමට සහ සෙලාන් බැංකුවෙහි කාර්යයන් මෙහෙයවීම සඳහා ලංකා බැංකුව පත්කිරීමට තීරණය කරන ලදී. මෙවැනි මැදිහත් වීමක් තුළින්, සෙලාන් බැංකුව පිළිබඳව වූ වෙළෙඳපොළ විශ්වාසීභාවය ප්‍රතිස්ථාපනය වූ අතර මූල්‍ය පද්ධතයෙහි ස්ථායීතාවයට වූ තර්ජනය සතුටුදායක අන්දමින් සමනය කරන ලදී.

### 2.6 ඉදිරි සුරැකුම් ගනුදෙනු පිළිබඳ විමර්ශනයන්

2008 නොවැම්බර් මස මුල් භාගයේ පළවූ මාධ්‍ය වාර්තාවලින් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ස්ටෑන්ඩඩ් චාර්ටඩ් බැංකුව, සිටි බැංකුව, ඩොයිෂ් බැංකුව, කොමර්ෂල් බැංකුව සහ මහජන බැංකුව යන බැංකු පහ අතර ඇතිවූ ඛනිජ තෙල් ව්‍යුත්පන්න ගනුදෙනු පිළිබඳව විමර්ශණයන් අරඹන ලදී. ඒ අතරතුර ශ්‍රේෂ්ඨාධිකරණයෙහි මෙම ඛනිජ තෙල් ව්‍යුත්පන්න ගනුදෙනු සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් නඩුකර දෙකක් ගොනුකරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මෙම සැකසහිත ගනුදෙනු පිළිබඳ විමර්ශනය කර අදාල පියවර ගන්නා ලෙස මුදල් මණ්ඩලයට නියම කළ අතර මෙය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු විසින් ගෙන ගිය පරීක්ෂණ කටයුතු වල විෂය පථය පුළුල් වීමට හේතු විය. ඒ අනුව, අදාළ බැංකු පහ විසින් ක්‍රියාත්මක කළ ඉදිරි සුරැකුම් ගනුදෙනු පිළිබඳව එතැන් පරීක්ෂණ පැවැත්වූ අතර, එම වාර්තා මුදල් මණ්ඩලය හා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී. මෙයට අමතරව, ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය පරිදි වැඩිදුර විමර්ශන කටයුතු සඳහා මෙම පරීක්ෂණ ප්‍රතිඵල අල්ලස් හා දූෂණ වංචා විමර්ශන කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලදී. 2008 දෙසැම්බර් 16 වන දින අදාළ බැංකු වෙත ඔවුන්ගේ ගනුදෙනු ඉදිරියට ගෙනයාමෙන් හෝ බලපැවැත්වීමෙන් වළකින ලෙස දැනුම් දෙන ලදී.

### 2.7 තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳව පරීක්ෂණයන් පැවැත්වීම

බැංකු පනතේ 83 (c) වගන්තිය යටතේ තහනම් කළ යෝජනා ක්‍රම පිළිබඳ පරීක්ෂා කිරීම 2008 වසර තුළදී තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. මේ සම්බන්ධයෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව අනුරාධපුරය, බලපිටිය, මහව - කුරුණෑගල, පන්විල, තෙල්දෙනිය සහ පොල්පිතිගම ප්‍රදේශවල විභාග කළ නඩුකර 09 කට සහභාගි විය. නීති විරෝධි හා වංචනික පිරමීඩ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය කිරීමෙහි හා ආධාර කිරීමෙහි ඇති ආදීනව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් ද පළකරන ලදී.

### 2.8. නඩුකර

2008 වර්ෂය තුළදී ගැටළු කිහිපයක් අරමුණුකොට ගෙන දිස්ත්‍රික් අධිකරණය මහාධිකරණය, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය, කම්කරු විනිශ්චය සභාව සහ මානව හිමිකම් කොමිෂන් සභාව යන ආයතනයන්හි නඩුකර පැවතිණි. එනම් ආයතනික යහපාලනය පිළිබඳ විධානය, ප්‍රමුඛ බැංකුව ඇවරකිරීම, බැංකුවල හිමිකම් ප්‍රාග්ධන අවශ්‍යතාවයේ ඉහළ දැමීම, ඛනිජ තෙල් ව්‍යුත්පන්න ගනුදෙනු සහ අනෙකුත් කටයුතු වේ. මේ සම්බන්ධයෙන් නඩුකර 17 ක් තවමත් විභාගවෙමින් පවතින අතර, නඩුකර 16 ක් පැමිණිලිකාර පක්ෂය විසින් ඉවත්කරන ලදී. තවත් නඩුකර තුනක් පසෙක තබන ලද අතර, නඩුකර දෙකක් වසර තුළදි සමථයකට පත්විය. 2008 වර්ෂයේ ජූලි මාසයේදී, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ විධානයන් නිකුත් කරන ලද අතර බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්ගේ වයස් සීමාව, සේවා කාලයේ දීර්ඝත්වය සහ දැරිය හැකි අධ්‍යක්ෂක තනතුරු සංඛ්‍යාව පිළිබඳ ප්‍රතිපත්ති ස්ථිර කරන ලදී.

### 2.9 ප්‍රාදේශීය සංවර්ධන බැංකු ඒකාබද්ධ කිරීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකු අන්තර්ග්‍රහණය කරමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පිහිටුවීම සඳහා 2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත 2008 ඔක්තෝබර් මාසයේ දී පාර්ලිමේන්තුවෙන් සම්මත කරන ලදී.

## 2.10 අධ්‍යක්ෂ මණ්ඩල හා විගණකවරු අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා වර්ධනය කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම සහ නීති රෙගුලාසි, ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණය, විචක්ෂණ සහ ගිණුම් ප්‍රමිතීන් පිළිබඳ නව ප්‍රවණතා, අභ්‍යන්තර පාලන සහ විගණන කටයුතු ආදිය පිළිබඳ සාකච්ඡා කිරීමේ අරමුණෙන් බැංකු අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රථම සම්මේලනය පැවැත්විණි. බැංකු විසින් කාර්යක්ෂම පාලන ක්‍රම භාවිතා කරනු ලැබීම තහවුරු කරගැනීමට සහ අධීක්ෂණ කටයුතුවලදී සැලකිල්ලට යොමුවී ඇති ගැටළු සාකච්ඡා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු වල විගණන මණ්ඩල කමිටු සහ බැංකුවල බාහිර විගණකවරුන් හමුවනු ලැබේ.

## 2. 11 අන්තර් නියාමන ආයතනික සභාව සහ අනෙකුත් පොදු හමුවන්

අන්තර් නියාමන ආයතනික සභාවේ සාමාජිකයෙකු ලෙස බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක අඛණ්ඩව කටයුතු කරයි.

පුළුල් මූල්‍ය පද්ධති ස්ථායීතාවය ඇති කිරීම සඳහා මූල්‍ය වෙළෙඳපොළ වල ක්‍රමික සංවර්ධනයක් ඇති කිරීමට යෝග්‍යවන්නා වූ ප්‍රතිපත්තිමය මග පෙන්වීම් ඇතිකිරීමත්, සියලුම නියාමන ආයතන අතර සහයෝගීතාව සහ තොරතුරු හුවමාරු කරගැනීම සහතික කිරීම සඳහාත් මෙම සභාව පිහිටුවන ලදී. එහි සභාපතිත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා විසින් උසුලන අතර ජාතික ගෙවීම් සමුළුව, ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිති පරීක්ෂා කිරීමේ මණ්ඩලය, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, කොළඹ කොටස් හුවමාරුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය, සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යනාදී ආයතනවල ප්‍රධානීන්ගෙන් මෙම සභාව සමන්විත වේ. 2008 වර්ෂයේදී අන්තර් නියාමන ආයතනික සභාවේ රැස්වීම් තුනක් පැවැත්විණි. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් සමග මාසික රැස්වීම් තවදුරටත් අඛණ්ඩව පවත්වනු ලැබූ අතර, බැංකු ක්ෂේත්‍රයට සම්බන්ධ ගැටළු හා ප්‍රතිපත්ති පිළිබඳ අදහස් හුවමාරු කරගැනීම සඳහා මෙම රැස්වීම් අවස්ථාව සපයන ලදී.

මූල්‍ය සමූහායතන සඳහා වූ නියාමකයන්ගේ ක්‍රියාකාරී කමිටුව වර්ෂය තුළදී රැස්වීම් 8 ක් පවත්වමින් ඔවුන්ගේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ජාතික ගෙවීම් සමුළුවේ සාමාජිකයෙකු ලෙස සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ සේවය අඛණ්ඩව සැපයුනි.

## 2.12 වාර්ෂික බලපත්‍ර ගාස්තු

නියාමන හා අධීක්ෂණ පිරිවැය අයකර ගැනීම උදෙසා නොයෙකුත් රටවල් විවිධ ක්‍රමෝපායන් යොදා ගනියි. දශකයක් පුරා බලපත්‍ර ගාස්තුව නොවෙනස්ව පැවැති බව අවධාරණයට ගනිමින් බැංකු අධීක්ෂණ පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමේ අරමුණ ඇතිව, විෂම පදනම මත බලපත්‍ර ගාස්තුව ඉහළ දැමීම සඳහා, මුදල් මණ්ඩලය විසින් මැනවින් පරීක්ෂා කොට තීරණය කරන ලදී. ඒ අනුව, 2009 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තුව දේශීය බැංකු කටයුතු මෙන්ම අක්වෙරළ බැංකු කටයුතු පත්වාගෙන යනු ලබන බලපත්‍ර ලාභී වාණිජ බැංකු සඳහා රු.500,000 ක් ද, අක්වෙරළ බැංකු කටයුතු පමණක් පවත්වාගෙන යනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා රු. 300,000 ක් ද, සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා රු. 200,000 ක් ද වේ.

## 2.13 මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්

මූල්‍ය පද්ධතිය පිළිබඳ සහ මූල්‍ය ආයතන සමග සිදුකරන ගනුදෙනු සම්බන්ධයෙන් ඇති අවදානම් හා ප්‍රතිලාභ පිළිබඳව දැනුවත්වීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීමේ අරමුණින් තොරතුරු බෙදාහැරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදුකරන ලදී. ඒ අනුව, ගෝලීය ආර්ථික අර්බුදය, ආයතනික යහපාලනය, තැන්පතු භාරගැනීම සඳහා අවසර ලත් ආයතන සහ ලියාපදිංචි මූල්‍ය ආයතන පිළිබඳව පුවත්පත් දැන්වීම් පළකරන ලදී.

**ඇමුණුම II-1**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ්
2. ඉන්දියන් ඕවර්සීස් බැංකුව
3. ඉන්දියන් බැංකුව
4. එම්සීබී බැන්ක් ලිමිටඩ්
5. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
6. ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් ලිමිටඩ්
7. ඩොයිෂ් බැංකුව ඒ.ජී.
8. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
9. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.
10. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.
11. පබ්ලික් බැන්ක් බර්හාඩ්
12. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී.
13. මහජන බැංකුව
14. යූනියන් බැන්ක් ඔෆ් කළම්බු ලිමිටඩ්

| | |
|---|---|
| 15. | ලංකා බැංකුව |
| 16. | ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව |
| 17. | ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්දියා |
| 18. | සිටිබෑන්ක් එන්.ඒ |
| 19. | හබීබ් බෑන්ක් ලිමිටඩ් |
| 20. | හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. |
| 21. | සම්පත් බෑන්ක් පී.එල්.සී. |
| 22. | සෙලාන් බෑන්ක් පී.එල්.සී. |

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

| | |
|---|---|
| 1. | ඌව සංවර්ධන බැංකුව |
| 2. | කඳුරට සංවර්ධන බැංකුව |
| 3. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව |
| 4. | ඩීඑෆ්සීසී බැංකුව |
| 5. | රජරට සංවර්ධන බැංකුව |
| 6. | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව |
| 7. | රුහුණු සංවර්ධන බැංකුව |
| 8. | වයඹ සංවර්ධන බැංකුව |
| 9. | සීමාසහිත සණස සංවර්ධන බැංකුව |
| 10. | සබරගමුව සංවර්ධන බැංකුව |
| 11. | සෙලින්කෝ සේවින්ස් බෑන්ක් ලිමිටඩ් |
| 12. | ලංකාපුත්‍ර සංවර්ධන බෑන්ක් ලිමිටඩ් |
| 13. | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව |
| 14. | ශ්‍රී ලංකා සේවින්ස් බෑන්ක් ලිමිටඩ් |

## 3. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය

2008 වසර තුළ දී බැංකු කටයුතු අධ්‍යන කේන්ද්‍රය පුළුල් පරාසයකින් යුතු පුහුණු වැඩසටහන්, අධ්‍යාපනික සම්මන්ත්‍රණ සහ මහජන දේශන උසස් තත්ත්වයෙන් පවත්වමින් එහි පුහුණු වැඩසටහන්වල විෂය ආවරණය හා ගුණාත්මක භාවය වර්ධනය කිරීමට පියවර ගෙන ඇති අතර, විවිධ විෂයයන්ට අදාළ ව සන්ධ්‍යා දේශන සහ සහතිකපත්‍ර පාඨමාලා හඳුන්වා දෙන ලදී. බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය තවදුරටත් දැනුම බෙදාගැනීම සහ උපාය මාර්ගික සම්බන්ධතා ජාලාවක් හරහා දැනුම ඒකරාශී කර ගැනීමේ අරමුණෙන්, විවිධ දේශීය සහ ජාත්‍යන්තර ආයතන සමග අන්තර් සම්බන්ධතාවයන් මෙම වර්ෂය තුළ දී ද ගොඩනගා ගන්නා ලදී. එමෙන් ම ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ට පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපනය කිරීමේ අදහසින් බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය 2008 වර්ෂය තුළ දී ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන ලදී. දේශීය හා විදේශීය සහභාගි වන්නන් සඳහා ඉහළ තත්ත්වයෙන් යුතු සේවාවක් ලබාදීමේ අරමුණෙන් වර්තමානයේ බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ පවතින නවාතැන් පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ඉහළ නැංවීමට ද කටයුතු කරන ලදී.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය 2008 වසර තුළ දී පුහුණු වැඩසටහන් 98 ක් පවත්වන ලදී. කලින් සැලසුම් කරන ලද දේශීය වැඩසටහන් 59 ක්, ජාත්‍යන්තර වැඩසටහන් 5 ක් සහ විවිධ පාර්ශ්වයන්ගේ ඉල්ලීම මත සංවිධානය කරන ලද විශේෂ වැඩසටහන් 34 ක් මෙයට ඇතුළත් විය. ඉහත වැඩසටහන් සඳහා සහභාගී වූ පුද්ගලයින් සංඛ්‍යාව පිළිවෙලින් 1763, 171 හා 1325 ක් විය. බැංකු හා මූල්‍ය, ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය, මූල්‍ය ආයතනවලට අදාළ රෙගුලාසි, තොරතුරු තාක්ෂණය, භාෂා හා සන්නිවේදන කුසලතා, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ග්‍රාමීය අංශයේ සංවර්ධනය හා ක්ෂුද්‍ර මූල්‍යකරණය යන ක්ෂේත්‍රයන් බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්වලට ඇතුළත් විය. ඉහත සඳහන් වැඩසටහන්වලට අමතරව ප්‍රතිපත්තිමය ගැටළු සහ මූල්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වැදගත්කමකින් යුතු වූ විශේෂ වැඩසටහන් ද වර්ෂය තුළ දී පවත්වන ලදී.

බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය ප්‍රසිද්ධ දේශන, සන්ධ්‍යා දේශන හා පාසල් ළමුන් සහ ගුරුවරුන් සඳහා විශේෂ අධ්‍යාපනික වැඩසටහන් මාලාවක් සංවිධානය කරමින් පොදු මහජනතාව සමග දැනුම බෙදාගැනීම අඛණ්ඩව පවත්වා ගැනීමට පියවර ගන්නා ලදී. නවතම මතවාදයන් මහජනයා වෙත ගෙනයාමටත් ඒ පිළිබඳව පොදු ජනතාවට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට හා දැනුම හුවමාරු කර ගැනීමට මගක් සැපයීමේ අරමුණ ඇතිව මෙම සම්මන්ත්‍රණ හා දේශන සැලසුම් කරන ලදී. 2008 වර්ෂය තුළ දී බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් ප්‍රසිද්ධ දේශන 15 ක්, සන්ධ්‍යා දේශන 4 ක් හා අධ්‍යාපනික සම්මන්ත්‍රණ 18 ක් පවත්වන ලදී. ඒ සඳහා සහභාගී වූ පුද්ගලියන් සංඛ්‍යාව පිළිවෙලින් 3410, 236 හා 2547 ක් විය. අධ්‍යාපනික සම්මන්ත්‍රණවලට අමතරව ශිෂ්‍යයන් සහ පාසල් ගුරුවරුන් අරමුණු කරගෙන රූපවාහිනී වැඩසටහන් 13 ක් ද පවත්වන ලදී.

## 4. සන්නිවේදන කාර්යභාරය

ගෝලීය ආර්ථිකය තුළ උද්ගතව තිබූ අර්බුදකාරී තත්ත්වයන් මධ්‍යයේ වුව ද, විශාල පරාසයක් පුරා පැතිර පවතින පුළුල් මාධ්‍ය ජාලය උපයෝගී කර ගනිමින් මහජනතාව සමග ශ්‍රී ලංකා මහ බැංකුව පසුගිය වසර පුරාම, ප්‍රශස්ත මට්ටමේ සන්නිවේදන කාර්යභාරයක් ඉටු කිරීමට සමත් විය. විශේෂයෙන්ම අර්බුදකාරී ආර්ථික වටපිටාවක් සහිත වාතාවරණයක ආර්ථික හා මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගැනීම අරමුණු කොට

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාවට නංවනු ලබන්නා වූ ප්‍රතිපත්තිමය තීරණ හා ක්‍රියාමාර්ගයන් පිළිබඳ මහජනතාව දැඩි විශ්වාසයක් තබන බැවින් මෙවන් අවධානග්‍රාහී සන්නිවේදන කාර්යභාරයක අවශ්‍යතාවය ඉස්මතුව පවතී. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර මෙන්ම බාහිර සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීමේ දී පසුගිය වසරේදීත් සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරනු ලැබීය.

ඉකුත් වසරවලදී මෙන්ම විනිමය අනුපාත, සතිපතා හා මාසික ආර්ථික දර්ශක, ශ්‍රී ලංකා අන්තර් බැංකු අපර්ණ අනුපාතික, බනිජ තෙල් මිල ගණන්, පාරිභෝගික මිල දර්ශක මෙන්ම භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වශයෙන් වූ රජයේ සුරැකුම්පත් වෙන්දේසි පිළිබඳ තොරතුරු නිකුත් කිරීම පසුගිය වසරේදීත් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව ප්‍රවෘත්ති නිවේදන 1352 ක් ද, පුවත් පත් වෙළෙඳ දැන්වීම් 152 ක් ද, ගැසට් නිවේදන 12 ක් ද පසුගිය වසර තුළ නිකුත් කරන ලදී. මෙලෙස සාම්ප්‍රදායිකව නිකුත්කරනු ලබන පුවත්පත් නිවේදන හා දැන්වීම් වලට අමතරව මාධ්‍ය සාකච්ඡා හෙවත් සම්මන්ත්‍රණ 15 ක් ද, ආර්ථික හා මූල්‍ය ක්ෂේත්‍රයේ කාලීන උපනතීන් පිළිබඳ මහජනතාවගේ දැනුම වඩාත් තීව්‍ර කිරීමේ අරමුණ ඇතිව, බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා මුහුණට මුහුණලා සහභාගි වූ මාධ්‍ය සාකච්ඡා ගණනාවක් ද දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලැබීය. ගෝලීය වශයෙන් පැන නැගී ඇති කාලීන මාතෘකා හා උපනතීන් මෙන්ම දේශීය ආර්ථිකයට එමගින් ඇති කෙරෙන බලපෑම් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දීම පිණිස මාධ්‍යකරුවන් හා මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙනුවෙන් වූ රැස්වීම් වාර 3 ක් සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසර තුළ සංවිධානය කරනු ලැබීය.

රජයේ ප්‍රධාන අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතනවල ද සහාය ඇතිව අන්තර්ජාතික වශයෙන් රටේ ප්‍රතිරූපය නංවාගැනීමේ හා කළමනාකරණය කර ගැනීමේ අරමුණින් දියත් කරනු ලැබූ වැඩසටහනක් දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරනු ලැබීය. රටේ ප්‍රතිරූපයට ඉතා හානිකර ආකාරයේ ජාත්‍යන්තර ප්‍රචාරයන් ක්‍රියාත්මක වෙමින් තිබූ සන්දර්භයක් තුළ දියත් වූ මෙම වැඩසටහන එවකට ක්‍රියාත්මක වෙමින් පැවති ජාත්‍යන්තර ණයකර නිකුතුව ඵලදායී ලෙස සම්පූර්ණ කර ගැනීමට මනා පිටිවහලක් විය. ජාත්‍යන්තර ප්‍රජාව තුළ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ ප්‍රතිරූපය යහපත් හා කල් පවතින ලෙස පවත්වා ගැනීම මෙම වැඩසටහනෙහි මූඛ්‍ය පරමාර්ථය විය.

ලොව පුරා විසිරී, සිටින ප්‍රජාව සම්බන්ධ කරනු ලබන ප්‍රධාන සන්නිවේදන දොරටුව ලෙස බැංකුවේ වෙබ් අඩවිය පසුගිය වසර පුරාම ඉතා වටිනා හා වැදගත් කාර්ය භාරයක නිරත විය.

බැංකු ප්‍රකාශන හා සමරු කාසි අලෙවි කිරීම පිණිස මංගත (On line) කවුළුවක් හඳුන්වාදීම හා RSS (Real Simple Syndication) වැනි නවාංග හඳුන්වාදීමත් සමග එය පසුගිය වසර තුළ තව තවත් ජනප්‍රිය තත්වයට පත්විය. පිළිවෙලින් 2006 වසරේ දී 600 ක් ද, 2007 වර්ෂයේ 88,000 ක් ද වශයෙන් පැවති දෛනික ග්‍රාහක සංඛ්‍යාව 2008 වර්ෂයේ දී 103,012 ක් දක්වා ආකර්ශනීය වැඩිවීමක් පෙන්නුම් කරනු ලැබීය. බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල ද සහයෝගයෙන් ප්‍රධාන භාෂා 3 න්ම වෙබ් අඩවිය අඛණ්ඩව යාවත්කාලීනව පවත්වා ගැනීමට පසුගිය වර්ෂයේ දී හැකිවිය. මධ්‍යම රජය වෙනුවෙන් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන නියෝජිත සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් කරනු ලබන නිරන්තර විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමක් ලෙස බැංකුවේ අදාල දෙපාර්තමේන්තු හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම සඳහා පියවර ගනු ලැබීය. ඒ අනුව 1919 දරන දුරකථන අංකයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු දැනගැනීමේ පහසුකම දැන් මහජනතාව සඳහා විවෘතව පවතී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව හා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සම්බන්ධ විමසීම්වලට ප්‍රතිචාර දැක්වීමට මෙමගින් මේ වනවිට විධි විධාන සලසා ඇත.

සුපරීක්ෂාකාරීව සැළසුම් කළ ප්‍රකාශිතයක් හරහා මහ බැංකුවේ පරිපූර්ණභාවය, වෘත්තීය නිපුණතාවය හා විෂය පථය පිළිබඳ සන්නිවේදනය කිරීමේ අරමුණින් නව ආයතනික රූපාංකනයක් හඳුන්වාදෙනු ලැබීය. ඒ අනුව, සියලුම සන්නිවේදන රූපාකෘති ප්‍රතිසැලසුම් කරනු ලැබූ අතර, මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම, පෙර දැක්ම විවරණිකාව වැනි මහ බැංකු ප්‍රකාශන නව මුහුණුවරකින් එළි දක්වනු ලැබීය.

මහ බැංකුවේ අභ්‍යන්තර සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස, දෙපාර්තමේන්තුව විසින් CBSL Daily අභ්‍යන්තර වෙබ් බිහිදොර (Web Portal) නොකඩවාම යාවත්කාලීන කරනු ලැබූ අතර, එමගින් දෛනික කාලගුණ වාර්තාවේ සිට දේශීය, විදේශීය බැංකු හා මූල්‍ය තොරතුරු, ආර්ථික දර්ශක, දේශන හා සේවකයින් වෙත කරනු ලබන විවිධ නිවේදන දක්වා පුළුල් පරාසයක තොරතුරු දෛනිකව සම්පාදනය කරනු ලැබීය. තවද, කාලීන මාතෘකා යටතේ සාධනීය සාකච්ඡාවන්ට සහභාගි වීම සඳහා සේවකයින් හට මංගත සභා මණ්ඩපයක (On-line forum) පහසුකම් ද සම්පාදනය කොට ඇත. මෙම අභ්‍යන්තර වෙබ් ද්වාරයට 2007 වර්ෂයේ දී 300 ක් වශයෙන් පැවති සාමාන්‍ය දෛනික පිවිසුම් සංඛ්‍යාව 2008 වර්ෂය තුළදී 350 ක් දක්වා ඉහළ ගියේය. දෙපාර්තමේන්තුවල කටයුතු පිළිබඳ කාර්ය මණ්ඩලයේ දැනුවත්භාවය ඉහළ නැංවීම පිණිස, අභ්‍යන්තර ප්‍රවෘත්ති හා විශේෂාංග ඇතුළත් කවුළුව සඟරාව නොකඩවාම 2008 වර්ෂයේදීත් පළකරනු ලැබූ අතර සේවකයින් හට විවිධ මාතෘකා ඔස්සේ තම විමර්ශන හා අදහස් පළකිරීම පිණිස එහි මුහුණුවර හා ඉඩකඩ වඩාත් පුළුල් කරනු ලැබීය.

මහ බැංකුව හා ආර්ථිකය සම්බන්ධ තොරතුරු මාධ්‍යවල පළවන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පහසුකම් සැපයීමක් ලෙස ප්‍රවෘත්ති ගොනුවක් ඉහළ කළමනාකාරිත්වයට දෛනිකව සම්පාදනය කරනු ලැබීය. කලින් වසරවලදී මෙන් 2008 වර්ෂයේ දී ද විවිධ ආර්ථික, මූල්‍ය සහ සමාජමය කාරණා යටතේ පළවූ එවැනි ප්‍රවෘත්ති අයිතම 1,290 ක් සම්පාදනය කරනු ලැබීය. මහ බැංකුවේ කටයුතු පිළිබඳ පළවන පුවත්පත් වාර්තා විශ්ලේෂණය කිරීමෙන් මහ බැංකු කටයුතු පිළිබඳ මාධ්‍යය තුළ ඇති ආකල්පයන් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබාගත හැකිවනු ඇත. මෙම පුවත්පත් වාර්තා පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත විස්තරාත්මක දැනුවත්

කිරීමක් නිරන්තරයෙන් සිදු කරනු ලැබූ අතර, එමගින් අදාල දෙපාර්තමේන්තුවල ද සහාය ඇතිව සාවද්‍ය කරුණු ඇතුළත් පුවත්පත් වාර්තා සම්බන්ධයෙන් විධිමත් ප්‍රතිචාර දැක්වීමටත්, අදාල දෙපාර්තමේන්තු හරහා ඒවා නිවැරදි කරවීමටත් කටයුතු කරනු ලැබීය.

අධ්‍යාපන හා මහජන දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ආර්ථික, බැංකු හා මූල්‍ය විෂයයන් සම්බන්ධ පාසැල් සම්මන්ත්‍රණ 24 ක් ද අදාල වර්ෂය තුළදී මෙහෙයවනු ලැබීය. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම් මත, ලාභදායී ගෘහ ආර්ථික ක්‍රියාවලියක් ලෙස කිරි පට්ටි පාලනය දියුණු කිරීම හා රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් වාර්තා වීඩියෝ වැඩසටහන් දෙකක් නිෂ්පාදනය කරනු ලැබීය. මෙම වැඩසටහන් සාමාන්‍ය මහජනතාව අතර බෙහෙවින් පිළිගැනීමට ලක් විය. විශාල පිරිසකට එකවර නැරඹීමට හැකිවන ලෙස මෙම වැඩසටහන් සංයුක්ත තැටි වශයෙන් සකස් කොට විශේෂයෙන් ඉලක්ක කරනු ලැබූ ප්‍රේක්ෂක ප්‍රජාවන් අතර බෙදාහැරීමට ද කටයුතු කරනු ලැබීය. මහ බැංකුවේ ප්‍රතිපත්ති හා වගකීම් පිළිබඳව සහ ආර්ථික හා මූල්‍ය තොරතුරු පිළිබඳ ජනතාවගේ දැනුම ඉහළ නැංවීමේ අරමුණින්, දෙපාර්තමේන්තුව විවිධ බාහිර ප්‍රදර්ශන ගණනාවකටම සහභාගි විය. මේ අතරින් කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයෙහි හා “දැයට කිරුළ” ප්‍රදර්ශනයෙහි මහ බැංකු ප්‍රදර්ශන කුටිය සැළකිය යුතු මට්ටමක මහජන ආකර්ශනයක් දිනා ගන්නා ලද අතර, මෙම ප්‍රදර්ශන කුටි හරහා මහ බැංකු ප්‍රකාශන විශාල ප්‍රමාණයක් අලෙවි කිරීමට ද හැකි විය. වසර තුළදී, රාජගිරිය බැංකු අධ්‍යයන කේන්ද්‍ර පරිශ්‍රය තුළ බැංකු ප්‍රකාශන අලෙවි කවුලුවක් ද අලුතින් ආරම්භ කරනු ලැබීය.

දීර්ඝ කාලීනව පැවති අඩුපාඩුවක් පිරිමසාලමින් දෙමළ පරිවර්තන ඒකකයක් දෙපාර්තමේන්තුව තුළ පසුගිය වසරේදී ස්ථාපනය කරනු ලැබූ අතර, එමගින් බැංකුවේ සියලුම දෙමළ පරිවර්තන අවශ්‍යතාවයන් සම්පූර්ණ කෙරෙනු ඇත. මෙම අංශය හරහා පුවත්පත් නිවේදන, ප්‍රවෘත්ති දැන්වීම්, ගැසට් නිවේදන සහ බැංකු ප්‍රකාශන ආදිය පරිවර්තන කිරීම වඩාත් කාර්යක්ෂම අයුරින් ඉටුකර ගැනීමට දෙපාර්තමේන්තුවට අවකාශ සැළසුනි.

දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන සටහන සහ නිව්ස් සර්වේ (News Survey) සඟරා කලින් වසරවලදී මෙන්ම 2008 වසරේ දීත් නොකඩවා පළ කරනු ලැබූ අතර, මහ බැංකුව විසින් පළ කරනු ලබන අනෙකුත් සියලුම ප්‍රකාශන මුද්‍රණය කොට ප්‍රසිද්ධ කිරීමේ නියෝජිත කාර්යභාරය දෙපාර්තමේන්තුව විසින් සාර්ථකව ඉටුකරනු ලැබීය. මහ බැංකු මුද්‍රණාලය විසින් මහ බැංකුවේ බොහෝ මුද්‍රණ අවශ්‍යතා 2008 වසර තුළදීත් පෙර පරිදිම ඉටුකරනු ලැබූ අතර, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංඛ්‍යාන, නිවුස් සර්වේ (News Survey), සටහන, කවුළුව, මාණ්ඩලික පත්‍රිකා, මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවය, ප්‍රතිපත්ති පෙර දැක්ම (Road Map), උපාය මාර්ගික සැලසුම හා මහ බැංකු දිනපොත යන ප්‍රකාශන මෙන්ම ආරාධනා පත්‍ර, හමුවීමේ මෙමෝ පත්, සුභ පැතුම් පත් සටහන් පත්‍රිකා ගොනු සහ ලිපි ගොනු කවර ආදී විවිධ දෙපාර්තමේන්තුවල මුද්‍රණ අවශ්‍යතාවයන් ද ඉටුකරනු ලැබීය. 2008 වසරේ දී මහ බැංකුව විසින් මෙහෙයවන ලද ප්‍රධාන වැඩසටහන් දෙපාර්තමේන්තුවේ ඡායාරූප ඒකකය විසින් විධිමත් ලෙස ඡායාරූපගත කරනු ලැබූ අතර, බැංකුව තුළ සහ පිටත දී ක්‍රියාවට නැංවුනු එවැනි වැඩ සටහන් 60 ක් 2008 වර්ෂය තුළදී එසේ ඡායාරූපගත කිරීම සිදු කරන ලදී.

### පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය

පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය විසින් බැංකු කාර්ය මණ්ඩලය හා වෙනත් ඉල්ලීම් සඳහා පුස්තකාල සේවා සැපයීම අඛණ්ඩව සිදුකරන ලදී. මුළු පොත් සංඛ්‍යාව 20,586 සිට 21,906 දක්වාත් වාර්තා 13,827 සිට 14,662 දක්වාත් සංයුක්ත තැටි 1,082 සිට 1,142 දක්වාත්, බඳින ලද සඟරා එකතුව 500 කින් ද වර්ෂය තුළදී වර්ධනය විය. බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ ඇති පුස්තකාලයේ පොත් එකතුව ද 5,273 සිට 5,516 දක්වා වැඩිවිය.

ආර්ථික විද්‍යා, ආර්ථික මිතිය හා මූල්‍ය විෂයයන් ඇතුළත් වාර සඟරා 100 කට වඩා මංගතව (Online) සම්බන්ධවීමට අවස්ථාව ලබාදෙන "Science Direct Database" නමැති දත්ත එකතුවට සම්බන්ධවීමට අවස්ථාව ලබාදීම නිසා එහි භාවිතය පුළුල් විය.

මෙම වසර තුළදී "Recent Additions", "List of Selected Articles", "News on Central Banking", "News Alert" වැනි විද්‍යුත් ප්‍රකාශන සම්පාදනය කළ අතර ඒවා අන්තර්ජාලය (Intranet) හරහා බෙදාහැරිණි. එමෙන්ම “තෝරාගත් තොරතුරු බෙදාහැරීමේ සේවය” ද පවත්වාගෙන යන ලදී. මහ බැංකු කාර්ය මණ්ඩලය තුළ පුස්තකාල මංගත පහසුකම් භාවිතය ධෛර්යමත් කිරීම සඳහා දෙපාර්තමේන්තු 11 ක් ආවරණය වන පරිදි පුස්තකාලය පරිහරණය කරන්නන්ගේ අධ්‍යාපන වැඩසටහන් 11 ක් පවත්වන ලදී. සේවකයන් දැනුවත් කිරීම සඳහා වාර්තා චිත්‍රපට දර්ශන 24 ක් ද පුස්තකාල ආලින්දයෙහි දිවා විවේකයේ දී සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා මූල්‍ය හා බැංකු පුස්තකාල ජාලය (Ebank lib net sl) පවත්වාගෙන යන ලද අතර, විද්‍යුත් තැපැල මගින් තොරතුරු බෙදාහැරීම නිසා එහි සාමාජික පුස්තකාල 22 කට විශාල වශයෙන් ප්‍රතිලාභ ලැබුණි.

ඔක්තෝබර් මාසයට යෙදී තිබුණු ජාතික පොත් කියවීමේ මාසය වෙනුවෙන් මිලදීගත් අලුත් ග්‍රන්ථ 723 ක් ඇතුළත් පොත් ප්‍රදර්ශනයක් සංවිධානය කර ප්‍රදර්ශනය කරන ලදී.

පොත් විචාර ලිවීමේ තරගය හා විද්‍යුත් තැපැල් පැන විසඳුම් තරගය ද ජාතික පොත් කියවීමේ මාසය තුළ ක්‍රියාත්මක වූ ජනප්‍රිය අංග විය. “ශ්‍රී ලංකාවේ ඉඩම් හා ඒවා සංරක්ෂණය” පිළිබඳව දෙසුමක් සංවිධානය කිරීමෙන් මෙම ජාතික ප්‍රශ්නය පිළිබඳව බැංකු කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදී.

බැංකු කාර්ය මණ්ඩලයට පහසුවෙන් පිවිසීම සඳහා ස්වයං පිවිසුම් භාෂා පර්යේෂණාගාරය (Self Access Languege Laboratory) පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානයේ විමර්ශන අංශය වෙත ගෙනයන ලදී. විමර්ශනයට භාජනය කරන ලද වසර තුළ සුවිශේෂ ජයග්‍රහණයක් වන්නේ පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානයට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ISO 9001:2000 ජාත්‍යන්තර තත්ත්ව සහතිකය පිරිනැමීමය.

# 5. ව්‍යවහාර මුදල්

## 5.1 ව්‍යවහාර මුදල් නිකුතුව සහ කළමනාකරණය :

ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පූර්ණ බලධරයා වශයෙන් ශ්‍රී ලංකාව තුළ ගනුදෙනු කිරීම සඳහා වලංගු මුදල් නිකුත් කිරීමේ කාර්යභාරය 2008 වර්ෂය තුළදී ද ඉටුකරන ලදී. 2008 වර්ෂය අවසානයේ සංසරණයේ පැවැති මුළු මුදල් ප්‍රමාණයේ වටිනාකම රුපියල් බිලියන 186 ක් වූ අතර ඉන් 97% ක් මුදල් නෝට්ටු වලින් ද ඉතිරිය කාසි වලින් ද සමන්විත විය. 2008 වර්ෂය තුළ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු සඳහා නිකුත් කරනු ලැබූ නව මුදල් නෝට්ටු සහ සේවා නිසි මුදල් නෝට්ටු ප්‍රමාණයන් හි වටිනාකම් පිළිවෙලින් රුපියල් බිලියන 27 ක් සහ රුපියල් බිලියන 193 ක් විය. වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පත් කළ මුළු මුදල් නෝට්ටු ප්‍රමාණයේ වටිනාකම රුපියල් බිලියන 207 ක් විය. ඒ අනුව 2008 වසර තුළ සංසරණය සඳහා නිකුත් කරනු ලැබූ ශුද්ධ මුදල් නෝට්ටු ප්‍රමාණයේ මුළු වටිනාකම රුපියල් බිලියන 13 ක් සහ ශුද්ධ කාසි ප්‍රමාණයේ වටිනාකම රුපියල් මිලියන 252 ක් විය.

## 5.2 මුදල් නිකුතුව සහ කළමනාකරණය සඳහා පිරිවැය කාර්යක්ෂම ක්‍රියාමාර්ග:

භාවිතයෙන් තොරව නිවාස සහ ආගමික ස්ථානයන්හි එක් රැස්වී ඇති කාසි නැවත සංසරණය සඳහා එක් කිරීම අරමුණු කොටගත් කාසි එකතු කිරීමේ වැඩසටහන 2008 වසර තුළදී ද රටපුරා දිස්ත්‍රික් නවයක් ආවරණය කරමින් තවදුරටත් ක්‍රියාත්මක කරනු ලැබුණි. මෙම වැඩසටහන යටතේ වසර අවසානය වනවිට රුපියල් මිලියන 50 කට ආසන්න මුහුණත වටිනාකමකින් යුතු කාසි රැස්කිරීමට හැකියාව ලැබුණි. එම කාසි ප්‍රමාණයේ ටංකන වියදම සහ එම කාසි නිකුත් කිරීම සඳහා දරණ ලද වියදම සැලකිල්ලට ගත් කළ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මෙමගින් ලද ශුද්ධ ප්‍රතිලාභය රුපියල් මිලියන 77 ක් පමණ විය. එසේම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අතීතයේ නිකුත් කරන ලද වටිනාකමින් වැඩි ලෝහයන්ගෙන් යුත් කාසි වෙනුවට අඩු පිරිවැය කාසි නිකුත් කිරීම මගින් ලබාගත හැකි ඉහළ ප්‍රතිලාභය සැලකිල්ලට ගනිමින් මිල අධික ලෝහයන්ගෙන් යුත් කාසි අපනයනය කරන ලදී. 2008 වසරේ දී මෙම ව්‍යාපෘතිය තුළින් උත්පාදිත මුළු ආදායම රුපියල් මිලියන 30 කට ආසන්න විය. තවද, මුදල් නෝට්ටු ගණනය කිරීම සඳහා වැඩි වේගයක් සහිත නව යන්ත්‍ර භාවිතය තුළින් මුදල් නෝට්ටු තේරීමේ සහ සකස් කිරීමේ කටයුතු වඩාත් කාර්යක්ෂමව ඉටුකරන ලදී.

## 5.3 මුදල් පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කිරීම :

මුදල් සම්බන්ධයෙන් පවතින මහජන විශ්වාසය ආරක්ෂා කිරීම මහ බැංකුවේ තවත් වගකීමකි. ඊට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් කාර්යාංශය සමඟ ඉතා සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන ගිය අතර, ව්‍යාජ මුදල් සම්බන්ධයෙන් වූ නඩු විභාග 22 කට සහභාගිවී අවශ්‍ය තොරතුරු ලබාදෙන ලදී. 2008 වසර තුළ අනාවරණය කරගනු ලැබූ සහ ව්‍යාජ මුදල් බවට සහතික කිරීම පිණිස මහ බැංකුව වෙත යොමු වූ ව්‍යාජ මුදල් නෝට්ටු ප්‍රමාණය සැලකීමේ දී, 2008 වසරේ සංසරණයේ පැවැති මුදල් නෝට්ටු මිලියනයකට වූ ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව 02 ක් පමණ විය. තවද ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මුදල් නෝට්ටු සඳහා ඇතුලත් කරනු ලැබූ නව ආරක්ෂණ සළකුණු පිළිබඳව නීතිඥයන්, පොලිස් නිලධාරීන්, මුදල් අයකැම්වරුන් ඇතුළු සාමාන්‍ය මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් ව්‍යාජ මුදල් නෝට්ටු වෙන්කර හඳුනාගැනීමට අවශ්‍ය දැනුම වර්ධනය කරන ලදී. ව්‍යාජ මුදල් නිෂ්පාදනය අකර්මන්‍ය කිරීම පිණිස ඉදිරියේදී හඳුන්වා දීමට නියමිත නව මුදල් නෝට්ටු සඳහා ඇතුළත් කළහැකි නවතම ආරක්ෂණ සලකුණු පිළිබඳව වර්තමාන මුදල් නෝට්ටු මුද්‍රණ ආයතනය වන ඩිලා රූ ලංකා සහ සෙකියුරිටි පුද්ගලික සමාගම සමඟ සාකච්ඡා කරන ලදී.

## 5.4 පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ප්‍රචලිත කිරීම :

සංසරණයේ පවත්නා මුදල් නෝට්ටුවල පිරිසිදුභාවය රැකගැනීම තුළින් ව්‍යවහාර මුදල් නිකුතුව සහ කළමනාකරණය වෙත ලැබෙන ප්‍රතිලාභ රාශියකි. එසේම එය විදේශිකයන් තුළ ශ්‍රී ලාංකිකයන් පිළිබඳව වූ ප්‍රතිරූපය ඔප්නංවන්නකි. මුදල් මනා ලෙස පරිහරණය කිරීමේ පුරුද්ද මුදල් නෝට්ටු වල ආයු කාලය දීර්ඝ කිරීමටත් එමගින් නව මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම සඳහා වන පිරිවැය අවම කිරීමටත් උපකාරී වේ. පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය පවත්වා ගැනීමේ එක් අංගයක් ලෙස මහ බැංකුව නව මුදල් නෝට්ටු සංසරණයට එකතු කිරීම සහ ඊට සමගාමීව සේවා අනිසි මුදල් නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීම සිදුකරන ලදී. කාසි සහ මුදල් නෝට්ටු මනා ලෙස පරිහරණය කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් තුළදී මහජනතාව තවදුරටත් දැනුවත් කරන ලදී. සංසරණයේ පවතින මුදල් නෝට්ටුවල ගුණාත්මකභාවය පවත්වාගැනීම පිණිස මුදල් නෝට්ටු තේරීම පිළිබඳව නිර්දේශයන් සියලු වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද අතර බැංකු විසින් තැන්පත් කරන ලද මුදල් නෝට්ටු වල ගුණාත්මකභාවය තහවුරු කරගැනීම සඳහා නෝට්ටු මිටි නියැදි වශයෙන් පරීක්ෂාවට ලක්කරන ලදී.

## 5.5 නව ව්‍යාපෘති:

### (අ) නව මුදල් නෝට්ටු කාණ්ඩය

සංසරණය පිණිස හඳුන්වා දීමට යෝජිත නව මුදල් නෝට්ටු කාණ්ඩය නිර්මාණය කිරීම සඳහා නිර්මාණශීලී, නිපුණතාපූර්ණ පුරවැසියන්ගේ නිර්මාණ කැඳවමින් දීප ව්‍යාප්ත නෝට්ටු

නිර්මාණ තරගාවලියක් දියත් කරන ලදී. ඊට ප්‍රතිචාර වශයෙන් නිර්මාණකරුවන් 219 දෙනෙකුගෙන් නෝට්ටු නිර්මාණ 1175 ක් ව්‍යාපෘතිය වෙත යොමු විය. අවසන් වටයේදී වඩාත් සුදුසු තරගකරුවන් දෙදෙනෙකු තෝරාගනු ලැබිණි. "සංවර්ධනය සහ සමෘද්ධිය" සහ "ශ්‍රී ලංකාවේ නර්තන ශිල්පීන්" නමැති තේමාවන් යටතේ නව මුදල් නෝට්ටු සඳහා වූ මූලික නිර්මාණ කටයුතු මේ වන විට අවසන් කොට ඇත.

**(ආ) අනුරාධපුර නව මුදල් කෞතුකාගාරය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙවන මුදල් කෞතුකාගාරය අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රයේ දී 2008 සැප්තැම්බර් මස 05 දින විවෘත කරන ලදී. පාසැල් සිසුන් ඇතුළු සාමාන්‍ය මහජනතාවටත් අනුරාධපුර පෞරාණික නගරය වෙත පැමිණෙන දේශීය, විදේශීය සංචාරකයන්ටත් ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල මුදල් පිළිබඳ තොරතුරු ලබාගැනිමට හැකි පහසුකම් සැලසීම මෙහි අරමුණ විය. ක්‍රි.ව. 3 සියවස සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ භාවිත වූ පෞරාණික මුදල් වර්ග, ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත වන තෙක් විවිධ යටත් විජිත යුගයන්හිදී ශ්‍රී ලංකාවේ භාවිත වූ කාසි සහ මුදල් නෝට්ටු, 1951 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ කාසි සහ නෝට්ටු කාණ්ඩයන් ඇතුළු විවිධ විදේශීය රටවලට අයත් කාසි හා නෝට්ටු නව කෞතුකාගාරයේ ඇති ප්‍රදර්ශන අයිතමයන්ගෙන් සමහරකි.

**5.6 මුදල් පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීම :**

දේශන, සම්මන්ත්‍රණ වැඩමුළු සහ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීම, පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය සහ කාර්යක්ෂමව කාසි භාවිතය පිළිබඳව බැංකු නිලධාරීන්, පාසැල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළු සාමාන්‍ය මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී. 2008 වසර තුළ පවත්වන ලද එවැනි වැඩසටහන් ගණන 15 කි.

එසේම ශ්‍රී ලංකාවේ කාසි සහ නෝට්ටු පිළිබඳවත් එහි ඓතිහාසික විකාශය පිළිබඳවත් මහජන අවබෝධය වැඩිදියුණු කිරීම පිණිස පහත සඳහන් ප්‍රදර්ශන සඳහා ද ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සිය දායකත්වය සපයනු ලැබීය.

1. 2008 ජනවාරි මස 25 දින සිට 27 දින දක්වා "අභිමානී 2008" ප්‍රදර්ශනය - අටාල ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරය, කෑගල්ල.
2. 2008 පෙබරවාරි මස 04 දින සිට 10 දින දක්වා "දැයට කිරුළ - 2008" ප්‍රදර්ශනය - බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව.
3. 2008 අප්‍රේල් මස 03 දින සිට 06 දින දක්වා "පුලතිසි නවෝදය" ප්‍රදර්ශනය - තෝපාවැව විද්‍යාලය, පොළොන්නරුව.
4. 2008 දෙසැම්බර් 13 සහ 14 දින "රුහුණු එක්ස්පෝ - ගමින් ලොවට" ප්‍රදර්ශනය - සුචී ජාතික පාසල, හම්බන්තොට.

මෙම ප්‍රදර්ශන සියල්ලකදීම මහජනතාවගෙන් සහ පාසැල් සිසුන්ගෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතා ඉහළ ඇගයීමක් ලැබුණි. රාජගිරිය, ශ්‍රී ලංකා මහ බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ ස්ථාපිත මුදල් කෞතුකාගාරය, මුදල් පිළිබඳ උනන්දුවන්නන්ගේ අවශ්‍යතා ඉටුකිරීම පිණිස සතියේ සෑම දිනකම විවෘතව තබන ලදී.

**5.7 සමරු මුදල් නෝට්ටු සහ කාසි අලෙවි කිරීම :**

2008 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව නව සමරු කාසි කට්ටල 02 ක් නිකුත් කරනු ලැබීය. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම 2007 වසරේ පැවැති ලෝක ක්‍රිකට් තරගාවලියේ අනුශූරයන් වීම සනිටුහන් කරනු වස් නිකුත් කරනු ලැබූ පළමු සමරු කාසි කට්ටලය, රුපියල් 1000 ක මුහුණත වටිනාකමකින් යුතු (නිකල් ආලේපිත වානේ, භාවිතයට පත් නොකළ දීප්තිමත් ආකාරයේ) කාසියකින් සහ දැනට සංසරණයේ පවතින රුපියල් 5 කාසිය සමග සංසරණයේ යෙදීම පිණිස වූ රුපියල් 5 ක මුහුණත වටිනාකමින් යුතු (පිත්තල ආලේපිත වානේ) කාසියකින් සමන්විත විය. දෙවැනි සමරු කාසි කට්ටලය, රුපියල් 1000 ක මුහුණත වටිනාකමකින් යුතු (නිකල් ආලේපිත වානේ, භාවිතයට පත් නොකළ දීප්තිමත් ආකාරයේ) කාසියකින් සහ දැනට සංසණයේ පවතින රුපියල් 2 කාසිය සමග සංසරණයේ යෙදීම පිණිස වූ රුපියල් 2 මුහුණත වටිනාකමකින් යුතු (නිකල් ආලේපිත වානේ) කාසියකින් සමන්විතව සේවක අර්ථසාධක අරමුදලේ 50 වැනි සංවත්සරය අනුස්මරණය පිණිස නිකුත් කරනු ලැබීය.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වඩාත් කාර්යක්ෂම විකුණුම් ප්‍රවර්ධන උපක්‍රමයන් භාවිතයට ගනිමින් මහජනතාවට සහ මුදල් එකතු කරන්නන්හට සමරු මුදල් නෝට්ටු, කාසි සහ කාසි ඇසුරුම් අලෙවි කිරීම දිගටම පවත්වාගෙන යන ලදී. ණය පත් මගින් මිලදී ගැනීමේ පහසුකම සලසා දෙනු පිණිස අවශ්‍ය උපකරණ සමරු කාසි අලෙවි මධ්‍යස්ථානයන්හි පිහිටුවන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය හරහා සමරු කාසි මිලදී ගැනීමේ පහසුකම 2008 අගෝස්තු මස 08 දින සිට ක්‍රියාත්මක කරනු ලැබීය.

# 6. දේශීය කටයුතු

දේශීය කටයුතු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමත් වාණිජ බැංකුවල සහ රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීමත් යන ප්‍රධාන කාර්යයන්හි තවදුරටත් නිරත විය. තවද, තත්කාලීන දළ පියවීම් පද්ධතිය යටතේ පියවීම් කටයුතු නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අරමුදල් පවත්වාගැනීම සඳහා උපකාරක සේවාවක් වශයෙන් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම ද දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

## 6.1. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

### (අ) විවට වෙළෙඳ කටයුතු (වි.වෙ.ක.)

මූල්‍ය ප්‍රතිපත්තියෙහි අවසන් අරමුණ වූ මිල ස්ථායිතාව ළඟාකර ගැනීම සඳහා සංචිත මුදල් කාර්තුගත ඉලක්කයන් තුළ පවත්වාගෙන යාම සඳහා සහ අන්තර්බැංකු පොලී අනුපාතිකයන්හි උච්චාවචනයන් හැකිතාක් දුරටට පාලනය කරගැනීමට දෙපාර්තමේන්තුව විවිට වෙළඳ පොළ කටයුතු සිදු කරන ලදී. ඒ අනුව, සංචිත මුදල් ඉලක්කයන් සපුරාගැනීමසඳහා ද්‍රවශීලතා උකහාගැනීම ඇඩි ලෙස සිදුකරන ලද අතර වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් වෙත මහ බැංකුව වෙතින් ලබාගතහැකි අරමුදල් වලට සීමාවන් පනවන ලදී. බැංකු පද්ධතිය තුළ තවදුරටත් ද්‍රවශීලතා හිඟයන් ඇතිවීම ගොඩනැගීම වැලැක්වීම තුළින් සහ අන්තර් බැංකු පොලී අනුපාතික සඳහා ඉහළ සීමාවක් ඇතිකිරීම මඟින් පොලී අනුපාතයන්හි ඇතිවිය හැකි අතිප්‍රමාණ විචල්‍යතාවයන් වළක්වාගන්නා ලදී.

ද්‍රවශීලතාවය උකහා ගැනීම තාවකාලික පදනමක් යටතේ දිනපතා ප්‍රතිමිලදී ගැණුම් ගනුදෙනු හා නිත්‍ය පදනමක් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සතු වූ භාණ්ඩාගාර බිල්පත් ද්විතීයික වෙළෙඳපොළෙහි ස්ථිර පදනමක් මත විකිණීම තුළින් සිදුකෙරුණි. එයට අමතරව, මෙම වර්ෂයේදී, සාපේක්ෂව දිගුකාලීන පදනමක් මත ද්‍රවශීලතාවය උකහාගැනීම සඳහා දිගුකාලීන පදනමක් සහිත ප්‍රතිමිලදී ගැණුම් ගනුදෙනු හඳුන්වා දෙනු ලැබිණි. තවදුරටත්, නොකඩවා සිදුකරන ලද ද්‍රවශීලතා උකහාගැනීම් නිසා මහ බැංකුව සතුව ප්‍රමාණවත් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් නොමැති අවස්ථාවලදී මහ බැංකුව විසින් දෛනික පදනම මත සහ දිගුකාලීන පදනම මත මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලැබිණි.

මෙම උපාය මාර්ගයන් අනුවම යමින් මහ බැංකුව ද්‍රවශීලතා හිඟයක් ඇතැයි ඇස්තමේන්තු කරන ලද අවස්ථාවකදී වාණිජ බැංකු හා ප්‍රාථමික අලෙවිකරුවන් වෙත සපයනු ලබන මුළු ප්‍රතිවිකුණුම් පහසුකම් ප්‍රමාණය අදාල ඇස්තමේන්තු ගත ප්‍රමාණයට සීමා කරන ලද අතර එක් ආයතනයකට ලබාදෙන පහසුකම් වාර ගණන ආයතනික වශයෙන් මෙන්ම, මාසයකට තුන්වරක් පමණක් වන සේ සීමාකරනු ලැබිණි. මහ බැංකුවේ ප්‍රතිවිකුණුම් අනුපාතය යටතේ ලබාදෙන අරමුදල් වලට අමතර අරමුදල් ප්‍රමාණයන්, 2007 දෙසැම්බර් මස හඳුන්වාදෙන ලද සියයට 19 දණ්ඩ අනුපාතික ප්‍රතිවිකුණුම් පහසුකම් යටතේ ලබාදීම තුළින් ඉහත සඳහන් සීමාවන් නිසා වෙළඳපොල පොලී අනුපාතිකයන්හි ඇති විය හැකි ඇඩි උච්චාවචනයක් වළක්වාගන්නා ලදී. ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොළ භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමෙන් සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය අඩුකිරීම තුළින් ද ද්‍රවශීලතා හිඟය වැඩිවීම මඟ හරවාගන්නා ලදී.

වසරේ මුල් කාර්තු තුන තුළ බැංකු පද්ධතියේ ද්‍රවශීලතා තත්වය සාමාන්‍යයෙන් අතිරික්තයක් පෙන්නුම් කළ අතර, අවසන් කාර්තුවේදී එය හිඟයක් බවට පෙරළිණි. (සටහන 11-1) වසරේ මුල් කාර්තුවේ අතිරික්ත ද්‍රවශීලතාවය සාමාන්‍යයෙන් රුපියල් බිලියන 8 ක් පමණ වුණු අතර එයට මූලික වශයෙන්ම දායක වූයේ දේශීය බැංකු පද්ධතිය තුළට විශාල ලෙස ඇදී ආ විදේශ මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගැනීමය. ඒ අතර රජයට ලැබුණු සාමූහික විදේශ ණය මුදල හේතුවෙන් ජූනි මාසයේදී මෙම ද්‍රවශීලතා අතිරික්තයේ උපරිමය දක්නට ලැබුණි. පූර්ව වර්ෂවලදී මෙන්ම, අප්‍රේල් මස මුල් දෙසතිය තුළදී උත්සව සමය තුළ මුදල් සඳහා ඇතිවන ඉල්ලුම වැඩිවීම හේතුවෙන් ද්‍රවශීලතා හිඟයක් දක්නට ලැබුණ අතර, ඉන්පසුව එම මුදල් නැවත බැංකු පද්ධතිය වෙත ළඟාවීමෙන් ද්‍රවශීලතාවයේ වැඩිවීමක් දකින්නට ලැබුණි. මේ අතර, සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ කාලය පුරාම සැලකිය යුතු ද්‍රවශීලතා හිඟයක් දක්නට ලැබුණි. එය ගෝලීය මූල්‍ය අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස විදේශීය ආයෝජකයින් විසින් රජයේ සුරැකුම්වල කරන ලද විදේශ ආයෝජන වලින් විශාල කොටසක් ආපසු ලබා ගැනීම නිසා ඇති වූ ඉල්ලුම හේතුවෙන් මහ බැංකුවට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් නොකඩවා දේශීය වෙළෙඳපොළ වෙත සැපයීමට සිදුවීමේ ප්‍රතිඵලයකි.

**රූප සටහන II-1**

**වෙළෙඳපොළ ද්‍රවශීලතාවය - 2008**




2008 වර්ෂය මුළුල්ලේම මහ බැංකු ප්‍රතිපත්තිමය පොලී අනුපාතික එනම් ප්‍රතිමිලදී ගැණුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික පිළිවෙලින් සියයට 10.5 ක් සහ සියයට 12 යන මට්ටමේම නොවෙනස්ව පැවැතුණි. මෙම කාලය තුළ දණ්ඩන අනුපාතිකයද සියයට 19 මට්ටමෙන්ම පවත්වාගෙන යනු ලැබුණි.

### (i) විවට වෙළෙඳපොළ කටයුතු වෙන්දේසි

#### දෛනික ප්‍රතිමිලදී ගැණුම්

බැංකු ක්‍රමය තුළ පැවැති අතිරික්ත ද්‍රවශීලතාවය භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැණුම් දෛනික පදනමක් මත වෙන්දේසියේ විකිණීම මගින් උකහා ගනු ලැබීය. රුපියල් බිලියන 6.6 ක් පමණ සාමාන්‍යයෙන් වශයෙන් දෛනික වෙන්දේසි සඳහා ඉදිරිපත් කරන ලද අතර, ඇස්තමේන්තුගත ද්‍රවශීලතාවයෙන් සියයට 71 ක් වූ රුපියල් බිලියන 5.2 ක් වෙන්දේසි තුළින් උකහාගනු ලැබීය. 2008 ජනවාරි මාසයේදී සියයට 11.93 ක්ව තිබූ දෛනික වෙන්දේසිවල සාමාන්‍ය එළදා අනුපාතිකය 2008 දෙසැම්බර් මාසය වන විට සියයට 11.6 ක් දක්වා අඩුවීමක් පෙන්නුම් කළේය.

**රූප සටහන II-2**
**වි.වෙ.ක. ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි - 2008**
**(මාසික සාමාන්‍යයෙන්)**




**දිගුකාලීන ප්‍රතිමිලදී ගැණුම් ගනුදෙනු**

2008 මැයි මාසයේ දී දිගුකාලීන පදනමක් මත ද්‍රවශීලතාවය උකහා ගැනීමේ උපාය මාර්ගයක් වශයෙන්, භාන්ඩාගාර බිල්පත් විකිණීම සඳහා දේශීය කටයුතු දෙපාර්තමේන්තුව දිගුකාලීන ප්‍රතිමිලදී ගැණුම් වෙන්දේසි හඳුන්වාදෙනු ලැබීය. දිගු කාලීන ප්‍රතිමිලදී ගැණුම් වෙන්දේසියේ කාල සීමාව සතියක් වූ අතර, සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 15.94 ක් විය.

**ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

2008 වසරේදී ප්‍රතිවිකුණුම් වෙන්දේසි නොපැවැත්විණි.

**(ii) නිත්‍ය පහසුකම්**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රතිවිකුණුම් අනුපාතයන්ට සහභාගිත්ව ආයතන වෙත නිත්‍ය පහසුකම් සැපයීම දේශීය කටයුතු දෙපාර්තමේන්තුව නොකඩවා සිදුකරන ලදී. අන්තර් බැංකු මූල්‍ය වෙළෙඳපොළෙන් සහ විවට වෙළෙඳ කටයුතු යටතේ සිදුකරනු ලබන වෙන්දේසි තුළින් ස්වකීය කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා කළමනාකරණය කරගැනීමට අපහසු වූ සහභාගිත්ව ආයතන වෙත මෙම පහසුකම සපයනු ලැබීය.

**ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු**

වෙන්දේසීන්හිදී සිය අවශ්‍යතාවයන් සපුරාගැනීමට නොහැකි වූ හෝ වෙන්දේසියේ දී සිය ලංසු ප්‍රතික්ෂේප වූ සහභාගිත්ව ආයතනයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය පහසුකම් තුළ ආයෝජනය කරනු ලබන ප්‍රධාන ආයෝජකයන් වේ. 2008 වර්ෂය තුළදී නිත්‍ය පහසුකම් යටතේ සිදුකරන ලද ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සාමාන්‍යයෙන් දිනකට රුපියල් බිලියන 1.4 පමණ වූ අතර, අතිරික්ත ද්‍රවශීලතාවයේ ප්‍රධාන කොටසක් උකහාගන්නා ලද්දේ විවට වෙළෙඳපොළ කටයුතු යටතේ සිදුකරන ලද දෛනික ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි තුළිනි.

**ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් පහසුකම් සැපයීමේ අරමුණ වන්නේ, සහභාගි වන්නෙකුට අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් මුදල් ලබාගැනීමට නොහැකි අවස්ථාවලදී ඔවුන්ගේ හදිසි ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා අවසාන මූලාශ්‍රය ලෙස කටයුතු කිරීමයි. ඒ නිසාම විශාල ලෙස ප්‍රතිවිකුණුම් පහසුකම් භාවිතා කිරීම අධෛර්යමත් කිරීම සහ සහභාගිත්ව ආයතන වල ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාදීම අතර සමබරතාවයක් පවත්වාගැනීමට මහ බැංකුව උත්සාහ දරනු ලැබීය. ඒ අනුව 2008 පෙබරවාරි 22 වනදා සිට බලපැවැත්වෙන පරිදි ද්‍රවශීලතා හිඟයක් බැංකු ක්‍රමය තුළ පවතින අවස්ථාවකදී පමණක් ලිත් මාසයකට තුන්වරක් දක්වා ප්‍රතිවිකුණුම් අනුපාතිකය යටතේ ප්‍රතිවිකුණුම් පහසුකම් සැපයීමටත්, එම සීමාව ඉක්මවා යන ගැණුම්කරුවෙකු සඳහා සියයට 19 ක් වූ දණ්ඩන පොලී අනුපාතිකයක් යටතේ ප්‍රතිවිකුණුම් පහසුකම් සැපයීමටත් මහ බැංකුව විසින් තීරණය කරන ලදී. එයට අමතරව දණ්ඩන අනුපාතිකය යටතේ ප්‍රතිවිකුණුම් පහසුකම් සැපයීම බැංකු ක්‍රමය තුළ ද්‍රවශීලතාවය සමබරව පවතින දිනවලදීත් සිදුකරන ලදී.

2008 ඔක්තෝබර් මාසයේදී, ගෝලීය මූල්‍ය වෙළෙඳපොළෙහි සිදුවූ අවාසිදායක තත්ත්වයන් නිසා අභ්‍යන්තර වෙළෙඳපොළේ ද්‍රවශීලතා හිඟයක් ඇතිවූ විට, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිවිකුණුම් මිලදී ගැනුම් පහසුකම සඳහා යොදා තිබූ සීමාවන් ලිහිල් කරමින්, සහභාගිත්ව ආයතනයන්ගේ හදිසි ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිවිකුණුම් අනුපාතය යටතේ එක් ලිත් මාසයක් සඳහා ණය ලබාගැනීමේ අවස්ථා 10 ක් දක්වා වැඩිකිරීම සහ තවදුරටත් අවශ්‍ය නම් සියයට 19 කට ණය ලබාගැනීමට සලස්වන ලදී. නමුත් ඇඩි මූල්‍ය ප්‍රතිපත්තීන් තවදුරටත් පවත්වාගෙනයාම සඳහා 2008 නොවැම්බර් 01 වෙනිදා සිට නැවතත් එම සීමාවන් නැවත හඳුන්වා දෙමින් එක් ලිත් මාසයක් සඳහා ණය ලබාගැනීමේ හැකියාව තුන්වරකට සීමා කෙරුණි.

බැංකු පද්ධතියෙහි ඇතිවූ සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය නිසා 2008 වසරේ අවසන් කාර්තුවේදී සහභාගිත්ව ආයතන නිත්‍ය පහසුකම් යටතේ ප්‍රතිමිලදී ගැනීමේ පහසුකම වැඩි වශයෙන් භාවිතා කරන ලදී. ඒ අනුව ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතය යටතේ සහ දන්ඩන අනුපාතයට නිත්‍ය පහසුකම් යටතේ ලබාදුන් ප්‍රතිමිලදී ගැනීම් වල වටිනාකම් පිළිවෙලින් රුපියල් බිලියන 377.5 ක් සහ රුපියල් බිලියන 527 ක් විය.

**(iii) මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම**

ප්‍රමාණවත් භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුව සතුව නොමැති විටදී, අතිරික්ත ද්‍රවශීලතාවයක් උකහාගැනීමට අවශ්‍ය විටදී එක්දින කල්පිරීමේ පදනමක් මත හෝ කාලීන පදනමක් මත මහ බැංකු සුරැකුම්පත් නිකුත්කරන ලදී. එක් දින කල්පිරීමේ පදනම යටතේ, මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීමේ ප්‍රථම වෙන්දේසිය 2008 ජූනි 26 දින සිදුකළ අතර, 2008 ජූලි මස සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළදී අතිරික්ත ද්‍රවශීලතාවය එක්දින පදනමකින් උකහාගැනීම සඳහා මෙම මහ බැංකු සුරැකුම්පත් වැඩි වශයෙන් භාවිතා කරන ලදී.

මෙම කාලපරිච්ඡේදයේ දී සාමාන්‍යයෙන්, රුපියල් බිලියන 6.4 ක් වූ මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසි සඳහා ඉදිරිපත් කරන ලද අතර, එයින් රුපියල් බිලියන 5.2 ක් වූ (සියයට 77.7) ප්‍රමාණයක් පිළිගෙන අතිරික්ත ද්‍රවශීලතාවය උකහාගන්නා ලදී.

2008 ජුනි සිට සැප්තැම්බර් අතර කාලය තුළදී පැවැත්වූ මෙම වෙන්දේසි සඳහා බරතබන ලද ඵලදා අනුපාතිකය සියයට 11.64 ත් 11.89 ත් අතර පරාසයක පැවැතිණි. නිත්‍ය පහසුකම් යටතේ ප්‍රතිමිලදී ගැනීම් අනුපාතයට මහ බැංකු සුරැකුම්පත් නිකුත් කළ අතර, එම නිකුත් කළ ප්‍රමාණය සාමාන්‍යයෙන් දිනකට රුපියල් බිලියන 1.4 ක් පමණ විය.

දිගුකාලීනව අතිරික්ත ද්‍රවශීලතාවය උකහා ගැනීමේ ක්‍රමයක් ලෙස දේක.දෙ. විසින් මහ බැංකු සුරැකුම්පත් කාලීන පදනමක් යටතේ වෙන්දේසි කිරීම කිහිප අවස්ථාවකදී සිදුකරන ලදී. මෙසේ නිකුත් කළ මුළු ප්‍රමාණය රුපියල් බිලියන 10 ක් විය. මෙම කාලීන වෙන්දේසි වල කල්පිරීමේ කාලය සති 2 සිට සති 3 දක්වා පරාසයක වූ අතර, බර තබන ලද ඵලදා අනුපාතයන් සියයට 15.7 ක් පමණ විය.

**(iv) ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු**

නිත්‍ය පදනමක් මත අතිරික්ත ද්‍රවශීලතාවය උකහාගැනීම සඳහා, මහ බැංකුව විසින් දරනු ලබන භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනමක් මත විකිණීමට වෙන්දේසි පවත්වනු ලැබීය. එසේම නිත්‍ය වශයෙන් වෙළෙඳපොළට ද්‍රවශීලතාවය ලබාදීම සඳහා මහ බැංකුව 2008 ඔක්තෝබර් මාසයේ දී ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සඳහා වෙන්දේසි පවත්වන ලදී. මෙය ප්‍රථම වතාවට 2003 වසරේ හඳුන්වාදුන් විවෘත වෙළෙඳ කටයුතු රාමුව යටතේ සිදුකරන ලද වෙළෙඳපොළ පදනම් වූ මුල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය මත සිදුවූවකි.

මෙම ස්ථිර පදනමක් යටතේ සිදුකරන ලද වෙන්දේසිවලදී විකුණූ සහ මිලදී ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් වල මුළු වටිනාකම පිළිවෙලින් රුපියල් බිලියන 26.6 ක් සහ රුපියල් බිලියන 8 ක් විය. මෙම විකුණන ලද භාණ්ඩාගාර බිල්පත්වල පරිණතිය දක්වා වූ ඉතිරි දින ගණන කෙටි වූ අතර දින 10 සහ 49 ක පරාසයක විය. මෙම ගණුදෙනු සිදුකරන අවස්ථාවේ දින 91 ක් වූ ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ හා සැසඳීමේදී ඵලදා අනුපාතයන් ඉතා පහළ මට්ටමක පැවතිනි. නමුත් ස්ථිර පදනමක් මත මිලදීගත් භාණ්ඩාගාර බිල්පත් වල පරිණතිය දක්වා වූ ඉතිරි දින ගණන ඉහළ අගයක් වූ අතර එය දින 53 සිට දින 291 ක් දක්වා වූ පරාසයක විය. මෙම මිලදීගැනීම් වල බරතබන ලද අනුපාතයන් ස්ථිර පදනමක් මත විකිණීම සිදුකරන අවස්ථාවේ ප්‍රාථමික වෙළෙඳපොළේ දින 91 බිල්පත් සඳහා බරතබන ලද සාමාන්‍ය අනුපාතිකයට සංසන්දනාත්මක අනුපාතිකයන්ට වඩා වැඩිවිය.

**ආ) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය**

මූල්‍ය උපකරණයක් ලෙස ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා නියමය ක්‍රියාත්මක කිරීම දේශීය කටයුතු දෙපාර්මේන්තුවේ වගකීමක් වේ. දේශීය විනිමය වෙළෙඳපොල තුළ ඇති වූ ඉල්ලුම සපිරීමට මහ බැංකුව විදේශීය මුදල් වෙළෙඳපොළට මුදාහැරීමට මැදිහත් වීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකු පද්ධතිය තුළ ඇති වූ ද්‍රවශීලතා හිඟය ආර්ථික කටයුතුවලට අයහපත් ප්‍රතිවිපාක ඇති කිරීමට හේතුවක් විය. එබැවින් මෙම ද්‍රවශීලතා හිඟය මග හැරීම සඳහා ස්ථිර පදනම මත බැංකු ක්‍රමය තුළට ද්‍රවශීලතාව මුදා හැරීම සඳහා මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අඩු අඩුකිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, 2001 ඔක්තෝබර් මස 19 වන දින සිට නොවෙනස්ව පැවැති 10% වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය 2008 ඔක්තෝබර් මස 17වන දින සිට බල පැවැත්වෙන පරිදි මුළු තැන්පතු වගකීම් වලින් සියයට දහයේ සිට (10%) සියයට නවයයි දශම දෙකයි පහ (9.25%) දක්වා පදනම් අංක හැත්තෑ පහකින් (75) අඩු කරන ලදී. එමගින් රුපියල් බිලියන හතයි දශම පහක (7.5) ද්‍රවශීලතාවයක් වෙළෙඳපොළට මුදාහරින ලදී. එසේ වුවද, අඛණ්ඩව ඇතිවූ ද්‍රවශීලතා හිඟය නිසා නැවතත් 2008 නොවැම්බර් මස 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය සියයට හතයි දශම හතයි පහ (7.75%) දක්වා පදනම් අංක 150 කින් තවදුරටත් අඩුකරන ලදී. එමගින් වෙළෙඳපොළට මුදාහළ රුපියල් බිලියන 17 වෙළෙඳපොළ ද්‍රවශීලතා හිඟය අඩු කිරීමට රුකුලක් විය.

**ඇ) බැංකු අනුපාතිකය**

මුදල් නීති පනතේ 87 වැනි වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවැතුණි. කෙසේ වුවද, බැංකු අනුපාතිකය යටතේ බැංකු විසින් මහ බැංකුවෙන් ණය ලබා නොගත් හෙයින් මෙම අනුපාතිකය අක්‍රීයව පැවතුණි.

## 6.2. වාණිජ බැංකුවල සහ රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ ක්‍රියාකාරීත්වය.

### 6.2.1 මූල්‍ය ආයතන වල ගිණුම්

මහ බැංකුවට බැංකුවල බැංකුකරු ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් සලස්වමින් කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් සහ පියවුම් ක්‍රමයක් සහතික කරනු වස්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත ජංගම ගිණුම් පහසුකම් සැපයීමෙහි තවදුරටත් නිරත විය. මෙම ගිණුම් මහ බැංකුවේ ස්වයංක්‍රීය පොදු ලෙජර් පද්ධතිය තුළ තත්කාලීන දළ පියවුම් පදනමක් මත ක්‍රියාත්මක විය.

### 6.2.2 රජයේ ගිණුම්

මහ බැංකුවට රජයේ බැංකුකරු වශයෙන් සේවය කිරීම අවශ්‍ය පහසුකම් ලබාදෙමින්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව, රජයේ දෙපාර්තමේන්තු රජයේ නියෝජිතායතන සහ ආයතන සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය බැංකු පහසුකම් සපයමින් ගිණුම් පවත්වාගෙන යාම අඛණ්ඩව සිදුකරන ලදී. 2008 වර්ෂය අවසානයේදී එසේ පවත්වාගෙන යනු ලැබූ ගිණුම් සංඛ්‍යාව 52 කි. වර්ෂය තුළදී රජයේ ඉල්ලුම අනුව ගිණුම් දෙකක් (2) විවෘත කළ අතර, දෙකක් (2) වසා දැමීය. මුදල් නීති පනතේ 89 වගන්තියට අනුව මහ බැංකුව රජයට කෙටි කාලීන අත්තිකාරම් ලබාදීම තවදුරටත් සිදුකරන ලදී. මෙවැනි අත්තිකාරම්වල සීමාව (රජයේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට 10) 2008 වර්ෂයේදී රුපියල් බිලියන 25.1 කින් රුපියල් බිලියන 77 දක්වා වැඩි විය. මෙම අත්තිකාරම් සඳහා පොලී අයකිරීමක් නොවීය.

### 6.3. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම

තත්කාලීන දල පියවුම් ක්‍රමය තුළ මෙහෙයුම් කටයුතු සුමට හා කාර්යක්ෂම ලෙස සිදුවීම සහතික කරනු පිණිස බැංකුවලට සහ ප්‍රාථමික වෙළෙඳුන්ට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීමේ කාර්යයෙහි දෙපාර්තමේන්තුව තවදුරටත් නිරත විය. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම ගාස්තුවකින් තොරව රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් තවදුරටත් සිදුකරනු ලැබීය. සුරැකුම්පත්වල වටිනාකම ඒවායේ වර්තමාන වෙළෙඳපොළ මිල ගණන් අනුව ගණනය කරනු ලබන අතර, එයට වසර තුළ ඇතිවිය හැකි මිල උච්චාවචනයන් ආවරණය කරගැනීම සඳහා ප්‍රමාණවත් ගැලපීමක් කරනු ලැබේ.

වර්ෂය තුළ ලබාගත් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්වල මුළු වටිනාකම සහ එක් දිනකට සාමාන්‍යය, පසුගිය වසරේ පිළිවෙලින් පැවැති රුපියල් බිලියන 1,222 සහ රුපියල් බිලියන 5.03 හා සසඳන විට මෙම වසරේ පිළිවෙලින් රුපියල් බිලියන 2,186 සහ රුපියල් බිලියන 9.07 ක් විය. වර්ෂය තුළ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගෙවීම් පැහැර හැරීම් වාර්තා නොවීය. මහ බැංකු අනුපාතිකය අනුව දඩ පොලියක් නියම කිරීම සහ නැවත නැවතත් ආපසු ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක මෙම පහසුකම අත්හිටුවීම වැනි පියවරයන් ගෙන තිබීම නිසා ලංකා සෙට්ල්හි ව්‍යාපාරික කටයුතු අවසන් කිරීමට පෙර දවස තුළ ද්‍රවශීලතා පහසුකම් ආපසු ගෙවීම නිසි ලෙස සිදුවීම සහතික වී ඇත.

**රූප සටහන II-3**

**2008 ලබාගත් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්**




## 7. ආර්ථික පර්යේෂණ

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ "ආර්ථික බුද්ධි මණ්ඩලය" ලෙස කටයුතු කරමින් සිය ව්‍යවස්ථාපිත වගකීම් අඛණ්ඩව ඉටුකරන ලදී. මෙම අතිශය වැදගත් ව්‍යවස්ථාපිත වගකීම් ඉටුකිරීමේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ආර්ථික, තොරතුරු හා විශ්ලේෂණ සහ උපදෙස් සපයමින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයට සහයවීම සහ රජයේ ආර්ථික උපදේශකයා ලෙස මහ බැංකුවට පැවරී ඇති කාර්යභාරය ඉටුකිරීමට සහායවීම ආදී කටයුතුවල නියැලිණි. මහජනයා වෙත ආර්ථික තොරතුරු හා දත්ත නිකුත් කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති තවත් වැදගත් වගකීමකි. මෙම වගකීම ඉටුකිරීමේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්ති මූලික කරගත් ආර්ථික පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදුකරන ලද, අතර දේශීය සහ ජාත්‍යන්තර මූලාශ්‍ර යන දෙඅංශයෙන්ම ආර්ථික කටයුතු සම්බන්ධ තොරතුරු රැස් කිරීමත්, මුදල් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් මණ්ඩලයට මග පෙන්වීමට අත්‍යවශ්‍ය යෙදවුම් ලෙස එම තොරතුරු විශ්ලේෂණය කිරීමත්, වඩා උචිත ප්‍රතිපත්තීන් සකස් කිරීම සඳහා විවිධ ගැටළු පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමත් සිදුකරන ලදී. මෙයට අමතරව, රජය විසින් වසර තුළදී ආරම්භ කරන ලද නව ක්‍රියාමාර්ග කිහිපයක් සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාශීලීව සිය විශේෂඥ ඥානය සපයන ලදී. එසේම මහ බැංකුවේ වෙනත් දෙපාර්තමේන්තු, රජය සහ වෙනත් විවිධ පාර්ශ්වකරුවන් වෙත ආර්ථික ගැටළු සම්බන්ධව ප්‍රතිපත්තිමය උපදෙස් ලබාදීමද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. ව්‍යවස්ථාපිත හා වෙනත් ප්‍රකාශන, පුවත්පත් නිවේදන, ආර්ථික දර්ශක සහ මහ බැංකු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම ආදී ක්‍රම තුළින් මහජනයාගේ ප්‍රයෝජනය උදෙසා ආර්ථික හා මූල්‍යමය තොරතුරු නිකුත් කිරීම තවදුරටත් අඛණ්ඩව සිදුකරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ සාක්ෂි පාදක පර්යේෂණයන් මූලික වශයෙන් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි යොමු විය. එසේම මෙම පර්යේෂණයන්, ශ්‍රී ලංකාවේ පුළුල් සාර්ව ආර්ථික අරමුණු වලට අනුකූලව ආර්ථිකයේ වෙනත් අංශයන් සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමද ඉලක්ක කර සිදුකරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ මෙම උත්සාහයන් ඊට අයත් වැදගත් කාර්යයක් වන මුදල් මණ්ඩලයේ අවධානය සඳහා විශ්ලේෂණයන් හා නිර්දේශයන් ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන මුදල් ප්‍රතිපත්ති කමිටුවට පහසුකම් සැලසීම හා එහි කටයුතු වඩාත් ශක්තිමත් කිරීම කෙරෙහි විශේෂයෙන් යොමු විය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති කමිටුවේ අදහස් හා විශේෂයෙන් අවධානය යොමුකරන ලද කරුණු ඇතුළත් කර පිළියෙළ කළ මුදල් මණ්ඩල පත්‍රිකා මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ තීරණවලට එළඹීම සඳහා මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ආර්ථිකයේ කාලීන ප්‍රවණතාවයන් පිළිබඳව මුදල් මණ්ඩලය දැනුම්වත් කිරීම සඳහා ආර්ථික තත්ත්වය පිළිබඳ නිතිපතා වාර්තාවක් ලබාදීම ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. කාලීන වැදගත්කමක් සහිත මාතෘකා පිළිබඳ ආර්ථික පර්යේෂණ කටයුතු ද අඛණ්ඩව සිදුවිය. මේ අතුරින් 2008 වසරේදී සම්පූර්ණ කරන ලද පහත සඳහන් පර්යේෂණ පත්‍රිකා "මාණ්ඩලික අධ්‍යයන පත්‍රිකා" වෙළුම 38 අංක 1 සහ 2, 2008 යටතේ ප්‍රකාශයට පත්කරන ලදී.

(අ) "ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ උද්ධමනය කෙරෙහි මුදල් ප්‍රතිපත්තියේ බලපෑම" : සී. අමරසේකර මහතා

(ආ) "මුදල් ඉලක්ක කිරීම සහ උද්ධමනය ඉලක්ක කිරීම - ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සංසන්දනාත්මක විග්‍රහයක්": එස්.එම්.විමලසූරිය මෙනවිය

(ඇ) "අපනයනාභිමුඛ වර්ධන කල්පිතය ශ්‍රී ලංකාවට අදාළ වේද? අපනයනාභිමුඛ වර්ධන කල්පිතය පිළිබඳ කාල ශ්‍රේණි විග්‍රහයක්" : ඩබ්ලිව්. ඒ. දිල්රුක්ෂිනී මිය

(ඇ) "කොටස් වෙළෙඳපොළ කාර්යක්ෂමතාව සහ ඒකාබද්ධතාව - ආසියා ශාන්තිකර කලාපයේ ආර්ථිකයන් අටක් සම්බන්ධ අධ්‍යයනයක්" : දිමුතු සමරතුංග මිය

කලාපීය මහ බැංකු අතර පර්යේෂණ තුළින් ලැබූ ප්‍රතිඵලයන් පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමේ අදහසින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව "මහ බැංකු කටයුතු සහ මූල්‍ය වෙළෙඳපොළ" පිළිබඳ සමාරම්භක පර්යේෂණ සම්මන්ත්‍රණය ද සම්බන්ධීකරණය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සියැසන් (SEACEN) මධ්‍යස්ථානය වැනි ජාත්‍යන්තර සංවිධාන සමඟ හවුල් පර්යේෂණ කටයුතුවල ද නිරත විය. මෙයට අමතරව, මහ බැංකුවේ නිලධාරීන් පර්යේෂණ කටයුතුවල නිරතවීම දිරිමත් කිරීමේ අරමුණින්, දැනටමත් ප්‍රකාශයට පත්කර ඇති පර්යේෂණ පත්‍රිකා අතරින් තෝරා ගන්නා ලද පත්‍රිකා පිළිබඳව සාකච්ඡා මාලාවක් ආරම්භ කරන ලදී. කාලීන මාතෘකා පිළිබඳ අදහස් සාකච්ඡා කිරීම සඳහා සතිපතා සාකච්ඡා මාලාවක් දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලයේ සියලු දෙනාගේම සහභාගිත්වය සහිතව සිදුකරන ලදී.

2008 ජනවාරි 02 දින අදාල සියළුම පාර්ශ්වකරුවන් වෙත ප්‍රකාශයට පත්කරන ලද "2008 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම" (ප්‍රතිපත්ති පෙර දැක්ම - 2008) වාර්තාව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී. 2007 දී ආර්ථිකයේ සහ මුදල් හා මූල්‍ය අංශයේ පැවැති ප්‍රතිපත්ති සහ 2008 සඳහා මුදල් හා මූල්‍ය ස්ථායීතාවය පිළිබඳව වන ඉලක්කයන් සහ ඒවා ළඟාකර ගැනීමේදී ඇති අභියෝගයන් පිළිබඳ විග්‍රහයක් මෙම වාර්තාවේ අන්තර්ගත වේ. මෙම ප්‍රකාශනයේ ප්‍රධාන අරමුණ වූයේ ඉදිරි කාලපරිච්ඡේදය සඳහා පාර්ශ්වකරුවන්ට තම සැලසුම් හා උපාය මාර්ග සකස් කිරීමට හා වඩාත් සුදුසු ලෙස හැඩ ගස්වා ගැනීමට උපකාරී වන පරිදි ප්‍රතිපත්ති පුරෝකථනයන් හා පාරදෘශ්‍යතාවය පුළුල් කිරීමය. එවැනිම ප්‍රතිපත්ති පෙර දැක්මක් 2009 වසර සඳහා ද පිළියෙල කළ අතර එය 2009 ජනවාරි මස 02 දින ප්‍රකාශයට පත්කරන ලදී.

මහ බැංකුවෙන් පිටත විශේෂඥයන්ගේ දැනුම හා අවබෝධය ලබාගැනීම හරහා මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පිහිටුවා ඇති මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුවට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලැබීය. මහාචාර්ය ඒ.ඩී.ඩී. ද එස් ඉන්ද්‍රරත්න (සභාපති), සෝලි කැප්ටන් මහතා, යොහාන් පෙරේරා මහතා, මහේන් දයානන්ද මහතා, ආර්.එම්.බී. සේනානායක මහතා, එම්.පී.ජයවර්ධන මහතා සහ කබ් විජේතුංග මහතා යන සාමාජිකයන්ගෙන් සමන්විත වූ මෙම කමිටුව ආර්ථික ප්‍රවණතාවයන් විශ්ලේෂණය කිරීම සඳහාත් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහාත් මාසික පදනමක් මත රැස්වීය. මෙම කමිටුවේ විශේෂඥ පදනම පුළුල්කිරීමේ අරමුණින් ආචාර්ය ජී.උස්වත්ත ආරච්චි මහතා ද එහි සාමාජිකයෙකු ලෙස 2009 ජනවාරි මස සිට පත්කරන ලදී.

රජයේ ආර්ථික උපදේශකයා ලෙස උපදෙස් සැපයීමේ කාර්යයේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලය වෙත ප්‍රතිපත්ති පත්‍රිකා ගණනාවක් ඉදිරිපත් කරනු ලැබීය. වැදගත් ආර්ථික ප්‍රතිවිපාකයන් ඇතිවිය හැකි, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධව ස්වාධීන මතයන් ඉදිරිපත් කිරීමද දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදුකරන ලදී. රජය ලබාගන්නා සියලුම වර්ගයේ විදේශ ණය වල මූල්‍යමය ප්‍රතිවිපාක පිළිබඳ ඇගැයීම ද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී.

වර්ෂය තුළදී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2008 පළමු මාස හය තුළ කර්මාන්ත ආයතනයන්හි ක්‍රියාකාරිත්වය සහ දැක්ම පිළිබඳ, සියලුම කාර්මික අංශ ආවරණය වන පරිදි එම ප්‍රධාන සමාගම් වල සහභාගිත්වය ද ඇතිව විශේෂ සමීක්ෂණයක් සිදුකරන ලදී. තවද, පළාත් පාලන ආයතන මට්ටමේ රාජ්‍ය මූල්‍ය දත්ත ලබාගැනීම සඳහා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වූ සමීක්ෂණයට අදාළ දත්ත රැස් කිරීම ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. විවිධ ප්‍රතිපත්තීන් හඳුන්වාදීම සම්බන්ධව රාජ්‍ය ආයතන ගණනාවක් සමඟ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සාකච්ඡා පවත්වන ලදී. සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය සහ ඇතැම් උසස් අධ්‍යාපන ආයතන කිහිපයක් සමඟ සිදුකරන ලද ප්‍රතිපත්තිමය මට්ටමේ සාකච්ඡාවන් මෙයට ඇතුළත් වේ. දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික අංශයේ කර්මාන්තවලින් රැස්කරගත් තොරතුරුවල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ විවිධ නියෝජිතයන් සමඟ රැස්වීම් සංවිධානය කිරීමද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ආර්ථික විෂයයන් සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ විවිධ කමිටුවල සහ වෙනත් බාහිර කමිටුවල සේවයේ යෙදෙමින් සිය විශේෂඥ ඥාණය ලබාදෙන ලදී. මෙම කමිටු වලට ජාතික ආර්ථික මණ්ඩලය, විදුලිබල මණ්ඩලයේ සමස්ත ගාස්තු ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම සඳහා වන කමිටුව, විදුලිබල උත්පාදනය පුළුල් කිරීමේ කමිටුව, ආහාර සුරක්ෂිතතාව සහ ජීවන වියදම් කමිටුව සහ සපුගස්කන්ද තෙල්පිරිපහදුව ප්‍රසාරණ හා නවීකරණ ව්‍යාපෘති ඇගැයීම් කමිටුව ඇතුළත් විය. මෙයට අමතරව, රජය විසින් 2008 ඔක්තෝබර් මාසයේදී නැවත ක්‍රියාත්මක කරන ලද තේ සඳහා වන ස්ථායීකරණ අරමුදල සම්බන්ධ කාර්යභාරයන්හි ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව නිරත විය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා මෙම අරමුදලේ සභාපතිවරයා ලෙස පත්කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බහරේන්, ඩුබායි සහ අබුඩාබි හි පවත්වන ලද රජයේ සුරැකුම්පත් ප්‍රචලිත කිරීමේ වැඩසටහන්වලට සහභාගි විය.

මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තා සහ අනෙකුත් විශේෂ වාර්තා භාෂා ත්‍රිත්වයෙන්ම පිළියෙළ කිරීමේ මූලික වගකීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඒ අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්මේන්තුව විසින් මහ බැංකුවේ 2007 වසරේ වාර්ෂික වාර්තාව, මැතකාලීන ආර්ථික

ප්‍රවණතා - 2008 සුවිශේෂ සිදුවීම් සහ 2009 අපේක්ෂාවන්, සහ මාසික විවරණිකාව ප්‍රකාශනය සම්බන්ධීකරණය කරන ලදී. රාජ්‍ය අයවැය පිළියෙළ කිරීම සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව විසින් මුදල් අමාත්‍යවරයාට ඉදිරිපත් කරනු ලබන රහසිගත වාර්තාව වන සැප්තැම්බර් 15 වාර්තාව පිළියෙළ කිරීම ද සම්පූර්ණ කරන ලදී. ආර්ථික කාරණා සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු ලබාදීම සඳහා පැවරී ඇති වගකීමෙහි ඉතා වැදගත් කොටසක් වශයෙන්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්තිය, ගෙවුම් ශේෂය හා ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳව නිතිපතා පුවත්පත් නිවේදන නිකුත් කරන ලදී. එමෙන්ම, විවිධ ආර්ථික ප්‍රවණතාවයන්, ගැටළු, ප්‍රකාශයන් හා දුර්මත පිළිබඳව පැහැදිලි කිරීම සඳහා ද පුවත්පත් නිවේදන කලින් කලට නිකුත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුව හා රජය වෙනුවෙන් වෙනත් ජාත්‍යන්තර බහුපාර්ශ්වික මූල්‍ය සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව ඉටුකරන ලදී. ඒ අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි IV වගන්තිය යටතේ උපදේශාත්මක කටයුතු සඳහා මෙරටට පැමිණි දූත පිරිස සම්බන්ධ කටයුතු, සාර්ක් මූල්‍ය ජාලයේ (SAARCFINANCE) මහ බැංකු අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය, 24 කණ්ඩායමේ අන්තර් රාජ්‍ය හවුල (G-24), පර්යේෂණ හා පුහුණුව සඳහා වන සියැසන් (SEACEN) මධ්‍යස්ථානය සහ සියැන්සා (SEANZA) කණ්ඩායම හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම මීට අයත් විය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අන්තර් ජාතික මූල්‍ය අරමුදල හා සියැන්සා වැනි ජාත්‍යන්තර සංවිධාන සඳහා අවශ්‍ය දත්ත අඛණ්ඩ පදනමක් මත සැපයීම ද සිදුකරන ලදී. මෙම දෙපාර්තමේන්තුව ෆිච් රේටින්ස් (Fitch Ratings) හා එස්. ඇන්ඩ් පී. රේටින්ස් සර්විසස් (S&P Ratings Services) වැනි අන්තර්ජාතික ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන සමඟ ද ඉතා සමීපව අඛණ්ඩව කටයුතු සිදුකරන ලදී. එසේම ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා වෙනත් විවිධ බහුපාර්ශ්වීය හා ද්විපාර්ශ්වීය සංවර්ධන හවුල්කරුවන් අතර සම්බන්ධීකරණ කටයුතුවලදී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට අවශ්‍ය සහාය ලබාදීම ද සිදුකරනු ලැබිය.

# 8. සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.)

සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් මුදල් මණ්ඩලය වෙත පවරා ඇති බලතල, කාර්යභාරයන් සහ ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ කටයුතු මනා සහයක් ලබා දෙයි. සාමාජික දායක මුදල් සහ අධිභාර රැස්කිරීම, සාමාජික ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම, පනත මගින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේ දී දරණ පිරිවැය අරමුදලේ ආදායමින් අයකර ගැනීම, ප්‍රතිලාභීන්ට අදාළ ප්‍රතිලාභ ආපසු ගෙවීම, සාමාජික ගිණුම්වලට අදාළ පොලී බැර කිරීම, අරමුදල පිළිබඳව වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙල කිරීම සහ එම ගිණුම් වාර්තා සෑම වසරකම දෙසැම්බර් මස අවසානයේ සිට තෙමසක් ඇතුළත කම්කරු අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම වැනි සේවක අර්ථසාධක අරමුදලේ කළමනාකරණය හා බැඳුණු බලතල සහ කාර්යභාරයන් ඉටුකිරීමේ වගකීම, පනත ප්‍රකාරව අරමුදලේ භාරකරු වශයෙන් මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. 2008 වසර තුළ දී ද, සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් ඉහත සඳහන් කරන ලද කටයුතු මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තීන්ට අනුකූලව සහ කම්කරු කොමසාරිස් සමග සමීප සම්බන්ධීකරණයකින් යුතුව පවත්වාගෙන යන ලදී.

## 8.1. සාමාජිකත්ව, සාමාජික ශේෂ සහ ප්‍රතිලාභ ගෙවීම්

2008 වසර අවසානයේ දී සේ.අ.අරමුදලෙහි මුළු වටිනාකම (සාමාජිකයන් වෙත වූ මුළු වගකීම) රුපියල් බිලියන 645.0 ක් වූ අතර, එය 2007 වසර අවසානයේ වූ රුපියල් බිලියන 549.4 ට සාපේක්ෂව සියයට 17.40 කින්, එනම් රුපියල් බිලියන 95.6 කින් ඉහළ ගොස් ඇත (සංඛ්‍යා සටහන II-1). සාමාජික සංඛ්‍යාවේ ඉහළයාම සහ වසර තුළ දී ඔවුන් විසින් ගෙවන ලද දායක මුදල් ද වසරේ ආදායම සාමාජිකයන් අතර බෙදා හැරීමද අරමුදලේ මෙම වර්ධනයට හේතු විය. මේ වසරේ දී මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 12.46 දක්වා ඉහළ ගිය අතර, ඒවායින් මිලියන 2.3 ක් පමණ වර්තමානයේදී දායක මුදල් ගෙවනු ලබන ගිණුම් වේ. 2007 වසරේ දී 61,116 ක් වූ දායක මුදල් ගෙවනු ලබන සේවායෝජකයන් සංඛ්‍යාව සියයට 4.7 ක වර්ධනයක් සනිටුහන් කරමින් 2008 වසරේ අවසානය වනවිට 64,000 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, වසරේ ශුද්ධ දායක මුදල (දායක මුදල් ලැබීම් වලින් ප්‍රතිලාභ ගෙවූ පසු ඉතිරිවන දායක මුදල) රුපියල් බිලියන 20.02 ක් ලෙස වාර්තා වූ අතර, පසුගිය වසරේ දී එම අගය රුපියල් බිලියන 18.8 ක් විය. පෙර වසරේදී ගෙවන ලද රුපියල් බිලියන 21.8 සමග සසඳන කළ, සියයට 19.20 ක වර්ධනයක් පෙන්නුම් කරමින් මේ වසර තුළ දී සාමාජිකයන්ට සහ ඔවුන්ගේ නෛතික උරුමක්කරුවන්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම් වශයෙන් රුපියල් බිලියන 25.9 ක් ගෙවනු ලැබූ අතර, ප්‍රතිලාභ ආපසු ගෙවීම් සංඛ්‍යාව පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 2.8 කින් වර්ධනය විය.

**සංඛ්‍යා සටහන II-1**

**අරමුදල පිළිබඳ මූලික දත්ත**

| අයිතමය | 2007 | 2008 | ප්‍රතිශත වෙනස්වීම |
|---|---|---|---|
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව '000 | 11,888 | 12,463* | 4.84 |
| දැනට දායක මුදල් එවනු ලබන ගිණුම් '000 | 2,181 | 2,296* | 5.27 |
| දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම් '000 | 9,707 | 10,167* | 4.74 |
| දායක මුදල එවනු ලබන සේවායෝජකයන් | 61,116 | 64,000* | 4.72 |
| මුළු දායක මුදල (රු. මිලියන) | 40,574 | 45,951 | 13.20 |
| ආපසු ගෙවන ලද මුළු ප්‍රතිලාභ (රු.මිලියන) | 21,752 | 25,931 | 19.20 |
| ප්‍රතිලාභ ලබාදුන් සංඛ්‍යාව | 97,936 | 100,706 | 2.83 |
| සාමාජිකයන් වෙත වූ මුළු වගකීම (රු.බිලියන) | 549.4 | 645.0 | 17.40 |
| අරමුදලේ මුළු වටිනාකම (රු.බිලියන) | 560.4 | 653.2 | 16.56 |

ඇස්තමේන්තුගත*

මූලය : සේවක අර්ථසාධක අරමුදල

## 8.2 අරමුදල් ආයෝජනය හා ප්‍රතිලාභය

### (අ) ආයෝජන කළඹ

2007 වසර අවසානයේ දී රුපියල් බිලියන 541 ක්ව පැවති ආයෝජන කළඹ, 2008 වසර අවසානය වනවිට රුපියල් බිලියන 627 ක් දක්වා සියයට 15.8 කින් වර්ධනය විය. (සංඛ්‍යා සටහන II-2). පසුගිය වසරවලදී මෙන්ම, අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් සිය ආයෝජනයන් සිදුකරන ලද්දේ, අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තියට, එනම්, ප්‍රතිලාභ ගෙවීම් සහ අනෙකුත් වියදම් සඳහා ද්‍රවශීලතාවය පවත්වාගෙන යන අතර සාමාජිකයන්ට දිගුකාලීන ධන මූර්ත පොලී අනුපාතිකයක් තහවුරු කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලවය. ඒ අනුව ආයෝජන කළඹින් සියයට 96.9 ක් රජයේ සුරැකුම්පත්වලින් සමන්විත විය. ඉතිරි කොටස සාංගමික ණයකර සහ ව්‍යාපාර කොටස්වල ද (සියයට 2.5 ක්), අවශ්‍ය ද්‍රවශීලතා මට්ටම පවත්වාගෙන යාමේ අරමුණින්, ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් වැනි (සියයට 0.6) ද්‍රවශීලතාවය වැඩි වත්කම්වල ද ආයෝජනය කෙරුණි.

**සංඛ්‍යා සටහන II-2**

**ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2007 | | 2008 | |
|---|---|---|---|---|
| | රු.බිලියන | දායකත්වය % | රු.බිලියන | දායකත්වය % |
| භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් | 453.7 | 83.8 | 539.6 | 86.0 |
| රජයේ රුපියල් ණය | 68.9 | 12.7 | 68.5 | 10.9 |
| සාංගමික ණයකර | 7.9 | 1.5 | 8.7 | 1.4 |
| සමාගම් කොටස් | 6.7 | 1.2 | 6.9 | 1.1 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සහ වෙනත් ආයෝජන | 4.3 | 0.8 | 3.5 | 0.6 |
| එකතුව | 541.5 | 100.00 | 627.2 | 100.0 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

### (ආ) ආදායම

අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2008 වර්ෂයේ දී රුපියල් බිලියන 79.5 ක් වූ අතර, එය 2007 වර්ෂයේ සමස්ත ආයෝජන ආදායම වූ රුපියල් බිලියන 59.4 හා සසඳන විට සියයට 33.8 ක වර්ධනයක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන II-3). පසුගිය වසර වලදී මෙන්ම, ක්‍රමක්ෂය ලාභ ද ඇතුළත්ව ඉපැයූ පොලී ආදායම අරමුදලේ ප්‍රධානම ආදායම් මූලාශ්‍රය වූ අතර, වට්ටම් කරන ලද අගයට මිලදී ගත් රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ මෙයට හේතුකාරක විය. 2007 වසරේ දී රුපියල් බිලියන 58.8 ක් වූ ක්‍රමක්ෂය ලාභ ඇතුළු පොලී ආදායම, 2008 වසරේදී රුපියල් බිලියන 78.9 ක් දක්වා රුපියල් බිලියන 20.1 කින් වර්ධනය විය. 2008 වසරේ දී අරමුදලේ සාමාන්‍ය ආයෝජන කළඹෙන් ඉපැයූ ප්‍රතිලාභ අනුපාතිකය පෙර වසරේ අගය වූ සියයට 12.7 සිට 13.8 ක් දක්වා ඉහළ ගියේය. පසුගිය වසරවලදී අරමුදලේ සියයට 96.5 ක ප්‍රමාණයක් විවිධ පොලී අනුපාතික යටතේ නිකුත් කරන ලද රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ බැවින්, ආයෝජන කළඹ මගින් ඉපැයූ සමස්ත ප්‍රතිලාභය රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹෙහි කල්පිරීමේ ව්‍යුහය සමග සමීප සහ සම්බන්ධතාවක් පෙන්නුම් කළේය. 2008 වර්ෂය තුළ දී, රජයේ සුරැකුම්පත් මගින් සියයට 13.9 ක බර තබන ලද සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතිකයක් උපයා ගන්නා ලද අතර, වර්ෂය අවසාන වනවිට එකී ආයෝජනයන්හි වාර්ෂික ඵලදා අනුපාතිකයන් විවිධ කල්පිරීම්වලට යටත්ව සියයට 10.4 සිට 15.3 ක් දක්වා පරාසයක පැවතුනි. (සංඛ්‍යා සටහන II - 4). 2008 වසරේ දී, අරමුදල මගින් ව්‍යාපාර කොටස්වල ආයෝජනය මගින් ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ වශයෙන් රුපියල් මිලියන 225 ක් ඉපැයුවද, එම වර්ෂයේ පැවති වෙළෙඳ පොළ අවපාත තත්ත්වය හේතුවෙන්, 2007 වසරේ දී ඉපැයූ රුපියල් මිලියන 434 ට සාපේක්ෂව 2008 වසරේ දී කොටස් වෙළෙඳ පොළින් ලද ආදායම සියයට 48 කින් පහත වැටී තිබිණි. ඒ අනුව 2007 වසරේ දී සියයට 8.3 ක් වූ ව්‍යාපාර කොටස් ආයෝජන කළඹේ සාමාන්‍ය මත වූ ප්‍රතිලාභ අනුපාතය 2008 වර්ෂය තුළ දී සියයට 3.8 ක් දක්වා පහත වැටුනි.

**සංඛ්‍යා සටහන II-3**

**ආයෝජන මගින් ලද ආදායම්**

| ආයෝජන වර්ගය | 2007 | | 2008 | |
|---|---|---|---|---|
| | රු. මිලියන | දායකත්වය % | රු. මිලියන | දායකත්වය % |
| පොලී | 49,885 | 84.0 | 61,445 | 77.3 |
| ලාභාංශ | 146 | 0.2 | 152 | 0.2 |
| ප්‍රාග්ධන ලාභ | 288 | 0.5 | 108 | 0.1 |
| ක්‍රමක්ෂය ලාභ | 8,945 | 15.0 | 17,452 | 22.0 |
| වෙනත් | 158 | 0.3 | 306 | 0.4 |
| මුළු ආදායම | 59,422 | 100.0 | 79,463 | 100.0 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

**සංඛ්‍යා සටහන II-4**

**2008 වසර අවසානයේ වූ රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹෙහි කල්පිරීමේ ව්‍යුහය**

| කල්පිරීම | මුදල රු.මිලියන | දායකත්වය % | බර තැබූ සාමාන්‍ය වාර්ෂික ඵලදා අනුපාතය |
|---|---|---|---|
| එක් වසරකට අඩු | 124,363 | 20 | 10.41 |
| වසර 1-2 | 206,684 | 34 | 15.33 |
| වසර 3-4 | 218,881 | 36 | 14.83 |
| වසර 5 ට වැඩි | 61,780 | 10 | 13.34 |
| එකතුව | 611,708 | 100 | 13.95 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

### (ඇ) වියදම්

2007 දී රුපියල් මිලියන 546 ක් වූ මෙහෙයුම් වියදම්, 2008 වසරේ දී රුපියල් මිලියන 637 ක් දක්වා සියයට 16.5 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-5). 2008 වර්ෂයේ දී අරමුදල විසින් සිය මුළු මෙහෙයුම් වියදම දළ ආදායමින් සියයට 0.80 මට්ටමක පවත්වා ගැනීමට සමත් විය. පසුගිය කාලය පුරා සමස්ථ මෙහෙයුම් වියදම දළ ආදායමින් සියයට 1 කට වඩා අඩු මට්ටමක පවත්වාගෙන යාම අරමුදලේ මූලික ලක්ෂණයකි.

**සංඛ්‍යා සටහන II-5**

**මෙහෙයුම් වියදම්**

| වියදම් අයිතමය | 2007 රු.මිලියන | 2008 රු.මිලියන | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| සේවක පිරිවැය | 318.2 | 323.1 | 1.5 |
| පරිපාලන වියදම් | 211.0 | 289.0 | 37.0 |
| මූල්‍ය වියදම් | 16.9 | 24.7 | 46.7 |
| මුළු මෙහෙයුම් පිරිවැය | 546.1 | 636.8 | 16.5 |
| මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 0.9 | 0.8 | (0.1) |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

## 8.3. සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්

අරමුදලේ සාමාජිකයන්ට පොලිය වශයෙන් ගෙවීම සඳහා 2008 වසරේ දී රුපියල් මිලියන 75,466 ක මුදලක් වෙන් කරන ලදී. (සංඛ්‍යා සටහන II -6). ඒ අනුව, මුළු සාමාජික ශේෂයන් සඳහා ගෙවන පොලී අනුපාතිකය සියයට 13.2 කි.

මෙය පසුගිය වසරේ ගෙවන ලද සියයට 11.2 ක පොලී අනුපාතිකයට වඩා පදනම් අංක 200 ක වැඩි අගයකි. කෙසේ වෙතත්, වර්ෂාවසානයේ ඇති සාමාජික ශේෂය මත පොලී අනුපාතිකය ගෙවීමේ ක්‍රියාපටිපාටියට අනුව, මෙමගින් 2008 වසර සඳහා සියයට 13.44 ක සඵල පොලී අනුපාතිකයක්[1] ලබා දීමට ඇස්තමේන්තු කර ඇත.

**සංඛ්‍යා සටහන II-6**

**සාමාජිකයන්ට ගෙවන ලද පොලී**

රු.මිලියන

| අයිතමය | 2007 | 2008 | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| දළ ආදායම | 59,422 | 79,463 | 33.70 |
| මුළු ක්‍රියාකාරී වියදම් | 546 | 637 | 16.60 |
| ආදායම් බදු | 4,451 | 5,426 | 21.90 |
| සාමාජිකයන්ට බෙදාහැරීම සඳහා ඇති ශුද්ධ ආදායම | 54,612 | 73,618 | 34.80 |
| ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලී (වර්ෂය තුළ) | 879 | 1,152 | 31.20 |
| සාමාජිකයන්ට බෙදාහැරීම සඳහා ඇති ශුද්ධ ආදායම (වර්ෂය තුළ ප්‍රතිලාභ මත ගෙවන ලද පොලිය අඩු කළ පසු) | 53,733 | 72,466 | 34.86 |
| සංචිතවලින් මාරුකිරීම | 1,725 | 3,000 | 73.91 |
| සංචිත වලින් මාරු කිරීමෙන් පසු සාමාජිකයන්ට බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම | 55,458 | 75,466 | 36.07 |
| සාමාජික ශේෂ සඳහා පොලිය | 55,240 | 75,027 | 35.82 |
| ඉදිරියට ගෙන යන ලද ශේෂය | 218 | 439 | 101.40 |
| සාමාජික ශේෂ සඳහා ගෙවූ පොලී අනුපාතය | 11.2% | 13.2% | 2.00 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

## 8.4. සාමාජික ගිණුම් ප්‍රකාශන

2008 වසරේ පළමු අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ සේවායෝජකයන් හරහා 2008 දෙසැම්බර් මාසයේ දී සාමාජිකයන් වෙත ලබාදෙන ලදී. 2008 වසරේ දෙවන අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ 2009 ජුනි මස අවසන් වීමට පෙර සාමාජිකයන් වෙත ලබාදීමට කටයුතු පිළියෙල කර ඇත.

## 8.5. නිවාස ණය පහසුකම

නිවාස ණය ක්‍රමය යටතේ අර්ථසාධක අරමුදල මගින් සාමාජික ගිණුම් ශේෂ මත ඇප සහතිකපත් නිකුත් කිරීම අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. 1988 වර්ෂයේ දී හඳුන්වා දෙන ලද මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය නිකුත් කරන ආයතන 6 කින් එනම්, ලංකා බැංකුව, මහජන බැංකුව, නිවාස සංවර්ධන සහ මූල්‍ය සංස්ථාව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, සමුපකාර ග්‍රාමීය බැංකුව සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් සාමාජිකයින්ට නිවාස ණය ලබා ගැනීමේ පහසුකම් සපයා ඇත. මෙම වර්ෂය තුළදී රුපියල් මිලියන 3,181 ක නිවාස ණය අනුමත කිරීම සඳහා ශේෂ සහතිකපත් 13,133 ක් නිවාස ණය නිකුත් කරන ආයතන වෙත නිකුත් කරන ලදී. (සංඛ්‍යා සටහන II-7) මෙයට අමතරව, 2008 වර්ෂය තුළදී නොගෙවා පැහැර හරින ලද ණය වෙනුවෙන් දළ වශයෙන් රුපියල් මිලියන 1,400 ක මුදලක් ණය සපයන ආයතන වෙත ප්‍රේෂණය කිරීම සඳහා සාමාජික ගිණුම් වලින් අඩු කරන ලදී. වර්ෂ 2000 සිට 2008 කාලය තුළ දී සාමාජිකයින් 137,340 ක් වෙනුවෙන් අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 23.5 ක් වූ අතර, පැහැර හරින ලද ණය වෙනුවෙන් ණය සපයන ලද ආයතන වෙත ප්‍රේෂණය කරන ලද මුදල රුපියල් මිලියන 7,207 ක් විය.

**සංඛ්‍යා සටහන II-7**

**නිවාස ණය පහසුකම්**

| වසර | නිකුත් කරන ලද සාමාජික ශේෂ සහතිකපත් සංඛ්‍යාව | අනුමත කරන ලද නිවාස ණය ප්‍රමාණය (රු.මිලියන) | පැහැර හරින ලද ණය වෙනුවෙන් සේ.අ.අ. ගෙවූ ප්‍රමාණය (රු.මිලියන) |
|---|---|---|---|
| 2000 | 12,938 | 1,648 | 262 |
| 2001 | 16,066 | 2,091 | 381 |
| 2002 | 19,502 | 2,673 | 541 |
| 2003 | 18,689 | 2,792 | 670 |
| 2004 | 14,307 | 2,452 | 735 |
| 2005 | 14,600 | 2,766 | 900 |
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 13,133 | 3,181 | 1,400 |
| **එකතුව** | **137,340** | **23,524** | **7,207** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල

## 8.6. මහජනතාව දැනුවත් කිරීම

2008 වර්ෂය තුළ දී ද මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සේ.අ. අරමුදල මගින් ක්‍රියාවට නගන ලදී. මේ අනුව වර්ෂය

1 සඵල පොලී අනුපාතය = සාමාජිකයන්ට ගෙවූ පොලිය / [ (වසර ආරම්භයේ සාමාජික ගිණුම් ශේෂය + වර්ෂාවසානයේ සාමාජික ගිණුම් ශේෂය)/2]

තුළ දී ජංගම සේවා 02 ක් (වලපනේ නිල්දණ්ඩාහින්න වත්තේ සහ නුවරඑළියේ කැළණිවැලි වත්තේ) සහ සේවකයින් නැවත ලියාපදිංචි කිරීම සහ සාමාජික තොරතුරු විද්‍යුත් මාර්ග යෙන් ලබා ගැනීම පිළිබඳව සේවායෝජකයින් දැනුවත් කිරීම සඳහා සම්මන්ත්‍රණ 10 ක් (ආයෝජන ප්‍රවර්ධන කලාප සඳහා සම්මන්ත්‍රණ 07ක් ද කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල සේවායෝජකයින් සඳහා සම්මන්ත්‍රණ 03 ක් ද) පවත්වන ලදී. තවද, දෙපාර්තමේන්තුව මගින් මහජන ප්‍රදර්ශන දෙකක් (මානව සම්පත් කළමනාකරණ සැපයුම්කරුවන්ගේ ප්‍රදර්ශනය සහ දැයට කිරුළ) සඳහා ද දායකත්වය ලබාදෙන ලදී. මේ අතර, අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම සහ නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අදාළ පුවත්පත් දැන්වීම් කිහිපයක් ද පළ කරන ලදී.

### 8.7. අර්ථසාධක අරමුදලේ 50 වැනි සංවත්සරය

අර්ථසාධක අරමුදලේ 50 වසරක සේවය 2008 ජුනි 1 වැනි දිනට සම්පූර්ණ කරන ලදී. මෙම රන් ජුබිලිය සැමරීම සඳහා අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සහ කම්කරු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව 2008 සැප්තැම්බර් 11 වැනි දින දැනුවත් කිරීමේ වැඩ සටහනක් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී පවත්වන ලදී. මීට අමතරව වර්ග තුනක සමරු කාසි, එනම්, නිකල් ආලේපිත වානේ වලින් නිමාකළ ටංකනය කරන ලද සංසරණයට එකතු නොකළ මුහුණත අගය රුපියල් 1000, නිකල් ආලේපිත දීප්තිමත් වානේ වලින් සාදන ලද සංසරණයට එකතු නොකළ මුහුණත අගය රුපියල් 1000 සහ නිකල් ආලේපිත වානේ වලින් සෑදූ සංසරණයට එකතු කරන ලද මුහුණත අගය රුපියල් 2 කාසි නිකුත් කරන ලදී. කම්කරු දෙපාර්තමේන්තුවේ ද සහභාගීත්වය ඇතිව රූපවාහිනී, ගුවන් විදුලි වැඩසටහන් සහ පුවත්පත් සාකච්ඡාවක් ද පවත්වන ලදී.

### 8.8. පද්ධති නවීකරණය

සාමාජිකයින්ට ලබාදෙන සේවාවන් වල ගුණාත්මක අගය වැඩිකරලීමේ අරමුණින් දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව සාමාජිකත්වය සඳහා සේ.අ. අරමුදලේ වෙබ් අඩවියෙහි දෙවන අදියරය වශයෙන්, සාමාජික තොරතුරු වෙබ් අඩවිය ඔස්සේ ලබාදෙන සේවාවක් දියත් කරන ලදී. මෙමගින් සාමාජිකයින්ට අන්තර් ජාලය හරහා ගිණුම් ශේෂ විස්තර, වර්තමාන දායක මුදල් විස්තර, ප්‍රතිලාභ අයදුම්පතේ සහ නිවාස ණය අයදුම්පතේ වර්තමාන තත්ත්වය දැනගැනීමට හැකිවේ. මෙයට අමතරව කෙටි පණිවුඩ සේවාව (SMS) මගින් තොරතුරු ලබාගැනීමේ පහසුකම ද හඳුන්වා දෙන ලදී. 2008 වසරේ 04 වන කාර්තුව තුළ දී කෙටි පණිවුඩ සේවාව (SMS) මගින් තොරතුරු ලබා ගැනීම සඳහා සාමාජිකයින් 340 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

### 8.9. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම

අර්ථසාධක අරමුදල පූර්ණ වශයෙන් පරිගණකගත කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරෙන නව්‍යකරණ (Re-engineering) වැඩසටහනේ පළමු අදියර ලෙස නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. කම්කරු දෙපාර්තමේන්තුව සහ අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මගින් සියළුම සාමාජිකයන් ජාතික හැඳුනුම්පතේ නම සඳහන්වන ආකාරයට ලියාපදිංචි කිරීම, සාමාජික අංක ලෙස ජාතික හැඳුනුම්පත් අංක ලබාදීම, සාමාජිකයින්ගේ පැරණි ගිණුම් ඒකාබද්ධ කිරීම මෙන්ම ඉතා ඉක්මණින් තොරතුරු ලබා ගත හැකි වඩා සුරක්ෂිත ගිණුම් ක්‍රමයක් සකස් කිරීමේ අරමුණින් සාමාජිකයින්ගේ මාපට ඇඟිලි සළකුණ ලබා ගැනීම ද සිදු කෙරේ. 2008 වසර අවසානය වනවිට සියයට 70 ක පමණ සාමාජිකයන්ගේ තොරතුරු එක්රැස් කිරීම නිමවී තිබිණි. එම තොරතුරු තහවුරු කිරීම හා දත්ත ගබඩා යාවත්කාලීන කිරීම 2009 වසරාවසානය වනවිට නිම කිරීමට අපේක්ෂිතය. බැංකුවක මෙහෙයුම් පද්ධතියකට අනුරූප ආකෘතියක් යටතේ වඩා හොඳ කළමනාකරණ තොරතුරු සහ අවදානම් කළමනාකරණ පද්ධතිද සහිතව සේ.අ. අරමුදල මෙහෙයවීමට මෙම නව්‍යකරණ ව්‍යාපෘතිය මගින් ඉඩ සැළසෙනු ඇත.

## 9. විනිමය පාලන

1953 අංක 24 දරන විනිමය පාලන පනත (සංශෝධිත) යටතේ රජයේ නියෝජිතවරයා වශයෙන් මහ බැංකුවට පවරන ලද විනිමය පාලන කටයුතු සම්බන්ධ කාර්යභාරයන් විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි. ඒ අනුව, 2008 වර්ෂය තුළදී විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වශයෙන් වූ, බලයලත් වෙළෙඳුන්ට හා අනෙකුත් අයට නියෝගයන්/මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම, විදේශ විනිමය ගනුදෙනු සඳහා අනුමැතිය ලබාදීම, විවිධාකාර වූ විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ පරීක්ෂා කිරීම හා විනිමය පාලන පනතේ වගන්ති උල්ලංඝනය කිරීම හා සම්බන්ධ පරීක්ෂණ කටයුතු මෙහෙයවීම සිදුකරනු ලැබීය. ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ඉදිරි දැක්ම 2008 ප්‍රකාශනයෙහි විනිමය පාලන ප්‍රතිපත්ති නියෝග සහ කාර්යයන් එළිදක්වා ඇත. දේශීය සම්පත් පරතරය පියවාගැනීම සහ ගෝලීය මූල්‍ය මධ්‍යස්ථාන ඇගයීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා විනිමය පාලන ප්‍රතිපත්ති නව මුහුණුවරකින් යොදවා ගැනීම සිදුකරන ලදී.

### 9.1 නව නියෝගයන්/මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම

විදේශ විනිමය ගනුදෙනු තවදුරටත් ක්‍රමානුකූලව පවත්වාගෙන යාමෙන් සහ ලිහිල් කිරීමෙන් අන්තර් ජාතික ආයෝජකයන්ගේ විශ්වාසය දිනාගැනීමේ අරමුණු සහිතව 2008 වර්ෂය තුළදී විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් බලයලත් වෙළෙඳුන්ට (බලපත්‍රලාභී වාණිජ බැංකු) සහ අනෙකුත් පාර්ශ්වයන්ට නව නියෝගයන්/මෙහෙයුම් උපදෙස් කිහිපයක් නිකුත් කරන ලදී. එසේ නිකුත් කරන ලද නියෝගයන් මෙහෙයුම් උපදෙස්වල සාරාංශයක් පහත දැක්වේ. මෙම නියෝගයන්/මෙහෙයුම් උපදෙස්වල සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්තාවේ III කොටසින් දැක් වේ.

**(අ) විදේශීය ආයෝජකයින් විසින් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම:**

විදේශීය රටවලපුරවැසියන්, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කළ ආයතන සහ විදේශීය සංස්ථායික ආයෝජකයින් එනම් විදේශීය රටවල අරමුදල්, සහයෝගිතා අරමුදල් සහ ප්‍රාදේශීය අරමුදල් යනාදියට භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමට, විකිණීමට සහ පැවරීමට විශේෂ රුපියල් ගිණුමක් එනම්,

"භාණ්ඩාගාර බිල්පත් ආයෝජන බාහිර රුපියල් ගිණුම" (TIERA-2) හරහා සිදු කිරීමට අවසර දී ඇති අතර එකී සියලුම ආයෝජනවල එකතුව නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල මුළු වටිනාකමින් 10% නො ඉක්මවිය යුතුය.

**(ආ) මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්:**

ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි අපනයනකරුවන් දිරිගැන්වීමේ උපාය මාර්ගයක් වශයෙන් ඔවුන්ගේ විදේශ විනිමය අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීම පිණිස "මැණික් හා ස්වර්ණාභරණ අපනයකරුවන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම"නමින් ගිණුමක් ආරම්භ කිරිමට සහ පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් වෙත අවසරය ප්‍රදානය කරනු ලැබීය.

**(ඇ) විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (SFIDA) :**

විදේශ පුරවැසියන්, ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කළ ආයතන සහ විදේශීය සංස්ථායික ආයෝජකයින් එනම්, දේශීය අරමුදල්, සහයෝගිතා අරමුදල් සහ ප්‍රාදේශීය අරමුදල් වෙනුවෙන් අනුමත විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල් වලින් ස්ථාවර හා ඉතිරිකිරීමේ තැන්පතු ගිණුම් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවසර ලබාදෙන ලදී. අවම තැන්පතු මුදල වන ඇ.එ.ජ.ඩොලර් 10,000 හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍ය වන ප්‍රමාණයකින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල දේශීය බැංකු ඒකකයන්හි මෙම ගිණුම් පවත්වාගෙන යා හැකි අතර බලයලත් වෙළෙන්දෙකු සතු විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් වල ශේෂයන්හි සම්පූර්ණ වටිනාකම දේශීය බැංකු ඒකකයෙහි මුළු තැන්පතු ප්‍රමාණයෙන් 20% නො ඉක්මවිය යුතුය. විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් ආදායම් රඳවුම් බදු සහ හර බදු වලින් නිදහස් කරන ලදී.

**(ඈ) අනේවාසික ආවෘත ගිණුම් වලින් ප්‍රතිමුඛ ප්‍රේෂණ:**

පවතින අනේවාසික ආවෘත ගිණුම්වල 2008 ජූලි 01 දින බැරට පවතින සම්පූර්ණ ශේෂය, ගිණුම් හිමියාට හෝ ගිණුම් හිමියාගේ නිත්‍යානුකූල ප්‍රතිලාභීන්ට ප්‍රතිමුඛ ප්‍රේෂණ ලෙස නිදහස් කිරීමට බලයලත් වෙළෙඳුන්ට අවසරය දෙනු ලැබීය. පවත්වාගෙන යන ආවෘත ගිණුම්වලට 2008 ජූලි 01 දිනට පසු තැන්පත්කරන මුදල් හෝ එදිනට පසුව ආරම්භ කරන ලද ආවෘත ගිණුම්වල තැන්පතුවලින් වාර්ෂිකව ඇ.එ.ජ.ඩොලර් 20,000 උපරිමයකට යටත්ව ප්‍රතිමුඛ ප්‍රේෂණයන් කිරීම සඳහා ද අවසරය දෙනු ලැබීය.

**(ඉ) විගාමිකයන් සඳහා විදේශ විනිමය අලෙවිය**

පවුල් ඒකකයකට හෝ තම පවුලේ අනෙකුත් සාමාජිකයන් සමඟ කැටුව නොයන තනි පුද්ගලයෙකුට ඔවුන් ශ්‍රී ලංකාවෙන් අපගමනයේ දී පෞද්ගලික ස්වර්ණාභරණ සහ පෞද්ගලික බඩුබාහිරාදියෙහි වටිනාකම ද ඇතුළත්ව ඇ.එ.ජ.ඩොලර් 150,000 හෝ අනුමත විදේශ ව්‍යවහාර මුදලින් ඊට තුල්‍ය වන අගයක උපරිමයකට යටත්ව ප්‍රතිමුඛ ප්‍රේෂණයන් සඳහා විදේශ විනිමය විකිණීමට බලයලත් වෙළෙඳුන්ට අවසර දෙනු ලැබීය. ඇ.එ.ජ.ඩොලර් 150,000 කට වැඩිවන මුදල් විගාමිකයන්ගේ නමින් ආවෘත ගිණුමකට බැර කිරීම කළයුතු වේ.

**(ඊ) විදේශීය ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ ගිණුම් :**

රජය හඳුන්වා දුන් "ශ්‍රී ලංකා මගේ සිහින නිවාස වැඩ සටහන" (My dream home programme) යටතේ නේවාසික වීසා මත ශ්‍රී ලංකාවේ රැඳී සිටින කාලය දීර්ඝ කර ගැනීමට බලාපොරොත්තු වන විදේශීය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ඔවුන්ගේ ගනුදෙනු පහසුකර ගැනීම සඳහා "ජ්‍යෙෂ්ඨ විදේශීය පුරවැසි ස්ථිර තැන්පතු ගිණුම" (SFNFDA) හඳුන්වා දෙන ලදී. අවම වශයෙන් ඇ.එ.ජ.ඩොලර් 15,000 ක් හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍ය වන ප්‍රමාණයක් මෙම ගිණුම ආරම්භ කිරීම සඳහා තැන්පත් කළ යුතුය. ඊට අමතරව ශ්‍රී ලංකාව තුළදී ඔවුන්ගේ නඩත්තුවට යන වියදම් සඳහා ප්‍රධාන අයදුම්කරු වෙනුවෙන් ඇ.එ.ජ.ඩොලර් 1,500 ක් හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍ය වන ප්‍රමාණයක් සහ තමා කැටුව එන කලත්‍රයා සහ එක් එක් යැපෙන දරුවන් සඳහා ඇ.එ.ජ.ඩොලර් 750 ක් හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍ය වන ප්‍රමාණයක මාසික ප්‍රේෂණයන් ශ්‍රී ලංකා රුපියල් ගිණුමක තැන්පත් කිරීම අවශ්‍ය වනු ඇත.

**(උ) එතෙර ගමන් කරන ශ්‍රී ලාංකිකයන්ට විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම :**

එතෙර ගමන් කරන ශ්‍රී ලාංකිකයන් සඳහා ලබාදෙනු ලබන විදේශ ගමන් දීමනාවේ කොටසක් වශයෙන් දැනට නිකුත් කරනු ලබන විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය ඇ.එ.ජ.ඩොලර් 1,000 සිට ඇ.එ.ජ.ඩොලර් 2,000 හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍ය වන ප්‍රමාණයක් දක්වා වැඩිකරන ලදී.

**(ඌ) ශ්‍රී ලංකා රජය විසින් 2007 දී නිකුත්කරන ලද අන්තර්ජාතික රාජ්‍ය සුරැකුම්පත් සම්බන්ධ ගනුදෙනු සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා අවසර ලබාදීම:**

විනිමය පාලන පනතෙහි 7 (අ) වගන්තියෙහි ප්‍රතිපාදන ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයන්ට අන්තර්ජාතික රාජ්‍ය සුරැකුම්පත් මිළදී ගැනීම් සම්බන්ධ ගෙවීම් කිරීමට බලයලත් වෙළෙඳුන් වෙත අවසර ලබාදෙනු ලැබූ අතර, 11(2) සහ 17(2) වගන්තීන් හි ප්‍රතිපාදන ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයින්ට අන්තර් ජාතික රාජ්‍ය සුරැකුම්පත් පැවරීම සහ බලයලත් වෙළෙඳුන් අතර එවැනි අන්තර් ජාතික රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු කිරීමට අවසර ලබා දෙන ලදී.

**(එ) එතෙර ගමන් සඳහා විදේශ විනිමය නිදහස් කිරීමේ මෙහෙයුම් යෝජනා ක්‍රමය:**

එතෙර ගමන් කරන්නන් සඳහා එක් පුද්ගලයෙකුට නිදහස් කරන විදේශ විනිමය ප්‍රමාණය ඇ.එ.ජ.ඩොලර් 5,000 හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍ය වන ප්‍රමාණයකට වැඩි ඕනෑම විදේශ විනිමය ප්‍රමාණයක් සඳහා 2008.11.03 සිට මාසික පදනම යටතේ විනිමය පාලක වෙත වාර්තා කළයුතු බව බලයලත් වෙළෙන්දන් ගෙන් ඉල්ලා සිටිනු ලැබීය.

**(ඒ) නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම් විවෘත කිරීම:**

නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම් ආරම්භ කළ හැකි අවම තැන්පතු අවශ්‍යතාවය දැනට පවතින ඇ.එ.ජ.ඩොලර් 500 හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍යවන ප්‍රමාණයක සිට ඇ.එ.ජ.ඩොලර් 100 හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට තුල්‍ය වන ප්‍රමාණයක් දක්වා අඩුකරන ලදී.

**(ඔ) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) සහ නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම්වල බැරට විදේශ ව්‍යවහාර මුදල් භාරගැනීම :**

ගිණුම් හිමියා විසින් ගෙන එන ලදුව අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) සහ නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුමෙහි බැරට තැන්පත් කරනු ලබන අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඕනෑම ප්‍රමාණයක මුදලක් විදේශ ගමන් බලපත්‍රය මත රේගු තහවුරුවක් නොමැතිව හෝ රේගු ප්‍රකාශන කාඩ්පත රහිතව භාරගැනීමට බලයලත් වෙළෙඳුන්ට අවසර දෙන ලදී. සමීපතම පවුලේ සාමාජිකයන්ගෙන් අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම්වල බැරට අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඕනෑම ප්‍රමාණයක මුදලක් භාර ගැනීමට ද බලය ප්‍රදානය කරනු ලැබීය.

**(ඕ) පූර්ව ගෙවීමේ පදනම මත කරන ආනයනයන් මත වන ආන්තික තැන්පතු අවශ්‍යතාව:**

පූර්ව ගෙවීමේ පදනම මත ආනයනය කිරීමේදී එම භාණ්ඩ ඇතුළත් මුළු ඉන්වොයිස් වටිනාකම මත වූ 100% ක ආන්තික තැන්පතුවක්, එම භාණ්ඩ සඳහා ගෙවීම් කරනු ලබන අවස්ථාවේ ආනයනකරු විසින් බැංකුව වෙත තැබීමට නියම කරන ලදී. ආන්තික තැන්පතු අවශ්‍යතාවය, ප්‍රති අපනයන සඳහා අන්තරාල වෙළෙඳාම (Entrepot Trade) යටතේ ගෙන්වන ලද භාණ්ඩ සඳහා කොන්දේසීන්ට යටත්ව නිදහස් කරන ලදී.

## 9.2 විදේශයන්හි ආයෝජනය හා විදේශයන් ගෙන් ණය ලබාගැනීම සඳහා අනුමැතිය

විදේශයන්හි ආයෝජනයට හා විදේශීය ණය ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීම් 85 අතුරින්, විනිමය පාලන පනතේ අදාළ වගන්තිවලට ප්‍රකාරව පහත දැක්වෙන ඉල්ලීම් 41 සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අවසර ලබාදෙන ලදී.

(අ) නේවාසික සමාගම් 20 කට ප්‍රධාන වශයෙන් ආයෝජන බැංකු, භාණ්ඩ නැව්ගත කිරීම්, සිල්ලර වෙළෙඳ කටයුතු සහ සේවක කොටස් මනාප යෝජනා ක්‍රම යන ක්ෂේත්‍රයන් හි විදේශ රටවල ආයෝජනය සඳහා අවසර ලබාදෙන ලදී. එසේ අවසර ලබාදෙන ලද ආයෝජනයන්ගේ සම්පූර්ණ වටිනාකම ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 7.16 ක් විය.

(ආ) නේවාසික සමාගම් 21 ක් සඳහා දළ වශයෙන් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 124.36 ක ප්‍රමාණයක විදේශීය ණය මුදල් ලබාගැනීම සඳහා අවසර ලබාදෙන ලදී.

## 9.3 භාණ්ඩ නැව්ගත කරන්නන්, මුදල් මාරුකරන්නන් හා සීමිත බලයලත් වෙළෙඳුන්හට (Restricted dealers) අවසරපත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම

පහත දැක්වෙන පරිදි භාණ්ඩ නැව්ගත කරන්නන්, මුදල් මාරුකරන්නන් සහ සීමිත බලයලත් වෙළඳුන්හට (Restricted dealers) බලපත්‍ර නිකුත් කිරීම විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී.

(අ) නව සමාගම් 29 ක් භාණ්ඩ නැව්ගත කරන්නන් ලෙස ලියාපදිංචි වූ අතර එමගින් 2008 වර්ෂය අවසාන වන විට භාණ්ඩ නැව් ගතකරන්නන් ලෙස ලියාපදිංචි වූ සමාගම්වල එකතුව 277 ක් විය.

(ආ) නව බලපත්‍ර 5 ක් විදේශ විනිමය හුවමාරු කරන ආයතන (Money Changers) සඳහා ලබාදුන් අතර බලපත්‍ර තුනක් අහෝසි කිරීමට කටයුතු කරන ලදින් මුළු විදේශ විනිමය හුවමාරු කරන ආයතන ගණන 68 දක්වා ඉහළ යන ලදී. තවද එ.ජ.ඩොලර් මිලියන 4 ක් වන වාර්ෂික විදේශ විනිමය මිලදී ගැනීමේ කඩඉම ඉක්මවා ගිය විදේශ විනිමය හුවමාරු කරන ආයතන 10 කට විදේශ විනිමය විකිණීම සඳහා අවසර ලබාදෙන ලදී.

(ඇ) තීරු බදු රහිත සාප්පු, සංචාරක හෝටල්, සංචාරක ආපනශාලා, සංචාරක නියෝජිතවරුන් හා මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳුන් යනාදීන්ගෙන් සමන්විත වූ අනෙකුත් සීමිත බලයලත් විදේශ විනිමය වෙළෙඳුන් සඳහා නව බලපත්‍ර 50 ලබාදීමට කටයුතු කරන ලද අතර, එම වෙළෙඳුන් මුළු ගණන 701 දක්වා වසර තුළදී ඉහළ යන ලදී.

## 9.4 විදේශ විනිමය ගනුදෙනු සුපරීක්ෂණය

වෙළෙඳපොළ විනය ප්‍රවර්ධනය කිරීම පරමාර්ථ පෙරදැරිව, බලයලත් වෙළෙඳුන්, සීමිත බලයලත් වෙළඳුන් හා මුදල් මාරුකරන්නන් යන පාර්ශ්වයන්ගෙන් සමන්විත වූ විදේශ විනිමය ගනුදෙනු වාර්තා කිරීමේ ක්‍රියාවලියෙහි සුපරීක්ෂණ කළමනාකරණය විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් ශක්තිමත් කරන ලදී. අනුමත විදේශ විනිමය ප්‍රේෂණ යෝජනා ක්‍රම හා ආනයන අපනයන විද්‍යුත් මුදල් පැවරුම් කාඩ්පත් හරහා සිදුවූ විදේශ විනිමය විකිණීම් හා මිලදී ගැනීම් ඇතුළත් වූ දත්ත වාර්තා කිරීම සිදුකරන ලදී. 2008 වර්ෂය තුළදී සංවර්ධනය කිරීමට යෙදුනු ජාලගත වාර්තා කිරීමේ ක්‍රමය සම්පූර්ණ කරන ලදී. මෙම ක්‍රමය නිසා විනිමය පාලන දෙපාර්තමේන්තුවට මාංගත පද්ධතිය (On Line) විමර්ශනය කිරීමේ ක්‍රමවේදයක් ඇතිකිරීමට හැකිවූ අතර ඉන් විදේශ විනිමය ප්‍රවාහයන් පිළිබඳ තක්සේරුව පහසු වී ඇත.

**9.5 විනිමය පාලන ආඥාපනතේ වගන්ති උල්ලංඝනයවීම් සම්බන්ධ විමර්ශන කටයුතු**

විවිධ පාර්ශ්වයන් විසින් විනිමය පාලන පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් විමර්ශන 135 ක් 2008 වර්ෂය තුළදී සිදුකරන ලද අතර, ඊට අදාළව එම පාර්ශ්වයන් වෙත පනවන ලද රු.16,890,331/19 දඩ මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

මෙම විමර්ශනයන් මූලික වශයෙන්ම අවසර නොලත් විදේශ මුදල් මිලට ගැනීම්, අනවසරයෙන් විදේශ මුදල් හුවමාරු කිරීම්, අදාල විනිමය පාලන නීතිවලට පටහැනිව සමාගම් කොටස්වල ආයෝජනය කිරීම් සම්බන්ධයෙන් හා අනවසරයෙන් විදේශ මුදල් මිලට ගැනීම් සම්බන්ධව තනි පුද්ගලයන්ට හා සංස්ථාගත ආයතනවලට එරෙහිව පවත්වන ලදී.

**9.6 වෙනත් ක්‍රියාකාරකම් : විදේශ රටවල සේවකයන් විසින් සිදුකරනු ලබන ප්‍රේෂණ පිළිබඳ දැනුවත් කිරීම**

බැංකු සහ අනෙකුත් නිල මාර්ග හරහා විදේශ මුදල් ප්‍රේෂණය කිරීමේ කටයුත්ත ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙන් විදේශ විනිමය ප්‍රේෂණය කරන්නන් දැනුවත් කිරීමේ අරමුණින් විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා වාණිජ බැංකුවල සහභාගිත්වය ඇතිව, විදේශ රැකියා සඳහා පිටත්ව යාමට අපේක්ෂිත 300 ක් සහභාගිත්වයෙන් කුරුණෑගලදී එක් දිනක දැනුවත් කිරීමේ වැඩසටහනක් මෙහෙයවන ලදී. මෙහිදී විදේශ රැකියාභිමුඛ පුද්ගලයින්ට විදේශ මුදල් ගනුදෙනුවලදී ඇතිවිය හැකි බාධාකාරී තත්ත්වයන් හා ගැටළු නිරාකරණය කරගැනීමට හැකිවිය.

# 10 මූල්‍ය බුද්ධි ඒකකය

මූල්‍ය බුද්ධි ඒකකය 2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධි විධානයන්ට අනුකූලව 2008 වර්ෂය තුළදී ද සිය කාර්යයන් ඉටු කරනු ලැබීය. එහි ප්‍රධාන කාර්යයන් වනුයේ, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති ආකාරයට මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදය මූල්‍යනය කිරීම හා නීති විරෝධී කටයුතු වලට සම්බන්ධ මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු එකතු කිරීම, සැකකටයුතු ගනුදෙනු පිළිබඳ විමර්ශණ පැවැත්වීම, විමර්ශණ පිළිබඳ තොරතුරු හා විස්තර, අදාළ නියාමන හා නීති බලධාරීන්ට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ලබාදීම සහ නීති මගින් ආවරණය වන වැරදි වැළැක්වීම සඳහා ගණුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම හා සැකකටයුතු ගනුදෙනු වැළැක්වීම පිළිබඳව රෙගුලාසි නිකුත් කිරීමයි.

**10.1 තොරතුරු එකතුව හා විමර්ෂණය**

මූල්‍ය බුද්ධි ඒකකය පනවන ලද අවශ්‍යතාවන්ට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය ආයතන හා කොටස් තැරැව්කාර ආයතනයන්හි මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ සීමාව වන රු. 500,000 හෝ ඒ හා සමාන විදේශ මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් හුවමාරු පිළිබඳව 2008 මැයි 31 දක්වා පැවැති සීමාව, 2008 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි රු. 1,000,000 හෝ ඒ සමාන විදේශ මුදල් ප්‍රමාණයක් දක්වා ඉහළ නංවනු ලැබිණි. වර්ෂය තුළදී වාර්තා කිරීමේ ආයතන රක්ෂණ කර්මාන්තය ද ආවරණය වන පරිදි ව්‍යාප්ත කරන ලදී. වාර්තා කරනු ලබන ආයතන වලින් ලැබෙන තොරතුරු/දත්ත විශ්ලේෂණය කිරීමට නිර්මාණය කරන ලද “ලංකාෆින්”("LankaFIN") තොරතුරු තාක්ෂණ පද්ධතිය වර්ෂය තුළ දී සම්පූර්ණ කරන ලදී. මෙම පද්ධතිය දශ ලක්ෂ 2.5 කට වැඩි ගනුදෙනු සංඛ්‍යාවක් සියුම් ලෙස පරීක්ෂා කිරීම සඳහා සහ සැක කටයුතු ගනුදෙනු 247 ක් පරීක්ෂා කිරීමට මූල්‍ය බුද්ධි ඒකකයට හැකියාව ලබාදෙන ලදී. මෙයට අතිරේකව වාර්තා කරන ආයතන සැක කටයුතු ගනුදෙනු පිළිබඳ වාර්තා 90 ක් යොමුකරනු ලැබීය. මූලික විමර්ෂණ කටයුතු අවසන් කිරීමෙන් පසුව, සැක කටයුතු ගනුදෙනු 12ක් නීති බලාත්මක අධිකාරීන් වෙත යොමුකරන ලදී. නීතිපති දෙපාර්තමේන්තුව හා අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව මගින් සැකකටයුතු ගනුදෙනු දෙකකට අදාලව අධි චෝදනා පත්‍ර ගොනුකරන ලදී.

**10.2 නිර්දේශ / රෙගුලාසි නිකුත් කිරීම හා ක්‍රියාත්මක කිරීම**

මූල්‍ය බුද්ධි ඒකකය පහත දැක්වෙන නිර්දේශ / රෙගුලාසි නිකුත් කරන ලද අතර ඒවා මෙම වාර්තා වේ III කොටසේ සවිස්තරව දක්වා ඇත.

I) රක්ෂණ කර්මාන්තය සඳහා “ගනුදෙනුකරු හඳුනාගැනීම සහ ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීමට අදාළ වන නීති” මෙම නීති මගින් රක්ෂණ සමාගම් තම ගනුදෙනුකරුවන් ගේ ගනුදෙනුවල ස්වභාවය හා මුදල් ලබාගන්නා මූලාශ්‍ර පිළිබඳව විස්තරාත්මක තොරතුරු පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

   තවද, රක්ෂණ සමාගම් විසින් සේවකයන් පුහුණු කිරීම, ලිඛිත ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි හා අභ්‍යන්තර පාලනයන් ඇතුළත් මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ වැඩසටහන් ස්ථාපිත කිරීමද අවශ්‍ය වේ.

II) මුදල් විශුද්ධිකරණය වැලැක්වීම හා ත්‍රස්තවාදීන්ට මුදල් ගලායාම වැලැක්වීමට සහ යහපාලනය ශක්තිමත් කිරීම සඳහා, වාර්තා කරනු ලබන ආයතන වලට ගනුදෙනු කරු හඳුනාගැනීම හා ගණුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීමේ ක්‍රියාමාර්ග දැඩිව ස්ථාපිත කිරීමට සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් වල පැවති සමහර අනුකූලතා දෝෂයන් නිරාකරණය කිරීම සඳහා නව නියමයන් හතරක් නිකුත් කරන ලදී.

**10.3 වෙනත් කටයුතු**

**I. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම**

සැක කටයුතු ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා මලයාසියානු මහ බැංකුව (Bank Nagara Maleysia) ඇෆ්ගනිස්ථාන මහ බැංකුව

(Da Afghanistan Bank) සහ කොරියානු මූල්‍ය බුද්ධි ඒකකය සමඟ අවබෝධතා ගිවිසුම් 3 ක් 2008 වර්ෂය තුලදී අත්සන් කරනු ලැබිණි.

**II. ආයතනික ව්‍යුහය ගොඩනැංවීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

බස්නාහිර, මධ්‍යම, උතුරු මැද සහ දකුණු පළාත් ආවරණය වන පරිදි පුහුණු කිරීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 15 ක් 2008 වර්ෂය තුළ පවත්වන ලදී. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය ආයතන, පොලිස් දෙපාර්තමේන්තුව, අධ්‍යාපනික ආයතන සහ පොදු මහජනතාව නියෝජනය කරමින් පුද්ගලයින් 2300 ට වැඩි පිරිසක් මෙම වැඩසටහන්වලට සහභාගි විය. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ ගනුදෙනු විශ්ලේෂණය කිරීම, හඳුනාගැනීම සහ වාර්තා කිරීම මෙහිදී සාකච්ඡාවට බඳුන් විය.

**III. ජාත්‍යන්තර සබඳතා**

(අ) එග්මොන්ට් කණ්ඩායම ((Egmont Group)

තම සාමාජිකයන් අතර, සුහදතාවය වර්ධනය කරගැනීම සහ මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාල විමර්ශන තොරතුරු හුවමාරු කරගැනීමට මූල්‍ය බුද්ධි ඒකකයන්ගේ සහභාගිත්වයෙන් එග්මොන්ට් කණ්ඩායම 1995 දී පිහිටුවා ගන්නා ලදී. ශ්‍රී ලංකාව විසින් මෙම කණ්ඩායමෙහි සාමාජිකත්වය සඳහා 2006 වර්ෂයේ දී යොමුකරන ලද අයදුම්පතට අනුකූලව 2008 වර්ෂය තුළදී "විමර්ශණ තත්ත්වය" (Observer Status ) හිමිවිය. පූර්ණ සාමාජිකත්වය 2009 වර්ෂය තුලදී ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

(ආ) මුදල් විශුද්ධිකරණය සඳහා වන ආසියා ශාන්තිකර කණ්ඩායම (Asia Pacipic Group on Money Laundering)

ශ්‍රී ලංකාව සාමාජික රටක් ලෙසින් 2008 ජූලි මස ඉන්දුනීසියාවේ පැවැති ආසියා ශාන්තිකර කණ්ඩායමෙහි එකොලොස්වන වාර්ෂික සමුළුවට සහභාගි විය. එසේම මූල්‍ය බුද්ධි ඒකකය 2008 ඔක්තෝබර් 27-29 කාලය තුළ කොළඹ පැවැති ආසියා ශාන්තිකර කණ්ඩායමෙහි එකලොස්වන වාර්ෂික ක්‍රමවේද සමුළුවට ද (Annual Typoligies Work Shop) අනුග්‍රහය දක්වන ලදී. මෙම සමුළුවේදී මූල්‍ය විශුද්ධියකරණයට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම පිළිබඳ වන නවතම ක්‍රමවේද උපක්‍රම සහ උපනතීන් පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය. මෙම සමුළුව සඳහා රටවල් 29 ක් නියෝජනය කරමින් විදේශීය නියෝජිතයන් 84 දෙනෙකු සහභාගි වූ අතර, ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නියෝජිතයන් 41 ක් සහභාගි විය.

# II. මූල්‍ය පද්ධති ස්ථායිතාව

මහ බැංකුවේ මූලික අරමුණුවලින් එකක් වූ මූල්‍ය පද්ධති ස්ථායීතාවය පවත්වාගෙන යාම සඳහා 2007 ජනවාරි මාසයේ දී මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ සුරක්ෂිතතාවය සහ ස්ථායීතාවයන්ට එල්ලවිය හැකි තර්ජන හඳුනා ගැනීම සහ ඒවා පහත දැමීම යන කාර්යයන් ඉටු කිරීමේ වගකීම එම දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව, ආරම්භක අවස්ථාවේදී ම මූල්‍ය පද්ධතියට වන අවදානම් හඳුනාගැනීම, මූල්‍ය අස්ථායීතාවය වළක්වාලීම සඳහා නිවාරණ සහ ප්‍රතිකාරක ප්‍රතිපත්ති යෝජනා කිරීම මෙන්ම අර්බුද අවස්ථාවේදී ගනු ලබන පියවරයන් අසාර්ථක වන විට ඒවා විසඳීමට සහාය වීමද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වේ. මෙහි දී මූල්‍ය අසමතුලිතතා සහ හානිකර තත්ත්වයන් හඳුනාගැනීම සඳහා ඉදිරි දැක්ම සහිත ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, කල්බදු සමාගම්, ප්‍රාථමික අලෙවිකරුවන්, රක්ෂණ සමාගම් සහ තැරැව්කරුවන්, කොටස් වෙළෙඳපොළේ තැරැව්කරුවන්, ඒකක භාර, විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල්, මෙන්ම මූල්‍ය වෙළෙඳපොළේ සූක්ෂම ණය ප්‍රදානය කරන්නන් වැනි මූල්‍ය ආයතන වලින්ද, මුදල් වෙළෙඳපොළ, බැඳුම්කර වෙළෙඳපොළ, විදේශ විනිමය වෙළෙඳපොළ සහ කොටස් වෙළෙඳපොළ යන වෙළෙඳපොළවලින් ද ගෙවුම් සහ පියවීම් පද්ධතියකින් යුත් මූල්‍ය යටිතල පහසුකම් වලින් ද සමන්විතය.

මූල්‍ය පද්ධතිය තුළ සිදුවන සියළුම අංශයන්ගේ වර්ධනයන් අධීක්ෂණය සහ විශ්ලේෂණය කිරීම සඳහා මූල්‍ය පද්ධති දෙපාර්තමේන්තුව විසින් පද්ධතිමය ආකාරයේ ප්‍රවේශයක් අනුගමනය කරනු ලැබේ. ඒ අනුව, සාර්ව සහ මූර්ත ආර්ථිකය, දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ, පද්ධතිමය වශයෙන් වැදගත් මූල්‍ය ආයතන යනාදියේ වර්ධනයන් අවේක්ෂණය සහ ප්‍රධාන මූල්‍ය යටිතල පහසුකම් ක්‍රියා කරවීම මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

මූල්‍ය ක්‍රමයේ ශක්තිමත්භාවය සහ සිදුවිය හැකි හානිකර තත්ත්වයන් හඳුනාගැනීමට ඉවහල් වන සමස්ත මූල්‍ය සහ ආර්ථික දත්ත විශාල ප්‍රමාණයක් මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව විසින් ඇගැයීම් කරනු ලැබේ. සාර්ව ආර්ථිකය, තැන්පතු භාරගන්නා ආයතන, අනෙකුත් මූල්‍ය ආයතන, සාංගමික සහ කුටුම්භ අංශයට සම්බන්ධ මූල්‍යමය ශක්තිමත් භාවය පෙන්වන දර්ශක රාශියක් මෙයට ඇතුලත් වේ. අදාළ බලධාරීන්ට සහ සහභාගි වන්නන්ට සිදුවිය හැකි අවදානම් කල්තියා හඳුනාගෙන ඊට සූදානම් වීම සඳහා මෙම දර්ශක උපකාරීවේ.

බැංකු අංශයේ සමස්ථ ශක්තිමත්භාවය කාලීනව නියාමනය කිරීම සඳහා මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුව විසින් බැංකු ස්ථායිතා දර්ශකයක් සකස් කරයි. මෙම දර්ශකය සකස්කර ඇත්තේ ප්‍රාග්ධන මට්ටම්, ලාභදායීත්වය, වත්කම්වල ගුණාත්මකභාවය සහ වත්කම්වල නොසීහුම් සම්බන්ධ දර්ශකවලිනි. මෙයට අමතරව, මූල්‍ය පද්ධති දෙපාර්තමේන්තුව බැංකු ආයෝජන කළඹ මත ආතති පරීක්ෂණ පවත්වා

අන්ත සිදුවීම් හෝ විවිධ වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ බැංකුවලට සිදුවිය හැකි ණය, වෙළෙඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් නිරාවරණයන් මිනුම්කරණය කරනු ලැබේ.

වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන මූල්‍ය පද්ධති ස්ථායීතා විමසුම පිළියෙල කිරීම මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුවේ තවත් වගකීමක් වේ. මෙම මූල්‍ය පද්ධති ස්ථායීතා විමසුම මගින් ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සහ එය මුහුණ දෙන අවදානම් පිළිබඳ ඇගයීමක් කරනු ලැබේ. මූල්‍ය පද්ධති ස්ථායීතාව වර්ධනය කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග යන් ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

මෙම වාර්තාවේ මූලික අරමුණ වන්නේ මූල්‍ය ආයතන සහ වෙළෙඳපොළ සහභාගිවන්නන්ට අවදානම් සඳහා සූදානම්වීමට සහ එය කළමනාකරණයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මෙන්ම මූල්‍ය ස්ථායීතාව සඳහා බලපාන ගැටළු පිළිබඳ දැනුවත් කිරීම සහ ඒ සම්බන්ධ සංවාදයක් ගොඩනැගීම දිරිමත් කිරීමයි. 2007 වර්ෂයේ මූල්‍ය පද්ධති ස්ථායීතා විමසුම 2007 නොවැම්බර් මාසයේ දී නිකුත් කරන ලදී.

මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුව මූල්‍ය පද්ධති ස්ථායීතා අංශයට අදාළ නියෝජ්‍ය අධිපති සභාපතිත්වය දරන මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් කටයුතු කරනු ලැබේ. මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව මාසිකව රැස්වන අතර, මූල්‍ය පද්ධති ස්ථායීතාව පිළිබඳව මුදල් මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

## 12. මානව සම්පත් කළමනාකරණය

2008 වසරේ පුහුණු වැඩකටයුතු දෙපාර්තමේන්තුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධ කිරීම තුළින් මහ බැංකුවේ මානව සම්පත් කළමනාකරණ කාර්යභාරය වඩාත් පුළුල් විය. 2008 වසරේදී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද මූලික කාර්යයන් අතර, බැංකුවේ උපාය මාර්ගික සැලැස්ම තුළින් හඳුනාගත් මානව සම්පත් අවශ්‍යතාවයන්ට සමගාමීව සිදුකරන ලද නව බඳවාගැනීම්, කාර්ය සාධන ඇගැයීම්, උසස් කිරීම්, පුහුණු හා සංවර්ධන වැඩසටහන් මෙන්ම සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම් ආදිය විය.

### 12.1 මානව සම්පත් ව්‍යුහය

2008 වසර අවසානය වන විට මහ බැංකු සේවයේ යෙදී සිටි සම්පූර්ණ සේවකයින් සංඛ්‍යාව 1,304 ක් විය. මෙම සේවක මණ්ඩලය, මාණ්ඩලික පංතියේ සේවකයින් 554, මාණ්ඩලික නොවන පංතියේ සේවකයින් 538, සුළු සේවකයින් 150 හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 62 කින් සමන්විත විය. තවද, මහ බැංකු කාර්ය මණ්ඩලයේ සාමාන්‍ය වයස් සීමාව අවුරුදු 43 ක් විය. එමෙන්ම, අංක II-8 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි මාණ්ඩලික නිලධාරීන්ගෙන් සියයට 85 ක ප්‍රතිශතයක් ප්‍රථම උපාධිය හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් සපුරා සිටියහ. තවද, 2008 වර්ෂය තුළදී සේවකයින් 27 දෙනෙකු බැංකු සේවාවෙන් විශ්‍රාමගත් අතර, 13 දෙනෙකු බැංකු සේවාවෙන් ඉල්ලා අස්වූහ.

### 12.2 බඳවා ගැනීම්

2008 වසර තුළදී මානව සම්පත් දෙපාර්තමේන්තුව හඳුනාගත් නිපුණතා අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නව බඳවා ගැනීම් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වන ලදී. ඒ අනුව බැංකු සහායකයින් 123 ක්, රියදුරන් 16 ක් හා සුළු සේවකයන් 63 ක් බඳවාගන්නා ලදී. මීට අමතරව, විවිධ දෙපාර්තමේන්තුවල පැවැති තාක්ෂණික නිපුණතා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින්, පද්ධති කළමනාකරුවෙකු, මෘදුකාංග සංවර්ධකයන් 3 දෙනෙකු, අරමුදල් කළමනාකරුවන් 3 දෙනෙකු හා තොරතුරු තාක්ෂණ ශිල්පී පුහුණුවන්නන් 6 දෙනෙකු 2008 වසර තුළදී බඳවා ගන්නා ලදී. තවද, කාන්තා ආරක්ෂක නිලධාරිනියන් 4 දෙනෙකු, ඛනිජ තෙල් පිළිබඳ භූ විද්‍යාඥයෙක් හා මූල්‍ය බුද්ධි ඒකකය සඳහා එක් නිලධාරියෙක් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගන්නා ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ දිළිඳුකම පිටුදැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය සඳහා කණිෂ්ඨ විධායක නිලධාරීන් 7 දෙනෙකු බඳවාගැනීම සඳහා ද මානව සම්පත් දෙපාර්තමේන්තුව පහසුකම් සලසා දෙන ලදී.

### 12.3 කාර්ය සාධන කළමනාකරණ ක්‍රමය

කාර්ය සාධන කළමනාකරණ ක්‍රමය සියලුම නිලධාරීන්ගේ කාර්යයන් බැංකුවේ ප්‍රධාන මෙහෙවරයන් සහ අරමුණු හා සම්බන්ධ වන පරිදි සකස් කර ඇත. ඒ අනුව වසර ආරම්භයේදීම එක් එක් සේවකයන් තම අධීක්ෂණ නිලධාරීන් සමග සාකච්ඡා කර, සුදුසු බර තැබීමකින් යුක්තව තම ඉලක්ක සකස් කිරීම මගින් කාර්ය සාධන ඇගැයීම් ක්‍රමය ආරම්භ කරනු ලබයි. මෙම ඉලක්ක මත පදනම්ව සේවකයන් විසින් එක් එක් ඉලක්කය සඳහා කාර්ය සාධන මට්ටම් ඉදිරිපත් කරමින්, කාර්ය සාධන ඇගැයීම් පත්‍රිකාවේ ස්වයං ඇගැයීමේ කොටස සම්පූර්ණ කරනු ලබයි.

කාර්ය සාධන මට්ටම් පිළිබඳව අවසාන තීරණයකට එළඹීම සඳහා අදාළ සේවකයා හා අධීක්ෂණ නිලධාරියා අතර කාර්ය සාධන ඇගැයීම් සාකච්ඡා පවත්වනු ලබයි. පසුව ප්‍රමිතිගත ඇගැයීම් ව්‍යුහයක් පවත්වා ගැනීම අරමුණු කොට ගෙන අධීක්ෂණ නිලධාරීන් විසින් සිදුකරන ලද සියලු ඇගයීම්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා කළමනාකාරීත්වය විසින් සමාලෝචනයට ලක් කරනු ලබයි. මීට අමතරව සේවකයන් විසින් අධ්‍යාපන, පුහුණු හා වෘත්තීය සංවර්ධන සැලසුම් ද කාර්ය සාධන ඇගයීම් පත්‍රිකාව සමග අධීක්ෂණ නිලධාරීන් ගේ ඇගයීම සඳහා ඉදිරිපත් කරනු ලබයි.

සියලුම බැංකු සේවකයන් සඳහා වූ 2007 වසරේ කාර්ය සාධන ඇගැයීම්, 2008 වසර තුළදී සාර්ථකව සම්පූර්ණ කරන ලදී. වසර ආරම්භයේදී ඉලක්ක ගතකළ කාලසීමාවලට සමගාමීව සේවකයන් ගේ හා දෙපාර්තමේන්තුවල 2008 වසර සඳහා වූ ඉලක්ක සකස් කිරීමද සිදුකරන ලදී.

### 12.4 උසස් කිරීම්

නිසිකලට උසස් වීම් ලබාදීම තුළින් සේවකයින්ගේ වෘත්තීය අභිවෘද්ධිය 2008 වසරේ දී ද තවදුරටත් තහවුරු කරන ලදී. උසස් කිරීම සඳහා නිර්නායකයන් ලෙස සේවය කරන ලද වසර ගණන, කාර්ය සාධන ඇගැයීම් මට්ටම සහ දෙපාර්තමේන්තු

**සංඛ්‍යා සටහන II-8**

**2008.12.31 දිනට මානව සම්පත් ව්‍යුහය**

| සේවක පංතිය | සේවකයින් සංඛ්‍යාව | | | සාමාන්‍ය වයස | අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | මුළු සංඛ්‍යාව | | පශ්චාත් උපාධි, ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය | පශ්චාත් උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය සහ වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| **(1) මාණ්ඩලික පංතිය** | | | | | | | | | | |
| (i) IV ශ්‍රේණිය සහ ඉහළ ශ්‍රේණි | 45 | 14 | 59 | 52 | 07 | 39 | 02 | 04 | 07 | 0 |
| (ii) III ශ්‍රේණිය | 82 | 28 | 110 | 50 | 13 | 57 | 01 | 03 | 36 | 0 |
| (iii) II ශ්‍රේණිය | 46 | 37 | 83 | 45 | 06 | 19 | 01 | 10 | 35 | 0 |
| (iv) I ශ්‍රේණිය (කළමනාකරන පුහුණුවන්නන්ද ඇතුළුව) | 135 | 167 | 302 | 41 | 02 | 22 | 02 | 27 | 167 | 08 |
| **(2) මාණ්ඩලික නොවන පංතිය** | | | | | | | | | | |
| (i) V ශ්‍රේණිය | 31 | 71 | 102 | 54 | 0 | 0 | 0 | 0 | 32 | 0 |
| (ii) IV ශ්‍රේණිය | 61 | 51 | 112 | 48 | 0 | 0 | 0 | 0 | 07 | 02 |
| (iii) III ශ්‍රේණිය | 87 | 20 | 107 | 48 | 0 | 0 | 0 | 0 | 06 | 03 |
| (iv) II ශ්‍රේණිය (බැංකු සහායකයින්ද ඇතුළුව) | 110 | 77 | 187 | 32 | 0 | 0 | 0 | 0 | 01 | 01 |
| (v) I ශ්‍රේණිය | 29 | 01 | 30 | 43 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| **(3) සුළු සේවක පංතිය** | | | | | | | | | | |
| (i) I, II සහ III ශ්‍රේණි | 143 | 07 | 150 | 36 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| **(4) කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගත් නිලධාරීන්** | | | | | | | | | | |
| (i) සියලුම කාණ්ඩයන් | 51 | 11 | 62 | 40 | 0 | 06 | 0 | 0 | 0 | 0 |
| මුළු සංඛ්‍යාව | **820** | **484** | **1,304** | **43** | **28** | **143** | **06** | **44** | **291** | **14** |

ප්‍රධානීන්ගේ නිර්දේශයන් යොදාගන්නා ලදී. මේ යටතේ 2008 වසර තුළදී සේවකයන් 177 දෙනෙකුට ශ්‍රේණි, පංති සහ තනතුරු උසස්වීම් ලබාදෙන ලදී. මේ යටතේ, නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් 22 දෙනෙකු මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියට අයත් වැඩබලන අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානින් ලෙසත්, එක් නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියට අයත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු ලෙසත් උසස් කරන ලදී. තවද, මාණ්ඩලික පංතියේ III ශ්‍රේණියේ නිලධාරීන් 22, නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් වශයෙන් නම්කරන ලදී. මෙයට අමතරව, මාණ්ඩලික නොවන පංතියේ IV හා V ශ්‍රේණි වලට අයත් පෞද්ගලික සහකාරවරියන් 22, මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියට උසස් කරන ලදී.

## 12.5 පුහුණු හා සංවර්ධනය

බැංකු කාර්ය මණ්ඩලයෙහි බහුවිධ කුසලතාවයන් සංවර්ධනය කිරීම අරමුණු කරමින් 2008 වසර තුළදී පුහුණු ක්‍රියාවලිය සැලසුම් කරන ලදී. මානව සම්පත් දෙපාර්තමේන්තුව, සියලුම දෙපාර්තමේන්තුවල නිපුණතාවල පවත්නා පරතරය හඳුනාගැනීම සඳහා දියත් කළ වැඩසටහන නිමකළ අතර, මෙහි අරමුණ වූයේ විශේෂිත පුහුණු වැඩසටහන් ලබාදීම මගින් අදාළ නිපුණතා පරතරය පිරවීමයි. මෙයට අනුව එම පුහුණු අවස්ථා, සම්මන්ත්‍රණ, වැඩමුළු හා සමුළු වැනි කෙටිකාලීන වැඩසටහන් වලින්ද, දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් වලින් මෙන්ම පශ්චාත් උපාධි අධ්‍යයන වලින්ද සමන්විත විය. 2008 වර්ෂය තුළදී පුහුණු අවස්ථා 1,712 ක් ලබාදෙන ලදී.

### (අ) විදේශීය පුහුණුව

2008 වසර තුළදී මහ බැංකුව සිය නිලධාරීන් 150 දෙනෙකුට පිළිගත් විදේශීය පුහුණු ආයතන මගින් මෙහෙයවන ලද විවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි විදේශීය පුහුණු වැඩසටහන් වලට සහභාගිවීමේ අවස්ථාව සලසා දෙන ලදී.

විදේශ පාඨමාලා තුළින් තමන් ලබාගත් දැනුම බැංකුවේ අනෙකුත් නිලධාරීන් සමඟ හුවමාරු කරගැනීමේ අරමුණින් විදේශ පුහුණු පාඨමාලාවලට සහභාගි වූ නිලධාරීන් හට, සහභාගී වූ පාඨමාලාව පදනම් කොටගෙන සම්මන්ත්‍රණයක් පවත්වන ලෙස ඉල්ලා සිටිනු ලබයි. මේ යටතේ බදාදා සහ බ්‍රහස්පතින්දා දිනවල බැංකු නිලධාරීන් විසින් සම්මන්ත්‍රණ 33 ක් වර්ෂය තුළදී පවත්වා ඇත.

**සංඛ්‍යා සටහන II-9**

**කෙටි කාලීන විදේශ පුහුණු අවස්ථා - 2008**

| ක්ෂේත්‍රය | සහභාගි වූ ප්‍රමාණය |
|---|---|
| ආර්ථික හා ආර්ථික ප්‍රතිපත්ති | 40 |
| මූල්‍ය පද්ධති හා රෙගුලාසි | 18 |
| අවදානම් කළමනාකරණය | 15 |
| මූල්‍යය | 19 |
| තොරතුරු තාක්ෂණය සහ ගෙවීම් පද්ධති | 15 |
| රාජ්‍ය ණය කළමනාකරණය | 12 |
| මහ බැංකු කටයුතු | 09 |
| මානව සම්පත් කළමනාකරණය | 13 |
| වෙනත් | 09 |
| **එකතුව** | **150** |

තවද, කෙටිකාලීන පුහුණු වැඩසටහන් වලට සහභාගිවීමෙන් ලබාගන්නා ලද දැනුම උපයෝගී කරගැනීම ධෛර්යමත් කිරීමේ අරමුණින් මෙවැනි පාඨමාලා වලට සහභාගි වන නිලධාරීන් එකඟ වූ විශේෂ පැවරුම්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා සහකාර අධිපතිවරුන් තිදෙනෙකුගෙන් සහ මානව සම්පත් අධ්‍යක්ෂකගෙන් සමන්විත පුහුණු අනු කමිටුවක් පත් කෙරිණි.

**(ආ) පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු**

පසුගිය වර්ෂයේදී මෙන්ම 2008 වර්ෂය තුළදීත් ශ්‍රී ලංකා මහ බැංකු ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ සිය කාර්ය මණ්ඩලයට එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, කැනඩාව, ජපානය හා ඕස්ට්‍රේලියාව යන රටවල පිළිගත් විශ්ව විද්‍යාලවල විද්‍යාපති, ශාස්ත්‍රපති සහ ආචාර්ය උපාධි සුදුසුකම් ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදුකරන ලදී. බැංකුව තුළ බුද්ධිමය හැකියාව (Intellectual Capacities) ඉහළ නැංවීමේ අරමුණු සහිතව ආචාර්ය උපාධි ලබාගැනීමට නිලධාරීන් වැඩි ප්‍රමාණයකට අවස්ථාව ලබාදීම අරමුණු කරගනිමින් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා අදාළව පවත්නා චක්‍රලේඛය සංශෝධනය කරන ලදී. මේ අනුව 2008 වසර තුළදී ආචාර්ය උපාධි සඳහා නිලධාරීන් 04 දෙනෙකුට හා විද්‍යාපති හා ශාස්ත්‍රපති උපාධි සඳහා නිලධාරීන් 05 දෙනෙකුට සිය අධ්‍යයන කටයුතු ඇරඹීම සඳහා අවස්ථාවන් සලසා දෙන ලදී. මේ අතර විද්‍යාපති හා ශාස්ත්‍රපති පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සාර්ථකව අවසන් කළ නිලධාරීන් 04 දෙනෙකු 2008 වර්ෂය තුළදී බැංකු සේවයට වාර්තා කරන ලදී.

**(ඇ) දේශීය පුහුණු කටයුතු**

2008 වර්ෂය තුළදී බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය හා පිළිගත් දේශීය පුහුණු ආයතන මගින් මෙහෙයවන පුහුණු පාඨමාලාවලට සහභාගිවීම සඳහා පුහුණු අවස්ථා 1,562 ක් මහ බැංකු නිලධාරීන් වෙත සපයා දී ඇත. දේශීය පුහුණු වැඩසටහන් ලබාදීමේදී තොරතුරු තාක්ෂණ, සන්නිවේදන, මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපොළ, බැංකු අධීක්ෂණ, සාර්ව ආර්ථික විශ්ලේෂණ, අභ්‍යන්තර විගණන සහ කළමනාකරණ ආදී ක්ෂේත්‍ර සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලදී. මීට අමතරව, කළමනාකරණ අභ්‍යාසලාභීන් 59 හා බැංකු සහායකයින් 123 දෙනෙකු සඳහා අනුස්ථාපනය කිරීමේ වැඩසටහනක් ද 2008 වසරේදී ක්‍රියාත්මක කරන ලදී. එසේම, නිලධාරීන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ හා ඉදිරිපත් කිරීමේ හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් සාමාජිකයින් 50 දෙනෙකුගෙන් යුක්තව "ශ්‍රී ලංකා මහ බැංකු ටෝස්ට්මාස්ටර්ස් ක්ලබ්" නමින් සංගමයක් ද පිහිටුවන ලදී.

**12.6 ස්ථාන මාරුකිරීම්**

බහුවිධ කුසලතාවයන්ගෙන් පිරිපුන් සේවකයන් පිරිසක් බිහිකර ගැනීමේ හා බැංකුවේ සමස්ත ඵලදායීතාවය ඉහළ නංවා ගැනීමේ අරමුණින් යුක්තව, එක් දෙපාර්තමේන්තුවක වසර පහකට වඩා සේවය කළ සේවකයන්ට, ඔවුන් තුළ පවතින නිපුණතා මට්ටම් හා විවිධ දෙපාර්තමේන්තුවල පවතින නිපුණතා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් වෙනත් දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරුවීම් ලබාදෙන ලදී. මේ යටතේ 2008 වසර තුළදී සේවකයන් 98 දෙනෙකුට මාරුවීම් ලබාදෙන ලදී.

**12.7 සේව්‍ය - සේවක සම්බන්ධතා**

වෘත්තීය සමිති හා කළමනාකාරිත්වය අතර සමීප සංවාදයක් වසර තුළදී පවත්වා ගැනීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව පසුකම් සපයා දෙන ලදී. අවශ්‍ය අවස්ථාවලදී වෘත්තීය සමිති සඳහා කළමනාකාරිත්වය හමුවී සාකච්ඡා කිරීමේ අවස්ථාවන්ද සලසා දෙන ලද අතර, මේ අනුව පසුගිය වසර තුළ එවැනි සාකච්ඡා වාර 6 ක් පවත්වන ලදී. මෙම සමීප සංවාදය තුළින් මහ බැංකු කළමනාකාරිත්වයට නව බඳවාගැනීම්, උසස් කිරීම්, පුහුණු, සුභසාධන හා සාමාන්‍ය පරිපාලන කටයුතු හා සම්බන්ධව පැවැති ගැටළුකාරී තත්ත්වයන් කිහිපයක්ද මගහරවා ගැනීමට හැකිවිය.

**අධිපතිතුමා සහභාගි වූ රැස්වීම්**

1. ජනවාරි මාසයේ දී ඉන්දියාවේ පැවැති කළමනාකරණ ගිණුම්කරණය පිළිබඳ ලෝක සමුළුවට සහභාගි වීම.
2. ජනවාරි මාසයේ දී හොංකොං හි ඇසෙට් සඟරාව මගින් පවත්වන ලද හොඳම සෙවරීන්ව බැඳුම්කර සම්බන්ධ කුසලාන දීමේ උත්සවය සඳහා සහභාගි වීම.
3. ජනවාරි මාසයේ දී මලයාසියානු මහ බැංකු (Bank Negara) අධිපතිතුමා මුණ ගැසීම.
4. ජනවාරි මාසයේ දී ගරු මුදල් ඇමතිතුමා සමඟ බෲනායි, දරුසලාම් (Darussalam) හි පැවැති රැස්වීමට සහභාගි වීම.
5. පෙබරවාරි මාසයේ දී එංගලන්තයේ ලන්ඩන් හි ආයෝජකයන් මුණගැසීම සහ ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සාකච්ඡා කිරීම.
6. මාර්තු මාසයේ දී පකිස්ථානයේ කරච්චි නුවර පැවැති 2 වන ලෝක කළමනාකරණ සමුළුව ඇමතීම.

7. මාර්තු මාසයේ දී ඉන්දුනීසියාවේ ජකර්තා නුවර පැවැති 43 වැනි සියසන් (SEACEN) අධිපතිවරුන්ගේ සමුළුවට සහ 27 වන සියසන් අධිපතිවරුන්ගේ මණ්ඩලයේ රැස්වීමට සහභාගි වීම.

8. අප්‍රේල් මාසයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී.සී. හි පැවැති ලෝක බැංකු හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වසන්ත සෘතුවේ දී පවත්වන ලද රැස්වීම් (Spring Meetings) සඳහා සහභාගි වීම.

9. ජූනි මාසයේ දී ලන්ඩන් හි දී පැවැති පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායකයන්ගේ සූදානම් වීමේ සමුළුවට සහභාගි වීම.

10. ජූනි මාසයේ දී මියන්මාරයේ පැවැති 37 වන ආසියානු නිශ්කාෂණ සංගමයේ (Asian Clearing Union) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සහභාගි වීම.

11 ජූනි මාසයේ දී ඩුබායි හා අබුඩාබි හි දී ආයෝජකයන් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාකච්ඡා කිරීම.

12. සැප්තැම්බර් මාසයේ දී තායිලන්තයේ බැංකොක් නුවර පැවැති සියන්සා (SEANZA) අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණයට සහභාගි වීම.

**පත්කිරීම් / උසස් කිරීම්**

1). මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත්කරන ලද එස්.අබේසිංහ මහතා මුදල් මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස 2008 සැප්තැම්බර් මස 23 දින සිට පත්වන ලදී.

2) පහත සඳහන් උසස් කිරීම් හා පත්කිරීම් 2008 ජූලි මස 03 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

I) පී.ජී.ජයසූරිය මහතා උසස් කර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

II) එච්.එම්.ඒකනායක මහතා උසස් කර ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

III) ජී.ඩී.ගුණරත්න මහතා උසස් කර ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධිකාරි වශයෙන්.

IV) කේ.ඩී.රණසිංහ මහතා උසස් කර ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

V) ඩී.එම්. රූපසිංහ මහතා උසස් කර මූල්‍ය බුද්ධි ඒකකයේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

VI) එස්.ගුණරත්න මහත්මිය උසස් කර ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

VII) එම්.ජේ.එස්.අබේසිංහ මහතා උසස් කර සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

VIII) ආර්.ඒ.එස්.එම්.දයාරත්න මහත්මිය උසස් කර තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

IX) කේ.ගුණතිලක මහත්මිය උසස් කර සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරි වශයෙන්.

X) යූ.එච්.ඊ.සිල්වා මහතා උසස් කර සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරි වශයෙන්.

XI) කේ.පී.එන්.එස්.කරුණාගොඩ මහතා උසස් කර බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

XII) පී.වී.එල්.නන්දසිරි මහතා උසස් කර මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක ප්‍රධාන ගණකාධිකාරි වශයෙන්.

XIII) ටී.එම්.ජේ.වයි.පී.ප්‍රනාන්දු මහත්මිය උසස් කර බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

XIV) එස්.ජේ.ඒ.හඳගම මහතා උසස් කර සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්.

XV) ඩී.ඒ.ජී.කේ.විජේතුංග මහතා උසස් කර දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

XVI) ජේ.පී.ආර්.කරුණාරත්න මහතා උසස් කර ලේකම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක ලේකම් වශයෙන්.

XVII) ඒ.ආර්.කේ.විජේසේකර මහතා උසස් කර මානව සම්පත් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

XVIII) සී.එන්.විජයසේකර මහතා උසස් කර රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරි වශයෙන්.

XIX) පී.ඩබ්.ඩී.එන්.ආර්.රොද්‍රිගු මහතා උසස් කර ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

XX) ඒ.ඒ.එම්.තාසිම් මහතා උසස් කර බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

XXI) ආර්.ජේ.පෙරේරා මහතා උසස් කර පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

XXII) එෆ්.සී.එස්.මෙන්ඩිස් මහතා උසස් කර කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

XXIII) පී.එච්.ඕ.චන්ද්‍රවංශ මහතා උසස් කර බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන්.

3) විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අතිරේක පාලක යූ.පී.අලවත්තගේ මහතා 2008 අප්‍රේල් 20 දින සිට බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අතිරේක අධ්‍යක්ෂ වශයෙන් ද, 2008 මැයි 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ වශයෙන්ද, 2008 නොවැම්බර් 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්ද පත්කරන ලදී.

4) බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ අධ්‍යක්ෂ ඩබ්.එම්.හේමචන්ද්‍ර මහතා 2008 මැයි 01 දින සිට ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවට විශේෂ නිලධාරියෙකු වශයෙන්ද, 2008 ජූලි 24 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් ද පත්කරන ලදී.

5) බැංකුනොවනමූල්‍යආයතනඅධීක්ෂණදෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ එස්.එස්.රත්නායක මහතා 2008 මැයි 10 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

6) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ බී.ඩී.ඩබ්.ඒ.සිල්වා මහතා 2008 ජූනි 03 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

7) මානව සම්පත් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ එස්.ලංකාතිලක මහතා 2008 ජූනි 03 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

8) රාජ්‍ය ණය දෙපාර්මේන්තුවේ වැඩ බලන අධිකාරී සහ රෙජිස්ට්‍රාර් සී.ජේ.පී. සිරිවර්ධන මහතා 2008 ජූනි 03 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධිකාරි හා රෙජිස්ට්‍රාර් වශයෙන් පත්කරන ලදී.

9) වැටුප් රහිත නිවාඩු මත සිටි අතිරේක අධ්‍යක්ෂ ඊ.ඒ.හෙට්ටිආරච්චි මහතා 2008 ජූලි 21 දින සිට විනිමය පාලන දෙපාර්තමේන්තුවේ වැඩ බලන පාලක වශයෙන් පත්කරන ලදී.

10) සුහසාධන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ එස්.එන්.පෙරේරා මහත්මිය 2008 ජූලි 22 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

11) විනිමය පාලන දෙපාර්තමේන්තුවේ විනිමය පාලක ඩී.වසන්ත මහතා 2008 ජූලි 21 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට විශේෂ නිලධාරියෙකු වශයෙන්ද, 2008 ජූලි 24 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධිකාරි වශයෙන්ද පත්කරන ලදී.

12) තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජේ.පී.මාම්පිටිය මහත්මිය 2008 අගෝස්තු 18 දින සිට ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

13) තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ආර්.ඒ.එස්.එම්.දයාරත්න මහත්මිය 2008 අගෝස්තු 18 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

14) ලේකම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක ලේකම් ජේ.පී.ආර්.කරුණාරත්න මහතා 2008 දෙසැම්බර් 26 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ වශයෙන් පත්කරන ලදී.

**විශ්‍රාම ගැනීම්**

1) විශිෂ්ඨ ආර්ථශාස්ත්‍රඥයෙකු සහ දක්ෂ පරිපාලකයෙකු මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව උසස් මට්ටමක වෘත්තීය තත්ත්වයකට පත්කිරීම සඳහා මගපෙන්වීම් කළ, ආචාර්ය පී.බී. ජයසුන්දර මහතාගේ මුදල් මණ්ඩල සාමාජිකත්වය, ඔහු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් තනතුරින් ඉවත්වීමත් සමග, 2008 සැප්තැම්බර් 23 වැනි දින සිට බලපවත්වන පරිදි අවසන් විය.

2). සහකාර අධිපති වයි.එම්.ඩබ්.බී.වීරසේකර මහතා 2008 ජනවාරි 14 වැනි දින සිට බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

3) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් හා ජ්‍යෙෂ්ඨ ආර්ථික ප්‍රතිපත්ති පිලිබඳ උපදේශක වශයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සේවය සඳහා මුදා හැර සිටි සහකාර අධිපති ආර්.ඒ. ජයතිස්ස මහතා 2008 නොවැම්බර් 21 දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

4) සුභසාධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.වී.එම්. ප්‍රනාන්දු මහතා 2008 ජනවාරි 22 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

5) පුහුණු වැඩ කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ පී.පී.සිරිසේන මහත්මිය 2008 පෙබරවාරි 04 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

6) අසාර්ථකවූ මූල්‍ය සමාගම් සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කොට විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් මුදාහැර සිටි ජේ.ඒ.එන්.දිසානායක මහත්මිය 2008 පෙබරවාරි 19 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

7) පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එච්.එම්.පී.හේරත් මහතා 2008 පෙබරවාරි 25 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

8) ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ.ආර්.එම්.සිරිවර්ධන මහත්මිය 2008 අගෝස්තු 16 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

9) ප්‍රතිපත්ති සැලසුම් හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.එම්. අත්තනායක මහතා 2008 සැප්තැම්බර් 10 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

10) ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ඒ. ජීවන්දර මහතා 2008 සැප්තැම්බර් මස 26 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

11) සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී එල්.වයි. ධර්මසේන මහතා 2008 ඔක්තෝබර් 09 වැනි දින සිට බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

**මුදාහරිනු ලැබ සිටි/නිවාඩු ලබා සිටි නිලධාරීන්**

1) සහකාර අධිපති කේ.ජී.ඩී.ඩී.ධීරසිංහ මහතා විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

2) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ජේ.පී.ආර්.කරුණාරත්න මහතා රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව හා නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙත (අර්ධකාලීන පදනම මත).

3) නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානී එස්.ආර්.ආටිගල මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

4) නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානී කේ.ජී.ආර්.කේ.ධීරසිංහ මෙනවිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

5) මාණ්ඩලික පංතියේ III ශ්‍රේණියේ බී.ලොකුරණමුක මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

6) මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ ටී. එම්. ආර්. පී. යටිගම්මන මහත්මිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

7) මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එච්.පී.එම්.වසන්ත කුමාර මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

8) මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එම්.මහින්ද සාලිය මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

9) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඩී.ජී.ඩී.අයි.ඒකනායක මහත්මිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

10) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඊ. ඩබ්. කේ. ජේ.බී. ඇහැලේපොල මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

11) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ කේ.ඒ.යූ. එස්.කේ.තිලකරත්න මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

12) මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඩී. කේ. උයන්ගොඩගේ මහත්මිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

13) කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබූ නීති නිලධාරිනි එච්.එම්.එන්.එස්.ගුණවර්ධන මහත්මිය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත.

14) මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ ආර්.ධීරසිංහ මහත්මිය වැටුප් රහිත විදේශ නිවාඩු මත.

## 13. තොරතුරු තාක්ෂණ

විමසුමට ලක් වූ වසර තුළ දී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉලක්කය වූයේ එහි සාම්ප්‍රදායික භූමිකාව වන සේවා සපයන්නෙකුගේ කාර්ය භාරයෙන් මෑත්ව බැංකුවේ මෙහෙයුම් සඳහා නව්‍යකරණය වූ විසඳුම් හඳුන්වා දෙමින් ව්‍යාපාර මෙහෙයවන්නෙකු ලෙස ක්‍රියා කිරීමයි. එකී අරමුණ මුදුන් පමුණුවා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් තේමා සතරක් (4) යටතේ සංවිධානය කරන ලදී.

1. ව්‍යාපෘති සංවර්ධනය හා නඩත්තුව

2. තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය

3. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය

4. මූල්‍ය / රාජ්‍ය අංශයට උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම

## 13.1 ව්‍යාපෘති සංවර්ධනය හා නඩත්තුව

පවත්නා පද්ධතිවල නඩත්තු කටයුතුවල නියැලෙන අතරතුර විනිමය පාලනය, සේවක අර්ථසාධක අරමුදල, රාජ්‍ය ණය කළමනාකරණය මෙන්ම ත්‍රස්තවාදී මූල්‍යකරණය හා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම යන ක්ෂේත්‍රවල නියෝජන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ බැංකුවේ මූලික අභිප්‍රායයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා පරිශීලක මිත්‍ර, ආරක්ෂිත හා අන්‍යෝන්‍ය ක්‍රියාකාරී වෙබ් මෘදුකාංග හඳුන්වා දෙන ලදී.

ඒ අනුව, 2007 වසරේ දී හඳුන්වා දුන් ඒකාබද්ධ ව්‍යාපෘති සංවර්ධන සංකල්පය පහත සඳහන් පරිදි ව්‍යාප්ත කරන ලදී.

අ) විනිමය පාලන දෙපාර්තමේන්තුව- විදේශ විනිමය අලෙවිය හා මිලට ගැනීම පිළිබඳ දත්ත, විදේශ විනිමය වෙළෙඳුන්ගෙන් රැස් කර ගැනීම සඳහා වන ForexNet නම් නව වෙබ් මෘදුකාංගය හඳුන්වා දීම.

ආ) මූල්‍ය බුද්ධි ඒකකය - වාණිජ බැංකු විසින් යොමු කරන ලද සැක කටයුතු හා මුදල් ගනුදෙනු විශ්ලේෂණය/වාර්තා කිරීමට LankaFin වෙබ් පද්ධතිය හඳුන්වා දීම.

ඇ) රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව - දත්ත හුවමාරුව කාණ්ඩ වශයෙන් සිදුකොට පාරිභෝගික එක් දින ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු පියවීමට සහ ප්‍රාථමික වෙළෙඳුන් සඳහා නව වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීමට.

ඈ) දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව - වාණිජ බැංකු හා ප්‍රාථමික වෙළෙඳුන්ගෙන් මූල්‍ය වෙළෙඳපොල මුදල් අනුපාත එකතු කිරීමට හා වාර්තා කිරීමට.

තවද, වෙබ් තාක්ෂණය මත පදනම් වූ ද්‍රවශීලතා නිරීක්ෂණ මෘදුකාංග පද්ධතියක් දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව සඳහා ද විදේශ විනිමය අනුපාත නිරීක්ෂණ මෘදුකාංග පද්ධතියක් ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සඳහා ද මේ දිනවල නිර්මාණය වෙමින් පවතී. විවෘත වෙළෙඳපොල කටයුතු සිදු කිරීමේදී මහ බැංකු සුරැකුම්පත් ඇපයක් ලෙස තබා ගැනීමේ පහසුකම් සැලසීම සඳහා දැනට පවත්නා ද්විතියික වෙළෙඳපොල විකුණුම් තොරතුරු පද්ධතිය නවීකරණය කරන ලදී.

විස්තීර්ණ පර්යේෂණ හා සංවර්ධන කාර්යයකින් පසුව Domino Document Manager භාවිතා කර විමසුමට ලක් වූ වසර තුළ දී බැංකුව සඳහා විද්‍යුත් ප්‍රතිපත්ති ලේඛනාගාරයක් ක්‍රියාවට නංවන ලදී.

සේවක අර්ථසාධක අරමුදල් පද්ධතියේ නඩත්තුව තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කළ අතර වසර මුළුල්ලෙහි 100% කට ආසන්න පද්ධති උපයෝජ්‍යතාවයක් පවත්වා ගැනීමට හැකි විය. සාමාජිකයින් හා සේවා නියුක්තිකයින් යන දෙපිරිසටම පුළුල් සේවා සැපයීමේ අරමුණින් සේවක අර්ථසාධක අරමුදල් වෙබ් අඩවිය ව්‍යාප්ත කරන ලදී. ජංගම දුරකථන භාවිතයේ පුළුල් ආවරණය සැලකිල්ලට ගනිමින් ජංගම දුරකථන සන්නිවේදන නාලිකා ප්‍රයෝජනයට ගෙන කෙටි පණිවුඩ මත පදනම් වූ සාමාජික තොරතුරු ලබා ගැනීමේ නව සේවාවක් වසර තුළ දී දියත් කරන ලදී. සේවක අර්ථසාධක අරමුදල් අභ්‍යන්තර කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මෘදුකාංග සංවර්ධනය වසර තුළ දී ආරම්භ විය. එකිනෙකට වෙනස් උප පද්ධති අතර ඒකාබද්ධතාවයකින් කාර්යක්ෂමතාවය හා කාර්යසාධනය වැඩි දියුණු කිරීම මගින් වත්මන් ව්‍යාපාර ක්‍රියාවලීන් වඩාත් ඵලදායි බවට පත් කිරීම ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලියේ අරමුණයි. සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය ප්‍රතිපාදන පහසුකම් කඩිනම් කිරීමට විමධ්‍යගත නිවාස ණය සහතික නිකුත් කිරීමේ පද්ධතියක් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දුන් අතර රජයේ සුරැකුම්පත්වල තමන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ආයෝජන කිරීමට සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභීන්ට පහසුකම් සැලසීමට පද්ධතියක්ද නිර්මාණය කරන ලදී.

සියළුම මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති හා දෙපාර්තමේන්තුවෙන් සපයනු ලබන තොරතුරු තාක්ෂණ සේවාවන් සඳහා කාර්යය පිරිවැය කිරීමේ පද්ධතියක් හඳුන්වා දීම වසර තුළ සිදුවූ ප්‍රධානතම සිදු වීමක් විය. ඒ අනුව, පද්ධතිය පිළිබඳ අධ්‍යයනය සම්පූර්ණ වූ විට හෝ අවශ්‍ය සේවාවන් සැලසීම අවසානයේ දී, සේවාදායක දෙපාර්තමේන්තුවලට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති / සේවා පිරිවැය යොමු කරන ලදී.

## 13.2 තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය

ගනුදෙනුවල තත් කාලීන පියැවීම් සඳහා උපරිම උපයෝජ්‍යතාවය සහතික කිරීමට, විධිමත් ගෙවීම් පද්ධතියක් නඩත්තු කිරීම තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම්වලින් එකක් විය. 2008 දෙසැම්බර් 31 දින වන විට ගෙවීම් පද්ධතිය සඳහා සියයට 99.6 ක උපයෝජ්‍යතාවයක් ලබා ගැනීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට හැකි වී තිබිණ.

බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිවලට අනවසරයෙන් ඇතුළු වීමට තැත් කිරීම් අනාවරණය කර ගැනීමට හා වැළැක්වීමට, බැංකු ජාල ද්වාරයෙහි පිහිටුවා ඇති අනවශ්‍ය ප්‍රවිෂ්ට වීම් අනාවරණ / නිවාරණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කරන ලදී. තාක්ෂණික විසඳුම් මගින් පමණක් තොරතුරු තාක්ෂණ ආරක්ෂණයට ඇති තර්ජන අවම කළ නොහැකි බැවින්, ආයතනික තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර යාවත්කාලීන කරන ලදී. තවද, බැංකුවේ කාර්ය මණ්ඩලය අතර තොරතුරු තාක්ෂණ ආරක්ෂණයේ දැනුවත් බව වර්ධනය කිරීමට භාෂා තුනෙන්ම ආරක්ෂණ අත්පොතක් සූදානම් කරන ලදී.

වසර තුළ දී බැංකුවේ ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම යාවත්කාලීන කරන ලද අතර ලංකා සෙට්ල් සහභාගිකරුවන්, විදේශීය ප්‍රතිපූරණ හා අභ්‍යන්තර දෙපාර්තමේන්තුවල සහභාගිත්වය ඇතිව ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම් පෙරහුරු, අවස්ථාවන් දෙකකදී ආපදා ප්‍රතිසාධන අංශයේ සිට මෙහෙයවන ලදී. 2008 ජූලි මස සාර්ක් සම්මේලනය පැවතුණු කාලයේදී, නොකඩවා දින පහක කාලයක් ආපදා ප්‍රතිසාධන අංශයේ

සිට බැංකු කටයුතු මෙහෙයවන ලදී. ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම පිළිබඳව දැනුවත් කිරීම සඳහා, දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරන ලද අත් පත්‍රිකාවක් නොබෝ දිනකින් අදාල කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර බෙදා හරිනු ඇත. ලංකාසෙට්ල් සහභාගිකරුවන්ගේ ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම් නිරීක්ෂණ සමාලෝචන සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීහු ක්‍රියාකාරීව සහභාගි වූහ.

ශ්‍රී ලංකා මහ බැංකු කාර්යයන් අධි ස්වයංකෘත පරිසරයක ක්‍රියාත්මක වන බැවින්, පරිශීලක විමසුම් සඳහා ඉක්මන් ප්‍රතිචාරයක් දැක්වීම අත්‍යවශ්‍ය වේ. ඔවුන්ගේ තීරණාත්මක අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට තොරතුරු තාක්ෂණ ආධාරක අංශය පැය 0700 සිට පැය 1830 දක්වා ක්‍රියාත්මක වේ. තොරතුරු තාක්ෂණ සිද්ධීන් හා ආධාරක අංශ විමසුම් වාර්තා කිරීම, නිරීක්ෂණය කිරීම හා ප්‍රතිචාර දැක්වීමට දෙපාර්තමේන්තුව විසින් නිර්මාණය කරන ලද Issue Tracker නම් මෘදුකාංග පද්ධතිය හඳුන්වා දෙන ලදී.

### 13.3. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය

මූල්‍ය අංශයට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් සම්බන්ධිත මහ බැංකු පුළුල් පැතුරුම් ජාලය (CBSLNET) මනාව පරිපාලනය කරන ලදී. මහ බැංකුව මගින් කලින් දරනු ලැබූ බදු රැහැන් මාර්ග (Leased Lines) නඩත්තු පිරිවැය සහභාගී වූ ආයතනවලට පවරා දීමට පසුගිය වර්ෂවලදී යොදන ලද විධි විධාන අවසන් කරන ලදී. තවද, ආරක්ෂණ බාධක හා අනවශ්‍ය ප්‍රවිෂ්ට වීම් අනාවරණ / නිවාරණ පද්ධතීන් වැනි මෙවලම් පිහිටුවීම මගින් ශ්‍රී ලංකා මහ බැංකු අව පැතුරුම් ජාලය වඩාත් ශක්තිමත් කිරීම නොකඩවා සිදු කරන ලදී. සේවක දැනුම් සම්භාරය වර්ධනය කිරීම, තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීමේ අවශ්‍යතාවය, වෙබ් විමසුමට ඇති ඉහළ ඉල්ලුම සහ මූල්‍ය ආයතන විසින් වෙබ් මෘදුකාංග හරහා වාර්තා නිසි කලට ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් අන්තර්ජාල රැහැන් ධාරිතාව 2 Mbps දක්වා ප්‍රසාරණය කරන ලදී. ප්‍රධාන කාර්යාලය හා ආපදා ප්‍රතිසාධන අංශය අතර ඉහළ උපයෝජ්‍යතාවයක් හා වේගවත් දත්ත හුවමාරුවක් ලබා ගැනීම සඳහා නාගරික සීමාව තුළ ඊතර්නෙට් සම්බන්ධයක් (Metro Ethernet Connectivity) භාවිතා කරමින් ප්‍රධාන කාර්යාලයේ සිට ආපදා ප්‍රතිසාධන අංශය තෙක් සම්බන්ධය 4 Mbps දක්වා වැඩි දියුණු කරන ලදී.

ප්‍රතිගුණන මෘදුකාංග (Replication Software) හා පරිගණක මෙහෙයුම් පද්ධති (Operating Systems) වැඩි දියුණු කිරීම මගින් පසුගිය වසර තුළ දී පද්ධතිවල ප්‍රත්‍යස්ථිතිය තවදුරටත් ඉහළ නංවන ලදී.

තත් කාලීන දළ පියවුම් පද්ධතිය (RTGS) හා විදේශ විනිමය අනුපාත පියවීම් සඳහා මූල්‍ය පණිවුඩ ජාලයක් ලෙස ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මුදල් හුවමාරු සංසදය (SWIFT) ක්‍රියා කරයි. එහි තාක්ෂණය හා ආරක්ෂණය උසස් කරලීමේ ව්‍යාපෘතියක් ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මුදල් හුවමාරු සංසදය දියත් කර ඇත. අදියර දෙකකින් යුතු මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර මෙම වසරේ සම්පූර්ණ කිරීම නිසා, වැඩි දියුණු කරන ලද ස්විෆ්ට් සේවාවන් තුළින්, බැංකුවේ මෙහෙයුම් කටයුතු වඩාත් ආරක්ෂිතව සිදු කළ හැකි විය. තවද, ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මුදල් හුවමාරු සංසදය සමග සම්බන්ධ වීමේ පිරිවැය ඉතිරි කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මුදල් හුවමාරු සංසද පරිශීලක කණ්ඩායම විසින් පිහිටුවා ගත් ශ්‍රී ලංකා මූල්‍යමය සේවා කාර්යාංශය (SWIFT Service Bureau of Sri Lanka) හරහා බැංකුවේ ආපදා ප්‍රතිසාධන අංශයේ ද්විතියික ඍජු සම්බන්ධය වක්‍ර සම්බන්ධයක් බවට වෙනස් කරන ලදී.

### 13.4 මූල්‍ය / රාජ්‍ය අංශයට උපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීම

ජාතික තලයේ ව්‍යාපෘතීන් සඳහා තාක්ෂණික සහාය ලබා දීම සහ උපදේශක සේවා සැපයීම දෙපාර්තමේන්තුව මගින් නොකඩවා සිදු කරන ලදී. වසර 2009 සිට තත් කාලීන කුඩා ගෙවීම් පද්ධතිය බවට පත් වන ශ්‍රී ලංකා පොදු ගෙවීම් හුවමාරු පද්ධතිය (Sri Lanka Common Payment Switch) ස්ථාපනය කිරීමේ ලා උචිත විසඳුමක් තෝරා ගැනීම සඳහා තාක්ෂණික යෝජනා ඇගයීම් කිරීමේදී ද මූල්‍ය ගනුදෙනු සහතික කිරීමේ අධිකාරියක් හඳුන්වා දීමේදී ද දෙපාර්තමේන්තුවේ දායකත්වය විශේෂිත විය.

කම්කරු දෙපාර්තමේන්තුව හා සේවක අර්ථ සාධක අරමුදල සඳහා විද්‍යුත් මාධ්‍ය දායක මුදල් රැස් කිරීමේ ප්‍රවර්ධන වැඩ මුළු මෙහෙයවීමේදී තොරතුරු තාක්ෂණ නිලධාරීන් ක්‍රියාකාරීව සහභාගි වූ අතර සේවක අර්ථ සාධක අරමුදල නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සපයන ලදී.

සම්පත්දායකයින් ලෙස බැංකු අධ්‍යයන කේන්ද්‍රයට නිලධාරීන් මුදා හරිමින් සහ දෙපාර්තමේන්තු සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා අභ්‍යන්තර පුහුණු /දැනුවත් කිරීමේ සැසිවාර මෙහෙයවමින්, මූල්‍ය ආයතනවල නිලධාරීන් මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් අතර තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිපුණතා යාවත්කාලීන කිරීමෙහි දෙපාර්තමේන්තුව නිරන්තරවම යෙදී සිටී.

## 14. ජාත්‍යන්තර කටයුතු

මුදල් නීති පනත මගින් නියම කර ඇති පරිදි ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකා රුපියලේ ස්ථායීතාවය පවත්වා ගැනීම සහ රටෙහි ජාත්‍යන්තර ගණුදෙනු ක්‍රියාවලිය බාධාවකින් තොරව උපරිම අයුරින් සිදුකිරීම සඳහා පවත්වා ගෙන යන විදේශ විනිමය සංචිතය කළමනාකරණය කිරීමේ වගකීම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

### 14.1 විදේශ විනිමය සංචිත කළමනාකරණය

2008 වර්ෂය, ගෝලීය ආයෝජකයින්ට අභියෝගාත්මක වසරක් විය. 2007 වර්ෂයේ දී ආරම්භ වූ උප ප්‍රමුඛ උකස් ණය වෙළඳපොළ අර්බුදය නිසා මුදල් වෙළෙඳපොළෙහි පැන නැගි අවුල් සහගත තත්ත්වය මත ලෝක මූල්‍ය අංශය

පෙර නොවූ විරූ අභියෝගවලට මුහුණපාන ලද අතර, එම අර්බුදය ආර්ථිකයේ අනෙකුත් අංශ කරාද ගලාගෙන යන ලදී. එම හේතුවෙන් ගෝලීය වර්ධනය සඳහා වූ අවකාශ අඩු වූ අතර, මූල්‍ය වෙළෙඳපොළ ද පෙර නොවූ විරූ අර්බුද වලට මුහුණපාන ලදී. මෙම තත්ත්වය, බල ශක්ති අර්බුදය හා ආහාර අර්බුදයද සමඟ 2008 දී ප්‍රධාන ආර්ථිකයන් හරහා අවපාතයක් ඇතිවීමේ තැති ගැන්මක් ඇතිකරන ලදී. මෙම වසර තුළ ලෝකයේ බොහෝ වාණිජ බැංකුවල ඇගයීම් තත්ත්වයන් පහත හෙලන ලදී. මූල්‍ය වෙළෙඳපොළ කැළඹීම දිගින් දිගටම ලෝක පොලී අනුපාත සහ වත්කම් මිල ගණන් වලට තර්ජනයක් වූ අතර එමගින් රත්‍රන් හැරුණු කොට අනෙකුත් භාණ්ඩවල මිළ ගණන් විශාල ලෙස පහත වැටීමක් සිදු විය. ප්‍රධාන මූල්‍ය වෙළෙඳපොළ වල බැංකු සහ මූල්‍ය ආයතන බිඳ වැටීම් හේතුවෙන් පුළුල් ලෙස ඇති වූ ණය දීමේ අකමැත්ත බැංකු සහ මූල්‍ය සමාගම් වෙත සැපයෙන විදේශ විනිමය ණය මාර්ග ලෙස විශාල අඩුවීමට හේතු විය. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ඇති වූ මෙම ද්‍රවශීලතා හිඟය සහ ණය සංකෝචනය විදේශිකයින් විසින් ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වල කර තිබූ ආයෝජනයන් ආපසු ගැනීමට ද හේතු වූ අතර, එමගින් ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය මත අමතර පීඩනයක් ඇති කරන ලදී. ඒ අනුව වසරේදී සංචිත කළමනාකරණය අභියෝගාත්මක ක්‍රියාවලියක් විය.

වසර තුළ විදේශ විනිමය සංචිත ආයෝජනය, මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද "විදේශ විනිමය සංචිත කළමනාකරණ මෙහෙයුම් උපදෙස්" වලට අනුව, විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ (FRMC) අධීක්ෂණය යටතේ සිදුකරන ලදී. එක්සත් ජනපද ඩොලර්, යූරෝ, බ්‍රිතාන්‍ය පවුම, ඔස්ට්‍රේලියානු ඩොලර් සහ රත්‍රන් වලින් සමන්විත විදේශ විනිමය සංචිත ප්‍රධාන වශයෙන් "ස්ථාවර ආදායම් සුරැකුම්පත්" සහ "මුදල් වෙළෙඳපොළ උපකරණ" යන වත්කම් දෙවර්ග යෙහි ආයෝජනය කරන ලදී. ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹ, ඉහල ඇගයුමකින් යුත් ස්වෛරී රාජ්‍ය සුරැකුම්පත්, රාජ්‍ය ඇපවීමක් සහිත සුරැකුම්පත් සහ රාජ්‍ය ආයතන සහ ප්‍රමුඛ ජාත්‍යන්තර ආයතන විසින් නිකුත් කළ සුරැකුම්පත් වලින් සමන්විත විය. ඉහත සියලු ආයෝජන, ඉහළ ඇගයුමකින් යුක්ත, අනුමත කළ ගනුදෙනුකාර පාර්ශ්වයන් සමඟ පමණක් සිදුකරන ලදී. කළමනාකාරිත්වය විසින් අනුමත කරන ලද සීමා ව්‍යුහයන් තුළ පමණක් මෙම ආයෝජනයන් සිදු කිරීමත්, එසේ කිරීමේ දී වත්කම් වල සුරක්ෂිතභාවය, ද්‍රවශීලතාවය සහ ලැබෙන්නාවූ ආදායම ගැන සැලකිලිමත් වීමත් සිදුකරන ලදී. සංචිතයේ ආයෝජන සහ මුදල් වර්ග සංයුතිය තීරණය කිරීමේ දී ද්‍රවශීලතාවය, රාජ්‍ය ණය ආපසු ගෙවීම්, අවදානම් කළමනාකරණ පරාමිතීන්, ආදායම ඉපැයීමේ හැකියාවන් සහ මුදල් මණ්ඩලයේ නියමයන් සැලකිල්ලට ගන්නා ලදී.

ණය අවදානමේ හදිසි වැඩිවීමකට නිරාවරණය වීමේ අවස්ථාව අවම කිරීමේ අරමුණෙන් ජාත්‍යන්තර වාණිජ බැංකු වල කර තිබූ ආයෝජනයන් ඒවායින් ඉවත් කර මහ බැංකු සහ ජාත්‍යන්තර පියවීම් සඳහා වන බැංකුවෙහි (BIS) ආයෝජනයට කිරීමට කටයුතු කරන ලදී. ද්‍රවශීල අවශ්‍යතා ඉටුකරගැනීම සම්බන්ධයෙන් සංචිතයේ ප්‍රමාණවත් කොටසක් කාණ්ඩ දෙවර්ගයට අයත් ඉහළ ද්‍රවශීලිතාවයකින් යුක්ත කෙටිකාලීන වත්කම් වල ආයෝජනය කරන ලදී. වර්ෂය තුළදී, සංචිත කළමනාකරණ කටයුතු වලින් අත්පත් කරගත් ශුද්ධ විදේශ විනිමය ආදායම එ.ජ.ඩොලර් මිලියන 153 ක් හෙවත් රුපියල් මිලියන 16,687 ක් වන අතර එය, වසර තුළ අපේක්ෂිත ආදායම වූ එ.ජ.ඩොලර් මිලියන 118 සහ පසුගිය වසරේ ආදායම වූ එ.ජ.ඩොලර් මිලියන 125 ඉක්මවීය. ප්‍රධාන ආර්ථිකයන්හි, පෙර වර්ෂයන්ට සාපේක්ෂව පහළ මට්ටමක පැවැති පොලී අනුපාත මධ්‍යයේ ලඟාකරගන්නා ලද මෙම ඉහළ ආදායම් ප්‍රමාණය සඳහා ස්ථාවර ආදායම් සුරැකුම්පත් අලෙවියෙන් ලැබුණු ප්‍රාග්ධන ලාභය හේතු පාදක විය.

## 14.2 අවදනම් කළමනාකරණය

විදේශ විනිමය සංචිත සහ ඒවායේ ආයෝජන හා බැඳී ඇති විවිධ අවදානම් පිළිබඳව සුපරීක්ෂාකාරීව සිට අදාළ නිසි පියවර ගැනීම ජාත්‍යන්තර කටයුතු දෙපාර්තුමේන්තුවේ මැදි කාර්යාලයෙන් සිදුවේ. විදේශ විනිමය සංචිත සහ ඒවායේ ආයෝජන විවිධ ආකාරවල අවදානම්වලට නිරාවරණය වී පවතී. මෙකී අවදානම් අතර විනිමය අවදානම, පොලී අනුපාත අවදානම, ණය අවදානම, ද්‍රවශීලතා අවදානම සහ මෙහෙයුම් අවදානම ප්‍රධාන තැනක් ගනී. විනිමය අවදානම හෙවත් විනිමය අනුපාතයන්හි සිදුවන උච්ඡාවචනයන් වල ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධන හානියක් සිදුවීමේ අවදානම, ආයෝජන කළඹෙහි විදේශ මුදල් විවිධාංගිකරණය තුළින් කළමනාකරණය කෙරේ. පොලී අනුපාත අවදානම හෙවත් මහ බැංකු සංචිතවල ආයෝජන කළඹ පොලී අනුපාත වල විචලනයන්ට නිරාවරණය වීමෙන් ඇතිවන අවදානම ආයෝජන කළඹේ කාල පැවැත්ම අදාළ ලෙස වෙනස් කිරීම මගින් කළමනාකරණය කෙරේ. ණය අවදානම අවම කිරීම සඳහා ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව "ගණුදෙනුකාර පාර්ශ්වය සඳහා වූ ණය අවදානම් කළමනාකරණ පද්ධතිය" භාවිතා කරනු ලබයි. ද්‍රවශීලතා අවදානම ලෙසින් හඳුන්වනු ලබන අනිවාර්ය උපලබ්ධි කිරීමකට යටත් වීමට සිදුවන අවස්ථාවකදී බැංකුවට දැරීමට සිදුවන ප්‍රාග්ධන හානිවීමේ අවදානම කළමනාකරණය කරගනු ලබන්නේ මූල්‍ය උපකරණවල ද්‍රවශීලතාව සැලකිල්ලට ගනිමින් හා ද්‍රවශීල අවශ්‍යතාවයන් නිර්ණය කරගැනීම මගිනි. මානුෂීය අතපසුවීම්, පද්ධති තුළ සිදුවන ව්‍යාධීන් සහ ප්‍රමාණවත් පටිපාටීන් සහ පාලන ක්‍රම නොපැවතීම මගින් ඇතිවන මෙහෙයුම් අවදානම, පියවර රාශියක් අනුගමනය කිරීම මගින් කළමනාකරණය කරන ලදී.

ලෝක ව්‍යාප්ත මූල්‍ය අර්බුදය හමුවේ ඇතිවිය හැකි ණය සහ ද්‍රවශීලතා අවදානම අඩුකිරීමේ අරමුණෙන් ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව විසින් කාලෝචිත ආරක්ෂක ක්‍රියාමාර්ගයන් වන මූල්‍ය වෙළෙඳපොළ ආයෝජනයන් විදේශ මහ බැංකු වෙත යොමුකිරීම, විදේශ ආයෝජන බැංකුවල ඇති ආයෝජනයන් නිසි වේලාවට ඉවත්කිරීම, ඉතා ශීඝ්‍රයෙන් වෙනස්වන වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ ගනුදෙනු සීමාකිරීම සහ වෙළෙඳපොළ ඇගැයීම් ශක්තිමත් කිරීමට කටයුතු කරන ලදී.

## 14.3 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ වෙනස්වීම් පිළිබඳ අධීක්ෂණය කිරීම

ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකයේ විචලනයන් ක්‍රමවත්ව පවත්වාගැනීමත්, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මනා ක්‍රියාකාරිත්වයකින් පවත්වාගැනීම වැඩිදියුණු කිරීමත් සඳහා ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව විසින් එම වෙළෙඳපොළෙහි ගනුදෙනු සහ එක් එක් වාණිජ බැංකු දෛනිකව පවත්වාගන්නා විදේශ විනිමය පරිමාවන් අධීක්ෂණය කිරීම 2008 වසර තුළදී ද අඛණ්ඩව සිදුකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල විදේශ ආයෝජනයන් කිරීම සඳහාවූ අවහිරතා තවදුරටත් ලිහිල් කිරීම හේතුවෙන් රටතුළට විදේශ විනිමය ගැලීම් ඉහළ ගිය අතර ඒ නිසා වසරේ පළමු මාස 8 තුළ විනිමය අනුපාතයේ ස්ථායීතාව කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකිව තිබුණි. මෙහිදී රුපියල ප්‍රතිප්‍රමාණය වීමෙන් ආනයන, අපනයන ආදී අංශ වලට මෙන්ම සමස්ත ආර්ථිකයටම සිදුවිය හැකි සෘණාත්මක බලපෑම ඉවත්කරනු පිණිස එක්සත් ජනපද ඩොලර් මිලියන 674 ක අතිරික්ත විදේශ විනිමය ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් මිලට ගන්නා ලදී. එහෙත් මෙම තත්ත්වය ගෝලීය මූල්‍ය අර්බුදය නිසා 2008 සැප්තැම්බර් සිට වෙනස්විය. වසරේ අවසාන මාස 4 තුළ හදිසියේම විදේශ විනිමය පිටතට ගලායාමේ නැඹුරුවක් ආරම්භ වීමත් සමඟ විනිමය අනුපාතයෙහි වූ අධික උච්ඡාවචනයන් සමනය කිරීම සඳහා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතුවලට මැදිහත්වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුවිය. රජයේ සුරැකුම්පත් වල විදේශිකයන්ගේ යෙදවුම් ආපසු ලබාගැනීමට උනන්දු වීම, වසරේ අවසාන කාර්තුවට අදාළ වූ සාපේක්ෂව ඉහළ මිල ගණන් යටතේ මිලට ගත් ඉන්ධන බිල්පත් ගෙවීමට සිදුවීම ආදිය, සැලකිය යුතු ප්‍රමාණයක් විදේශ විනිමය පිටතට ගලායාම කෙරේ බලපාන ලදී. ඒ අනුව 2008 වසරේදී, එක්සත් ජනපද ඩොලර් මිලියන 1,532 ක් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට මුදාහැරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුවිය.

අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව 2007 වසරේදී එක්සත් ජනපද ඩොලර් මිලියන 9,275 ක් වූ අතර 2008 වසරේ සමගාමී අගය එක්සත් ජනපද ඩොලර් මිලියන 14,132 ක් වෙමින් සියයට 52.36 ක වර්ධනයක් පෙන්වනු ලැබීය.

තවදුරටත්, දේශීය විදේශ විනිමය වෙළෙඳ පොළෙහි කටයුතු මැනවින් කරගෙනයාමට තර්ජනයක් විය හැකිව පැවැති, සමප්‍රේක්ෂණ ගනුදෙනු පාලනය කිරීම සඳහා වාණිජ බැංකුවල අනුමත දෛනික විදේශ විනිමය පවත්වා ගැනීම් ප්‍රමාණයන් සංශෝධනය කරන ලදී. ශ්‍රී ලංකා රුපියලට එරෙහිව අනෙකුත් විදේශ මුදල් සඳහා වූ විනිමය අනුපාත තොරතුරු රජයේ දෙපාර්තමේන්තුවලට සහ සංස්ථාවලට, දේශීය හා විදේශීය ආයතන සහ වෙනත් පාර්ශ්වයන්ට සැපයීම 2008 වසර තුළදීද අඛණ්ඩව සිදුකරන ලදී.

**සංඛ්‍යා සටහන II-10**

**අන්තර් බැංකු විදේශ විනිමය ගණුදෙනු පරිමාව - 2008**

එ.ජ.ඩොලර් දශ ලක්ෂ

| මාසය | එතැන් | පසුදින | එදින | ඉදිරි | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 552 | 150 | 95 | 476 | 1273 |
| පෙබරවාරි | 398 | 127 | 138 | 414 | 1077 |
| මාර්තු | 451 | 95 | 160 | 389 | 1094 |
| අප්‍රේල් | 409 | 269 | 177 | 375 | 1230 |
| මැයි | 331 | 140 | 140 | 387 | 998 |
| ජූනි | 306 | 256 | 101 | 434 | 1097 |
| ජූලි | 417 | 210 | 187 | 602 | 1416 |
| අගෝස්තු | 292 | 170 | 106 | 542 | 1110 |
| සැප්තැම්බර් | 393 | 231 | 138 | 556 | 1318 |
| ඔක්තෝබර් | 826 | 169 | 120 | 768 | 1883 |
| නොවැම්බර් | 391 | 139 | 87 | 298 | 915 |
| දෙසැම්බර් | 306 | 108 | 75 | 231 | 720 |
| එකතුව | 5070 | 2064 | 1526 | 5472 | 14132 |

**සංඛ්‍යා සටහන II-11**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය මිලදී ගැනීම් සහ විකුණුම් වල මාසික සාරාංශය - 2008**

එ.ජ.ඩොලර් දශ ලක්ෂ

| මාසය | මිලට ගැනීම් | විකුණුම් | ශුද්ධ මිලට ගැනීම් |
|---|---|---|---|
| ජනවාරි | 136 | 24 | 112 |
| පෙබරවාරි | 160 | 7 | 153 |
| මාර්තු | 95 | 14 | 81 |
| අප්‍රේල් | 57 | 136 | (79) |
| මැයි | 5 | 47 | (42) |
| ජූනි | 31 | 51 | (20) |
| ජූලි | 124 | 0 | 124 |
| අගෝස්තු | 14 | 36 | (22) |
| සැප්තැම්බර් | 0 | 203 | (203) |
| ඔක්තෝබර් | 0 | 588 | (588) |
| නොවැම්බර් | 0 | 266 | (266) |
| දෙසැම්බර් | 53 | 160 | (108) |
| එකතුව | 674 | 1532 | (858) |

# 15. නීති

නීති දෙපාර්තමේන්තුව 2008 වසර තුළදී ද බැංකුවේ පරමාර්ථ මුදුන් පත්කිරීමට දායකත්වය සැපයීය. ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම, නීති සහ අතුරු නීති සම්පාදනය සහ අධිකරණ සහ වෙනත් විනිශ්චය සභා ඉදිරියේ බැංකුවේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම යන ආකාරයෙන් මෙම දායකත්වය සපයන ලදී.

බැංකුකරණය, තැන්පතු රක්ෂණය සහ සමාගම් නගා සිටුවීම සහ ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල නීති සම්පාදනයේ දී දෙපාර්තමේන්තුව ක්‍රියාශීලී දායකත්වයක් සපයන ලදී. විශේෂයෙන්ම යහපාලනය සහ ගෙවීම් උපක්‍රම ඇතුළුව මූල්‍ය පද්ධතියේ ස්ථාවරතාවය සම්බන්ධ අතුරු නීති සම්පාදනයේ දී දෙපාර්තමේන්තුවේ සහාය ලබාදෙන ලදී.

මහ බැංකුව විසින් හඳුන්වා දුන් විචක්ෂණශීලී නියමයන්ගේ වලංගුතාවය අභියෝගයට ලක් කරමින් බැංකුවට එරෙහිව පැවැති අධිකරණ ක්‍රියාමාර්ග විශාල සංඛ්‍යාව හේතුකොට ගෙන 2008 වසර විශේෂයෙන්ම අභියෝගාත්මක වසරක් විය. මහජන සුභසිද්ධිය අවසාන පරමාර්ථය වශයෙන් සලකා බැංකුව විසින් ගන්නා ලද සක්‍රීය මැදිහත් වීම් මගින් මෙම අභියෝග යට සාර්ථකව මුහුණ දෙන ලදී. මූල්‍ය ආයතන ඵලදායී ලෙස නියාමනය කිරීමේ අවශ්‍යතාව පිළිගන්නා අධිකරණමය තීන්දු ලබාගැනීමට බොහෝ අවස්ථාවලදී හැකිවිය.

## 16. කළමනාකාරිත්ව විගණන

බැංකු කටයුතු හා ඒවාට අදාළ පාලන ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අවැසි වන යෝජනා ඉදිරිපත් කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ 2008 වසරේ උපාය මාර්ගික සැලසුම මගින් ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය සහාය, අවදානම මත පදනම් වූ විගණන ප්‍රවේශයක් මගින් 2008 වසර තුළදී කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් තම අභ්‍යන්තර විගණන හා කළමනාකරණ සේවා කටයුතු මගින් ඉටුකරන ලදී. ඒ අතර මුදල් මණ්ඩලයේ විගණන කමිටුවේ හා මහ බැංකු අවදානම් කළමනාකරණ කමිටුවේ ලේකම් කාර්යාලය ලෙස ද මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාකරන ලදී.

2008 වසරේ විගණන සැලසුමට අනුව යමින් ස්ථාපිත අභ්‍යන්තර පාලන ක්‍රමයන්හි ප්‍රමාණවත්භාවය තහවුරු කිරීම සඳහා ද, එලෙසම නිශ්චිත පාලන ක්‍රමවල අනුකූලතාවය තහවුරු කරගැනීමේ විගණන කටයුතු ද නොකඩවා පවත්වාගෙන යමින් විගණන පැවරුම් රාශියක් දෙපාර්තමේන්තුව මගින් ඉටුකරන ලදී. ඒ අනුව සමහර අභ්‍යන්තර විගණනයන්, දෙපාර්තමේන්තුවල පවතින අවදානම් තක්සේරු කිරීම පදනම් කොටගෙන ඉටුකරනු ලැබූ අතර තවත් තනි තනි වූ විගණන පැවරුම් කිහිපයක් පවතින අවදානම් මට්ටම කෙරෙහි වඩා වැඩි අවධානය යොමු කරමින් සකස් කරන ලදී. තවද, පසුගිය වසරේ මෙන්ම විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ මට්ටම තහවුරු කරගැනීම සඳහා වූ පසුවිපරම් විමර්ශන කටයුතු ද ඉටුකරන ලදී.

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් 2008 වසරේ විගණන සැලසුම අනුව බොහෝ විගණනයන් සම්පූර්ණ කරන ලදී. එමෙන්ම ලේකම් දෙපාර්තමේන්තුවට හා සුභසාධන දෙපාර්තමේන්තුවට අදාළ සියළුම "පූර්ව විගණන" කටයුතු ද ඉටුකරන ලදී. මීට අමතරව මානව සම්පත් දෙපාර්තමේන්තුවට හා ලේකම් දෙපාර්තමේන්තුවට අදාළ වූ අනුකූලතා විගණන කටයුතු ද සාර්ථක ලෙස ඉටුකරන ලදී.

ඉහළ සහ මධ්‍යස්ථ අවදානම් සහිත මෙහෙයුම් කටයුතු සිදුකරන අංශ සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුවල කටයුතු හා ක්‍රියා පිළිවෙත් වල මනා ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව විසින් වැඩි සම්පත් දායකත්වයක් එක්කරමින් විශේෂ විගණන පැවරුම් රාශියක් ඉටුකරන ලදී. මේ යටතේ ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම (BCP), ප්‍රවේශ පාලන පද්ධතිය සහ මහ බැංකුවේ ආරක්ෂිත කැමරා පද්ධතිය හා මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ ඔරකල් දත්ත සමුදාය පරිපාලනය සම්බන්ධ නිශ්චිත පිවිසුම් ක්‍රමය පිළිබඳ විගණනයන් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලදී. අනෙකුත් විගණනයන් වන්නේ ආපදා අවස්ථාවකදී බැංකුමය කටයුතු කරගෙන යෑමේ පෙරහුරුව, නිවාඩු නිකේතන සඳහා ගාස්තු අය කිරීමේ ප්‍රතිපත්තිය, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි තේ සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමයෙහි 2007 වසරේ මූල්‍ය ප්‍රකාශන, ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ගෙවනු ලැබූ හිමිකම් මුදල් ආපසු අයකර ගැනීමේ පිළිවෙත සහ දිළිඳුකම පිටුදැකීම සඳහා වූ සුළු පරිමාණ ණය යෝජනා ක්‍රමයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා ඇති පාලන විධික්‍රමයන්හි සඵලදායීත්වය ඇගයීම, මහ බැංකු මුද්‍රණාලයේ වියදම් මත පාලනය, විදේශ මුදල් සංචිතයෙන් එක් එක් ප්‍රතිපාර්ශවයන් සමග ගනුදෙනු සීමාවන්, එම සංචිතයෙන් එක් එක් විදේශ මුදල්වල තබාගත යුතු සංයුතිය පිළිබඳ සීමාවන් පිළිපැදීම සම්බන්ධව ද, ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන ප්‍රාග්ධන වියදම් ගිණුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ සංචිත කළමනාකරණ කටයුතු සම්බන්ධ සීමාවන් ඇති කිරීම සහ ලේකම් දෙපාර්තමේන්තුවේ සේවා ගිවිසුම්වලට අදාළ සමස්ත කටයුතු සම්බන්ධ විවරණය යන ඒවා ප්‍රධාන වේ. මීට අමතරව, බැංකුව තුළ ක්‍රියාත්මක මෘදුකාංග පද්ධතියේ සඵලදායිතාවය තහවුරු කිරීමට විගණන දෙපාර්තමේන්තුව විසින් ඉහළ අවධානයක් යොමුකර තොරතුරු තාක්ෂණ පද්ධති විගණනය ආරම්භ කරන ලද අතර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි තොරතුරු තාක්ෂණ පද්ධති විගණන අධ්‍යයනය ආරම්භ කිරීම හා සීමිත පරාසයක් තුළ වෙනත් තොරතුරු තාක්ෂණ පද්ධති විගණන පැවරුම් කිහිපයක් ද සිදුකරන ලදී.

2008 වර්ෂය තුළ කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව ක්‍රියාවලි විගණනවලට මූලිකත්වය දෙනු ලැබූ අතර එහිදී ක්‍රියාපටිපාටිවලට අදාළ ගැටළු රාශියක් හඳුනා ගැනීමට හැකි විය. මෙම නිරීක්ෂණයන් සහ විගණන අනුමැති අදාළ දෙපාර්තමේන්තුවලට මෙන්ම අධිපතිතුමාට සහ විගණන කමිටුවට නිතිපතා වාර්තා කරන ලදී. වසරේ දෙවන කාර්තුව තුළ මෙම වාර්තා මුදල් මණ්ඩලයේ දැනගැනීම සඳහා ද ඉදිරිපත් කරන ලදී.

2008 වර්ෂය තුළ මහ බැංකුවට අදාළ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ඉහළ නැංවීමට කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව තවදුරටත් ක්‍රියාකරන ලදී. අවදානම් කළමනාකරණය භාර නිලධාරීන්ගේ එම විෂය පිළිබඳව දැනුම වැඩිදියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කරගෙන යන ලදී. අවදානම් සහගත සිදුවීම් / අවස්ථා වාර්තා කිරීමේ ක්‍රියාවලිය මෙම වර්ෂය තුළදී ද අඛණ්ඩව සිදුවූ අතර, දෙපාර්තමේන්තු කටයුතුවලට අදාළ "අවදානම් දැරිය හැකි මට්ටම් තීරණයට" අවශ්‍ය කටයුතු ද අඛණ්ඩව සිදු කෙරිණි.

විදේශ විනිමය සංචිත පිළිබඳ ප්‍රවේසම්කාරී සංචිත කළමනාකරණය සඳහා වන යෝජනා සහිත වූ සවිස්තරාත්මක වාර්තාවක් දෙපාර්මේන්තුව විසින් සකස් කරන ලද අතර එය අධිපතිතුමාගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

දෙපාර්තමේන්තුව මගින් සිදුකෙරෙන කටයුතු ඉහළ නැංවීම පිණිස විගණන මෘදුකාංගයක් (ACL) මිලදී ගැනීම සඳහා දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත. එය මිලදී ගැනීම සඳහා වූ කටයුතු දැනට සිදුවෙමින් පවතී. 2009 වසරේදී මෙම අංශයෙහි කටයුතු වඩා හොඳින් කරගෙන යෑමේ අරමුණින් නිලධාරීන් දෙදෙනෙකුට මෙම මෘදුකාංගය සම්බන්ධව විශේෂ පුහුණුවක් ද ලබාදෙන ලදී.

දෙපාර්තමේන්තුවේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා ඉදිරි පියවරක් වශයෙන් විගණනය හා බැඳුනු කටයුතු පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

# 17. ගෙවීම් සහ පියවීම්

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත මගින් ගෙවීමේ, නිශ්කාෂණය කිරීමේ හා බේරුම් කිරීමේ පද්ධති නියාමනය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් පොත් පත් අනුව සුරැකුම්පත් නියාමනය, මූල්‍ය සේවා සපයන ආයතන නියාමනය, විද්‍යුත් මාර්ගයෙන් චෙක්පත් ඉදිරිපත් කිරීම සඳහා විධිවිධාන සැලසීම සහ ගෙවීම් හා පියවීම් පද්ධති හා සම්බන්ධ ඕනෑම කාර්ය භාරයක් සඳහා පුළුල් පරාසයක පැතිරුනු බලයක් හා අධිකාරිත්වයක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම කාර්යයන් ඉටුකරනු ලබන්නේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව මගිනි. ඒ අනුව, මූල්‍ය පද්ධතියට ඇතිවන අභ්‍යන්තර හා බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාවක් ඇති, සුරක්ෂිත, ශක්තිමත් හා කාර්යක්ෂම මූල්‍ය පද්ධතියක් පවත්වා ගැනීමේ අරමුණ ලඟාකර ගැනීම සඳහා ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව 2008 වර්ෂයේදී ද, පද්ධතිමය වශයෙන් වැදගත්, ඉහළ වටිනාකම් සහිත ගෙවීම් හා පියවීම් පද්ධතිය වන තත්කාලීන දළ පියවීම් පද්ධතිය මෙහෙයවීම, ලංකාසෙට්ල් පද්ධතිය හරහා කෙරෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනුවලට අදාළ විද්‍යුත් ප්‍රවේශ කවුළුව මෙහෙයවීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය සංචිත කළමනාකරණ හා විවට වෙළෙඳපොළ කටයුතුවලට අදාළ ගෙවීම් හා පියවීම් පිළිබඳ උපදෙස් පිළියෙල කිරීමේ හා බලගැන්වීමේ පසු මෙහෙයුම් කාර්යාල කටයුතු (Back Office Functions) කිරීම, ස්විෆ්ට් ජාලය හරහා සිදුකරන ගනුදෙනු මෙයෙවීම හා කළමනාකරණය කිරීම, ආසියානු නිශ්කාෂණ සංගමය හරහා කෙරෙන වෙළෙඳ හා මූල්‍ය ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සහ රට තුළ පවතින ගෙවීම් හා පියවීම් පද්ධතීන්ට අදාළ ප්‍රතිපත්ති සැකසීම හා ඒවා අවේක්ෂණය කිරීම යන කටයුතු තවදුරටත් සිදුකරන ලදී. මෙයට අමතරව, සාක් කලාපීය ගෙවීම් ප්‍රවේශය ස්ථාපිත කිරීම හා එහි ලේකම් කාර්යාලය මහ බැංකුව තුළ පවත්වාගෙන යාමේ කටයුතු ද දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලැබීය.

## 17.1 තත්කාලීන දළ පියවීම් පද්ධතිය මෙහෙයවීම

මූල්‍ය වෙළෙඳපොළෙහි, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිත්ව ආයතන අතර සිදුකරන ලද ගෙවීම් මෙන්ම ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් ද, තත්කාලීන දළ පියවීම් පදනම මත පියවීම හා එම සහභාගිත්ව ආයතන සඳහා කාර්යාල වේලාවන් තුළදී උපකාරක සේවා ලබාදීම ද 2008 වසර තුළදීත්, තත්කාලීන දළ පියවීම් මෙහෙයුම් අංශය විසින් නොකඩවා සිදුකරන ලදී. මෙම වසර තුළදී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ සිදුකළ ගනුදෙනු සංඛ්‍යාව 228,654 ක් වූ අතර එම ගනුදෙනුවල මූල්‍ය වටිනාකම රුපියල් බිලියන 25,131 ක් විය. තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ එක් දිනකදී වාර්තා කළ විශාලම ගනුදෙනු සංඛ්‍යාව වූ 1,515, 2008 වර්ෂයේ දී වාර්තා වූ අතර එහි වටිනාකම රුපියල් බිලියන 277 ක් විය. වසර තුළ සිදුකළ ගනුදෙනු සංඛ්‍යාවේ සහ ඒවායේ මූල්‍ය වටිනාකම්වල දෛනික සාමාන්‍යය පිළිවෙලින් 949 ක් සහ රුපියල් බිලියන 104 ක් විය. පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා, මහ බැංකුව විසින් දවස තුළ ලබාදෙන ද්‍රවශීලතා පහසුකම (Intra-day Liquidity Facility-ILF) යටතේ දිනකට රුපියල් බිලියන 9.0 ක පමණ ප්‍රමාණයක් එම පහසුකම ඉල්ලා සිටි තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිත්ව ආයතන වෙත ලබාදෙනු ලැබීය.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු 22 ක්, බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන් 8 ක්, සේවක අර්ථසාධක අරමුදල, සහ කොළඹ කොටස් හුවමාරුවේ මධ්‍යම තැන්පතු පද්ධතිය යන ආයතනයන්ය. ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් (පකිස්ථාන්) බැංකුව, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව සමඟ ඒකාබද්ධ වීම නිසා 2008 වසර අවසානයේ දී ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිත්ව ආයතන සංඛ්‍යාව 33 ක් විය. කාර්ය සාධන දර්ශකයක් ලෙස ගත් විට, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ ක්‍රියාකාරී පැවැත්ම 2008 වසර තුළදී සියයට 99.65 ක් ලෙස පවත්වා ගැනීමට එම පද්ධතියේ මෙහෙයුම් අංශයට හැකිවිය. හදිසි අවස්ථාවකදී පද්ධතියේ ක්‍රියාකාරී පැවැත්ම, සේවා බිඳ වැටීමකින් තොරව පවත්වා ගතහැකි බව තහවුරු කරගැනීම සඳහා ප්‍රතිප්‍රාප්ති වැඩ බිම් භාවිතා කොට කිහිප වතාවක්ම සජීව මෙහෙයුම් කටයුතු සාර්ථකව සිදුකරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති විධානයන්ට අනුව සහභාගිත්ව ආයතනවල ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමේ සැලසුම් (Business Continuous Plans) ගුණාත්මක වශයෙන් වැඩිදියුණු කිරීමටද සහභාගිත්ව ආයතන උනන්දු කරවනු ලැබීය. මේ අතර, මෘදුකාංගවල සිදුකරන ලද ගුණාත්මක වර්ධනයන් තුළින් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම්වල දක්නට ලැබුණු ප්‍රගතිය පිළිබඳව සලකා බලා, තත්කාලීන දළ පියවීම් පද්ධතිය දවසේ ගනුදෙනු අවසානයේ වසා දමනු ලබන වේලාව 2008 නොවැම්බර් 03 දින සිට බලපැවැත්වෙන පරිදි ප.ව. 5.15 සිට ප.ව. 5.00 දක්වා ඉදිරියට රැගෙන එන ලදී. ප්‍රධාන කාර්යාලය හා ප්‍රතිප්‍රාප්ති වැඩ බිම යන ස්ථාන දෙකෙහිදීම තත්කාලීන දළ පියවීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි හදිසි අවස්ථාවකදී, බිඳ වැටීමකින් තොරව ගෙවීම් හා පියවීම් කටයුතු කරගෙනයාම සඳහා පුද්ගලික පරිගණක මත පදනම් වූ පියවීම් පද්ධතියක් ද සකස් කරන ලදී.

## 17.2 විදේශ විනිමය සංචිත කළමනාකරණයට අදාළ ගනුදෙනු පියවීම

ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ විදේශ විනිමය, රන් හා විදේශ සුරැකුම්පත් පියවීමේ අංශය විසින් භාණ්ඩාගාර

ගනුදෙනු කළමනාකරණ ක්‍රමය (Treasury Dealing Room Management System - TDRMS) හරහා, ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද ගනුදෙනුවල පසු මෙහෙයුම් කාර්යාලීය කටයුතු (Back Office Funtions) නොකඩවා සිදුකරනු ලැබීය. 2008 වසර තුළදී ඩොලර් බිලියන 50.04 ක් වූ පියවීම් උපදෙස් 7,049 ක් මෙම මෙහෙයුම් අංශය මගින් ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම, භාණ්ඩාගාර ගනුදෙනු කළමනාකරණ පද්ධතියෙහි පසු මෙහෙයුම් කාර්යාලයීය ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම හා ජාත්‍යන්තර ආයතන සමඟ අදාළ ගිවිසුම් අත්සන් කරමින් ගනුදෙනුවල අවශ්‍යතාවයන් සඳහා පහසුකම් සැපයීමද මෙම අංශය මගින් කරන ලදී.

### 17.3 විවට වෙළෙඳපොළ කටයුතු පිළිබඳ ගනුදෙනු පියවීම

සහභාගිත්ව ආයතන සමඟ කරන ලද විවට වෙළෙඳපොළ ගනුදෙනුවලට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආයෝජන කළඹෙන් සුරැකුම්පත් වෙන්කර දීමේ වගකීම විවිට වෙළෙඳ කටයුතු පියවීමේ අංශය සතුවේ. මෙම අංශය මගින් වටිනාකම රුපියල් බිලියන 850 ක් වූ ප්‍රතිමිලදී ගැනීම් (Repo) ගනුදෙනු 2,234 ක් ද, වටිනාකම රුපියල් බිලියන 904.6 ක් වූ ප්‍රති විකුණුම් (Reverse Repo) ගනුදෙනු 1,037 ක්ද, රුපියල් බිලියන 28.3 ක් වූ ස්ථිර පදනමක් මත කරන ලද විකුණුම් (Outright sales) ගනුදෙනු 252 ක් ද, රුපියල් බිලියන 12.5 ක් වූ ස්ථිර පදනමක් මත කරන ලද මිලදී ගැනීම් (Outright purchases) ගනුදෙනු 49 ක් ද, වටිනාකම රුපියල් බිලියන 176.7 ක් වූ මහ බැංකු සුරැකුම්පත් (Central Bank Securities) ගනුදෙනු 409 ක් ද සඳහා වූ පියවුම් කටයුතු සිදුකරන ලදී.

නිර්ලේඛන සුරැකුම්පත් වෙනුවෙන් සහභාගිත්ව ආයතනවලට දවස තුළ ලබාදෙන ද්‍රවශීලතා පහසුකම සැපයීමත්, නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් පද්ධතිය ආරම්භයේ සිට දවස පුරා, සහභාගිත්ව ආයතන විසින් ලබාගන්නා ලද එම ද්‍රවශීලතා පහසුකම් පියවනු ලබන ආකාරය නිරීක්ෂණය කිරීමත් ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදුකරන ලදී. 2008 වර්ෂය තුළදී, දවස තුළ ලබාදෙන ද්‍රවශීලතා පහසුකම් යටතේ වටිනාකම රුපියල් බිලියන 2,189.2 ක් වූ ගනුදෙනු 9,645 ක් සඳහා පියවුම් කටයුතු සිදුකරන ලදී.

### 17.4 ස්විෆ්ට් සන්නිවේදන කටයුතු මෙහෙයවීම

ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ ස්විෆ්ට් සන්නිවේදන අංශය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්විෆ්ට් පණිවිඩ හා සම්බන්ධ කාර්යයන්හි නිරත වූ අතර ස්විෆ්ට් පද්ධතිය සංවර්ධනය කිරීමේ සැලසුමට සමගාමී වෙමින් පහත දැක්වෙන වෙනස්කම් සිදුකරන ලදී.

- RSA (Asymmetric Security Algorithm) යතුරු උත්පාදනය කිරීම හා සියළුම තර්කානුකූල පර්යන්තයන්ගේ (Logical Terminals) සහතික යාවත්කාලීන කිරීම
- අනුපූරක ආයතන සමඟ පවත්වන සබඳතා කළමනාකරණය සඳහා භාවිතා කළ, ද්වි පාර්ශ්වික යතුරු හුවමාරු (Bilateral Key Exchange - BKE) ක්‍රමය, නව සබඳතා කළමනාකරණ යෙදවුමට (Relationship Management - RMA) යොමු කිරීම සාර්ථකව නිමකිරීම සහ ස්විෆ්ට් නෙට් දෙවන අදියර අවසන් කිරීම.
- SAA/SAE/RMA යන යෙදවුම් 6.0.50 අනුවාදයට යාවත්කාලින කිරීම.

2008 වසර තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යොමුකරන ලද හා ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබුණු ස්විෆ්ට් නෙට් පණිවිඩ සංඛ්‍යාව පිළිවෙලින් 1,206,408 ක් හා 794,075 ක් විය. ලැබුණු පණිවිඩ සංඛ්‍යාවෙන් 154,358 මහ බැංකුවේ ගනුදෙනුවලට අදාළ ඒවා වූ අතර ඉතිරිය ලංකාසෙට්ල් පද්ධතියට අදාළ ගනුදෙනු හා සම්බන්ධ ස්විෆ්ට් පණිවිඩ විය.

### 17.5 ආසියානු නිශ්කාෂණ සංගමයේ (ආ.නි.සං.) ගනුදෙනු

ආසියානු නිශ්කාෂණ සංගම් යාන්ත්‍රණය හරහා ශ්‍රී ලංකාව විසින් සිදුකරන ලද ගනුදෙනුවල මුළු වටිනාකම 2007 දී රුපියල් බිලියන 337 සිට රුපියල් බිලියන 363 දක්වා 2008 දී සියයට 8 කින් වර්ධනය විය. ඉරානයෙන් තෙල් ආනයනය කිරීම වැඩිවීමත්, 2008 මුල් මාස 10 තුළ තෙල් මිල ඉහළ අගයක පැවැතීමත් මෙම වර්ධනයට හේතු විය. 2008 වසර තුළදී ආසියානු නිශ්කාෂණ සංගම් යාන්ත්‍රණය හරහා කරන ලද ශුද්ධ පියවීම්වල වටිනාකම රුපියල් බිලියන 315 ක් දක්වා සියයට 7 කින් වර්ධනය විය.

**සංඛ්‍යා සටහන II-12**

**ආසියානු නිශ්කාෂණ සංගමයේ අනෙකුත් රටවල් සමඟ ශ්‍රී ලංකාවේ වෙළඳාම් සහ ආ.නි.සං. ගණුදෙනු වටිනාකම (රුපියල් බිලියන)**

| අයිතමය | 2006 | 2007 |
|---|---|---|
| ආ.නි.සං.හරහා සිදුකරන ලද මුළු ගණුදෙනු | 337.2 | 363.3 |
| ශ්‍රී ලංකාව ආ.නි.සං. රටවලට කරන ලද අපනයන | 78.8 | 72.3 |
| ශ්‍රී ලංකාව ආ.නි.සං.රටවලින් කරන ලද ආනයන | 403.7 | 525.3 |
| ශ්‍රී ලංකාව ආ.නි.සං.රටවල් සමඟ කරන ලද මුළු වෙළෙඳ ගණුදෙනු | 482.2 | 597.6 |
| ආ.නි.සං.ගණුදෙනුවල ශුද්ධ පියවීම් | 293.5 | 315.2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2008 ජූනි මාසයේ දී මියන්මාර්හි පැවැති 37 වන ආ.නි.සං. යේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ප්‍රධාන අවධානය යොමුකරනු ලැබුයේ 2008 පෙබරවාරි මස ශ්‍රී ලංකා මහ බැංකුවේ සභාපතිත්වය යටතේ පැවැති ආ.ස.නිං. යේ තාක්ෂණික කමිටුවේ නිර්දේශයන් කෙරෙහිය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන නිර්දේශයන් ඒකමතිකව අනුමත කරන ලදී.

1. ආ.නි.සං. යාන්ත්‍රණය හරහා සිදුකරන ගනුදෙනු එ.ජ.ඩො.වලින් හෝ යූරෝ වලින් පියවීම සහ ඒ සඳහා වෙන් වෙන්ව ගිණුම් තැබීමේ ක්‍රම දෙකක් පවත්වාගෙන යාම, එනම්, එක් ගිණුම් ක්‍රමයක් එ.ජ.ඩො. වලින් කරන ගනුදෙනු සඳහා ද අනෙක් ගිණුම් ක්‍රමය යූරෝ වලින් කරන ගනුදෙනු සඳහා ද වශයෙනි.

2. මාසික පුවත් පත්‍රිකාව හා වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේදීත් මුදල් හුවමාරුව (Currency Swap) සඳහා හැකියාව හා හිමිකම තීරණය කිරීමේදීත් පදනම් මුදල් වර්ගය ලෙස එ.ජ.ඩො. භාවිතා කිරීම.

3. සැසඳුම් අනුපාතය (Reference Rate) ලෙස අන්තර් ජාතික මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත විශේෂ ගැනුම් හිමිකම් (SDR) හරස් අනුපාතය (Cross Rate) යොදා ගැනීම.

4. පියවීම් කාලපරිච්ඡේදයක් අවසානයේ දී ආ.නි.සං. ඩොලර් සහ ආ.නි.සං. යූරෝ ගිණුම් එක්ව ගත්කල පවතින ශුද්ධ හිඟය පදනම් කරගෙන මුදල් හුවමාරුව (Currency Swap) සඳහා ඇති හැකියාව නිර්ණය කිරීම.

5. බාර්ක්ලේස් බැන්ක් වෙනුවට බ්‍රිටිෂ් බැන්කර්ස් ඇසෝසියේෂන් විසින් ප්‍රකාශිත පොලී අනුපාතය, මුදල් හුවමාරුව සඳහා සැසඳුම් පොලී අනුපාතය ලෙස යොදා ගැනීම.

6. ආ.නි.සං. ලේකම් කාර්යාලය විසින් සකස් කරන ලද තොරතුරු හා පත්‍රිකා පදනම් කරගෙන ආ.නි.සං. යාන්ත්‍රණය පිළිබඳව වාණිජ බැංකුවල දැනුම වර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.

2009 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කළහැකි වන පරිදි ආ.නි.සං. ලේකම් කාර්යාලය විසින් ආ.නි.සං. ගිවිසුම් හා කාර්ය පටිපාටීන් සංශෝධනය කර ඇත. ඒ අනුව, 2008 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු වෙත ආ.නි.සං. ඩොලර් සහ ආ.නි.සං.යූරෝ යටතේ ආ.නි.සං. යාන්ත්‍රණය ක්‍රියාත්මක වීම පිළිබඳ වූ මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. එමෙන්ම, ආ.නි.සං. යාන්ත්‍රණය පිළිබඳව වාණිජ බැංකු වල අදාළ නිලධාරීන් දැනුවත් කිරීමත්, ආ.නි.සං. ගනුදෙනු ප්‍රායෝගිකව සිදුකරනු ලබන ආකාරය පිළිබඳව ඔවුන්ගේ අදහස් ලබාගැනීමත් සඳහා 2008 දෙසැම්බර් මාසයේදී, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකුවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් ද ක්‍රියාත්මක කළේය.

ආ.නි.සං. යේ 38 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම කොළඹ දී පැවැත්වීමටත්, 2009 වර්ෂය සඳහා එහි සභාපතිවරයා ලෙස ශ්‍රී ලංකා මහබැංකුවේ අධිපතිවරයා පත්කිරීමටත් ආ.නි.සං. යේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද අතර 38 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වීම සඳහා මූලික කටයුතු දෙපාර්මේන්තුව විසින් ආරම්භ කර ඇත.

## 17.6 ගෙවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ අවේක්ෂණය

ගෙවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සහ අවේක්ෂණය කිරීමේ අංශය විසින් සිය නිත්‍ය අවේක්ෂණ කටයුතු නොකඩවා සිදුකරන ලද අතරතුර පද්ධතිමය වශයෙන් වැදගත් ගෙවීම් හා පියවීම් පද්ධතියේ විශ්වසනීයත්වය පවත්වා ගැනීම හා අවදානම අවම කිරීම කෙරෙහි සිය ප්‍රධාන අවධානය යොමුකරන ලදී. ගෙවීම් හා පියවීම් පද්ධතියේ බිඳවැටීමක් තුළින් පද්ධතිමය වශයෙන් ඇතිවිය හැකි අහිතකර වූ අවදානම් තත්ත්වයන් සළකා බලා, සහභාගිත්ව ආයතනවල ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් කේන්ද්‍රගත කොටගත් අවේක්ෂණ කටයුතු 2008 වර්ෂයේදී ද සිදුකරන ලදී. වර්ෂය තුළදී, ගෙවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ සහ අවේක්ෂණය කිරීමේ අංශය විසින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවල සහයෝගය ඇතිව බලපත්‍රලාභී වාණිජ බැංකු 22 ක සහ ප්‍රාථමික වෙළෙඳුන් 3 ක ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් සහ ප්‍රතිප්‍රාප්ති වැඩ බිම්වල කටයුතු ඇගයීම සිදුකරන ලදී. ඇගයීම්වලට භාජනය වූ අංශ තවදුරටත් වර්ධනය කිරීමත් ඒ පිළිබඳව ඔවුන්ගේ අදහස් ලබාගැනීමත් සඳහා එම පරීක්ෂණ වලින් හඳුනාගත් කරුණු පිළිබඳව අදාළ ආයතන දැනුවත් කිරීමක් කරන ලදී. ශ්‍රීලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන්ට අනුව සහභාගිත්ව ආයතනවල ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්වල සහ ප්‍රතිප්‍රාප්ති වැඩ බිම්වල සිදුකළ යුතු වැඩිදියුණු කිරීම් නැවත ඇගයීම 2009 වසර තුළදී සිදුකිරීමට දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.

ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂණ පද්ධතියට අදාළව නියම කරන ලද, නිශ්කාෂණ සහ පියවීම් කාලසටහනට අනුකූල වන පරිදි අදාළ ආයතන කටයුතු කරන බව තහවුරු කරගැනීම සඳහා ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් චෙක්පත් ඉදිරිපත් කිරීම් සහ නිශ්කාෂණයේ ප්‍රමාදයන් පිළිබඳව අර්ධ වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත චක්‍ර ලේඛයක් නිකුත් කරන ලදී. ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂණ පද්ධතිය යටතේ චෙක්පත් නිශ්කාෂණය සඳහා අතිරේක දින ඉල්ලා සිටින ආයතන පිළිබඳ මාසික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ලංකාක්ලියර් පෞද්ගලික සමාගමට උපදෙස් දෙන ලදී.

අදාළ ගිණුම්වල ප්‍රමාණවත් පරිදි අරමුදල් නොමැතිවීම නිසා සැලකිය යුතු චෙක්පත් ප්‍රමාණයක් අගරුවීම තුළින් ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂණ පද්ධතිය මගින් අපේක්ෂිත කාර්යක්ෂමතාවය හීන වන බව සැලකිල්ලට ගෙන, මුදල් නොමැතිකම නිසා "අණකරු විමසනු" යන ශීර්ෂය යටතේ අගරු වන චෙක්පත් නැවත ඉදිරිපත් කිරීම වළක්වාලීම සඳහාත්, අගරු වන චෙක්පත් ඉදිරිපත් කරන වාණිජ බැංකු වලට දඩ මුදලක් නියම කිරීම සඳහාත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2008 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විධිවිධානයන් නිකුත්කරන ලදී.

ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂණ පද්ධතියේ T+1 රීතියට බලපත්‍රලාභී වාණිජ බැංකුවල අනුකූලතාවය පිළිබඳව පාරිභෝගිකයින් ගේ ප්‍රතිචාරය ලබාගැනීම සඳහා

ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්මේන්තුවෙහි සහයෝගය ඇතිව පාරිභෝගික සමීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු පිළියෙල කරන ලදී.

ශ්‍රී ලංකාවේ ගෙවීම් කාඩ්පත් පාවිච්චි කරන්නන්ගේ යහපත සඳහාත්, කාඩ්පත් මත පදනම් වූ ගෙවීම් සුරක්ෂිතවූත් ආරක්ෂාකාරීවූත් අයුරින් වර්ධනය වීමට පිටිවහලක් වන ලෙසටත් ගෙවීම් කාඩ්පත් සේවා සපයන්නන් සඳහා අවම විචක්ෂණ අවශ්‍යතා ඇතුලත් රෙගුලසි හා විධානයන් කෙටුම්පත් කිරීම මෙම අංශය මගින් සිදුකරමින් පවතී. මෙම කාර්යයන්ට අමතරව, සහභාගිත්ව ආයතන සඳහා ආරක්ෂිත හා ලාභදායී ස්විෆ්ට් සබඳතා ලබාගත හැකි වන ලෙස 2008 ජූනි මාසයේ දී ලංකා මූල්‍ය සේවා කාර්යාංශය (LFSB) ස්ථාපිත කිරීමටත් 2009 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කොට ඇති තත්කාලීන සුළු පරිමාණ ගෙවීම් පද්ධතිය වන පොදු ගෙවීම් යන්ත්‍රණය (Common Payment Switch) සථාපිත කිරීම සඳහාත් මේ අංශය මගින් පහසුකම් සැලසීම සිදුකරන ලදී. ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් ත්‍රෛමාසික ගෙවීම් විවරණිකාව මහ බැංකු අන්තර් ජාලයේ පළකිරීම නොකඩවා සිදුකරන ලදී. ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂණ පද්ධතිය හා අනෙකුත් අදාළ පියවීම් පද්ධති පිළිබඳව පොදු මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත්වීමද දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදුකරන ලදී.

### 17.7 සාක් ගෙවීම් ප්‍රවේශය

සාමාජික රටවල් අතර ක්‍රියාශීලී හා අන්‍යොන්‍ය සහයෝගීතාවකින් යුතු සම්බන්ධතාවයක් ගොඩනැංවීම සඳහා සාමූහිකව කටයුතු කිරීමේ අරමුණෙන් සාක් කලාපීය ගෙවීම් ප්‍රවේශය පිහිටුවීම සඳහා දෙපාර්තමේන්තුව, 2008 වර්ෂයේ දී පහසුකම් සලසන ලදී. සාක් ගෙවීම් ප්‍රවේශයෙහි සමාරම්භක හා සාක් ගෙවීම් කවුන්සලයේ ප්‍රථම රැස්වීම 2008 මාර්තු මස 28 වන දින කොළඹ දී පවත්වන ලදී. සාක් ෆිනෑන්ස් මණ්ඩලයේ අධිපතිවරුන්ගේ අනුග්‍රහය යටතේ සාක් කලාපීය ගෙවීම් ප්‍රවේශයේ කටයුතු කළමනාකරණය කිරීම සාක් ගෙවීම් කවුන්සලයේ වගකීම වේ. සාක් ගෙවීම් කවුන්සලය, සාක් ෆිනෑන්ස් මණ්ඩලයේ අධිපතිවරුන් විසින් නම්කරන ලද මහ බැංකු/මූල්‍ය අධිකාරීන්හි නියෝජිතයින් 8 දෙනෙකුගෙන් සමන්විත වේ.

මූලික වශයෙන්, අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා සාක් ගෙවීම් ප්‍රවේශයෙහි ලේකම් කාර්යාලය ශ්‍රී ලංකා මහ බැංකුවේ පිහිටුවන ලදී. මෙම ලේකම් කාර්යාලයෙහි ප්‍රධාන කර්තව්‍ය වන්නේ, සාමාජික රටවල් අතර අධ්‍යයනයන් හා තක්සේරු කිරීමේ කටයුතු සංවිධානය කිරීම, විශේෂිත තාක්ෂණික ව්‍යාපෘති සැලසුම් කිරීම, ඒවාට පහසුකම් සැපයීම සහ ක්‍රියාත්මක කිරීම සහ සාමාජික රටවල ගෙවීම් හා පියවීම් පද්ධති ජාත්‍යන්තර ප්‍රමිති මට්ටමට ගුණාත්මක වශයෙන් උසස් කිරීම සඳහා ඔවුන්ට සහයෝගය ලබාදීමය. මීට අමතරව, සාක් කලාපීය ගෙවීම් ප්‍රවේශයේ සම්බන්ධීකරණ කටයුතු පරිපාලනය සඳහා සහාය වීම ද මෙම කාර්යාලයෙන් සිදුවේ.

සාක් ගෙවීම් කවුන්සලයේ ප්‍රථම රැස්වීමේදී, එහි දැක්ම, මෙහෙවර, විෂය පථය, අරමුණු සහ ආයතනික රාමුව, කාර්ය භාරය හා වගකීම් මෙන්ම සාමාජික රටවල ගෙවීම් හා පියවීම් පද්ධති සංවර්ධනය කිරීම පිළිබඳ ඉදිරි දැක්ම ද, සකස් කරන ලද අතර සියළුම නියෝජිතවරු ඔවුන්ගේ රටවල ගෙවීම් හා පියවීම් පද්ධති පිළිබඳ තොග ගණනය කිරීමක් සඳහා ද එකඟ වූහ. සාක් ගෙවීම් කවුන්සලයේ දෙවන රැස්වීමේදී, සාක් ගෙවීම් ප්‍රවේශයෙහි ලේකම් කාර්යාලය විසින්, කලාපීය ගෙවීම් හා පියවීම් පද්ධති පිළිබඳ සංසන්දනාත්මක අවබෝධයක් සාමාජිකයින් හට ලබාගත හැකිවන පරිදි, තොග ගණනය කිරීම මගින් හඳුනාගත් කරුණු පිළිබඳ ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී.

සාක් ගෙවීම් කවුන්සලයේ තුන් වන රැස්වීම 2008 සැප්තැම්බර් මස 29 වන දින කොළඹ දී පවත්වන ලදී. සාක් ගෙවීම් කවුන්සලයේ සහ සාක් කලාපීය ගෙවීම් ප්‍රවේශයේ ප්‍රගතිය හා සාමාජික රටවල ගෙවීම් හා පියවීම් පද්ධති වල සංවර්ධනයන් පිළිබඳව දැනුම වර්ධනය කිරීමේ අරමුණෙන්, සාක් ගෙවීම් විවරණිකාවේ ප්‍රථම වෙළුම ප්‍රකාශයට පත්කිරීම හා සාක් කලාපීය ගෙවීම් ප්‍රවේශය සඳහා වෙබ් අඩවියක් එළි දැක්වීම, සාක් ගෙවීම් ප්‍රවේශයෙහි ලේකම් කාර්යාලය විසින් මෙම රැස්වීමේ දී සිදුකරන ලදී.

සාක් ගෙවීම් ප්‍රවේශයෙහි ලේකම් කාර්යාලය විසින්, ගෙවීම් හා පියවීම් පද්ධතිවලට අදාළ නීති හා රෙගුලාසි රාමුව පිළිබඳ ප්‍රවේශ වාර්තාවක් 2008 දෙසැම්බර් 20 වන දින පකිස්ථානයේ පැවැති සිව්වන රැස්වීමේ දී ඉදිරිපත් කරන ලදී. සාක් කලාපීය රටවල් අතර කෙරෙන ගෙවීම් ප්‍රමාණය පිළිබඳ ඇගයීමක් කිරීම සඳහා විදේශ රැකියා නියුක්තියන්ගේ ප්‍රේෂණ පිළිබඳ දත්ත රැස්කිරීමේ නියමු ව්‍යාපෘතියක් ද ආරම්භ කරන ලදී.

## 18. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වන්නේ (අ) උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම සහ ඉදිරි වර්ෂ 5 ක කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම වාර්ෂිකව යාවත්කාලීන කිරීම, (ආ) උපාය මාර්ගික සැලසුම් මත පදනම්ව දෙපාර්තමේන්තුවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, සහ (ඇ) කාලීන මාතෘකාවන් අළලා ප්‍රතිපත්ති සමාලෝචනයන් සහ අධ්‍යයනයන් කිරීමත් ය.

### (අ) උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම

2009-2013 කාලපරිච්ඡේදයට අදාළව උපාය මාර්ගික සැලසුම පිළියෙල කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා, සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ඔවුන්ගේ නියෝජිතයන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහභාගිත්වයෙන් 2008 ඔක්තෝබර් 3 - 5 දින තුළ කණ්ඩලම හෙරිටන්ස් හෝටලයේ දී දෙදින කථිකාවතක්, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. උපාය මාර්ගික අරමුණු, ඉලක්ක, ඉලක්ක ළඟාකර ගැනීමේ යාන්ත්‍රය, ප්‍රතිඵල, ප්‍රතිඵල දර්ශකයන් සහ විවිධ පර්ෂදවලට අදාළ අරමුණු හා ක්‍රියාකාරී සැලසුම්

ළඟාකර ගැනීමේ වගකීම පැවරෙන දෙපාර්තමේන්තු මොනවාද යන්නත් මෙම උපාය මාර්ගික සැලසුම් තුළ අන්තර්ගත වෙයි. උපාය මාර්ගික සැලසුමේ අඩංගු පර්ෂදයන් වන්නේ, ආර්ථික හා මිල ස්ථායීතාවය, මූල්‍ය පද්ධති ස්ථායීතාවය, ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා කළමනාකරණය, නියෝජිත සේවාවන්, මානව සම්පත් කළමනාකරණය හා සංවර්ධන සේවා, ආයතනික සේවාවන් සහ ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණය යනාදියයි.

**ආ) දෙපාර්තමේන්තුමය උපාය මාර්ගික සැලසුම්වල ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම**

නිරීක්ෂණ කාර්යයෙහි ප්‍රධාන අංග දෙක වූයේ උපාය මාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ පූර්ව වැඩමුළු පැවැත්වීමත්, දෙපාර්තමේන්තු කාර්ය සාධනය කාර්තුමය පදනමක් මත නිරීක්ෂණය කිරීමත්ය. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්, උපාය මාර්ගික සැලසුම පිළිබඳ මහ බැංකු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ රැස්වීම් මාලාවක් වර්ෂය ආරම්භයේදීම පවත්වනු ලැබීය. කාර්තුමය නිරීක්ෂණ යටතේ, ක්‍රියාකාරී සැලසුම් හා අපේක්ෂිත ප්‍රතිඵලයන් මත පදනම්ව සෑම දෙපාර්තමේන්තුවකම ප්‍රගතිය ඇගයීමට ලක්කරන ලද අතර, ඒවායේ ප්‍රතිඵල බැංකුවේ ඉහළ කළමනාකාරිත්වයෙන් සැදුම්ලත් උපාය මාර්ගික නිරීක්ෂණ කමිටුව (SPRC) වෙත වාර්තා කරන ලදී. මිල ස්ථායීතාවය, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් ප්‍රධාන කාර්යයන් පවත්වා ගැනීම සම්බන්ධයෙන් වූ ප්‍රගතිය මෙම ප්‍රගති වාර්තාවන්හි ඇතුළත් විය.

**ඇ) ප්‍රතිපත්ති සමාලෝචන සහ අධ්‍යයනයන්**

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින්, පොලී අනුපාතික ප්‍රතිපත්තිය, මුදල් හා විදේශීය විනිමය ප්‍රතිපත්ති, වර්තමාන ගෝලීය මූල්‍ය අර්බුදය හා ශ්‍රී ලංකාවට එයින් ඇති බලපෑම සහ රාජ්‍ය ණය කළමනාකරණය යනාදිය පිළිබඳ සමාලෝචන වාර්තා කිහිපයක් පිළියෙළ කරන ලදී. මහ බැංකුවේ ප්‍රතිපත්ති හා සම්බන්ධ ලේඛනවලට අදාල වූ මෘදු පිටපත් (Soft Copy) ගබඩා කිරීම සඳහා විද්‍යුත් ප්‍රතිපත්ති පුස්තකාලයක් (online.e.polcy library) තොරතුරු තාක්ෂණික දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහායද ඇතිව 2008 දෙසැම්බර් මස සිට ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. මහ බැංකුවේ මෙහෙයුම්වලට අදාළ වූ ව්‍යවස්ථා, නියාමන, මහ බැංකුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛන හා නියමයන් සහ මහ බැංකු ප්‍රකාශන මෙම විද්‍යුත් ප්‍රතිපත්ති පුස්තකාලය තුළ අඩංගු කොට ඇත.

## 19. පරිශ්‍ර

මහ බැංකුවේ නිලධාරීන් සඳහා ප්‍රවාහන සහ සන්නිවේදන පහසුකම් වැනි උපකාරක සේවාවන් සැපයීමට අමතරව මහ බැංකු පරිශ්‍රය නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව 2008 වර්ෂය තුළදී තවදුරටත් නිරත විය.

අවම පිරිවැයකින් හා වඩාත් කාර්යක්ෂමව සේවාවන් ලබාගැනීමේ අරමුණ ඇතිව නඩත්තු කටයුතු වලින් වැඩි කොටසක් හා ප්‍රවාහන සේවාවල කොටසක් සඳහා බාහිර ආයතන වලින් සේවා ලබාගැනීම තවදුරටත් කරනු ලැබීය.

රුපියල් මිලියන 100 ක වියදමින් සම්පූර්ණයෙන් නවීකරණය කරන ලද බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ පිහිටි නේවාසිකාගාරය"සවරින් රෙසිඩන්සීස්" යනුවෙන් නැවත නම්කරන ලදී. ජාතික පුවත්පත් වල පළකරන ලද ප්‍රසිද්ධ මිල කැඳවුම් මගින් තෝරාගනු ලැබූ එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනමට වසර 10 ක් සඳහා "සවරින් රෙසිඩන්සීස්" හි කළමනාකාරිත්වය බදු පදනම මත බාර දී ඇත. මෙම "සවරින් රෙසිඩන්සීස්" තරු තුනක හෝටලයක තත්ත්වයට ගෙන ඒම සඳහා බණ්ඩාරනායක අනුස්මරණ ජාතික පදනම විසින් රුපියල් මිලියන 50 ක ආයෝජනයක් කළයුතු අතර, 2009 පෙබරවාරි පළමු සතියේ දී එහි මෙහෙයුම් ආරම්භ කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

පරිශ්‍ර දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 45 ක වියදමින් මාතලේ ප්‍රාදේශීය කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2008 මාර්තු මාසයේදී ආරම්භ කරන ලදී. ආසන 160 කින් යුත් ශ්‍රවණාගාරයක් සහිත, ආසන්න වශයෙන් වර්ග අඩි 11,000කින් සමන්විත මහල් දෙකකින් යුත් මෙම කාර්යාල ගොඩනැගිල්ල මාතලේ ත්‍රිකුණාමල වීදියේ ඉදිකර ඇත. එය 2009 පෙබරවාරි මස 01 වන දින විවෘත කිරීමට නියමිතව ඇත.

අනගාරික ධර්මපාල මාවත පුළුල් කිරීම හේතුවෙන් මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කොටසක් කඩා ඉවත් කිරීමට සිදුවූ අතර, එම කඩා ඉවත් කිරීමත් සමඟ මුළු ප්‍රාදේශීය කාර්යාලයම රුපියල් මිලියන 30 ක වියදමකින් ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කෙරුණි. මෙම වැඩ කටයුතු ව්‍යුහාත්මක වෙනස් කිරීම් හා ඉදිකිරීම් ඇතුළු විශේෂිය ව්‍යුහයක් සහිත විය. ඒ අනුව සියලුම මූලික අලුත්වැඩියාවන් සහ ඉදිකිරීම් දැනටමත් අවසන් කර ඇති අතර, අභ්‍යන්තර නිමැවුම් වැඩ කඩිනමින් සිදුකරමින් පවතී. මෙම ගොඩනැගිල්ල 2009 මාර්තු 01 වන දින විවෘත කිරීමට නියමිතව ඇත. ඊට අමතරව ප්‍රාදේශීය කළමනාකරුගේ නිල නිවාසය අළුත්වැඩියාකර අවසන් කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ සහ චැතැම් වීදියේ පිහිටි හෝරාස්තම්භයේ පිටත වර්ණ ගැන්වීම සතුටුදායක ලෙස නිමකරන ලදී. 1999 වසරේ ඉදිකිරීම් කටයුතු අවසානයේ දී කළ පළමු වර්ණාලේපයෙන් පසු, ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ වර්ණාලේප කර නොතිබුණි. එම කාර්යයන් දෙක මේ වසරේදී නිම කරන ලද අතර ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම දළ වශයෙන් රුපියල් මිලියන 20 ක් විය. එසේම නව ගොඩනැගිල්ලේ හිරු එළි ආවරණයන් පිරිසිදු කිරීමේ කාර්යයද අවසන් කර ඇත.

පරිශ්‍ර දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලීය පරිශ්‍රයේ මුදල් කෞතුකාගාරයක් ස්ථාපිත කරන ලදී. මෙම ව්‍යාපෘතිය සති 9 ක් ඇතුළත ඉතා ඉක්මණින් සම්පූර්ණකර 2008 සැප්තැම්බර් මස 05 වන දින මහජනතාව සඳහා විවෘත කරන ලදී.

රුපියල් මිලියන 8 ක වියදමින්, මහ බැංකු ප්‍රධාන ගොඩනැගිල්ලේ පිහිටා ඇති විදුලි සෝපානයන් හදිසි අවස්ථාවකදී බිම් මහලට පැමිණීමේ ක්‍රමයක් සවිකර ඇත. එසේම රුපියල් මිලියන 3 ක වියදමින් මහ බැංකු සේවකයන් සඳහා ක්‍රීඩා හා ශාරීරික පුහුණු ස්ථානයක් ඉදිකිරීමේ කටයුතුද අවසන් කර ඇත.

මහ බැංකුවට අයත් සියලුම පරිශ්‍රයන්හි බාහිර අලංකාරකරණය පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් නිරත විය.

## 20. රාජ්‍ය ණය

රාජ්‍ය ණය නිකුත් කිරීමේ සහ කළමනාකරණය කිරීමේ රජයේ නියෝජිතයා ලෙස රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව එම වගකීම වැඩි වගකීමකින් සහ විනිවිදභාවයකින් යුතුව අඛණ්ඩව සිදුකරන ලදී. ඒ අනුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව රජයේ මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය අරමුදල් විචක්ෂණශීලී අවදානම් මට්ටමක් සහිතව අවම පිරිවැයක් යටතේ මධ්‍යකාලීන සහ දිගුකාලීනව රැස්කරන ලදී. ඊට අමතරව, රාජ්‍ය ණය සේවාකරණය නියමිත දිනට සියයට සියයක් නිවැරදිව සිදුකිරීම මගින් ඒ සඳහා ශ්‍රී ලංකාව සතු නොකැළැල් වාර්තාව එලෙසම පවත්වා ගෙන යාමද රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ පුළුල් කිරීම සඳහා කළහැකි සියළු ක්‍රියාමාර්ග ගැනීමද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2008 වසරේ උපාය මාර්ගික සැලසුමේ දක්වා ඇති පරිදි, 2007 වසරේදී සැලසුම් කළ මධ්‍යකාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය යාවත්කාලීන කිරීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. ණය පරිණතවීම ඒකරාශීවීම, භාණ්ඩාගාර බැඳුම්කර වැඩසටහනෙහි විභේදන ගැටළුව, දිගුකාලීන ඵලදා වක්‍රය ගොඩනැංවීම, විශ්වාසනීය සහ ද්‍රවශීල ණය වෙළෙඳපොළ සංවර්ධනය සහ සියළු රජයේ සුරැකුම්පත් ගනුදෙනු මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි වාර්තා කිරීම යන කරුණු ණය කළමනාකරණ උපාය මාර්ගය යටතේ සලකා බලනු ලබයි. තවද, මධ්‍යකාලීන ණය හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාත ඉලක්කයන් ළඟාකර ගැනීම, ආයෝජක පදනම පුළුල් කිරීම, පවතින නීතිමය රාමුව සහ ගෙවීම් සහ පියවීම් රාමුව ශක්තිමත් කිරීම සහ ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම ආදී අරමුණු ඉටුකර ගැනීම සඳහා සුපරික්ෂාකාරී ණය රැස්කිරීමේ සැලසුමක්ද එමගින් නිර්දේශ කර ඇත.

පවතින ණය ප්‍රමාණයෙහි පරිණත වීමේ ව්‍යුහය මගින් පෙන්නුම් කරන්නේ ණය ප්‍රමාණය කෙටිකාලීන පරිණතියකින් යුත් ණය පරිණතීන් දෙසට සැලකිය යුතු ලෙස ඒකරාශීවී ඇති බවයි. 2008 වසරේදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් දින 364 පරිණත කාලයකින් යුත් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම ඉහළ නැංවූ අතර දින 91 භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය සැලකිය යුතු ලෙස සීමාකිරීම මගින් භාණ්ඩාගාර බිල්පත් ඒකරාශීවීමේ ගැටළුව අවම කිරීමට උත්සාහ දරණ ලදී. කෙසේ වුවද, වෙළෙඳපොළ තුළ පැවැති ඉහළ පොලී අනුපාත හේතුවෙන් දිගු කාලීන පරිණතීන් සහිත භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට නොහැකි විය. දේශීය බැඳුම්කර වෙළෙඳපොළේ කාණ්ඩ සංඛ්‍යාව ඉහළ යාමට පිළියමක් ලෙස නව භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ හඳුන්වාදීම හැකිතාක් දුරට සීමා කරමින් පවතින භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ නැවත නිකුත් කිරීමේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. කෙසේ වුවද, විදේශ බාහිර ණය ගැනීම්, දේශීය ප්‍රභවයන්ට මාරුවීම හේතුවෙන් දේශීය අංශයෙන් ණය ගැනීම් සීඝ්‍රයෙන් ඉහළ ගිය අතර එය 2008 වසරේ සැලසුම් කළ පරිදි බැඳුම්කර කාණ්ඩ සංඛ්‍යාව අඩුකිරීමේ ක්‍රියාවලියට අහිතකර ලෙස බලපෑවේය. මෙම ගැටළුව හමුවේ වුවද, නව භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ හඳුන්වාදීම සීමාකිරීම මගින් 2007 වසරේ 42 ක් ලෙස පැවැති මුළු භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ ප්‍රමාණය 2008 වසර අවසානයේදී එලෙසම පවත්වා ගැනීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට හැකි විය. ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලද අතර, එම ප්‍රාථමික අලෙවි කටයුතු විවිධාංගීකරණය කිරීමේ වැඩසටහනට අවශ්‍ය නීතිමය අනුමැතිය ලැබුණු වහාම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

2007 වසරේදී, රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරය සඳහා වූ ද්‍රවශීලතාවය ඉහළ නැංවීමේ අරමුණින් 2008 වසරේදී එය ද්වීතියික වෙළෙඳපොළ තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට මිලට ගැනීමට ඉඩ ලබාදෙන ලදී. එසේම රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ආයෝජක පදනම පුළුල් කිරීම සඳහා මෙන්ම දේශීය වෙළෙඳපොළෙහි පොලී අනුපාතිකයන් මත පීඩනය අවම කිරීම සඳහා 2008 මැයි මසදී භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළද විදේශීය ආයෝජකයින් සඳහා විවෘත කරන ලදී. ඒ අනුව, පවතින මුළු භාණ්ඩාගාර බිල්පත් තොගයෙන් සියයට 10 ක් දක්වා ආයෝජනය කිරීමට විදේශිකයන්ට ඉඩ ලබා දෙන ලදී.

කුඩා වටිනාකමින් යුත් ගනුදෙනු වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පුළුල් පැතුරුම් පරිගණක ජාල යෙදුම හඳුන්වාදීමත්, සියළු ගනුදෙනු මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි වාර්තා කිරීම අනිවාර්ය කිරීමත් සමඟ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ ක්‍රමය හරහා සිදුවන ගනුදෙනුවල වටිනාකම මෙන්ම මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි පවත්වාගෙන යනු ලබන ගිණුම් ප්‍රමාණයද 2007 වසරට සාපේක්ෂව 2008 වසරේදී සැලකිය යුතු ලෙස වැඩිවී ඇත. රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි කුඩා ආයෝජකයන්ගේ සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා මෙම පියවර ඉවහල් වී ඇත. මීට අමතරව, ලංකාසෙට්ල් පද්ධතිය දිගුකාලීන ප්‍රකෘති තත්ත්වයකට පත්කළ නොහැකි අවස්ථාවකදී, ඒ සඳහා විකල්ප මාර්ගයක් ලෙස පුද්ගලික පරිගණක පදනම් කරගත් ගෙවීම් සහ සුරැකුම්පත් පියවීම් පද්ධතියක් 2008 වසරේදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලදී.

රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ පුළුල් කිරීම සහ ආයෝජක පදනම විවිධාංගීකරණය කිරීම පිණිස විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්, මහජන සහ අධ්‍යාපනික වැඩමුළු හරහා ආයෝජකයන් දැනුවත් කිරීමේ ක්‍රියාකාරී වැඩසටහන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් වසර පුරා පවත්වන ලදී. මීට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා වාර්තාමය

කෙටි චිත්‍රපටියක් 2008 වසරේදී නිකුත් කළ අතර එය විවිධ රූපවාහිනී නාලිකා හරහා මෙන්ම විවිධ ප්‍රදර්ශන සහ වැඩමුළු වලදී ද ප්‍රදර්ශනය කරන ලදී. 2008 වසරේදී ද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ වාර්ෂික ප්‍රකාශනය නිකුත් කරන ලදී. මෙහි මූලික අරමුණ වූයේ රාජ්‍ය ණය කටයුතුවල විනිවිදභාවය ඉහළ නැංවීම සහ රාජ්‍ය ණය කළමනාකරණය සහ එහි තත්ත්වය පිළිබඳ තොරතුරු මහජනතාව, ප්‍රතිපත්ති සම්පාදකයින්, විද්වතුන් සහ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ ක්‍රියාකාරීන්ට බෙදාහැරීමයි. ආයෝජකයන්ගේ කැමැත්ත පරීක්ෂා කර බැලීම සහ ආයෝජක පදනම පුළුල් කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් මැදපෙරදිග රටවල් කිහිපයක වෙළෙඳ නොවන ප්‍රචාරක වැඩසටහන් සංවිධානය කරන ලදී. ඊට අමතරව, මුදල් අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් සැදුම්ලත් නිලධාරි කණ්ඩායමකට මැද පෙරදිග වෙළෙඳපොළෙහි ආයෝජකයන් ආකර්ශනය කරගැනීම සඳහා ෂාරියා මූලධර්මය යටතේ නිකුත් කරන විවිධ මූල්‍ය පිළිබඳ පුහුණුවක් ලබාදෙන ලදී.

2008 වසරේදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් ෆිච් රේටිංග්ස් (Fitch Ratings) සහ ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් (Standard & Poors) සමඟ පැවැති ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීමේ වාර්ෂික සාකච්ඡා වාර දෙකක් සඳහා පහසුකම් සැපයීමද ජේ.පී.මෝගන් උපදේශකයන්ගේ සහාය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම පිළිබඳ වැඩමුළුවක් ද සංවිධානය කරන ලදී.

## 2008 වසර තුළ ක්‍රියාකාරිත්වය

### (අ) ණය එක්රැස්කිරීමේ ඉලක්ක සහ ක්‍රමෝපාය

2007 අංක 61 දරණ විසර්ජන පනත යටතේ 2008 වසර වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද දළ ණය සීමාවේ මුහුණත වටිනාකම රුපියල් බිලියන 708 ක් විය. මෙයට හදිසි අවශ්‍යතා සඳහා වෙන්කරන ලද රුපියල් බිලියන 19 ඇතුළත්ය. මෙම ණය සීමාවෙන්, රුපියල් බිලියන 475 ක් දේශීය මූලාශ්‍ර වලින්ද ඉතිරි රුපියල් බිලියන 233 විදේශීය මූලාශ්‍ර වලින්ද එක්රැස්කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වුවද වසර අග භාගයේ පැනනැගුණු ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් රජයට එම වසර තුළදී රැස්කිරීමට නියමිතව තිබූ විදේශීය වාණිජ ණය ප්‍රමාණය සැලසුම් කළ ආකාරයෙන් මුළුමනින්ම ලබාගැනීමට නොහැකි වූ අතර ඉන් කොටසක් දේශීය වශයෙන් ලබාගැනීමට සිදුවිය. එම නිසා, දේශීය වශයෙන් ලබාගත් ණය රුපියල් බිලියන 76 කින් ඉහළ ගිය අතර, දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 551 ක් විය. දළ විදේශීය ණය ලබාගැනීම් රුපියල් බිලියන 97 කින් අඩුවූ අතර, 2008 වසරේ ලබාගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 136 ක් බවට පත්වෙමින් මුළු ණය එක්රැස් කිරීම් මුලින් ඉලක්ක කළ සීමාව තුළ තබා ගැනීමට සමත් විය. 2007 වසරේ සිට පැවැති ඉහළ උද්ධමනකාරී තත්ත්වය නිසා, 2008 වසරේදී දේශීය පොලී අනුපාත ඉහළ මට්ටමක පැවැතුණි. එම නිසා දීර්ඝකාලීන ණය උපකරණ වෙනුවට කෙටි හා මධ්‍යකාලීන දේශීය ණය උපකරණ භාවිතා කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට සිදුවිය. එබැවින්, භාණ්ඩාගාර බිල්පත් මගින් රුපියල් බිලියන 61.9 ක් ද, භාණ්ඩාගාර බැඳුම්කර මගින් රුපියල් බිලියන 406.5 ක් ද රැස්කරන ලද අතර ඒවායේ මුල් ඉලක්ක පිළිවෙලින් රුපියල් බිලියන 10 සහ රුපියල් බිලියන 362 ක් විය. තවද 2008 වසරේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වලින් ලබාගැනීමට ඉලක්කගත කෙරුණු රුපියල් බිලියන 37.6 න් (එ.ජ.ඩොලර් මිලියන 360), රුපියල් බිලියන 36.1 (එ.ජ.ඩොලර් මිලියන 335) ක් රැස්කරන ලදී. දේශීය ණය තොගයෙහි පවතින වෙළෙඳපොළේ අභිමුඛ නොවූ ණය තොගය අඩුකරනු වස් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2008 වසරේදී රුපියල් ණය නිකුත් නොකෙරුණි.

2008 වසරේදී, මාසික ණය ඒකරාශීවීම අවම කිරීම සඳහා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් දින 91 භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සීමා කළ අතර, දින 182, දින 364 භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම ඉහළ දමන ලදී. එමගින් මාස 3 කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම, 2008 වසරේ මුළු භාණ්ඩාගාර බිල්පත් නිකුතුවෙන් සියයට 32 ක් වූ අතර එම අගය 2007 වසරේදී සියයට 67 ක් දක්වා ද මාස 12 කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම 2008 වසරේ සියයට 41 දක්වා ද වැඩිවූ අතර 2007 වසරේ දී එම අගය සියයට 14 ක් විය. කෙසේ වෙතත් දීර්ඝකාලීන කල්පිරීම් සඳහා පැවැති ඉහළ පොලී අනුපාත නිසා මෙම ක්‍රමෝපාය භාණ්ඩාගාර බැඳුම්කර සඳහා සාර්ථකව යොදාගැනීමට නොහැකි වූ අතර, වසර තුන ඉක්මවූ කල්පිරීම් කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර, මුළු බැඳුම්කර නිකුතුවෙන් සියයට 29 කට පමණක් සීමා විය.

ගෝලීය මූල්‍ය අර්බුදය නිසා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට විදේශීය වාණිජ ප්‍රභවයන්ගෙන් 2008 වසර සඳහා රැස්කළ මුදල රුපියල් බිලියන 39 ක් වූ අතර, ඒ සඳහා පැවති ඉලක්කය රුපියල් බිලියන 67 ක් විය. මේ මුදලින් රුපියල් බිලියන 16 ක්, සම්මිලිත ණය මගින් රැස්කළ අතර, රුපියල් බිලියන 22.9 ක් භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර විදේශිකයන්ට නිකුත් කිරීම මගින් සපුරාගන්නා ලදී. එසේ වුවත්, රජය ව්‍යාපෘති /වැඩසටහන් ණය අතරින් මහජන ආයෝජන වැඩ සටහන් සඳහා විදේශීය සහනදායී ප්‍රභව වලින් 2008 වසර සඳහා අපේක්ෂිත රුපියල් බිලියන 166 අතරින් ලබාගැනීමට හැකිවූයේ රුපියල් බිලියන 97 ක් පමණි.

### (ආ) ණය උපකරණ නිකුත් කිරීම

2008 වසරේ, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි 52 ක් පැවැත්වූ අතර, එම වෙන්දේසි මගින් හා ඍජු නිකුතු මගින් දළ මුහුණත වටිනාකම් රුපියල් බිලියන 779.6 ක් රැස්කරන ලදී. විදේශීය ආයෝජකයින් සඳහා නිකුත් කළ දළ වටිනාකම රුපියල් බිලියන 14.7 ක නිකුතුද මීට අයත් වේ. මේ අතරම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මුහුණත් වටිනාකම් රුපියල් බිලියන 488.8 ක මුදලක් භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි 76 ක් සහ ඍජු නිකුතු මගින් උපයාගෙන ඇත. මෙයට රුපියල් බිලියන 10.5 ක විදේශීය ආයෝජනද අයත් වේ.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDBs) නැවත නිකුත් කිරීම් දෙකක් 2008 ජුනි සහ සැප්තැම්බර් මාසවලදී පවත්වන ලදී. මෙම වෙන්දේසි මගින් වසර දෙකක කල්පිරීමේ කාලයක් සහිත එ.ජ.ඩොලර් මිලියන 275 ක් සහ එ.ජ.ඩොලර් මිලියන 60 ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර රැස්කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට හැකිවිය. තවද, ලංකා බැංකුවේ වි.ව්‍ය.මු.බැංකු ඒකක මගින් ලබා තිබූ එ.ජ.ඩොලර් මිලියන 593.1 ක ණය, 2008 ජූලි මාසයේදී වසර දෙකක කල්පිරීම් කාලයක් (එ.ජ.ඩොලර් මිලියන 195) සහ වසර 5 ක කල්පිරීමේ කාලයක් (එ.ජ.ඩොලර් මිලියන 398) සහිත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර බවට පරිවර්තනය කරන ලදී. මීට අමතරව, දේශීය බැංකුවල වි.ව්‍ය.මු. බැංකු ඒකක මගින් එ.ජ.ඩොලර් මිලියන 77 ක ණය ප්‍රමාණයක් එක්රැස් කරගෙන ඇත.

**(ඇ) ණය සේවා ගෙවීම්**

2008 වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් රුපියල් බිලියන 592.8 ක් දේශීය සහ විදේශීය රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් සිදුකර ඇත. මෙයින් රුපියල් බිලියන 212.5 ක් පොලී ගෙවීම් සඳහා වූ අතර රුපියල් බිලියන 380.3 ක් ණය ආපසු ගෙවීම් විය. මුළු දේශීය ණය සේවා ගෙවීම් රුපියල් බිලියන 440.9 ක් වූ අතර, විදේශීය ණය සේවා ගෙවීම් රුපියල් බිලියන 151.9 ක් විය. (විදේශීය ණය සේවා ගෙවීම් වලට කල්පිරීමට පෙර විකුණා මුදල් ලාබගත් විදේශ ආයෝජකයන්ගේ බැඳුම්කර ද ඇතුළත්ය. මීට අමතරව වර්ෂයේ තුළදී කල්පිරුණු රුපියල් මිලියන 678 ක භාණ්ඩාගාර බිල්පත් නැවත නිකුත් කරන ලදී.

**(ඈ) එලද අනුපාතික සහ ද්විතීයික වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය**

මෑතක සිට ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවති, රජයේ සුරැකුම්පත් සඳහා වූ එලදා අනුපාතික ඉහළයෑමේ ප්‍රවණතාවයේ ආපසු හැරීමක් 2008 වසර ආරම්භයත් සමඟ දක්නට ලැබුණි. මේ සඳහා දායක වූ ප්‍රධානතම හේතූන් වූයේ, 2008 මැයි මස සිට දේශීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ විදේශිකයන්ට විවෘත කිරීමත් සමඟ රජයේ සුරැකුම්පත් සඳහා විදේශීය ආයෝජකයන්ගේ ඉල්ලුම වර්ධනය වීමත් වසරේ දෙවන භාගය වන විට අපේක්ෂිත උද්ධමනය පහළ යාමත් (වසරේ අවසන් මාස කීපය හැර) වෙළෙඳපොළෙහි අඛණ්ඩව පැවති අතිරික්ත ද්‍රවශීලතාවයත්ය.

2008 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී දින 91, දින 182 සහ දින 364 පරිණත කාලවලින් යුත් භාණ්ඩාගාර බිල්පත් සඳහා වන ද්විතීයික වෙළෙඳපොළ එලදා අනුපාතික පිළිවෙලින් පාදකාංක 520 පාදකාංක 255 සහ පාදකාංක 215 බැගින් පහළ වැටුණු අතර වසර 2 සිට වසර 5 පරිණත කාලවලින් යුත් භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වූ ද්විතීයික වෙළෙඳපොළ එලදා අනුපාතික, මෙම කාලය තුළදී පාදකාංක 140-250 පරාසයකින් පහත වැටුණි. එලදා අනුපාතික පහළයෑමේ ප්‍රවණතාව තවදුරටත් පෙන්නුම් කරමින්, 2008 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළදී ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොළ එලදා වක්‍ර ක්‍රමානුකූලව පහළට විතැන්වීමක් සිදු විය. මෙයට ප්‍රධානතම හේතුව වූයේ, විදේශීය ආයෝජකයන් වැඩි ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කිරීමට උනන්දු වීමයි. එසේ වුවද, ලෝක මූල්‍ය වෙළෙඳපොළෙහි හටගත් අර්බුදකාරී වාතාවරණය හේතුකොටගෙන, 2008 සැප්තැම්බර් සිට දෙසැම්බර් කාලය තුළදී, බොහෝ විදේශීය ආයෝජකයන් ඔවුන් සතු ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් විකිණීම හේතුකොටගෙන, දේශීය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි පැවැති සැපයුම් ඉහළ ගියේය. ඒ සමගම ඇති වූ ද්‍රවශීලතා හිඟයද හේතුකොටගෙන 2008 සැප්තැම්බර් සිට දේශීය වෙළෙඳපොළෙහි රජයේ සුරැකුම්පත් සඳහා වන එලදා අනුපාතික කෙරෙහි අතිරේක පීඩනයක් ඇති විය. කෙසේ වුවද, වසර අවසානය වන විට පහළ යන උද්ධමනය සහ අනාගත උද්ධමන අපේක්ෂා හේතුකොට ගෙන එලදා අනුපාතික ඉහළයෑමේ ප්‍රවණතාව තරමක් දුරට අඩුවී ද්විතීයික වෙළෙඳපොළෙහි එලදා අනුපාතිකවල යම්කිසි ස්ථාවර බවක් පෙන්නුම් කරන ලදී.

**(ඉ) නිර්ලේඛන සුරැකුම්පත් පියවුම් ක්‍රමය** (SSSS) **සහ මධ්‍යම සුරැකුම් තැන්පතු ක්‍රමය** (CDS) **- ලංකාසෙකියො** (Lanka Secure)

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 2008 වසරේ දී, එහි සහභාගිකරුවන්, බලපත්‍රලාභී වාණිජ බැංකු 22 ක් ඇතුළුව සේවක අර්ථසාධක අරමුදල, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 8 දෙනෙකු සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සීමාසහිත මධ්‍යම සුරැකුම් තැන්පතු ක්‍රමය (පෞද්ගලික) සමඟ ලංකාසෙකියො මෙහෙයුම් නොකඩවා පවත්වාගෙන යන ලදී. 2007 වසරේ නිර්ලේඛන සුරැකුම්පත් පියවුම් ක්‍රමය තුළින් සිදුවූ ගනුදෙනු සංඛ්‍යාව සියයට 60 කින් වැඩිවීම සමඟ සැසඳීමේදී 2008 වසරේදී කැපී පෙනෙන ලෙස එය සියයට 85 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම රුපියල් බිලියන 26,038 ක් වන එම ගනුදෙනුවල වටිනාකම සියයට 45 කින් ඉහළ ගොස් ඇත. 2007 වසරේ දී මධ්‍යම සුරැකුම්පත් තැන්පතු ක්‍රමයෙහි මෙහෙයවූ හා ලියාපදිංචි වූ තැන්පතු ගිණුම් සංඛ්‍යාව 41,953 අතර එහි 2008 වසරේ දී එම අගය 56,041 දක්වා කැපී පෙනෙන ලෙස වැඩිවී ඇත. මේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නිරන්තරයෙන් ආයෝජකයන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙල නිසා ආයෝජකයන් සංඛ්‍යාව පුළුල්වීම සහ 2007 දී හඳුන්වා දුන් කුඩා අගයන්ගෙන් යුත් ආයෝජන ප්‍රතිස්ථාන ගත කිරීමේ ගනුදෙනු ශ්‍රී ලංකා මහ බැංකු පැතුරුම් ජාලය මත පදනම් වූ ක්‍රමයක් තුළින් නොමිලයේ සිදුකිරීමත්ය. ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය කරලීම උදෙසා ලංකාසෙකියො මගින් ඔවුන්ගේ ආයෝජන පිළිබඳ වාර්තා නිකුත් කිරීම නොනවත්වා කරගෙන යනු ලබයි. මධ්‍යම සුරැකුම්පත් තැන්පතු ක්‍රමයෙහි ලියාපදිංචි වී ඇති තමන්ගේ රාජ්‍ය සුරැකුම්පත් නිරීක්ෂණය කිරීම සඳහා මාර්ගගත ප්‍රවේශනයක් සපයමින් ලංකාසෙකිනෙට් පහසුකම ලංකාසෙකියො මගින් නොමිලේ ලබාදෙන තවත් සේවාවකි.

හදිසි ආපදාවකදී යළි ප්‍රකෘති තත්ත්වයට පත්කිරීමේ පුළුල් සැලසුමක් දෙසට ගමන් කිරීම අරමුණු කරගත් නව විධිවිධානයන් නිකුත් කිරීමටද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පියවර ගනු ලැබීය. ඒ අනුව, ලංකා සෙට්ල් පද්ධතිය දිගුකාලීනව ප්‍රකෘති තත්ත්වයට පත්කළ නොහැකි අවස්ථාවක් ඇති වූ විට, 2008 අගෝස්තු 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි හඳුන්වාදුන් පුද්ගලික පරිගණක පදනම් කරගත් ගෙවීම් හා සුරැකුම් පියවීම් පද්ධතිය විකල්ප පියවුම් පද්ධතියක් ලෙස භාවිතා කළහැක.

**(ඊ) ප්‍රාථමික අලෙවිකරු අධීක්ෂණය**

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පවත්වා ගෙනයාමේ අපේක්ෂා පෙරදැරිව 2008 වසරේදීද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව දුරස්ථ පරීක්ෂා, එතැන් පරීක්ෂා සහ විශේෂ එතැන් පරීක්ෂා හරහා ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. ඒ අනුව වසර තුළදී එතැන් පරීක්ෂා 7 ක් සහ එක් විශේෂ එතැන් පරීක්ෂාවක් පවත්වන ලදී. මෙහිදී මූලිකව අවධානය යොමුකරනු ලැබුවේ ප්‍රාථමික අලෙවිකරුවන්ට මුහුණ දිය හැකි අවදානම් එනම්, වෙළෙඳපොළ අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම සහ වෙනත් අවදානම් මෙන්ම මෙම අවදානම් කළමනාකරණය පිළිබඳවයි. තවද, පවතින සම්පත්වල ප්‍රමාණාත්මක බව එනම්, ඉපැයීම්, ප්‍රාග්ධනය සහ

**සංඛ්‍යා සටහන II-13**

**2008 වසර තුළ නිකුත් කළ හා කල්පිරුණු දේශීය ණය (අ)**

රුපියල් දශ ලක්ෂ

| | කල්පිරීම් | නිකුතු | ආපසු ගෙවීම් | ශුද්ධ නිකුතු |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | දින 91 | 172,696 | 239,187 | -66,491 |
| | දින 182 | 147,654 | 128,036 | 19,618 |
| | දින 364 | 156,519 | 97,427 | 59,092 |
| | වෙනත් | 302,707 | 212,980 | 89,727 |
| | එකතුව | 779,576 | 677,630 | 101,946 |
| භාණ්ඩාගාර බැඳුම්කර | අවුරුදු 1 | 45,549 | 39,154 | 6,395 |
| | අවුරුදු 2 | 179,192 | 2,700 | 176,492 |
| | අවුරුදු 3 | 123,690 | 119,457 | 4,233 |
| | අවුරුදු 4 | 93,423 | 9,100 | 84,323 |
| | අවුරුදු 5 | 26,072 | 43,700 | -17,628 |
| | අවුරුදු 6 | 2,550 | 43,500 | -40,950 |
| | අවුරුදු 10 | 18,261 | - | 18,261 |
| | එකතුව | 488,737 | 257,611 | 231,126 |
| රුපියල් ණය | අවුරුදු 9/10 | - | 1,500 | -1,500 |
| | එකතුව | - | 1,500 | -1,500 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ආ) | අවුරුදු 2 | 36,121 | 34,474 | 1,647 |
| | එකතුව | 36,121 | 34,474 | 1,647 |
| අක්වෙරළ ණය (ආ)(ඇ) | <=අවුරුදු 1 | 8,078 | 5,400 | 2,678 |
| | අවුරුදු 2 | 215 | 1,663 | -1,448 |
| | එකතුව | 8,293 | 7,063 | 1,230 |
| **මුළු එකතුව** | | **1,312,727** | **978,279** | **334,448** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මුහුණත අගය

(ආ) 2008 ජූලි මස වි.ව්‍ය.මු.බැ. ඒකක වලින් ලබාගත් එ.ජ.ඩො. දශ ලක්ෂ 593.1 ක් වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට පරිවර්තනය කළ මුදල අන්තර්ගත නොවේ.

(ඇ) 2007 ඔක්තෝබර් මස ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් එ.ජ.ඩො. දශ ලක්ෂ 50 ට අදාළ ආපසු ගෙවීම අන්තර්ගත වේ.

කළමනාකරණය පිළිබඳවද මෙහිදී සැලකිලිමත් වන ලදී. මීට අමතරව, ප්‍රාථමික අලෙවිකරු විධායක නිලධාරි රැස්වීම් වසර පුරා අඛණ්ඩව පවත්වන ලද අතර, මෙහිදී ප්‍රාථමික අලෙවිකරු කර්මාන්තය ක්‍රමානුකූලව පවත්වා ගෙන යාම සඳහා විධායක නිලධාරීන්ගේ අදහස් ලබාගැනීම මෙන්ම ගැටළු සාකච්ඡා කිරීමද සිදු කෙරුණි.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ප්‍රාථමික අලෙවිකරුවන් ගේ සංගමය සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය සමඟ එක්ව, ප්‍රාථමික අලෙවිකරුවන් විසින් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඔවුන්ගේ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සඳහා පොදුවේ පාවිච්චි කළහැකි ප්‍රධාන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුමෙහි (Master Repo Agreement) කටයුතු අවසන් කරන ලදී. ඒ අනුව, 2009 ජනවාරි 1 වැනිදා සිට බලපාන පරිදි සියළුම ප්‍රාථමික අලෙවිකරුවන් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෙම ප්‍රධාන ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම ඔවුන්ගේ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සඳහා භාවිතා කිරීමට අපේක්ෂිතය.

**(උ) රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය**

ආයෝජක පදනම පුළුල් කිරීම මගින් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීමේ අරමුණින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය සමඟ එක්ව ආයෝජකයන් දැනුවත් කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා මහජන සහ අධ්‍යාපනික වැඩමුළු ගණනාවක් පවත්වන ලදී. 2008 වසර තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 14 ක්, පාසැල් සිසුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩමුළු 24 ක් පැවැත් වූ අතර, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සමඟ එක්ව ගුවන්විදුලි වැඩසටහන් 30 ක් සංවිධානය කරන ලදී. ඒ සමඟම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මහජනතාව දැනුවත් කිරීම සඳහා රජයේ සුරැකුම්පත් පිළිබඳ වාර්තාමය කෙටි චිත්‍රපටියක් 2008 වසරේදී නිකුත් කළ අතර, විවිධ රූපවාහිනී නාලිකාවල සහ විවිධ ප්‍රදර්ශන සහ වැඩමුළුවල එම වාර්තාමය කෙටි චිත්‍රපටිය 28 වාරයක් ප්‍රදර්ශනය කරන ලදී. මීට අමතරව, රජයේ සුරැකුම්පත් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මෙරට සහ විදේශයන්හි විකාශනය වූ රූපවාහිනී සාකච්ඡා 8 කට සහභාගි විය.

# 21. ප්‍රාදේශීය සංවර්ධන

විමර්ශනයට ලක්වන වර්ෂය තුළදී, උපාය මාර්ගික වශයෙන් වැදගත් අංශයන්ට ණය ගලායාම දිරිගැන්වීම හා සංවිධානය කිරීම තුළින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමෙහි කටයුතුවල තවදුරටත් නිරත විය. මෙය සාක්ෂාත් කරගනු ලැබුවේ ප්‍රතිමූල්‍ය පහසුකම්, පොලී සහනාධාර හා ණය සම්පාදන වැඩසටහන් මාලාවක් තුළිනි. අළුතින් මුදාගත් නැගෙනහිර පළාතේ 2008 වර්ෂයේදී පැවැති යහපත් ආරක්ෂක තත්වය සිය අරමුදල් ප්‍රවාහයේදී නැගෙනහිර පළාත තුළ පුළුල් කිරීමෙහි ලා සක්‍රියව සහභාගිවීමේ අවස්ථාව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබාදුන්නේය. දරිද්‍රතාවය පිටුදැකීම සම්න්ධයෙන් සලකන කළ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, නැගෙනහිර පළාතේ දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් කෙරේ සුවිශේෂ අවධානය යොමු කරන ලදී. දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමයෙහි දෙවන අදියරෙහි මූලික වැඩ කටයුතුද සම්පූර්ණ කෙරුණු අතර එම වැඩසටහන ප්‍රධාන වශයෙන් ජනවාර්ගික අරගලයට හසුවුනු දිස්ත්‍රික්ක ආවරණය කරනු ඇත. 2008 අයවැය මගින් ප්‍රකාශයට පත්කළ කෘෂි සත්ව පාලන ණය යෝජනා ක්‍රමය 2008 වසරේ අප්‍රේල් මාසයේ සිට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කළේය. කෘෂිකාර්මික අංශය වර්ෂය තුළදී වාර්තා කළ වර්ධනයට අනුරූපව, කෘෂිකාර්මික කටයුතු හා අනුබද්ධ ණය වැඩසටහන් වලින් ණය සඳහා වන ඉල්ලුමෙහි විශාල වැඩිවීමක් දැකිය හැකි විය. වර්ෂයේ තුන්වන කාර්තුවේ දී සුනාමි පුනරුත්ථාපන ණය යෝජනා ක්‍රමයෙහි සමීක්ෂණයක් පැවැත්වුණු අතර දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ණය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් කෙරෙන විස්තරාත්මක සමීක්ෂණයක මූලික කටයුතු ද වර්ෂය තුළදී අවසන් කරන ලදී.

2008 වර්ෂයේ දී සහභාගිත්ව මූල්‍ය ආයතනයන්ට ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදීම තුළින් හෝ පොලී සහනාධාර ගෙවීම තුළින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කළ, සම්බන්ධීකරණය කළ ණය යෝජනා ක්‍රම සංඛ්‍යා සටහන 1 හි දැක්වේ.

## 21.1 නැගෙනහිර පළාතේ සංවර්ධනය

2008 වර්ෂයේදී නැගෙනහිර පළාතේ ආරක්ෂිත තත්වයෙහි වූ වර්ධනය උපයෝගි කොටගෙන එම පළාතේ සංවර්ධන කටයුතු කඩිනම් කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කළේය. පෙර පැවැති ආරවුල් සහගත තත්වය හේතුවෙන් නැගෙනහිර පළාතේ සුනාමි පුනරුත්ථාපන ක්‍රියාකාරකම් හි ප්‍රගතිය අඩපණ වූයෙන් දෙපාර්තමේන්තුව නැගෙනහිර පළාත තුළ සුනාමියට හසුවූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ක්‍රියාකාරිත්වය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සියයට 6 ක සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් ලබාදෙන සුසහන දෙවැනි අදියරෙහි කටයුතු දියත් කළේය. එසේම, සුනාමි පුනරුත්ථාපන කටයුතු සඳහා යුරෝපා ආයෝජන බැංකුවේ පශ්චාත් සුනාමි ණය යෝජනා ක්‍රමය යටතේද ණය පහසුකම් ලබාගත හැකි විය. නැගෙනහිර පළාත් සංවර්ධනය සඳහා ණය පහසුකම් ලබාගත හැකි බැංකු පහසුකම් පිළිබඳ දැනුවත් කිරීම සඳහා පැවැති ප්‍රවෘත්ති සාකච්ඡා දෙකට අමතරව කෘෂිකාර්මික හා අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා සහනදායී පොලී අනුපාත යටතේ ණය ලබාදෙන විශේෂ ණය යෝජනා ක්‍රම පිළිබඳ නැගෙනහිර පළාතේ බැංකු කාර්ය මණ්ඩල, රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය නොවන සංවිධාන හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 39 කට වර්ෂය තුළදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහභාගි විය. සහභාගිත්ව නියෝජිත ආයතන සහ සහභාගිත්ව මූල්‍ය ආයතනයන්ගේ උපකාරයෙන් නැගෙනහිර පළාතේ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති චක්‍රීය ණය යෝජනා ක්‍රමයන්හි දිළිඳු ප්‍රතිලාභ ලාභීන් ඉලක්කගත කරගැනීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකිවිය. 2008 වර්ෂය අවසානයේ දී නැගෙනහිර පළාතේ මෙම යෝජනා

ක්‍රමයට ලියාපදිංචි වූ ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 4,732 ක් විය. මින් ප්‍රතිලාභීන් 1,517 දෙනෙකුට ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ඇරඹීම සඳහා රුපියල් මිලියන 52.1 ක මුදලක් ණය වශයෙන් ප්‍රදානය කරන ලදී. සමස්තයක් වශයෙන් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය, දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය, යුරෝපා ආයෝජන බැංකුවේ පශ්චාත් සුනාමි ණය යෝජනා ක්‍රමය , සුසහන II සහ කෘෂි නවෝදය යෝජනා ක්‍රමය යටතේ නැගෙනහිර පළාත සඳහා 2008 වර්ෂයේදී රුපියල් මිලියන 432.7 ක් මුදාහරින ලදී. එසේම, උතුරු සහ නැගෙනහිර පළාත් දෙකම අයත් වන සහ එම පළාත් දෙකට මායිම්වන දිස්ත්‍රික්ක 14 ක් ඉලක්ක කොට ගත් දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය යෝජනා ක්‍රමය -II අදියර මගින් නැගෙනහිර පළාතේ දිළිඳුකම පිටුදැකීමේ ක්‍රියාකාරකම් සඳහා තවදුරටත් අරමුදල් ලබාදෙනු ඇත.

## 21.2 කෘෂිකාර්මික හා සත්ව පාලන අංශය

2008 අප්‍රේල් මාසයේදී කෘෂි සත්ව පාලන සංවර්ධන ණය වැඩසටහන හඳුන්වාදීම කෘෂිකාර්මික සහ සත්ව පාලන අංශය වෙත මූල්‍ය පහසුකම් සැපයීම සම්බන්ධයෙන් වර්ෂය තුළදී එළැඹි මංසළකුණක් විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශය මත 2008 රාජ්‍ය අයවැයට ඇතුළත් වුණු මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් රටෙහි දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගත්තේය. කිරි ගොවීන්ට අමතරව, කිරි ගොවීන් /බෝග වවන්නන් 1000 - 10000 ක් සමඟ දියර කිරි නිෂ්පාදන /බෝග නිෂ්පාදන මිලයට ගැනීම සඳහා ඉදිරි වෙළඳ ගිවිසුම්වලට එළැඹෙන්නටද කිරි නිෂ්පාදන සැකසුම් හෝ බෝග නිෂ්පාදන සැකසුම් සඳහා කර්මාන්ත ඒකක පිහිටුවීම සඳහා සහනදායී පොලියක් යටතේ ණය ලබාගත හැකිවේ. (පොලී අනුපාත, ණය උපරිම සීමා සහ ණය දෙනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර සඳහා වගුව 1 පරිශීලනය කරන්න) මෙම ණය වැඩසටහනෙහි සුවිශේෂ ලක්ෂණයක් වන්නේ මනා සත්ව පාලන විධි ක්‍රම අනුගමනය කිරීම ණය මුදාහැරීම සඳහා අනිවාර්ය කොන්දේසියක් වීමයි. කිරි ගොවීන්ට මෙන්ම කිරි නිෂ්පාදන සැකසුම් සඳහාද ණය පහසුකම් ලබාදීම තුළින් මෙම ණය වැඩසටහන නිෂ්පාදන ක්‍රියාදාමයක් සඳහා මූල්‍ය පහසුකම් සලසා ඇත. සමස්තයක් වශයෙන් ගත්කළ 2008 වර්ෂයේදී කෘෂි හා සත්වපාලන සංවර්ධනය වැඩසටහන යටතේ වටිනාකාම රුපියල් මිලියන 880.8 ක් වන, ණය 3,549 ක් ලියාපදිංචි වී ඇත.

කෘෂිකාර්මික අංශය 2008 වර්ෂයේදී අත්විඳි තියුණු වර්ධනයක් සමඟ නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ බෝග වගාව සඳහා ලබාදෙන ණය පහසුකම් වල සීඝ්‍ර වර්ධනයක් දැකිය හැකිවිය. 2007/08 මහ කන්නයේදී බෝග වගාව සඳහා සමස්තයක් වශයෙන් රුපියල් මිලියින 1,571.6 ක මුදලක් ලබාදී ඇති අතර, එය 2006/07 මහ කන්නයට සාපේක්ෂව සියයට 62 ක වර්ධනයක් විය. 2008 යල කන්නයේදී ප්‍රදානය කරන ලද ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 1,178.6 ක් වූ අතර, එය 2007 යල කන්නයට සාපේක්ෂව සියයට 38.4 ක වර්ධනයක් විය. මේ අතරතුර කෘෂිකාර්මික අංශය වාර්තා කළ ඉහළ වර්ධන වේගය සහ 2008 වර්ෂයේදී කෘෂිකාර්මික භාණ්ඩ මිල ගණන් සීඝ්‍රයෙන් උච්ඡාවචනය වීම හේතුකොට ගෙන නිෂ්පාදකයන් මෙන්ම නිෂ්පාදන මිලදී ගන්නන්ද මිල අවදානමට ගොදුරුවීම අවම කිරීම සඳහා ඉදිරි වෙළෙඳපොළ යාන්ත්‍රණය වෙත යොමුවීම හේතුවෙන් වර්ෂය තුළදී අත්සන් තැබුණු ඉදිරි වෙළෙඳ ගිවිසුම් සංඛ්‍යාවෙහි වර්ධනයක් දැකිය හැකිවිය. 2007/08 මහ කන්නයේදී ඉදිරි වෙළෙඳ ගිවිසුම් මගින් ගොවි නිෂ්පාදන මිලයට ගැනීම සඳහා ප්‍රදානය කරන ලද ණය වටිනාකම රුපියල් මිලියන 3,918.2 ක් වූ අතර, එය සියයට 104.0 ක් වර්ධනයක් විය. 2008 යල කන්නයෙහි මීට අදාළ ණය වටිනාකම රුපියල් මිලියන 3,866.0 ක් වූ අතර, එය පසුගිය වර්ෂයේ යල කන්නයට සාපේක්ෂව සියයට 52.0 ක් විය. මේ අතරතුර කෘෂිකාර්මික සම්බන්ධිත ක්‍රියාකාරකම් සඳහා සහනදායී පොලී අනුපාත යටතේ ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසායකයන් සඳහා මැදි හා දිගුකාලීන ණය පහසුකම් සපයන සහභාගිත්ව මූල්‍ය ආයතනයන් සඳහා පොලී සහනාධාර ලබාදෙන කෘෂි නවෝදය වැඩසටහන මගින් 2008 මුල් භාගයේදී රුපියල් මිලියන 552.3 ක ණය ප්‍රදානය කරන ලදී. විශේෂයෙන් සඳහන් කළයුතු කරුණක් වන්නේ උතුරු පළාතේ බැංකු කිහිපයක්ද මෙම වැඩසටහන යටතේ සැලකිය යුතු මුදලක් ප්‍රදානය කිරීමට යටත් වීමයි. 2008 ජූලි මාසයේ දී වර්ෂය තුළ පැවැති ඉහළ පොලී අනුපාතික ව්‍යුහය හේතුවෙන්, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සහ කෘෂි නවෝදය වැඩසටහන් වල පොලී අනුපාතික 12% දක්වා ඉහළ දැමුණු අතර, රජය විසින් ලබාදෙන සියයට 8 ක පොලී සහනාධාරයන් සමඟ සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා බලපැවැත්වෙන පොලී අනුපාතිකය 20% දක්වා ඉහළ නැංවිණි. සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය සහ තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය මගින් ණය සැපයීම අඛණ්ඩව සිදුකෙරෙන අතර, 2008 වර්ෂයේදී මෙම ව්‍යාපෘති යටතේ ලබාදුන් ණය වටිනාකම පිළිවෙලින් රුපියල් මිලියන 117.2 ක් හා 262.8 ක් විය. 2008 වර්ෂය අවසන් මාසවලදී තේ මිල ගණන් වල තියුණු පහත වැටීමක් සිදුවූ අතර, මිල ගණන් ස්ථාවර කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට තේ මිලදී ගැනීම හරහා වෙළෙඳපොළට මැදිහත් වීමට සිදුවිය. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මෙහිදී ශ්‍රී ලංකා තේ මණ්ඩලයට තේ මිලයට ගැනීම සඳහා 12% ක සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය ලබාගැනීමට අවස්ථාව සලසමින් ලංකා බැංකුව හා මහජන බැංකුව තුළින් ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදුන්නේය. මෙම වැඩසටහන යටතේ, 2008 රුපියල් මිලියන 231.4 ක ප්‍රතිමූල්‍ය පහසුකම් මුදාහැරිණි.

## 21.3 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දිරිමත් කිරීම

වර්ෂය තුළදී ඉදිකිරීම් අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය සතුටුදායක අන්දමින් ක්‍රියාත්මක වූ අතර, ඒ යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ලබාදුන් ණය ප්‍රමාණය රුපියල් මිලියන 632.2 ක් විය. යුරෝපා ආයෝජන බැංකුවේ පශ්චාත් සුනාමි ණය යෝජනා ක්‍රමය මගින් වර්ෂය තුළදී රුපියල් මිලියන 581.6 ක

ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලදී. සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතියද මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන චක්‍රීය අරමුදල් ව්‍යාපෘතියද අදාළ දිස්ත්‍රික්ක තුළ 2008 වර්ෂයේදී ක්‍රියාත්මක විය. සබරගමු ව්‍යාපෘතිය යටතේ වර්ෂය තුළදී රුපියල් මිලියන 42.3 ක ණය මුදා හැරුණු අතර, මාතලේ ව්‍යාපෘතිය යටතේ මුදාහැරුණු ණය වටිනාකම රුපියල් මිලියන 54.9 ක් විය. සුසහන සහ ජීවනශක්ති යන සුනාමි පුනරුත්ථාපන ණය යෝජනා ක්‍රමයන්හි බලපෑම තක්සේරු කිරීමට පැවැති සමීක්ෂණයක ක්ෂේත්‍ර කටයුතු ද වර්ෂය තුළදී අවසන් කෙරුණි.

## 21.4 දිළිඳුකම පිටුදැකීම

දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය චක්‍රීය අරමුදල් යෝජනා ක්‍රමය වර්ෂය තුළදී රටපුරාම ක්‍රියාත්මක විය. මෙම වැඩසටහන යටතේ වර්ෂය තුළදී ලියාපදිංචි වුණු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 4,182 ක් විය. මේ අතුරින් ප්‍රතිලාභීන් 15,200 කට ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ඇරඹීම සඳහා රුපියල් මිලියන 513.9 ක ණය මුදල් ප්‍රදානය කෙරුණි. මේ අතරතුර සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන සුළු පරිමාණ චක්‍රීය අරමුදල් යෝජනා ක්‍රමයද වර්ෂය පුරා ක්‍රියාත්මක වෙමින් ප්‍රතිලාභීන් 5,610 ක් සඳහා රුපියල් මිලියන 143.9 ක් ණය වශයෙන් ලබාදුන්නේය. දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය යෝජනා ක්‍රමයේ දෙවැනි අදියරේ සියළු මූලික කටයුතු අවසන් කෙරුණි. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානය විසින් අරමුදල් සපයන මෙම වැඩසටහන 2009 වසර මුලදී ඇරඹීමට අපේක්ෂිතය. උතුරු පළාත මුළුමනින්ම මුදාගැනීමත් සමඟ මේ වැඩසටහන එම පළාතේ ද ක්‍රියාත්මක වීමට නියමිතය.

දිළිඳුකම පිටුදැකීම සඳහා පවත්නා වැඩසටහන් සහ දැනටමත් නිමවී ඇති වැඩසටහන් ඉලක්කගත ප්‍රතිලාභීන් කෙරෙහිත්, සමස්ත සමාජය කෙරෙහිත් බලපෑ ඇති ආකාරය පිළිබඳ තක්සේරු කිරීම කර තිබීම දිළිඳුකම පිටුදැකීම සඳහා පවත්නා වැඩසටහන් වැඩි දියුණු කිරීමේදීත් නව වැඩසටහන් සැලසුම් කිරීමේදීත් වැදගත් වෙයි. මෙම අරමුණු පෙරදැරිව දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය යෝජනා ක්‍රමයේ බලපෑම තක්සේරු කරන විස්තරාත්මක සමීක්ෂණයක් සැලසුම් කර ඇති අතර එහි ප්‍රශ්නාවලිය සහ සංඛ්‍යා සටහන් වගු සැකසීම, නියැදිය තේරීම සහ සමීක්ෂණ පූර්ව මූලික තොරතුරු (baseline Information) ඒකරාශීකරණය වැනි කටයුතු 2008 දී නිමවා ඇත.

## 21.5 ණය අතිරේකකරණ කටයුතු

වාර්ෂික වාරික එකතු කිරීම, හිමිකම්පෑමේ අයදුම්පත් කළමනාකරණය කිරීම, අයදුම්පත් ගෙවීම සඳහා යොමුකිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ ගෙවීම් නැවත අයකරගැනීමට කටයුතු කිරීම වැනි කටයුතු මගින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ණය අතිරේක කරන කටයුතුවල අඛණ්ඩව නිරත විය. මෙම වැඩසටහන් තුළින් එකතු කළ වාරික වටිනාකම රුපියල් මිලියන 66.4 ක් විය. අනෙකුත් යෝජනා ක්‍රම යටතේ ණය මුදාහැරීම නැවති ඇති බැවින් රජයේ ඉල්ලීම පරිදි, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තු මැණික් හා ආභරණ අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි නිෂ්පාදන අංශ නවීකරණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයන් හඳුන්වා දුන්නේය. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ඇප මත පදනම් නොවූ, එහෙත් ව්‍යවසායේ ශක්‍යතාවය මත පදනම් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් සඳහා යෝජිත ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ අවසන් අදියරේ කටයුතුවලද දෙපාර්තමේන්තුව නියැලුනේය.

## 21.6 ප්‍රාදේශීය කාර්යාල

අනුරාධපුර, මාතර සහ මාතලේ ප්‍රාදේශීය කාර්යාල තුන, මෑතකදී ඔවුන් ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක/ ප්‍රදේශවල මූල්‍යකරණ කටයුතුවලට ප්‍රවිශ්ට වීම සඳහා අවශ්‍ය කටයුතු ප්‍රවර්ධනය කළ අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවලට අවශ්‍ය සේවා සම්පාදන කටයුතුවලද නිරත විණි. මූල්‍යකරණයට ප්‍රවිශ්ට වීම ප්‍රවර්ධනය කිරීම සඳහා කළ ප්‍රධාන කටයුතු අතරට ප්‍රතිලාභීන් සඳහා ණය ලබාගත හැකි පහසුකම් පිළිබඳව සහ රාජ්‍ය අනුග්‍රාහක සේවාවන් පිළිබඳව සහභාගිත්ව ණය දෙන ආයතන හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද සහනදායී ණය සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණ ප්‍රවර්ධන කටයුතුවල නිරතවීම සහ ගොවීන් සහ මිලදී ගන්නන් අතර කෘෂිකාර්මික ද්‍රව්‍ය ගනුදෙනු සඳහා ඉදිරි වෙළඳ ගිවිසුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අනුබල දීම ආදිය ඇතුලත්ය. වර්ෂය තුළ පවත්වන ලද දැනුවත් කිරීමේ රැස්වීම්/වැඩසටහන් 357 මගින් 20,000 ක් පමණ ප්‍රතිලාභීන්ට සහන සැලසීමට ප්‍රාදේශීය කාර්යාල මගින් කටයුතු සකසන ලදී. අනුරාධපුර සහ මාතලේ ප්‍රාදේශීය කාර්යාල ඉරිඟු, වී, සෝයා, බීළුනු, ඉඟුරු සහ දියර කිරි ඇතුළු කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා මුළු ආදායම / පිරිවැටුම රුපියල් මිලියන 4,570 ඉක්මවන 28,000 ක් පමණ වූ ඉදිරි වෙළෙඳ ගිවිසුම් සඳහා අත්සන් තැබීමේ සහ අත්සන් තැබූ ඉදිරි වෙළෙඳ ගිවිසුම් සුරැකුම් මත පදනම්ව බැංකුවලින් ගොවීන් වෙත ණය පහසුකම් සැපයීමේ කටයුතුවල නිරත විය. ශ්‍රී ලංකා මහ බැංකුවට සපයන සේවාවන් අතරට සම්මන්ත්‍රණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, මහ බැංකු ප්‍රකාශන කාසි සහ සමරු අලෙවිය, සේවක අර්ථසාධක අරමුදල් සාමාජික විමසීම්වලට අවධානය යොමු කිරීම, විවිධ ආර්ථික දත්ත එකතු කිරීම සහ සැපයීම, ක්ෂේත්‍ර පරීක්ෂණවල නියැලීම සහ විවිධ ගැටළු සම්බන්ධයෙන් ක්ෂේත්‍ර නිරීක්ෂණ කටයුතුවල යෙදීම ඇතුළත්ය. 2008 සැප්තැම්බර් මැසයේදී අනුරාධපුර ප්‍රාදේශීය කාර්යයාලයෙහි මුදල් කෞතුකාගාරයක් විවෘත කළ අතර එහි අනුරාධපුර හා පොළොන්නරු යුගයන්ට අයත් මුදල් ද ප්‍රදර්ශනය සඳහා තබා ඇත.

මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවිශ්ට වීම ප්‍රවර්ධනය කිරීමට සහ රාජ්‍ය අනුග්‍රාහක සේවා සම්න්ධීකරණයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය තුළින් ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාකාරී සහභාගිත්වය පිළිබඳ වර්ධනය වන අවශ්‍යතාවන් සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය කාර්යාලවල ක්‍රියාකාරිත්වය පුළුල් කිරීම සඳහා 2009 වර්ෂයේදී ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී.

**සංඛ්‍යා සටහන II-14**

**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රාදේශීය සංවර්ධන ණය යෝජනා ක්‍රමවල ප්‍රධාන ලක්ෂණ**

| | ව්‍යාපෘතිය හා එය ක්‍රියාත්මක වන කාලසීමාව | අරමුදල් සපයන ලද ආයතනය | පුළුල් අරමුණ | අරමුදල් යෙදවීම | ණයකරුවන් ගෙවිය යුතු පොලී අනුපාතිකය | ආපසු අයවීමේ අනුපාතිකය |
|---|---|---|---|---|---|---|
| 1. | කෘෂිකාර්මික අංශය | | | | | |
| 1.1 | දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය (SPCDPRF) (2006 - 2014) | ශ්‍රී ලංකා රජය | බහුවාර්ෂික බෝග අංශයේ වාණිජකරණය, නිෂ්පාදනය දියුණු කිරීම, පැල තවාන් දැමීම, පසු අස්වනු මෙහෙයුම් කටයුතු, නිෂ්පාදන සැකසීම හා වෙළෙඳපොළ පහසුකම් ලබාදීම. | රුපියල් බිලියන1.2 | 9% | 90% (ආසන්න වශයෙන්) |
| 1.2 | තේ සංවර්ධන (චක්‍රීය අරමුදල්) ණය ව්‍යාපෘතිය (TDPRF) (2006 - 2018) | -එම- | කුඩා තේ වතු හිමියන්ගේ ආදායම තිරසාර ලෙස ඉහළ දැමීම සහ අපනයන වෙළෙඳපොළ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. මේ යටතේ මූලික වශයෙන් HACCP සහතිකය ලබාගැනීම සඳහා තේ කර්මාන්ත ශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයිය හැකිය. | රුපියල් බිලියන1.1 | 9% | 90% (ආසන්න වශයෙන්) |
| 1.3 | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) (අඛණ්ඩව ක්‍රියාත්මක වන වැඩසටහනකි) | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | සුළු ගොවීන් සඳහා මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සැපයීම.<br>● කෙටිකාලීන නිෂ්පාදන ණය<br>● බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය<br>● ඉදිරි වෙළෙඳ ගිවිසුම් ක්‍රමය යටතේ කෘෂිකාර්මික ද්‍රව්‍ය මිලට ගැනීම. | සහභාගිත්ව මූල්‍ය ආයතන තමන්ගේම අරමුදල් මගින් ණය ප්‍රදානය කෙරේ. | 2008 ජූලි දක්වා 8% එතැන් සිට 12% | 90% (ආසන්න වශයෙන්) |
| 1.4 | කෘෂි සත්ව පාලන ණය යෝජනා ක්‍රමය | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | කිරි හරක් පාලනයේදී පහත දැක්වෙන ප්‍රාග්ධන වියදම් සඳහා<br>● ගව නිවහන තැනීමට<br>● එළදෙනුන් මිලදී ගැනීමට<br>● ආහාර මිලදී ගැනීම, පශු වෛද්‍ය සේවා හා ඖෂධ ආදිය සඳහා<br>● සත්ව ආහාර වගා කිරීම සඳහා<br>● ජීව වායු ටැංකි ඉදිකිරීමට<br>● පශු වෛද්‍යවරු විසින් නිර්දේශ කරනු ලබන අනෙකුත් කවර හෝ අවශ්‍යතාවයන් සඳහා<br>දියර කිරි සැකසුම් කර්මාන්ත හා Agribased කර්මාන්තවලට පහත දැක්වෙන අරමුණු සඳහා අරමුදල් සැපයීම<br>● කාර්මික ගොඩනැගිලි ඉදිකිරීම/ නවීකරණය කිරීම<br>● නවීන යන්ත්‍ර සහ උපකරන මිලයට ගැනීමට<br>● ගබඩා පහසුකම්, ශීත කාමර හා ප්‍රවාහන සේවා<br>● අනෙකුත් අවශ්‍ය සේවා, ප්‍රමිති කළමනාකරණ සඳහා උපකරණ සඳහා | සහභාගිත්ව මූල්‍ය ආයතන සිය අරමුදල් මගින් ණය ලබාදේ. රුපියල් මිලියන 5000 ක් මෙමගින් ලබාදීමට අපේක්ෂිතය | කුඩා කිරි පට්ටි ණය ව්‍යාපෘති සඳහා 12%<br><br>කිරි සහ භෝග සැකසීම සඳහා 14% | |
| 1.5 | කෘෂි නවෝදය ණය වැඩසටහන (2007 මාර්තු සිට 2010 පෙබරවාරි අවසානය දක්වා) | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත, ක්ෂුද්‍ර හා බිංදු වාරි පද්ධති ඇතුළුව කෘෂිකාර්මික හා සත්ව පාලන අංශයට අදාල කටයුතු වලට මැදිකාලීන ණය සැපයීම. | ණයදෙන ආයතන තම සම්පත් උපයෝගී කොටගෙන ණය ප්‍රදානය කරයි. ණය ක්‍රමය ක්‍රියාත්මක වන කාලය තුළදී රුපියල් මිලියන 3,000 ක් මුදාහැරීමට අපේක්ෂා කෙරේ. | 2008 ජූලි දක්වා 8% - එතැන් සිට 12% | 90% (ආසන්න වශයෙන්) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2. | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය | | | | | |
| 2.1 | මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන (චක්‍රීය අරමුදල්) ව්‍යාපෘතිය (MREAPRFS) (2007 - 2009) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලල (IFAD) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ආධාර සැපයීමෙන් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම ඉහළ නැංවීම. | රුපියල් මිලියන 77 | 10% | ණය මුදල් සහන කාලය තුළ පවතී. |
| 2.2 | සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන (චක්‍රීය අරමුදල්)ණය ව්‍යාපෘතිය (SPIRDPRF) (2006 - 2010) | ශ්‍රී ලංකා රජය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය තුළ ජනතාවගේ ආදායම් උත්පාදන කටයුතු තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම. | රුපියල් මිලියන 100 | 10% | 93% |
| 2.3 | යුරෝපා ආයෝජන බැංකුවේ පශ්චාත් සුනාමි ණය යෝජනා ක්‍රමය (ශිවිසුම B)(EIB) (2006 - 2014) | යුරෝපා ආයෝජන බැංකුව (EIB) | සුනාමි ව්‍යසනයට ගොදුරු වූ ප්‍රදේශ වල සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර යළි නගා සිටුවීම. | යූරෝ මිලියන 20 | 9% | ණය මුදල් සහන කාලය තුළ පවතී |
| 2.4 | සුසහන ණය යෝජනා ක්‍රමය (අදියර 2) | ශ්‍රී ලංකා මහ බැංකුව | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සහාය වීම | රුපියල් මිලියන 500 | 6% | ණය මුදල් සහන කාලය තුළ පවතී |
| 2.5 | ඉදිකිරීම් අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය (2007-2015) | ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය (AFD) | පශ්චාත් සුනාමි ඉදිකිරීම් කටයුතුවල යෙදෙන ඉදිකිරීම්, වාණිජ හා සංවර්ධන ආයතනය විසින් අනුමත සමාගම් වෙත යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම. | යූරෝ මිලියන 10 | 9% | -එම- |
| 3. | ක්ෂුද්‍ර මූල්‍ය අංශය | | | | | |
| 3.1 | වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩසටහන (2006 - 2012) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | මොණරාගල, කුරුණෑගල, බදුල්ල හා අනුරාධපුර වැනි තෝරාගත් දිස්ත්‍රික්කවල දිළිඳු ගොවීන්ගේ ජීවන තත්ත්වය සහ ආදායම් ප්‍රවර්ධනය කිරීම සඳහා | ශ්‍රී ලංකා රුපියල් මිලියන 200 | 10% | ණය මුදල් සහන කාලය තුළ පවතී |
| 3.2 | කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (2007 - 2015) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | මැදරට ප්‍රදේශයේ තේ සහ බහු වාර්ෂික බෝග වගා කරන කුඩා වතු හිමියන්ගේ සහ මොණරාගල ප්‍රදේශයේ අන්තර් කලාපීය ප්‍රදේශයන්හි උස්බිම් වල ආහාර බෝග වගා කරන රබර් වගාව සඳහා යොමු වීමට කැමති ගොවීන්ගේ ජීවන තත්වය නගා සිටුවීම. | ඇ.එ.ජ.ඩොලර් මිලියන 40.7 | 9%<br>16%-20% | ණය මෙතෙක් මුදාහැර නැත<br>90%<br>(ඉක්මවා ඇත). |
| 3.3 | සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) යෝජනා ක්‍රමය (SFLCPRF ) | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් මූල්‍යකරණ පහසුකම් සැපයීම සඳහා ඵලදායී ණය මුදාහැරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම. | ශ්‍රී ලංකා රුපියල් මිලියන 512.7 | 16%-20% | 90%<br>(ඉක්මවා ඇත). |
| 3.4 | දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘති (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය (PAMPRF) | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් මූල්‍යකරණ පහසුකම් සැපයීම සඳහා ඵලදායී ණය මුදාහැරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම.<br>හඳුනාගත් ණය ගැනුම්කරුවන් අතර ආදායම් ඉපැයීමේ ක්‍රම හඳුන්වාදීමෙන් දිළිඳුබව දුරලීම.<br>සංවිධිත මූල්‍ය අංශය හා සම්බන්ධවීම සඳහා අඩු ආදායම්ලාභී කුඩා කණ්ඩායම් සංවිධානය කිරීම | ශ්‍රී ලංකා රුපියල් මිලියන 1,250 | 16% | 90%<br>ඉක්මවා ඇත. |

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

## 22. ලේකම්

ලේකම් දෙපාර්තමේන්තුව 2008 වසරේදී කලට වේලාවට භාණ්ඩ හා සේවාවන් සැපයීමෙන් ද, ක්‍රමවේදයන් සහ ක්‍රියාපිළිවෙත් නිරන්තර ඇගයීමකට ලක් කිරීමෙන් සහ වැඩිදියුණු කිරීමෙන් ද, නිවාඩු, විශ්‍රාම වැටුප් අරමුදල්, දේශීය හා විදේශීය ගමන් සම්බන්ධ නීති හා නියෝග ක්‍රියාවට නගමින් ද, බැංකුවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ආයක විය.

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව ටෙන්ඩර් 48 ක් සම්බන්ධ කටයුතු නිම කරමින් රුපියල් දශ ලක්ෂ 79.7 ක වටිනාකමින් යුත් භාණ්ඩ හා සේවාවන් ද, රුපියල් දශ ලක්ෂ 55.9 ක වටිනාකමකින් යුතු ප්‍රාග්ධන නොවන අයිතමයන් ද, ගුණාත්මක භාවයෙන් යුතුව තරඟකාරී මිල ගණන් යටතේ කලට වේලවට සපයන ලදී. මහ බැංකුවේ මිලදී ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරිම තුළින් දෙපාර්තමේන්තුවල භාණ්ඩ හා සේවා අවශ්‍යතා කලට වේලාවට සැපයීම තවදුරටත් කඩිනම් කිරීමේ අරමුණින් වර්ෂය තුළදී මිලදී ගැණුම් සැලසුම් කිරීමේ සංකල්පය ක්‍රියාවට නගනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවේ සමස්ත මිලදී ගැනීමේ අවශ්‍යතාවලින් සියයට 87 ක ප්‍රමාණයක් ඉතා සාර්ථක ලෙස අවසන් කිරීමට මෙම වර්ෂය තුළදී ලේකම් දෙපාර්තමේන්තුවට හැකිවිය. මීට අමතරව, බැංකුවේ සියලුම දේපල සඳහා සඵල විස්තීර්ණ රක්ෂණ ආවරණයක් ලබාගන්නා ලදී. තවද, පවත්නා රෙගුලාසි සහ ව්‍යවස්ථාවන්හි ශක්තිමත් සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීමේ අදහසින් බැංකු අත්පොත යාවත්කාලීන කිරීමේ කටයුතු සම්පූර්ණ කරන ලද අතර, එය 2009 වසරේදී නිකුත් කෙරේ. මහ බැංකු විශ්‍රාම යෝජනා ක්‍රමයේ, වැන්දඹු සහ අනත්දරු අරමුදලේ සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු අරමුදලේ පාලන කටයුතුද ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. මෙම යෝජනා ක්‍රමයන් යටතේ වර්ෂය අවසානය වනවිට විශ්‍රාමිකයන් 1,956 දෙනෙකු ලියාපදිංචි වී සිටින අතර, මෙම අරමුදල් සම්බන්ධයෙන් වන දත්ත පද්ධතීන් පරිගණක ගතකිරීමේ කටයුතු වර්ෂය තුළදී තවදුරටත් ක්‍රියාත්මක විය.

2008 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ සේවා තිළිණ ප්‍රදානය, නිදහස් දින උත්සවය වැනි වාර්ෂික උත්සවයන් ද විවිධ ආගමික උත්සවයන්ද සම්බන්ධීකරණය සහ සංවිධානය කරන ලදී.

## 23. ආරක්ෂක සේවා

ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලය, ගොඩනැගිලි හා දේපල, බැංකුව වෙත පැමිණෙන අමුත්තන් හා මුදල් බහාලුම් ප්‍රවාහනයේදී අවශ්‍ය ආරක්ෂාව ලබා දීමේ අරමුණින් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂක විධි විධාන තවදුරටත් තර කරන ලදී. එසේ ආරක්ෂක විධි විධාන තර කිරීමේ කටයුතු රැසක් 2008 වර්ෂය තුළදී ඉටු කරන ලදී.

හදිසි අවස්ථාවන්හි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සකස් කර ඇති "ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම" 2008 අගෝස්තු මාසයේ දී රාජගිරිය බැංකු අධ්‍යයන කේන්ද්‍රයේදී අත්හදා බැලීමට ලක් කළ අතර, ඒ සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සිය සක්‍රීය දායකත්වය ලබා දෙන ලදී. තවද ගිනි නිවීම් සහ ප්‍රථමාධාර ලබාදීම් පිළිබඳ ගිනි පෙරහුරු වැඩසටහන් අටක් සහ හදිසි අවස්ථාවන් පිළිබඳව සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පහක් පසුගිය වර්ෂය තුළ පවත්වන ලදී. මහ බැංකු ගොඩනැගිල්ල තුළ සහ ඉන් පිටත සමීප දර්ශන ලබා ගැනීම සඳහා දැනට සවිකර ඇති කැමරා පද්ධතිය වැඩි දියුණු කර විදුලිය නොමැති රාත්‍රියකදී පවා දර්ශන ලබාගත හැකි කැමරා සවිකර රජයේ ආරක්ෂක අංශවල ගුවන් ආරක්ෂක පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සහය දැක්වීය. දැනට භාවිතා කරනු ලබන භාණ්ඩ පරීක්ෂා කිරීමේ පැරණි එක්ස්කිරණ යන්ත්‍ර වෙනුවට නව යන්ත්‍ර ලබාගැනීමට සහ නව ආරක්ෂක සහාය සේවා කිහිපයක් බාහිර ආයතනවලින් ලබාගැනීමට අවශ්‍ය මූලික කටයුතු සකස් කරන ලද අතර, නව ගිනි අනතුරු සංඥා පද්ධතියක් රාජගිරිය බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ ස්ථාපිත කරන ලදී.

ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ආරක්ෂක නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය වැඩිකිරීමේ අරමුණින් ශාරීරික අභ්‍යාස වැඩ සටහනක් පසුගිය වසර තුළ හඳුන්වා දෙන ලදී. තවද ආරක්ෂක නිලධාරීන් අට දෙනෙකු සඳහා ආරක්ෂක කළමනාකරණය, ගිනි නිවීම, ආරක්ෂාව පිළිබඳ අධීක්ෂණය හා පාලන මැදිරි කළමනාකරණය පිළිබඳව විදේශ පුහුණුවක් ලබාදෙන ලද අතර, තවත් ආරක්ෂක නිලධාරීන් 10 දෙනෙකු සඳහා අදාළ ක්ෂේත්‍රයේ දේශීය පුහුණු අවස්ථාවන් ද පසුගිය වසර තුළ ලබාදෙන ලදී.

## 24. සංඛ්‍යාන හා ක්ෂේත්‍ර සමීක්ෂණ

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව පළාත් ජාතික ගිණුම්, මිල ගණන්, වැටුප්, ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය සහ වෙනත් සමාජ ආර්ථික අංශ පිළිබඳව දත්ත එක්රැස් කිරීම, සම්පාදනය කිරීම, විශ්ලේෂණය සහ සන්නිවේදනය කිරීමේ කටයුතු 2008 වසරේදී ද අඛණ්ඩව සිදු කළේය."තෝරාගත් ආර්ථික දර්ශක" සතිපතා සහ මාසිකව ප්‍රසිද්ධ කිරීම තුළින් මහජනතාව වෙත සමාජ ආර්ථික දත්ත සහ තොරතුරු අඛණ්ඩව නිකුත් කැරිණි. පාරිභෝගික මිල තොරතුරු සහ උද්ධමනය පිළිබඳව මාසික පුවත්පත් නිවේදන ප්‍රකාශයට පත්කිරීම ද අඛණ්ඩව සිදුකරන ලදී.

මෙයට අමතරව, දෙපාර්තමේන්තුව මගින් වර්ෂය තුළ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා මාධ්‍ය සාකච්ඡාවලට සම්පත් දායකයන් සැපයීම තුළින් මහජනතාව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පවත්වන වැඩසටහන්වලට ක්‍රියාශීලීව දායක විය. දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතුවල ගුණාත්මකභාවය හා ඵලදායීතාව වර්ධනය කිරීමෙහි ලා ඉවහල් වන පරිද්දෙන් තම දැනුම හා කුසලතාවයන් තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා නිලධාරීන් රැසක් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගි විය.

### 24.1 සංඛ්‍යාන සමීක්ෂණ

අනාගත උද්ධමනය පිළිබඳ පාරිභෝගිකයින්ගේ, ආයෝජනකයින්ගේ හා ව්‍යාපාරික ප්‍රජාවගේ අපේක්ෂාවන්

තක්සේරු කිරීම සඳහා 2006 වසරේ ආරම්භ කරන ලද උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය 2008 වසරේදී ද අඛණ්ඩව සිදුකරන ලදී. මෙහි ප්‍රතිඵල මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට උපකාරී වීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ සහ මූල්‍ය ප්‍රතිපත්ති උපදේශක කමිටුවේ මාසික රැස්වීම්වලට ඉදිරිපත් කරන ලදී.

**24.2 ශ්‍රී ලංකාව සඳහා සෞභාග්‍ය දර්ශකය**

ශ්‍රී ලංකාවේ සහ එහි පළාත්වල සෞභාග්‍යය මැනීම සහ සන්සන්දනය කිරීම සඳහා ගණනය කරන ලද සෞභාග්‍ය දර්ශකය 2008 වසර තුළ දී ප්‍රකාශයට පත් කරන ලදී. මෙම දර්ශකය වසර දෙකක පර්යේෂණයක සහ වෘත්තීයවේදීන් සමග කරන ලද සාකච්ඡා, සම්මන්ත්‍රණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් ලබා ගත් ප්‍රතිචාරවල ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය කොට වැඩි දියුණු කරන ලද්දකි.

## 24.3 ජාතික සහ ප්‍රාදේශීය ආදායම් ගිණුම්

ශ්‍රී ලංකා ආර්ථිකයෙහි මූර්ත අංශයේ සිදුවන වර්ධනයන් සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීමත්, ජාතික ආදායම් පුරෝකථනයන් සැකසීමත් 2008 වර්ෂය තුළ දී ද සිදු කරන ලදී. ආර්ථිකයෙහි විවිධ අංශයන්හි ප්‍රාථමික හා ද්විතීයික දත්ත එක්රැස් කිරීම, නිෂ්පාදනය, පරිභෝජනය, ඉතුරුම් හා ආයෝජන පිළිබඳ ප්‍රවණතා විශ්ලේෂණය සහ අනාගත උපනති පුරෝකථනය කිරීම ද මේ ක්‍රියාවලිය තුළ දී සිදු කැරිණි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත ජාතික ආදායම් ගිණුම් පදනම් කොට ගෙන සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2007 වසර සඳහා පළාත් මට්ටමේ දළ දේශීය නිෂ්පාදිතයන් සම්පාදනය කරන ලදී. මෙම පළාත් දළ දේශීය නිෂ්පාදිතයන් පවත්නා වෙළෙඳපොළ මිල ගණන් අනුව ඇස්තමේන්තු කර ඇති අතර, ඒ ඒ පළාත් සමස්ථ දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ලද දායකත්වය මෙමඟින් අනාවරණය කෙරේ. පළාත් අතර ඇති ආදායම් විෂමතාවයන් අඩු කිරීමට ඉවහල් වන උපායමාර්ග හඳුන්වාදීමට හා ක්‍රියාත්මක කිරීමට පළාත් බලධාරීන්ට මෙන්ම මධ්‍යම රජයේ ජාතික ප්‍රතිපත්ති සම්පාදකයින්ටද මෙම පළාත් දළ දේශීය නිෂ්පාදිත තොරතුරු උපකාරී වේ.

## 24.4 දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල

1978 දී ආරම්භ කරන ලද දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙලට 2008 වර්ෂයේ දී තිස් වසරක් සැපිරුණි. මෙම දත්ත රැස්කිරීම, රජයේ පාසැල්වල ගුරුභවතුන් මගින් දීප ව්‍යාප්ත ජාලයක් හරහා ක්‍රියාත්මක කැරිණි. මේ වෙනුවෙන් උතුරු නැගෙනහිර පළාත්වල මධ්‍යස්ථාන 18 ක් ද ඇතුළුව දිවයිනේ දත්ත රැස්කිරීමේ මධ්‍යස්ථාන 101 ක් සඳහා ගුරු මහත්ම මහත්මීහු සංඛ්‍යාන සමීක්ෂකවරුන් ලෙස කටයුතු කරති. පරිභෝජන භාණ්ඩවල සිල්ලර මිල ගණන්, කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදන මිල ගණන් සහ අවිධිමත් අංශයට අදාළ වැටුප් අනුපාත පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම මෙම වැඩසටහන යටතේ සිදු කැරිණි. මෙහිදී වී, තේ, රබර් සහ පොල් වගාවන්ට ද, කුඩා පරිමාණ ඉදිකිරීම් හා සේවාවන්ට ද අදාළව දෛනික වැටුප් පිළිබඳ තොරතුරු රැස්කරනු ලැබේ. පිටකොටුව වෙළෙඳපොළ, මරඳගහමුල සහල් වෙළෙඳපොළ සහ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය යන මධ්‍යස්ථානවලින් ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල තොග සහ සිල්ලර මිල ගණන් එකතු කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද ගුරුභවතුන් නොවන දත්ත සමීක්ෂකයන් විසින් සිදු කැරිණි. අභිනවයෙන් පිහිටුවන ලද නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳපොළ තොරතුරු එක්රැස් කිරීම සහ බෙදාහැරීම ද එය විවෘත කළ 2008 දෙසැම්බර් මාසයේ සිටම දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කරන ලදී. දත්ත සමීක්ෂකයන් මගින් එවනු ලබන මිල ගණන් අඛණ්ඩව දුරස්ථ සහ සමීපස්ථ අධීක්ෂණයන්ට ලක් කිරීම තුළින් දත්ත එක්රැස් කිරීමේ ගුණාත්මක බව සහ කාලීන බව තවදුරටත් වැඩි දියුණු කැරිණි. සමහර භාණ්ඩ සහ වෙළෙඳ නාම වෙළෙඳපොළෙන් ඉවත් වීම, ඒකක පරිමාණයන් වෙනස් වීම වැනි පවතින වෙළෙඳපොළ වර්ධනයන් සැලකිල්ලට ගෙන දත්ත රැස්කිරීමේ ලේඛන අදාළ පරිදි සංශෝධනය කරන ලදී.

දත්ත සමීක්ෂකයන් සඳහා නවමු පුහුණුවක් ලබාදීම තුළින් දත්ත රැස්කිරීමේ නිරවද්‍යතාවය, ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාවය හා කාලීන බව වැඩි දියුණු කිරීමත්, මධ්‍යස්ථාන සහ ප්‍රදේශ අතර මිල ගණන් වෙනස් වීමට හේතු ඔවුන් වෙතින් ලබා ගැනීමත් උදෙසා 2008 වසරේදී ද කොළඹ, මාතර, අනුරාධපුර හා මහනුවර දී ප්‍රාදේශීය සම්මන්ත්‍රණ හතරක් පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණවල දී පාසැල් දරු දැරියන් වෙත සහ සමාජය තුළ දැනුම බෙදාහැරීම අරමුණු කොට ගෙන දත්ත සමීක්ෂක ගුරුභවතුන් දැනුවත් කිරීම උදෙසා උද්ධමනය සහ අළුතින් හඳුන්වා දුන් කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය, ශ්‍රී ලංකාවේ සෞභාග්‍ය දර්ශකය සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ යන මාතෘකා ඔස්සේ ආර්ථිකයේ ඇති වූ සමකාලීන වර්ධනයන් පිළිබඳ විශේෂ දේශන පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණවල දී දත්ත සමීක්ෂක ගුරුභවතුන් වෙතින් දක්නට ලැබුණු දැනුවත් බව සහ උනන්දුව මගින් මෙවැනි වැඩසටහන්වල සාර්ථකත්වය පිළිබිඹු විය.

## 24.5 මිල, වැටුප් හා සේවා නියුක්තිය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2007 නොවැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලද කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.), (2002=100) භාවිතා කරමින්, පාරිභෝගික මිල ගණන්වල සහ උද්ධමනයේ හැසිරීම විශ්ලේෂණය කිරීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී. දෙපාර්තමේන්තුව විසින් 2008 වසරේදී ද 2003/2004 නවතම පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණය පාදක කර ගනිමින්, පදනම් කාලය 2003-2005 මත පළාත්බද පාරිභෝගිකමිල දර්ශක සහ රටේ සමස්ත පාරිභෝගික මිල දර්ශකය අඛණ්ඩව සම්පාදනය කරන ලදී.

නිෂ්පාදන මිල හා ප්‍රාථමික වෙළෙඳපොළ මට්ටමේ තොග මිල ගණන්වල වෙනස් වීම් විශ්ලේෂණය කිරීම සඳහා තොග මිල දර්ශකය සම්පාදනය ද, දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙලෙහි වැටුප් දත්ත පදනම් කරගනිමින් ශ්‍රී ලංකාව සඳහා අවිධිමත් අංශයේ වැටුප් පරිමාණ අනුපාත සකස් කිරීම ද අඛණ්ඩව සිදු කරන ලදී.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සහ කාර්තුමය සමීක්ෂණයන් ද 2008 වසරේ දී පවත්වන ලදී. 2007 වසරේ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයේ දී වාර්තා වූ පරිදි දහසකට වැඩි සේවක සංඛ්‍යාවකින් යුත් මධ්‍යම රජයේ හා රාජ්‍ය අංශයේ (පළාත් සභා හැර) අනෙකුත් සියළුම ආයතන මෙම සමීක්ෂණයට ඇතුළත් විය. 2008 වර්ෂය තුළ විදේශ සේවා නියුක්තිය, සේවක සම්බන්ධතා සහ ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ශ්‍රම බලකාය සහ ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳ එක්රැස් කරන ලද තොරතුරු දෙපාර්තමේන්තුව විසින් විශ්ලේෂණය කරන ලදී.

### 24.6 සංඛ්‍යා තොරතුරු බෙදාහැරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් එහි වාර්ෂික ප්‍රකාශනයන් දෙක වන "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2008"-xxix වන වෙළුම 2008 මාර්තු මාසයේ දී ද, "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2008"-xxxi වන වෙළුම 2008 ජූනි මාසයේ දී ද නිකුත් කරනු ලැබිණි. මෙයට අමතරව, බැංකුවෙහි 2008 සාක්කු දින පොතෙහි සංඛ්‍යාන වගු යාවත්කාලීන කරන ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ආර්ථික සහ සමාජ සංඛ්‍යාන පිළිබඳ දත්ත පුස්තකාලයක් පිහිටු වීමේ නව ව්‍යාපෘතියක් 2008 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

## 25. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද මුදල් සමාගම් සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් නියාමනය සහ අධීක්ෂණය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, 2008 වර්ෂය තුළදී ද ක්‍රියාත්මක කරන ලදී.

2008 වර්ෂය තුළදී විශේෂිත කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචිව තිබූ සමාගමක් සහ නව සීමාසහිත පොදු සමාග මක් මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි වීමත් සමඟ වර්ෂය අවසානය වන විට ලියාපදිංචි මුදල් සමාගම් මුළු සංඛ්‍යාව 32 සිට 34 දක්වා වැඩි විය. එමෙන්ම නව පොදු සමාගම් තුනක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ අතර ඒ අනුව කල්බදු මූල්‍යකරණ ආයතන ලෙස ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 78 ක් දක්වා, 2008 වර්ෂය අවසානයේදී ඉහළ ගොස් ඇත.

### 25.1 ලියාපදිංචි මුදල් සමාගම්

අධීක්ෂණ හා නියාමන කටයුතු සිදුකිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව දුරස්ථ පරීක්ෂණ සහ එතැන් පරීක්ෂණ යන විධි ක්‍රම දෙකම උපයෝගී කරගනු ලැබේ. සියලුම මුදල් සමාගම් මාසිකව දුරස්ථ පරීක්ෂණ සිදුකරනු ලබන අතර, එතැන් පරීක්ෂණ කලින් සකස් කරන ලද සැලසුමකට අනුව වර්ෂ දෙකකට වරක් සිදුකරනු ලැබේ. එතැන් පරීක්ෂණ සඳහා භාජනය නොවන සමාගම්වල තෝරාගත් විශේෂිත ක්ෂේත්‍රයන් ද ආවරණය වන පරිදි සීමිත එතැන් පරීක්ෂණ කටයුතු සෑම වර්ෂයකම සිදුකරනු ලැබේ.

**(අ) දුරස්ථ පරීක්ෂණ ක්‍රමය**

දුරස්ථ පරීක්ෂණ සඳහා මූලික වශයෙන් උපයෝගී කරගන්නේ ලියාපදිංචි මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් කාලීනව මෙම දෙපාර්තමේන්තුව වෙත සපයනු ලබන මූල්‍ය ප්‍රකාශන වන අතර, ඒවා විශ්ලේෂණය කිරීම මගින් එකී ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදාළ පනත්වල ප්‍රතිපාදන යටතේ පනවනු ලැබ ඇති විධානයන් සහ රීතීන් අනුගමනය කරන්නේද යන්න විමසා බැලීමයි.

**(ආ) එතැන් පරීක්ෂණ ක්‍රමය**

එතැන් පරීක්ෂණ ක්‍රමය මගින් ලියාපදිංචි මුදල් සමාගම්වල ද්‍රවශීලතාවය, වත්කම්වල ගුණාත්මක තත්ත්වය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය, කළමනාකරණ කාර්යක්ෂමතාවය, ඉපැයීම්, ලාභදායිත්වය, පද්ධති හා පාලන විධි සහ ආයතනික යහපැවැත්ම සම්බන්ධව ඇගැයීම් සිදුකරනු ලැබේ. 2008 වර්ෂය තුළදී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ලියාපදිංචි මුදල් සමාගම් 11 ක සම්පූර්ණ එතැන් පරීක්ෂණ සිදුකරනු ලැබීය. ඊට අමතරව, සම්පූර්ණ එතැන් පරීක්ෂණ සඳහා භාජනය නොවූ ලියාපදිංචි මුදල් සමාගම් 17 ක්, සඳහා තෝරාගත් විශේෂ ක්ෂේත්‍රයන් එනම්, ද්‍රවශීලතාවය, ණය කළමනාකරණය, වත්කම් ව්‍යුහය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය සහ පද්ධති සහ පාලන විධි ආවරණය වන පරිදි විශේෂිත එතැන් පරීක්ෂණ සිදුකරනු ලැබීය.

මෙම සම්පූර්ණ එතැන් පරීක්ෂණ හා විශේෂිත එතැන් පරීක්ෂණවලදී හඳුනාගන්නා ලද කරුණු මුදල් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට දැනුම්දීමට කටයුතු කර ඇති අතර, පවතින දුර්වලතාවයන් ඉතා ඉක්මනින් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුම් දෙන ලදී. නිවැරදි කළ යුතු ක්ෂේත්‍ර එසේ නිවැරදි කිරීම සඳහා නිශ්චිත කාලසීමාවක් තුළ කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලවල එකඟතාවය ලබාගැනීමටද කටයුතු කර ඇත. මෙම නිවැරදි කිරීම් පිළිබඳව දෙපාර්තමේන්තුව සමීපව පසුවිපරම් කරනු ලබන බවද සඳහන් කළ යුතුය.

**(ඇ) විධාන නිකුත් කිරීම**

2008 වර්ෂය තුළදී, පහත සඳහන් විධාන හතර නිකුත් කරන ලදී.

(i) **2008 අංක 1 දරන මුදල් සමාගම් (පොලී) විධානය**
2005 අංක 2 දරන මුදල් සමාගම් (පොලී) විධානය අවලංගු කරමින්, ලියාපදිංචි මුදල් සමාගමක් විසින් ලබාග න්නා ලද හෝ නිකුත් කරනු ලබන කාලීන තැන්පතුවක්, ඉතිරිකිරීමේ තැන්පතුවක් හෝ බැඳුම්කරයක් හෝ වට්ටමක් මත නිකුත් කරන ලද ණය උපකරණයක් සඳහා ගෙවනු ලබන උපරිම වාර්ෂික පොලී අනුපාත මට්ටම මෙම විධානය මගින් නියම කර ඇත.

(ii) **2008 අංක 2 දරන මුදල් සමාගම් (පොලී) විධානය** - මෙම විධානය මගින් 2008 අංක 1 දරන මුදල් සමාගම් (පොලී) විධානය අවලංගු කර ඒ වෙනුවට සංශෝධනය කරන ලද මෙම විධානය නිකුත් කරන ලදී.

(iii) **2008 අංක 3 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලන) විධානය** - බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද ආයතනික යහපාලන මූලධර්ම පාදක කර ගනිමින් ලියාපදිංචි මුදල් සමාගම් සඳහා සකස් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මූලධර්මයන් 2009 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය ඇගයීමේ නිර්ණායක, මණ්ඩලය විසින් බලය පවරා ඇති කළමනාකරණ කාර්යයන්, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ කාර්යයන් වෙන් කර දැක්වීම, මණ්ඩලය විසින් පත්කළ කමිටු හා මූල්‍ය වාර්තා හෙළිදරව් කිරීම් යනාදිය, මෙයින් ආවරණය වන ප්‍රධාන අංගයන් වේ. නව අවශ්‍යතාවයන්ට සංක්‍රමණය වීම පහසු කිරීම සඳහා විවිධ මූලික අංගයන් යටතේ අන්තර්කාලීන විධිවිධාන කිහිපයක් මෙම විධානය යටතේ සපයා ඇත. මෙම විධානයේ ප්‍රධාන අරමුණ වනුයේ සමස්තයක් ලෙස මුදල් සමාගම්වල මනා පැවැත්ම පවත්වාගැනීම සඳහා මුදල් සමාගම්වල ව්‍යාපාර කටයුතු සහ ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් වර්ධනය කිරීමේ වැඩි වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරීමයි.

(iv) **2008 අංක 4 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලන - සංශෝධන) විධානය** - 2008 අංක 3 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලන) විධානයෙහි සඳහන් අන්තර්කාලීන විධිවිධානවල වෙනස්කම් කිහිපයක් සිදුකිරීම සඳහා මෙම විධානය නිකුත් කරන ලදී.

## 25.2 ලියාපදිංචි කල්බදු මූලයකරණ ආයතන

### (අ) කල්බදු මූල්‍යකරණ ආයතන ලියාපදිංචි කිරීම

මෙම වර්ෂය තුළදී, කල්බදු මූල්‍යකරණ පනත යටතේ පොදු සමාගම් 3 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලියාපදිංචි කරනු ලැබීය. ඒ අනුව, 2008 වර්ෂය අවසානය වනවිට, බලපත්‍රලාභී වාණිජ බැංකු 14 ක්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 9 ක්, ලියාපදිංචි මුදල් සමාගම් 33 ක් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 22 ක් වශයෙන් ලියාපදිංචි මුළු කල්බදු මූල්‍යකරණ ආයතන සංඛ්‍යාව 78 ක්ව පැවැතිනි.

### (ආ) විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන අධීක්ෂණය කිරීම

2008 වර්ෂය තුළදී ද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන විසින් මාසිකව දුරස්ථ පරීක්ෂණ කටයුතු සිදුකරන ලදී. (අනෙකුත් ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන වන බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ ලියාපදිංචි මුදල් සමාගම් ඒවාට අදාළ ව්‍යවස්ථාපිත පනත් යටතේ අධීක්ෂණයන්ට ලක්වේ.) මීට අමතරව, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල සම්පූර්ණ එතැන් පරීක්ෂණ 6 ක් සහ සීමිත එතැන් පරීක්ෂණ 12 ක් ද වර්ෂය තුළදී සිදුකර ඇත. එතැන් පරීක්ෂණවල අරමුණ වූයේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල මූල්‍ය ක්‍රියාකාරිත්වය, එම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් මුහුණ දිය හැකි අවදානම සහ එකී සමාගම්වල පද්ධති සහ පාලන විධික්‍රම වල සඵලතාව ඇගැයීමට ලක් කිරීමයි. දුරස්ථ පරීක්ෂණය සඳහා සපයනු ලබන මූල්‍ය තොරතුරු වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සහ විධානයන් පිළිපැදීම ද මෙම එතැන් පරීක්ෂණවලදී පරීක්ෂා කරනු ලැබේ. විධානයන් පිළි නොපැදීම සම්බන්ධව හෙළිවන තොරතුරු අනුව එම විධානයන් පිළිපැදීම සඳහා නිශ්චිත කාලසීමාවක් ද සහිතව උපදෙස් දීමත් ඒ සම්බන්ධව සමීපව පසු විපරම් කිරීමත් සිදුකරනු ලදී.

## 25.3 අසාර්ථක වූ මුදල් සමාගම්

මුදල් සමාගම් පනත යටතේ සැලසී ඇති ප්‍රතිපාදන අනුව 1988 සිට අසාර්ථක වූ මුදල් සමාගම් නවයක පරිපාලනය සහ කළමනාකරණය මුදල් මණ්ඩලය වෙත පවරා ගෙන ඇත. 2008 වර්ෂය අවසානය වන විට, මෙම සමාගම් අතුරින් හතර ක් ගනුදෙනු බේරා වසා දමා ඇත. තවත් සමාගම් 5 ක් සඳහා ඇවර කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී. අසාර්ථක මුදල් සමාගම් සම්බන්ධයෙන් පරීක්ෂාකර ගත හැකි ඉදිරි පියවර සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද විගණන සහ නීති ආයතන වල නිර්දේශ ඇතුලත් වාර්තාව අදාළ බලධාරීන් වෙත යොමු කර ඇති අතර, දැනට සමාලෝචන මට්ටමේ පවතී. අසාර්ථක මුදල් සමාගම් සම්බන්ධව පරීක්ෂා කිරීමට පත්කරන ලද ජනාධිපති කොමිෂන් වාර්තාව අතිගරු ජනාධිපතිතුමා වෙත 2008 දෙසැම්බර් 15 දින ප්‍රදානය කරන ලදී.

## 25.4 අනවසරයෙන් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම

නීත්‍යානුකූල අවසරයකින් තොරව මුදල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන බවට තොරතුරු ලද ආයතන සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු 2008 වර්ෂය තුළදී, දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කරගෙන යන ලදී. මුදල් සමාගම් පනතේ (1) වගන්තිය යටතේ බලතල ප්‍රකාරව අනවසර මුදල් ව්‍යාපාර පවත්වාගෙන යන ආයතන සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවන් සලකා බැලීමෙන් පසුව, අනවසරයෙන් මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගිය ආයතන 7 ක් නීති විරෝධී ලෙස මුදල් ව්‍යාපාර කටයුතු වල යෙදෙන බවට මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරන ලදුව, මුදල් සමාගම් පනතින් පැවරී ඇති බලතල යටතේ නීති මාර්ගයෙන් කටයුතු කිරීම සඳහා සැප්තැම්බර් මස දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී. 2008 වර්ෂය අවසානය වන විට ආයතන 56 ක් සම්බන්ධව මහජන පැමිණිලි ලැබී තිබුණි. මේවායින් ආයතන 14 ක්, මුදල් සමාගම් පනතේ සඳහන් වගන්ති සහ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන් කඩ කරමින් නීති විරෝධී ලෙස මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගොස් ඇති බැවින්, ඊට විරුද්ධව නීතිමය කටයුතු ආරම්භ කොට ඇත. අවසර නොලත් මුදල් තැන්පතු රැස්කරන ආයතන පිළිබඳව පරීක්ෂා කිරීමට පවතින

ප්‍රතිපාදන ශක්තිමත් කිරීම සඳහා මුදල් සමාගම් පනතට අවශ්‍ය සංශෝධන යෝජනා කර ඇත.

## 25.5 මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්

අවසර නොලත් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම සම්බන්ධව මහජනයා දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කටයුතු කරනු ලැබීය. ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග පහත සඳහන් වේ :-

(අ) පුවත්පත් නිවේදන

විවිධ නීතිමය ප්‍රතිපාදන යටතේ තැන්පතු භාරගැනීමට මහ බැංකුවේ අනුමැතිය ලැබූ ආයතනවල සහ අවසරලත් සංවිධානවල නම් ඇතුලත් ලේඛනයක්, "තැන්පතු" යන්නට අදාළ නිර්වචනය ද සහිතව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව මාස්පතා පුවත්පත්වල පළකරන ලදී. මෙයට අතිරේකව 2008 වර්ෂයේ දෙවන භාගය තුළදී, විශේෂයෙන්ම අවසර නොලත් මුදල් ආයතන සම්බන්ධ පුවත්පත් දැන්වීම් 19 ක් පළකර ඇත.

(ආ) අවසර නොලත් මුදල් ව්‍යාපාර පිළිබඳව මහජනයා දැනුවත් කරන වැඩසටහන් 4 ක් සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී විය.

(ඇ) "අවසර නොලත් පුද්ගලයන් සහ ආයතන විසින් මහජනයා වෙතින් මුදල් තැන්පතු රැස්කිරීම" යන මාතෘකාව සහිතව මුද්‍රණය කරන ලද අත් පත්‍රිකාවක් ලියාපදිංචි මුදල් සමාගම් සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු මාර්ගයෙන් මහජනයා වෙත බෙදාහැරීමට කටයුතු කරන ලදී.

**2008.12.31 දින වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති ආයතන**

**ලියාපදිංචි මුදල් සමාගම්**

1. අබාන්ස් ෆයිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
2. එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
3. ඒ එම් ඩබ් කැපිටල් ලීසිං ලිමිටඩ්
4. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
5. ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්
6. ඒෂියා ඇසෙට් ෆයිනෑන්ස් ලිමිටඩ්
7. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
8. බාට්ලීට් ෆිනෑන්ස් ලිමිටඩ්
9. බිම්පුත් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
10. කැපිටල් රීච් ලීසිං ලිමිටඩ්
11. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
12. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්
13. සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් රියල්ටි ලිමිටඩ්
14. විලච් ෆිනෑන්ස් ලිමිටඩ්
15. කොමර්ෂල් ක්‍රෙඩිට් ලිමිටඩ්
16. එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
17. ඉන්ඩස්ට්‍රියල් ෆිනෑන්ස් ලිමිටඩ්
18. ලංකා ඔරික්ස් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
19. එල්.බී. ෆිනෑන්ස් පීඑල්සී
20. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
21. මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්
22. නන්දා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
23. නෙක්ස්ට් ෆිනෑන්ස් ලිමිටඩ්
24. සෙන්කඩගල ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
25. සෙලාන් මර්චන්ට් ලීසිං පීඑල්සී
26. සිල්වරින් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
27. සිංගර් ෆිනෑන්ස් (ලංකා) ලිමිටඩ්
28. සිංහපුත්‍ර ෆිනෑන්ස් ලිමිටඩ්
29. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
30. ද ෆිනෑන්ස් ඇන්ඩ් ගරන්ටි කම්පැනි ලිමිටඩ්
31. ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
32. ද මල්ටි ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
33. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
34. වැලිබල් ෆිනෑන්ස් ලිමිටඩ්

**විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

1. ඒෂියා කොමර්ස් ලිමිටඩ්
2. ඇසෙට්ලයින් ලිසිං කම්පැනි ලිමිටඩ්
3. කැපිටල් රීච් ක්‍රෙඩිට් ලිමිටඩ්
4. සීලීස් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්
5. සෙලින්කෝ ඩිවලොප්මන්ට් බෑන්ක් ලිමිටඩ්
6. සෙලින්කෝ ෆයිනෑන්ස් පීඑල්සී
7. සෙලින්කෝ ලීසිං කෝපරේෂන් ලිමිටඩ්
8. කොමර්ෂල් ලීසිං කම්පැනි පීඑල්සී
9. කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්
10. ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ්
11. ඉසුරු ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
12. කළුතොට ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ලීසිං ලිමිටඩ්
13. කොෂිබා ලීසිං කම්පැනි ලිමිටඩ්
14. ලංකා ඔරික්ස් ලීසිං කම්පැනි පීඑල්සී
15. ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
16. එල්.ඕ.එල්.සී.මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
17. මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී

18. ඔරියන්ට් ෆිනෑන්ෂියල් සර්විසස් කෝපරේෂන් ලිමිටඩ්
19. පීපල්ස් ලීසිං කම්පැනි ලිමිටඩ්
20. පීපල්ස් මර්චන්ට් බැන්ක් පීඑල්සී
21. සම්පත් ලීසිං ඇන්ඩ් ෆැක්ටරිං ලිමිටඩ්
22. සෙලාන් මර්චන්ට් බැන්ක් පීඑල්සී.

### 25.6 සුළු මූල්‍යකරණ ආයතන නියාමනය කිරීම

සුළු මූල්‍ය ආයතන විශාල සංඛ්‍යාවක් රට පුරා මූල්‍ය කටයුතුවල නියැලී ඇත. මෙම ආයතන දැනට කිසිදු ආකාරයක නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් හෝ විධිවිධානයන් යටතේ නියාමනය හෝ අධීක්ෂණය කරනු නොලබයි. සුළු මූල්‍ය අංශයේ සහ පවතින නීතිවල ඇති විවිධත්වය සහ සංකීර්ණතාව නිසා මෙම ආයතන කිසියම් අධීක්ෂණයකට සහ නියාමනයකට ලක් කිරීමේ අවශ්‍යතාවය පෙනී ගොස් ඇත. එම නිසා මෙම අංශය සඳහා අධීක්ෂණ සහ නියාමන ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී.

## 26. සුභසාධන

විමර්ශනයට භාජනය කරනු ලබන වර්ෂය තුළදී සුභසාධන දෙපාර්තමේන්තුව විසින් සිය සේවාවන්හි ගුණාත්මක බව වැඩි කිරීමත් සමගම බැංකු සේවානියුක්තයන්, විශ්‍රාමිකයන් සහ ඔවුන්ගේ යැපෙන්නන් සඳහා ඇති සුභසාධන පහසුකම් ද ඉහළ නංවන ලදී. සුභසාධන දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන මෙම සේවා පහසුකම් අතරට වෛද්‍ය ප්‍රතිලාභ, නිවාස හා වාහන ණය, අභ්‍යන්තර වෛද්‍ය මධ්‍යස්ථානයක්, ආපනශාලා පහසුකම්, සහනදායී ණය ක්‍රමයන් සහ ඊට අනුබද්ධිත අනෙකුත් සේවාවන් ඇතුළත් වේ.

සේවානියුක්තයින්ගේ වෛද්‍ය ප්‍රතිලාභ හිමිකම් ඉහළ නැංවීමෙන් සහ සේවානියුක්තයින් සහ විශ්‍රාමිකයින් වෙනුවෙන් දියවැඩියා රෝග ප්‍රතිකාර සඳහා සිදුකෙරෙන වියදම් ප්‍රතිපූරණය කිරීමේ පහසුකම් වැනි නව ප්‍රතිලාභ කාණ්ඩයන් හඳුන්වා දීමෙන් මහ බැංකු වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ සපයනු ලබන පහසුකම් 2008 වසර තුළදී සැළකිය යුතු ලෙස පුළුල් කරන ලදී. එමෙන්ම, ඉදිකිරීම් අංශයෙහි පිරිවැය මෙන්ම ඉඩම් මිල සහ වාහන මිල ඉහලයාමත්, ඒ සඳහා දෙනු ලබන ණය මුදල් ප්‍රමාණවත් නොවීමත් සැළකිල්ලට ගනිමින් දෙපාර්තමේන්තුව විසින් නිවාස ණය සහ වාහන ණය ප්‍රමාණයන් සැලකිය යුතු ලෙස වැඩිකරන ලදී. මෙම නව ක්‍රමය 2009 වසරේ සිට ක්‍රියාත්මක කරනු ඇත. බැංකු සේවාවෙන් විශ්‍රාම යන සේවානියුක්තයින් සඳහා ප්‍රතිලාභ සලසනු වස් නිවාස ණය වාරික ලබාගැනීමේ අවස්ථාව සිය විශ්‍රාම යාමේ දිනසිට මාස 6 ක් දක්වා දීර්ඝ කිරීම තුළින් නිවාස ණය පහසුකම්ද තවදුරටත් පුළුල් කරන ලදී. තවද, 2009 වසරේ සිට නිවාස ණය වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා පරිගණකගත ක්‍රමයකට අවශ්‍ය පූර්ව කටයුතු සිදුකරන ලදී. දීර්ඝ කාලයක් නිවාස ණය ශේෂයන් ආපසු ගෙවීම පැහැර හරින ලද හිඟ ණය හිමිකරුවන්ගෙන් රුපියල් මිලියන 9 ක පමණ මුදලක් පියවාගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය. ඒ අතරතුර දෙපාර්තමේන්තුව විසින් සේවානියුක්තයන්ගේ ණය අවශ්‍යතා සපුරාලීමේ දී ඉතා කෙටි කාලසීමාවක් තුළ වඩාත් කාර්යක්ෂමව ණය මුදාහැරීමට ද කටයුතු කරන ලදී. මෙම වසර තුළ අනුමත කරන ලද නිවාස ණය සංඛ්‍යාව 90 ක් වූ අතර, සේවක සුභසාධන ණය, පරිගණක ණය, වාහන ණය ආදියද ඇතුළුව අර්ථසාධක අරමුදල් ණය සංඛ්‍යාව 1073 ක් විය.

මහ බැංකු ආපනශාලා සේවය වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීමටත්, බැංකු සේවානියුක්තයන්හට සිය අභිමතය පරිදි ආහාර තෝරා ගැනීමටත් ස්වයං සේවා ක්‍රමය ඉවහල් විය. ආපනශාලා පහසුකම් භුක්ති විඳින සංඛ්‍යාව ඉහල ගියද, මෙතෙක් එම සේවාවන් සපයන ලද කාර්ය මණ්ඩලයට ඇතුළත් සංඛ්‍යාවේ වෙනසක් නොවී එකී සේවාවන් කාර්යක්ෂමව සපයන ලදී.

බැංකු කාර්ය මණ්ඩලයේ සුභසිද්ධිය සඳහා සෞඛ්‍ය සහ වෙනත් පොදු මාතෘකා යටතේ දේශන මාලාවන් පැවැත්වීම සඳහා අවශ්‍ය මෙහෙයවීමේ කටයුතු ද දෙපාර්තමේන්තුව විසින් 2008 වසරේදී සිදුකරන ලදී. එමෙන්ම, විද්‍යුත් මාධ්‍යය උපයෝගී කර ගනිමින් ප්‍රයෝජනවත් සෞඛ්‍යමය උපදෙස් බෙදාහැරීම ද සිදුකරන ලදී.